

# මෛත්‍රී සන්ත

# වෙළෙඳ සස්ත

පණ්ඩිත වැලිගම ඤාණරතන
ස්ථවිර

බුද්ධ ධර්මය පිළිබඳ පොත් පෙළක්
ප්‍රසිද්ධ කැරවීමේ අදහසක් අප
මෑණියන් තුල ඇති හෙයින්
'සද්ධර්ම රශ්මි ග්‍රන්ථ මාලාවේ'
දෙවන පුස්තකය වන මේ ලෙමඉහණ
සත්ත මුද්‍රණය කැරවීමේ වියදම
දරන ලද්දේ ද අප මෑණියන් විසින්.

මෙය විකිණීමෙන් ලැබෙන
ආදායම මතු පුස්තකයන් ප්‍රචාරය
කැරවීමට යොදවනු ලැබේ.

මේ පොතේ මිල රු. 3 කි.
තැ. ගා. ශත 35 ක් අතිරේක
වශයෙන් ගෙවිය යුතු වේ.

ධම්මිඤ මුනසිංහ

10, ලෙයාර්ඩ්ස් පාර,
හැව්ලොක් ටවුන්.

# මේ පොත

අපවත් වී වදාළ අතිගරු පැලෑණේ ශ්‍රී වජ්‍රඥාන මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට සහ අසමද්දුවංශී අහංගම සිරි විමලසාර මාහිමි පාණන් වහන්සේට ත් පූජා පුෂ්පයක් වේවා !

මෙයට,

සම්පාදක

ඵන්දනං, චපලං චිත්තං - දුරක්ඛං දුන්නිවාරයං
උජුං කරොති මෙධාවි - උසුකාරොව තෙජනං



# පෙරවදන

---

මෙහෙණ සස්න නම් වූ මේ පොත මෙයින් වසර කීපයකට පෙර ලියනලද්දකි. “භික්ෂුණී ප්‍රාතිමොක්ෂාංගතාවිනය ශික්ෂාපද ත් ඒ ශික්ෂාපදයන්හි තේරුම ත් ලියාදුන මැනැවැ”යි හැව්ලොක්ටවුන්හි ලෙයාර්ඩ්ස් පාරේ සිරිසරණ මැදුරෙහි බී. මුනසිංහ මැතිනිය විසින් කරනලද ආරාධනය මේ පොත ලිවීමට හේතු විය. මෙහි භික්ෂුණී විනය ශික්ෂාපද ඇතුළුව ශ්‍රේෂ්ඨතම රහත් මෙහෙණින් වහන්සේලා කීප නමකගේ චරිත කථා ත් සමග ලංකාවේ මෙහෙණ සස්න පිළිබඳ සංක්ෂිප්ත ඉතිහාසය ලියා තබන්නට කල්පනා කෙළෙමි. එසේ කල්පනා කෙළේ මෙය ලැබැ ගන්නා කාහට වුවත් සුලු ප්‍රයෝජනයක් වත් සලසා දීමේ අදහසිනි.

මෙකලැ මෙහෙණ සස්න අභාවයට ගොස් තිබෙන හෙයින් සැදූහැති උපාසිකාවනට බුදු සසුන්හි මහණ උපසපන් වැ භික්ෂුණීයක වශයෙන් වෙසෙමින් ගුණදම් පුරන්නට අවකාශයක් නැත. භික්ෂුණීයක විසින් භික්ෂු-භික්ෂුණී යන උභතො සංඝයාගෙන් ම උපසම්පදාව ලැබැ ගතයුතු හෙයින් නැවැත භික්ෂුණී ශාසනයක් ඇතිකිරීමට හැකියාවක් කිසිවකුට නැත. එහෙත් සැදූහැති උපාසිකාවක විසින් භික්ෂුණී විනය ශික්ෂාපද උගෙනැ ඒ අනුව පිළිපැදීම තම ඉන්ද්‍රිය දමනයට අදාළ වන බව පමණක් කියැ හැකිය. එබැවින් කාගේත් පරිශීලනයට මෙය සුදුසුය.

මෙයට,

වැලිගම ඥාණරතන ස්ථවිර

2500 වෙසක් මසැ

පුර තියවක්ලත් ගුරු ද

බම්බලපිටියේ වජ්‍රාරාමයේ දී ය.

# පටුන


| | පිටු |
|---|---|
| බුද්ධත්වයේ සිට දම්සක් දෙසුම තෙක් | 1 – 3 |
| යසකුලපුත්‍රයා | 4 – 5 |
| ධර්මප්‍රචාරය | 5 – 6 |
| බුදුරජ කිඹුල්වත් පුරයට වැඩමවීම | 6 – 8 |
| ශාක්‍ය කෝලිය යුද්ධය | 8 – 9 |
| සුදොවුන් රජ පිරිනිවීම | 9 |
| ගෞතමිය පැවිද්ද ලැබීමට නික්මීම | 10 – 12 |
| අනඳමාහිමි හමුවීම | 12 – 14 |
| අෂ්ටගරු ධර්මය සහ මෙහෙණ සස්න ආරම්භ කිරීම | 14 – 19 |
| භික්ෂුණී විනයේ පාරාජිකාපත්තිහු | 19 – 25 |
| සප්තරස සංඝාදිසෙසයෝ | 26 – 41 |
| තිස් නිසගිපචිති | 42 – 53 |
| එක්සිය සැටක් පචිති | 54 – 90 |
| අට පාටිදෙසනීයාපත්තිහු | 91 – 93 |
| සෙඛියා පන්සැත්තෑව | 93 – 103 |
| සප්ත අධිකරණ සමථ | 104 |
| බුද්ධාගමයෙන් ස්ත්‍රීනට සිදුවූ යහපත | 105 - 106 |
| මහාප්‍රජාපතී ගෞතමී ස්ථවිරා චරිතය | 107 - 116 |
| ඛෙමා ස්ථවිරාවෝ | 117 – 121 |
| අම්බපාලි ස්ථවිරාවෝ | 122 – 128 |
| සුන්දරිනන්දා ස්ථවිරාවෝ | 129 – 131 |
| අනෝපමා ස්ථවිරාවෝ | 132 – 133 |
| ජීවකම්බවනිකා ශුභා ස්ථවිරාවෝ | 134 – 143 |
| ශුභා (කම්මාරධීතා ස්ථවිරාවෝ | 144 – 150 |
| පටාචාරා ස්ථවිරාවෝ | 151 – 155 |
| කිසාගෝතමී ස්ථවිරාවෝ | 156 - 160 |

| | පිටු |
|---|---|
| භද්දකුණ්ඩලකෙසා සථවිරංවෝ | 161 – 164 |
| සෝමා සථවිරංවෝ | 165 – 166 |
| ධම්මදින්නා සථවිරංවෝ | 167 |
| දන්තිකා සථවිරංවෝ | 168 |
| උබ්බිරී සථවිරංවෝ | 169 – 170 |
| මිත්තාකාලී සථවිරංවෝ | 171 – 172 |
| රෝහිණී සථවිරංවෝ | 173 – 178 |
| මෙහෙණ සස්න ව්‍යාප්තවීම | 178 |
| අශෝක කාලය | 179 – 186 |
| අනුලා ඇතුළු පිරිස පැවිදිවීම | 187 – 194 |
| මෙහෙණ සස්නේ අවසානය | 195 – 196 |

# මෛහේණ සස්ත

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

සෙත් කළ සත්වගට – මහකුළුණු බැරි දින දින
සුවිසි කෙළ ලක්වරක් - සමවන් සමවතිනි පුන්

නමදිම් බුදුරදුන් – සකසා අමාමග පෑ
මගණු'පසපුව ඉතිරින් – හට ද දීමෙත් පිරිපුන්

සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ ලොවුතුරා බුදු වැ සත්සති ගත කොටැ අජපල් නුගරුක් මුලැ අටවැනි සතිය ගෙවමින් වැඩැහුන් සේක. එහි දී උන් වහන්සේට පහළ වූ අදහසෙක් නම්: "මා අවබෝධ කළ චතුරාර්ය සත්‍ය ධර්මය ඉතා ගැඹුරු ය. ගැඹුරු නිසා ම අවබෝධයට අපහසු ය. සාමාන්‍ය ලෝවැස්සා වූ කලී තෘෂ්ණාවෙන් දූවැටුණේ ය. මෝහයෙන් පිරිවරා ගත්තේ ය. තෘෂ්ණාවෙහි ගිලුණු මෝහයෙන් පිරිවැරුණු සත්නට පටිච්ච සමුප්පාදය හා නිවන අවබෝධ කිරීම දුෂ්කරය." යනාදි වශයෙනි. මෙසේ බුදු වැ ධර්මයෙහි ගැඹුරු ගතිය ත් සත්වයාගේ සමාන්‍ය තත්වය ත් සිතත් ම **සහම්පතී** නම් මහා බ්‍රහමයා එහි අවුත් බුදුන් වැඳ "ස්වාමීනි, බුදුරජාණන් වහන්ස, ධර්මදේශනා කරන සේක්වා! ධර්මය අවබෝධ කරන්නෝ ඇත්තා හ. උස පර්වතයකට නැග හාත්පස බලන්නකුට අවට තිබෙන හැමෙකක් ම දැකිය හැක්කා සේ ධර්මමය ප්‍රාසාදයට නැග බුදු ඇස යොමා බලන ඔබ වහන්සේට සත්වවර්ගයා පිළිබඳ කෙලශ තත්වය ත් ඥාන ප්‍රමාණය ත් දත හැක්කැ" යි පැවැසී ය.

ඉන්පසු තථාගතයාණෝ බුදු ඇස යොමු කොට සත්ව වර්ගයා දෙස බලා ධර්මදේශනාවට කාලය පැමිණි බව දත්හ. හැමට පළමු වැ කවරකු හට දහම් දෙසුව මනාදැ' යි සිතූහ,

ආළාර උද්දක යන දෙ තවුසන් බොහෝ නුවණැත්තවුන් හෙයින් ඔවුන් ගැන සිතිකළහ. ඔවුන් මියැ ගොස් අරූ–පලෝකයෙහි උපන් බව ප්‍රත්‍යක්ෂයෙන් දත්තෙන් ඉන්පසු බරණැසැ ඉසිපතනත්හි වෙසෙන පස්වග තවුසන් මතක් වැ ඔවුනට බණ දෙසුම් වස් නිශ්චය කොට ඇසළ මස තුදුස්වක් (14) ද වනතුරුැ ඒ අජපල් නුගරුක් සෙවණෙහි ම වුසූහ.

## බරණැස බලා නික්මීම

ඇසළමසැ තුදුස්වක පැමිණියේ ය. එදා අළුයමැ තථාගතයන් වහන්සේ බරණැස ඉසිපතනය බලා නික්මුණු සේක. බුද්ධගයාවේ සිට බරණැස දක්වා වූ අටලොස් (18) යොදුන් මහ මග ඉක්මවන බුදුනට **උපක** නම් ආජීවකයා හමු විය. ඔහු සමග පිළිසඳර කථා කොට තමන් වහන්සේ ලොවුතුරා බුදු වැ දම් දෙසුම් පිණිස කසී රටැ බරණැස් නගරයට වඩනා බව පවසා, ගමන් කොට ඇසළ පසළොස්වක යෙදුණු පසු දින සවස් භාගයෙහි ඒ බරණැස ඉසිපතනයට ළඟාවූ සේක. එදා එහි වුසූ කොණ්ඩඤ්ඤ – භද්දිය – වප්ප – මහානාම – අස්සජි යන පස්වග තවුසෝ දුරැ වඩනා තථාගතයන් වහන්සේ දැක කතිකා කර ගත්හ. “ඔය එන මහණ ගොයුම් තෙමේ සැහැල්ලු පැවැත්මෙන් වෙත් වැ, වැඩියක් සිවුපස පරිභොගයට පෙරළී, අඟපසඟින් වැඩී රන්වන් බවට පත්ව, දැන් එයි. එබැවින් අපි වන්දන මානනාදිය නො කරම්හ. උසස් පවුලෙක්හි උපන්නකු බැවින් හිඳිනට අසුන් පමණක් දෙම්හ” කියායි. ඔවුහු මෙසේ කතිකා කොටැ සිටිය ද තථාගතයන් වහන්සේ ළංවත් ම ඒ කතිකාහි පිහිටා සිටිනුව නො සමත් වූහ. ඔවුනතරැ කෙනෙක් පෙර ගමන් කොට පා සිවුරු ගත්හ. කෙනෙක් මුව දෝනා පැන් තැබූහ. කෙනෙක් අසුන් පැණැ වූහ. කවුරුත් වැඳුම් – පිදුම් ඈ ආචාර කළහ. මෙසේ හරසරින් පිළිගත ද “තවමත් නො බුදුය” යන

හැඟුම ඇත්තෝ "ඇවැත්නි" යි තථාගතයන් ඇමතූහ. එවිට තථාගතයන් වහන්සේ තමන් වහන්සේ බුද්ධත්වය ලැබගත් බව සකාරණ වැ හෙළිකළහ.

## දම්සක් දෙසුම

සන්ධ්‍යා කාලයෙහි පෙරදිගින් සඳ උදාවත් ම බටහිරින් හිර බැස ගියේය. තාරකාවෝ මදින් මඳ බබළන්නට වන්හ. බණ අසන රිසියෙන් දෙව් - බඹහු ද රැස් වූහ. නැකැතක් බලාපොරොත්තු නොවුව ද හැම වැඩකට ම සුදුසු වූ විජය යොගය පැමිණියේ ය. ඉක්බිති තථාගතයන් වහන්සේ පස් වග තවුසන් අමතා "ද්වෙ මෙ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා" යනාදි වශයෙන් "ධම්මචක්කප්පවත්තන සූත්‍රාන්ත ධර්මය" අති මධුර වූ අෂ්ටාංග සමන්වාගත ස්වරයෙන් දෙශනා කරන්නට පටන් ගත් සේක. පරම ගම්භීර වූ මේ සූත්‍රාන්ත ධර්මයට මුළු හිතින් ම කන්දුන් ඔවුනතර කොණ්ඩඤ්ඤ තවුසා ඇතුළු වූ දහ අට කෝටියක් බ්‍රහ්මයෝ සෝවාන් වූහ. සෝවාන් වූ කොණ්ඩඤ්ඤ තවුසා තථාගතයන් වහන්සේගෙන් මහණකම ඉල්ලා සිටියෙන්, තථාගතයන් වහන්සේ "එහි භික්ඛු, ස්වාක්ඛාතො ධම්මො, චර බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියාය" මහණ, මෙහි එව, නව ලොවුතුරු දහම හොඳින් ප්‍රකාශ කරන ලදී. මතු මාර්ගත්‍රය සංඛ්‍යාත බ්‍රහ්මචර්යයෙහි හැසිරෙව" යි දෙශනා කළ සේක. එය ම කොණ්ඩඤ්ඤ තවුසාගේ පැවිද්ද ත් උපසම්පදාව ත් විය. කොණ්ඩඤ්ඤ භික්ෂුව බුදුසසුන්හි පැවිදි-උපසපන් වීමෙන් පසුව බුදුරජාණන් වහන්සේගේ භික්ෂු ශාසනය ආරම්භ විය. භික්ෂු ශාසනය ආරම්භ වත් ම තුනුරුවන සම්පූර්ණ විය. ඉතිරි තවුසන් සිවුදෙනා හට මතු සිවු දිනයෙහි අවවාද කොට දවසකට එක එක තවුසා බැගින් සෝවාන් වූ කල්හි ඒ සිවුදෙනා හට ත් කොණ්ඩඤ්ඤ භික්ෂූන් වහන්සේට මෙන් පැවිදි - උපසපුව දී, අව විසේනිය දවසෙහි අනාත්ම ලක්ෂණ සූත්‍රය දෙශනා කොට පස්නම ම රහත් මගට යොමු කළ සේක.

**යස කුල පුත්‍රයා**

එකල්හි බරණැස යස නම් සිටු පුත් තෙමේ ගිහිගෙහි කලකිරී තවුස් පැවිද්දක් ලබන රිසින් බරණැස ඉසිපතනයට පැමිණියේ ය. තථාගතයන් වහන්සේ ද අළුයම්හි සක්මනෙහි යෙදී සිටි සේක. යස කුල පුත්‍රයා එතැනට පැමිණීයෙන්, තථාගතයන් වහන්සේ ඔහුට අවවාද කිරීම් වශයෙන් දාන කථාදි පිළිවෙල කථාව දේශනා කොට, යස කුල පුත්හුගේ සිත් සතන් නීවරණාපගමයෙන් (නිවරණ පහවීමෙන්) පහන් වූ කල චතුරාර්ය සත්‍ය ධර්මය දෙසූ සේක. යස කුල පුත් ඒ ධර්මය අසා සෝවාන් විය. ඔහු පිය තෙමේ ද "යස කුල පුත් කොහි ගියේදැ"යි සොයමින් ඔහුගේ පා සටහන් අනුව එන්නේ ඉසිපතනයට ම අවුත් "ස්වාමීනි, දැන් මේ මගින් ගිය යසකුල පුත්‍ර දුටු සේක්දැ"යි ප්‍රශ්න කෙළේ ය. එවිට තථාගතයන් වහන්සේ "ගෘහපතිය, යස දකිනු කැමැත්තෙහි නම්, මෙහි විකක් හිඳුව"යි ප්‍රකාශ කොට ඔහුට ද දෙසුම් ක්‍රමය වන දාන කථාදී පිළිවෙළ කථාව කළ සේක. ඒ දෙසනාවසානයෙහි යස කුල පුත්හුගේ පිය තෙමේ සෝවාන් විය. පියාට දෙසූ දහමට කන් දුන් යස කුල පුත් තෙමේ ද ඒ දම්දෙසුම් අවසන්හි ම උතුම් රහත් ඵලයට පත් විය. ඉන් පසු "යස ගිහි ගෙයි නොරැඳෙන්නේය"යි දත් තථාගතයන් වහන්සේ යස කුල පුත්‍රයා පියාට නොපෙනෙන්නට ඉටූ සේක. පියා යස කුල පුත් දුටු කල්හි "පුත්‍රය ඔබගේ මෑණියන්දෑ ඔබ නොදැක දුක් ශෝකයෙන් සිටින දෑ ය. එහෙයින් ඔබගේ මෑණියන්දෑට ජීවිත දානය දෙන මැනවැ"යි පැවැසී ය. එවිට යස කුල පුත් තෙමේ තථාගතයන් වහන්සේ දෙස බැලී. එවිට බුදුරජාණන් වහන්සේ "යස කුල පුත්‍රයා රහත්වූයෙන් මින් පසු ගිහිගෙහි නොවසාය"යි ප්‍රකාශ කළ සේක. එ යැසූ සේ "පුත්‍රයාට වූයේ මහත් ලාභයෙකැ"යි කියා දවල් දනට ද ආරාධනා කොට නික්ම ගියේය. යස ද තථාගතයන් වහන්සේගෙන් ඒහිභික්ඛුප්‍රව්‍රජ්‍යාව ලැබ එදා දවල් දනට යස භික්ෂුව සමග බුදුරජාණන් වහන්සේ

එහි වැඩම කළ කල්හි යසගේ මව ද පුරාණ භාර්යාව ද අවුත් එකත් පසෙක්හි හිඳ ගත්හ. භාග්‍යවතුන් වහන්සේ ඔවුනට දම් දෙසූ සේක්, දෙශනාවසානයෙහි ඒ දෙදෙන සෝවාන් වූහ. බුදුසසුන්හි පළමු කොට තිසරණ ගත වූ උපාසිකාවෝ මොවුහු ය. යස සිටු පුත් පැවිදි වූ බැව් අසා ඔහුගේ යහළුවෝ සිවු පණස් දෙනෙක් ද බුදුසසුන්හි පැවිදි ව රහත් වූහ.

## ධර්ම ප්‍රචාරය

මෙසේ ලෝකයෙහි රහතන් වහන්සේ සැට එක් නමක් ඇති වූහ. වස් තුන් මස ද ඉක්ම ගියේ ය. තව මසකුත් එහි ම විසූ සේක්, දවසක් තථාගතයන් වහන්සේ භික්ෂූන් අමතා "මහණෙනි දෙනාට යහපත පිණිස මේ ශාන්ත ධර්මය දේශනා කරමින් චාරිකාවෙහි හැසිරෙවු. දෙනමක් එක මග නොයවු" යි භික්ෂූන් ධර්ම දූත කාර්යයෙහි යොදවා තමන් වහන්සේ උරුවෙල් දනව්ව දෙසට වැඩි සේක. එසේ වඩනා වූ උන්වහන්සේ හට අතරමග දී හමු වූ භද්‍ර වර්ගිය කුමාරයන් තිස්දෙනා ද මාර්ග ඵලයන්හි පිහිටුවා ධර්මප්‍රචාරයට යවා උරුවෙල් දනව්වෙහි විසූ උරුවෙල කාශ්‍යප - නදී කාශ්‍යප - ගයා කාශ්‍යප යන ජටිලයන් තිදෙනා ඇතුළු ඔවුන් ගේ පිරිවර ජටිලයන් දහස ද දමනය කොට රහත් බව්හි පිහිටුවා ඒ ජටිල භික්ෂූන් දහස පිරිවරා ගෙන රජගහ නුවරට වැඩි සේක. එහි දී දෙසූ දම් අසා බිම්සර රජ ඇතුළු එකොළොස් නහුතයක් දෙන සෝවාන් පෙළෙහි පිහිටිය හ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර වෙලුවනාරාමයෙහි වැඩ වෙසෙමින් දෙව්මිනිස්නට නිවන් මග හෙළි කරද්දී සුද්ධෝදන රජතෙමේ තම පුත්‍රයා බුද්ධත්වය ලබා රජගහ නුවර වසන්නේය" යි දැන ගෙන කිඹුල්වත් පුරයට වැඩමවා ගැනීම පිණිස දහසක් පුරුෂයන් සහිත අමාත්‍යයකු පිටත් කෙළේය. හෙතෙමේ එහි ගොස් දහම් අසා පිරිස් සහිත ව රහත් වැ පැවිදි විය. ඒ පිරිසෙහි ආරංචි මාත්‍රයකුදු නොලබා නැවත ද පෙර

සේ ම දහසක් පිරිවර සහිත අමාත්‍යයකු යැවී ය. මෙසේ දහස දහස පිරිවර ඇති ඇමැතියෝ නව දෙනක් නව වරයක්හි යවනු ලැබූහ. එසේ ද වුව රජුගේ අදහස සඵල නොවී ය. ඉක්බිති සුදෙවුන් රජ කාලුදායි ඇමතියාට කථාකොට "දරුව මගේ පුත්‍රයා මෙහි කැඳවා ගෙන ඒම සඳහා දහස දහස පිරිවර කොට ඇති ඇමැතියන් නව දෙනකුන් නව වරයක් යැවීමි. පුත්‍රයා කැඳවා ගෙන එනුවා තබා ඔවුන්ගේ ආරංචියක් වත් අසන්නට ලැබුණේ නැත. මම ද දූඩි මහල්ලෙක්මි. මගේ පුත්‍රයා දැක ගැනීමට ද ඉතා කැමැත්තෙමි. ඔබ මේ පිරිවර දහසත් සමග ගොස් ම පුතු කැඳවා ගෙන එනු මැනැවි" යි කීවේ ය. එවිට කාලුදායි "මට මහණ වන්නට අවසර දෙන සේක් නම්, එය කට හැකැ" යි ප්‍රකාශ කොට පිටත්ව ගියේ ය. ඒ පිරිස ද තථාගතයන් වහන්සේ ගෙන් බණ අසා රහත් වූහ.

## කිඹුල්වත් පුරයට වැඩමවීම

හේමන්ත ඍතුව අවසන් වී වසන්ත කාලය පැමිණි-යේ ය. කාලුදායි තෙරුන් වහන්සේ තථාගතයන් වහන්සේට "කිඹුල්වත් පුර ගමනට කාලය පැමිණ තිබේය" යි ගමන වර්ණනා කොට අරාධනා කළහ. භාග්‍යවතුන් වහන්සේ ද විසි දහසක් භික්ෂූන් පිරිවරණ ලදුව කිඹුල්වත් පුරය බලා රජගහ නුවරින් නික්මුණු සේක. දවසකට එක යොදුනක් ගමන් කරමින් දෙමසකින් කිඹුල්වත් පුරයට පිවිසි සේක. මේ කාලය තුළ කාලුදායි තෙරුන් වහන්සේ කිඹුල්වත්පුර සුදෙවුන් රජමාලිගාවට හැමදම පිඩු සිගා වැඩැ තුමූ එහි වළඳ තථාගතයන් වහන්සේට රජ ගෙදරින් පිණ්ඩපාතය ගෙන ගොස් පිරිනැමූහ. මෙසේ පැමිණි කාලුදායි තෙරුන් ගෙන් බුදු ගුණ අසා ඉතා පැහැද සිටි කිඹුල්වත් පුර වැසි නෑයෝ බුදුරජාණන් වහන්සේගේ වාසය සඳහා නිග්‍රෝධ නම් උයන පිළියෙල කළෝය. කිඹුල්වත් පුරයට පිවිසියා වූ බුද්ධප්‍රමුඛ සංඝයා නිග්‍රෝධාරාමයට වැඩම කරවා

ගෙන ගියහ. කිඹුල්වත් පුර ශාක්‍යයෝ බුදුරජාණන් වහන්සේට වයසින් බාල වූ කුමර කුමරියන් ලවා වන්දවා තුමූ මානයෙන් නො වැඳ සිටියහ. ඔවුන්ගේ අදහස දත් බුදුරජාණන් වහන්සේ ප්‍රාතිහාර්‍ය්‍ය කොට ඔවුන්ගේ මානය සිඳ ලූ සේක. ඒ දුටු ශුද්ධෝදන රජතුමා "මේ මාගේ තුන්වන වැඳුමය" යි කියා තථාගතයන් වහන්සේට වැන්දේ ය. ඉන්පසු සෙසු සියල්ලෝ ම ත් වැන්දහ. පසුදා බුදුන් වහන්සේ භික්ෂූන් සමග කිඹුල්වත් පුරයෙහි පිඬු පිණිස හැසිරෙන බව ඇසූ සුදෙවුන් රජ වේගයෙන් දුව අවුත් "ස්වාමීනි පිඬු සිඟමින් ගෙන්ගෙට ඇවිද අපට නින්දා නො කළ මැනැවැ"යි කී කල්හි "මහරජ මෙය අපේ බුද්ධවංශයේ සිරිතය' යි බණ වදාළ සේක. ඉක්බිති රජතුමා බුද්ධ ප්‍රමුඛ සංඝයා රජ මැඳුරට වැඩම කරවා ගෙන ගොස් දන් වැළඳ වීය. වළඳා අවසන්හි භාග්‍යවතුන් වහන්සේ අනුමෙවෙනි බණ වදාළ කල්හි සුදෙවුන් රජ සෝවාන් විය. ඒ දෙසුමෙන් ම මහාපජාපතී ගෞතමිය ද සෝවාන් වූහ.

ඉන්පසු යශෝධරාවන්ගේ ගෙට වැඩි සේක. එහි බුද්ධප්‍රමුඛ සංඝයා වැඩ හුන් කල්හි යශෝධරාව භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදය අල්ලා ගෙන දැඩි ප්‍රේමයෙන් අඬන්නට පටන් ගත්තාය. ටික වේලාවකින් ම සිහි ලැබ ඇය ඉවත් වූවායින් පසු ශුද්ධෝදන රජතුමා යශෝධරාවගේ ගුණ කියන්නට පටන් ගති. එවිට එ කරුණ මුල් කර ගෙන භාග්‍යවතුන් වහන්සේ චන්දකින්නර ජාතකය දෙශනා කළ සේක. යශෝධරාව එදා ම පැවිදි වනු කැමැති වූ කල්හි "මහාප්‍රජාපතී ගෞතමිය මෙහෙණි සස්න ඇතිකිරීමට ම පැරුම් පුරා ආ නිසා තථාගතයන් වහන්සේ එය ප්‍රතික්ෂෙප කළ සේක. පසුදා මහා ප්‍රජාපතී ගෞතමියගේ පුත්‍ර නන්ද කුමාරයා ද පැවිදි කොට සදිනක් කිඹුල්වත්හි ඥාති සංග්‍රහය කරමින් වැඩ සිටි සේක. සත් වැනි දා රජ ගෙහි දන් වළඳා විහාරයට වඩිද්දි යශෝධරා තොමෝ 'රහල් කුමරු සරසා නරසීහ ගාථා උගන්වා පියා සතු

ධනය ඉල්ලා ගෙන එන්නටය'' යි යැවූවා ය. ඉන්පසු ''තමන් වහන්සේ බෝ මුල දී ලබා ගත් සප්තාර්යධනය දෙන්නෙමි'' යි අදිටන් කොට විහාරයට වැඩමවා සැරියුත් තෙරුන් වහන්සේ ලවා රාහුල කුමාරයා පැවිදි කරවන ලදි. රාහුල කුමාරයන් පැවිදි කිරීම නිසා දුක් ශොකයෙන් කම්පා වූ සුදොවුන් රජ "මවුපියන් ගෙන් අවසර නොලත් කුල දරුවන් පැවිදි නො කරන මෙන්'' තථාගතයන් වහන්සේගෙන් ඉල්ලා සිටියේය.

රහජ් කුමරු පැවිදි වීමෙන් පසුව ද යශෝධරාව මහණ වීමට කැමැති වූහ. සුදොවුන් රජ බොහෝ කරුණු කියා එය වැළැක්වී. මෙසේ කිඹුල්වත් පුරයෙහි ගත කොට එයින් පිටත් ව මල්ල රටෙහි සැරි සරා අනෝමා නදී තිරයෙහි පිහිටි අනුපිය ගමට ද එතැනින් රජගහ නුවරට ද මේ ක්‍රමයෙන් ඒ ඒ පළාත්හි සැරිසරමින් ධර්මාමෘතය බෙදා දෙමින් ජනපද චාරිකායෙහි හැසුරුණු තථාගතයන් වහන්සේ සිවුවන වස පවරා, නැවත ත් කිඹුල්වත් පුරයට වැඩම කොට න්‍යග්‍රෝධාරාමයේ විසූ සේක.

**ශාක්‍ය කොළිය යුධය**

ඒ කාලයෙහි ශාක්‍ය කොළිය රජවරුන් අතර යුධයකට කරුණු සැලසුණේය. ජලය නිසා පැන නැගුණු ඒ යුධය පිණිස "රෝහිණී'' ගං ඉවුරෙහි දෙ සෙනඟ ම රැස් වූහ. බුදුරජාණන් වහන්සේ ඒ දෙ සෙනඟ මැද අහස්හි වැඩ හිඳ අත්තදණ්ඩ සූත්‍රය දෙශනා කොට ඔවුන්ගේ ක්‍රොධය සංසිඳ වූ සේක. ඉන්පසු ඵන්දන ජාතකය ලටුකික ජාතකය වට්ටක ජාතකය යන මේ ජාතකයන් දෙශනා කොට ඔවුන් සමඟියෙහි පිහිටුවා වදාළ සේක. මේ ගැන පැහැදුණු ඔවුහු ශාක්‍ය කොළිය දෙ කුලයෙන් පසකින් දෙසිය පණස බැගින් පන්සියයක් කුමාරයන් භාග්‍යවතුන් වහන්සේට භාරදුන්හ. භාග්‍යවතුන් වහන්සේ ඒ පන්සීය ම එහිභික්ෂු භාවයෙන් පැවිදි කොට ඒ භික්ෂූන් සමඟ කිඹුල්වත් පුරයට නුදුරු මහ වනයට වැඩි

සේක. ඒ භික්ෂූන්ගේ පැරණි භාර්යාවරු නොයෙක් පණිවුඩ යවමින් සිත් ගන්නට මහත්සි දරණ බැව් දැනැ ගත් තථාගතයන් වහන්සේ ඒ භික්ෂූන් හිමාලය වනයට ගෙන ගොස් කුණාලජාතකය දෙශනා කළ සේක. එයින් ඒ භික්ෂූන්ගේ සිත් තුළ බුද්ධසසුන්හි ඇල්ම ඇති විය. ඉක්බිති චතුස්සත්‍යය දෙශනා කෙළෙන් හැමට බාල භික්ෂුව සෝවාන් මගට ත් හැමට වැඩිමහලු භික්ෂුව අනාගාමි මගට ත් සෙස්සෝ සෙදගැමි මගට ත් පැමිණියහ. එහිදී භාග්‍යවතුන් වහන්සේ **මහාසමය - සම්මා පරිබ්බාජනිය - පුරාභෙද - කලහවිවාද - චූල වියූහ - මහා වියූහ - තුවටක** යන සූත්‍ර දෙශනාවන් ද පවත්වා ආපසු කිඹුල්වත් පුරයට ම වැඩි සේක.

බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් පුරයෙහි වැඩ සිටි කාලයෙහි මහාප්‍රජාපතී ගෞතමිය ස්ත්‍රීනට බුදුසසුන්හි පැවිදි වීමට අවසර දෙන මෙන් තුන්වරක් ම ඉල්ලා සිටියහ එහෙත් එයට අවසර නුදුන් සේක. එවිට මහාප්‍රජාපතී ගෞතමිය ශොකයට පත් වැ කඳුළු පිරුණු මුහුණු ඇතිව අඬමින් භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට යන්ට ගියාය.

**සුදෙවුන් රජ පිරිනිවීම**

භාග්‍යවතුන් වහන්සේ ටික කලක් කිඹුල්වත් පුරයෙහි වැඩ සිට විසල් පුරයට වැඩ ඒ සමීපයෙහි පිහිටි මහා වනයේ කූටාගාර ශාලාවෙහි සමාදන් ව වුසූ සේක. ඒ කාලයෙහි **සුඬොදන රජතුමා** රොගාතුරව වාසය කරන බව ත් රජතුමා තමන් වහන්සේ දක්නට කැමැත්තෙන් සිටින බව ත් පෙනී, ඍද්ධියෙන් එහි සැපත්ව සත්‍යක්‍රියා කොට රජුගේ ශරීර ගත පීඩා දුරු වූ කල්හි තථාගතයන් වහන්සේ රජුට අනිත්‍ය ප්‍රතිසංයුක්ත ධර්ම කතාවකින් අවවාද කළ සේක. ඒ ධර්මකථාවසානයේ දී රජ රහත් වැ සතියක් විමුක්ති සුඛයෙන් වැඩ සිට ඒ සති කෙළවරදී අනිත්‍ය ප්‍රතිසංයුක්ත ධර්ම කතාවකින් එහි සිටි කාට ත් අවවාද කොට **පිරිනිවන් පෑයේය**. බුදුරජාණන් වහන්සේ පිතෘදෙහය ආදාහන කරවා රැස්වූ පිරිසට දම් දෙසා කිඹුල්වත්පුරයෙන් නැවත ද විසල් පුරයට වැඩි සේක.

## මෙහෙණසස්නේ ආරම්භය

සුද්ධොදවුන් රජු රහත් වැ පිරිනිවි කල්හි යශෝධරා දේවිය පැවිදිවීමට නැවත ත් සූදානම් වූය. එවිට මහා ප්‍රජාපතීගෞතමිය යශෝධරාව අමතා මෙමෙස් කීහ. "දූවණියනි, සිද්ධාර්ථ කුමාරයන් ඉපදී සත් දිනක් ගත වූ විට මහා මායා දේවිය කාලක්‍රියා කළාය. මහා මායා දේවිය කාලක්‍රියා කළ දවස වන විට මගේ කුසින් උපන් නන්ද කුමාරයාට එද දවසක් පිරුණා පමණය. එහෙත් මම නන්ද කුමාරයා කිරිමවුනට භාර දී සිද්ධාර්ථ කුමාරයා හදන්නට භාර ගත්තෙමි. ඉපැදි සත් දවසේ සිට කිරි පොවා, හැම මෙහෙයක් ම කොට ඇති දැඩි කෙළෙමි. ඒ මම භාග්‍ය වතුන් වහන්සේගෙන් තෙවිටක් ම මහණකම ඉල්ලුවෙමි. මා වැනි මෑණි කෙනකුත්ටව ත් උන්වහන්සේ මහණකම නුදුන් සේක. ඔබ උන්වහන්සේ ගිහිගෙහි වසද්දි වත් උන්වහන්සේ ඉදිරියේ සිට කිසිවක් කියන්නට පවා අසමර්ථ වූවනු ය. එසේ කල, දැන් උන්වහන්සේගෙන් පැවිද්ද ඉල්ලා ගන්නට කෙසේ නම් සමර්ථ වන්නහු ද? මම ගොස් කරුණු කියා පළමු කොට පැවිද්ද ඉල්ලා ගන්නෙමි. ඉන්පසු ඔබට පැවිදි වන්නට පුළුවනි" මහා ප්‍රජාපතීගෞතමිය මෙමෙස් කී කල්හි යශෝධරාව නිහඬ වූය.

### ගෞතමිය පිටත්වීම

ඉන්පසු මහා ප්‍රජාපතීගෞතමිය පැවිදිවීම පිණිස නැවත ත් සූදානම් වූවා ය. ඈ කලහ විවාද සූත්‍ර දේශනාව අවසානයේ දී පැවිදි වූ ශාක්‍ය - කෝලිය කුමරුවන් පන්සියයගේ භාර්යාවරු ද මහණ වීමට කැමැති කර ගත්තා ය. ඒ කුමරියන් පන්සිය ත් මහාප්‍රජාපතී ගෞතමිය ත් යන සැවුරුත් හිස මුඩු කරවා ගත්හ. කසා-වත් ද පොරොවා ගත් හ. මැටි පාත්‍ර ද මිළදී ගත් හ. මෙලෙස පිරිපුන් පැවිදි වෙසින් සැරසුණු ඒ උවැසි පිරිස තථාගතයන් වහන්සේ වැඩ වෙසෙන විසල් පුරයේ

කූටාගාර ශාලාව බලා යන්නට නික්මුණහ. මහා ප්‍රජාපතී ගෞතමිය අසුවල් අසුවල් රජ කුමරියනුත් සමග පැවිදි වෙස් ගෙන විශාලා මහනුවර බලා පිටත් වූවා''යි මහ ජනයාගේ කටින් කට හැම තැන ම ප්‍රසිද්ධ ව ගියේ ය. ඒ ආරංචියෙන් කැලඹී ගිය බොහෝ දෙනෙක් නන් විසිතුරු යාන - වාහන ගෙනැත් "මේ අපගේ රථයෙන් වඩිනු මැනැවි- මේ අපගේ රථයෙන් වඩිනු මැනැවි" යනාදි විසින් පැරැත්ත කරන්නට වූහ. "අප යාන වාහනයෙන් යෑම භාග්‍යවතුන් වහන්සේට ගෞරව පිණිස නොවන්නේ ය. පා ගමනින් ගිය කල භාග්‍යවතුන් වහන්සේ අප කෙරෙහි වඩාත් අනුකම්පා කොට පැවිද්ද දෙන්නට පුළුවන් ය. එවිට අපට පදවි නිහාරානිශංස ද ලැබෙන්නේය. ඒ නිසා පා ගමනින් ම යන්නෙමුය" යි කියා ඒ වාහන සියල්ල ම ප්‍රතික්ෂේප කළහ. එසේ කොට පා ගමනින් ම නික්මුණහ.

වෙහෙස නො බලා, පණස් එක් යොදුන් මග ගෙවමින් පයින් ම ගමන් කළ මේ උපාසිකාවන්ගේ ශාන්ත ලීලාව දුටු හැමෝ ම අතිශයින් ම පැහැදුණෝය. මහජනයා මග දෙපස සිට, මහත් භක්තියෙන් බලා සිටියහ. සමහරෙක් දෙ අත් මුදුන්හි තබා වැඳ පෙරළුණෝ ය. ඇතැමෙක් නොයෙක් දන්-පහන් ආදිය පිළිවෙළ කරගෙන අවුත් ''මේ අපගේ දානය පිළිගනු මැනැව' යනාදි වශයෙන් ආරාධනය කළහ. සමහරෙක් අවුත් "අහෝ සිවුමැලි දේවිනි, විශාලා මහනුවරට යොදුන් පණස් එකකි ඔබ හැමදෙනා වහන්සේ ම ඉතා සිවුමැලි රජකුමරියෝ වහු ය. එතරම් දිර්ඝ ගමනක් පයින් යන්නට තමුන්නාන්සේලා කෙසේ නම් සමත් වන්නහු ද? මාර්ගය ද බොහෝ උවදුරු සහිත ය. දූවිල්ලෙන් ගැවැසී ගත්තේ ය. එහෙයින් මේ වාහන වලින් වඩිනු මැනැවි" යනාදි වශයෙන් ආරාධනා කළෝ ය. ගමන අවසානය තෙක් ම මෙසේ ආරාධනා ලැබුණු නමුත් ඒ සියල්ල නො ඉවසා පයින් ම ගොස් විසල්

පුර කූටාගාර ශාලා දොරටුවට ගියහ. ගමන අවසන් කරත් ම ඒ සියල්ලෝ ම මැලවී ගිය රත්පියුම් වනයක් මෙන් වූහ. හැමෝ ම දූවිල්ලෙන් කිළුටු වූ ද, දහඩියෙන් තෙත් වූ ද සිරුරින් යුක්ත වූහ. ඉදිමී ගිය පතුල් වලින් හා වැගිරෙන ලේ දහරින් ද මතු වූ බිබිලි වලින් ද බොහෝ පීඩාවට පත් වූහ.

## ආනන්ද මාහිමියනට හමුවීම

එවේලෙහි ආනන්ද මාහිමියන් වහන්සේ "පිටත සළමනා වත් පිළිවෙත් කුමක්ද"යි සොයමින් වඩනාහු දොරටුවෙන් පිටත සිටි දුක්මුසු මුහුණින් යුතු, බැගෑපත් ඒ පිරිස දැක- "අහෝ! මෑණියනි, අහෝ! රාජ දුහිතෘවරුනි, මේ කිම? ශාක්‍යකුලයෙහි පිරිහීමක් වීද? තොප රජයෙන් නෙරපූවහු ද? මේ ආවේ කිනම් ගමනක් ද? එසේ අවුත් ඔබ පුතණුවන් වහන්සේ (බුදුරජාණන් වහන්සේ) වැඩ සිටිනා ආරාමය තුළට නො පැමිණ සිටින්නේ කවර හෙයින් ද? යනාදි වශයෙන් ඇසූහ. එවිට මහාප්‍රජාපතී ගෞතමිය කියන්නී, "ශාක්‍ය කුලයෙහි කිසි පිරිහීමක් නැත. මම භාග්‍යවතුන් වහන්සේගෙන් තෙවිටක් ම පැවිද්ද ඉල්ලූ වෙමි. එහෙත් එය ලබාගන්නට නො හැකි විමි. මේ වර මහණ වෙස් ගෙන පැමිණත් පැවිද්ද ලබා ගත නො හැකි වුව හොත්, එය මට ත් මදිකමෙකි. ඒ ගැන තථාගතයන් වහන්සේ කෙරෙහි ද ඇතැම් කෙනෙකුන් නින්දා කළ හැකිය. ඒ නිසා බුදුසසුන්හි පැවිද්ද ලැබෙනවා නම්, වෙහෙර තුළට යෑමට ත්, නො ලැබෙනවා නම් මෙහෙන් ම ආපසු හැරී යන්නට ත් සිතා ගෙන විහාරයෙන් බැහැර සිටිමු" යි අඩමින් කීහ.

එවිට ආනන්ද මාහිමියන් වහන්සේ "මදක් ඔහි සැනසී සිටිනු මැනව"යි කියා තථාගතයන් වහන්සේ වෙත ගොස් වැද "ස්වාමීනි බුදුරජාණන්වහන්ස, මහාප්‍රජාපතී ගෞතමිය පන්සියයක් බිසෝවරුන් හා තවුස් වෙස් ගෙන

මහත් දුකසේ පයින් ම මෙහි අවුත් දොරටුව සමීපයෙහි අඬ අඬා සිටිමින් මහණ කම බලාපොරොත්තු වෙති. ස්වාමීනි බුදුරජාණන් වහන්ස; ස්ත්‍රීනට බුදුසසුන් විෂයයෙහි පැවිද්ද දෙන සේක් නම් යහපති" යි කියා ආයාචනා කළහ. ඊට තථාගතයන් වහන්සේ "අලං ආනන්ද මා තෙ රුච්චි මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනාගාරියං පබ්බජ්ජා" ආනන්දය බුදුසසුන්හි ස්ත්‍රීන්ගේ පැවිදිවීම ගැන උත්සාහ නොකරන්නැයි දේශනා කළ සේක. මෙසේ දේශනා කෙළේ තව තවත් අගේ කොට දුන් කල්හි එය හොඳින් ආරක්ෂා කරණ හෙයිනි. දෙවනු තෙවනුව ද අනඳ මාහිමියෝ පෙරසේ ම පවසා ස්ත්‍රීන් හට බුදුසසුන්හි පැවිද්ද දෙන ලෙස ඉල්ලා සිටියහ. ඒ වාර වලදී ද භාග්‍යවතුන් වහන්සේ එය ප්‍රතික්ෂෙප කළ සේක. ඉන්පසු අනඳ මාහිමියන් වහන්සේ මෙසේ සිතන සේක. "බුදුරජාණන් වහන්සේ ස්ත්‍රීනට බුඩශාසන විෂයයෙහි ප්‍රව්‍රජ්‍යාව නොදෙන සේක. දැන් වෙන ලෙසකින් වත් කරුණු සැලකොට ස්ත්‍රීන් හට ප්‍රව්‍රජ්‍යාව ලබා දෙන්නෙමැ"යි සිතා මතු සඳහන් ප්‍රශ්න තථාගතයන් වහන්සේගෙන් ඇසූහ.

ආනන්ද මාහිමි: "භබ්බො නු ඛො භන්තෙ මාතුගාමො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනාගාරියං පබ්බජිත්වා සොතාපත්ති ඵලං වා සකදාගාමි ඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකාතුං" (චුල්ලවග්ග භික්ඛුණීක්ඛන්ධක)

"ස්වාමීනි, බුදුරජාණන් වහන්ස, ස්ත්‍රියක් ගිහිගෙයින් නික්ම බුදුසසුන් විෂයයෙහි පැවිදි ව සෝවාන් ඵලය හෝ සකෘදාගාමී ඵලය හෝ, අනාගාමි ඵලය හෝ. අර්හත් ඵලය හෝ ලබන්නට සමර්ථ වන්නී ද?"

බුදුරජාණන් වහන්සේ.- "භබ්බො ආනන්ද, මාතුගාමො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනා-

**ගාරියං පබ්බජිත්වා සොතාපත්තිඵලම්පි සකදාගාමි ඵලම්පි අනාගාමිඵලම්පි අරහත්තම්පි සච්ඡිකාතුං"**

"ආනන්දය, ස්ත්‍රියක් ගිහිගෙයින් නික්ම බුදුසසුන් විෂයෙහි පැවිදිව සෝවාන් ඵලය ද, සකෘදාගාමි ඵලය ද, අනාගාමි ඵලය ද, රහත් බව ද ලබන්නට සමර්ථ වන්නීය."

**ආනන්ද මාහිමියන් වහන්සේ:**

ස්වාමීනි බුදුරජාණන් වහන්ස, ස්ත්‍රීහු ගිහිගෙයින් නික්ම බුදුසසුන් විෂයෙහි පැවිදිව සෝවාන් ඵලය ද සකෘදාගාමි ඵලය ද, අනාගාමි ඵලය ද, රහත් බව ද ලබන්නට සමර්ථ වන්නාහු නම්: ස්ත්‍රීනට බුදුසසුන් විෂයෙහි පැවිද්ද දෙන සේක්වා! එසේ ම මහාප්‍රජාපතී ගෞතමිය භාග්‍යවතුන් වහන්සේගේ කුඩා මෑණියෝ ය. එතුමිය භාග්‍යවතුන් වහන්සේට බොහෝ උපකාර වූහ. හද - වඩා ඇති දැඩි කළ හ. මහා මායා දේවිය කළුරිය කළ පසු කිරි දී පෝෂ්‍ය කළ හ. ඒ නිසා ද ප්‍රජාපති ගෞතමියගේ බලාපොරොත්තුව මුදුන්පත් කරනසේක් නම් ඉතා මැනවි" ආනන්ද මාහිමියන් වහන්සේ මෙසේ කියා සිවුවැනි වරට ත් ආරාධනා කළ කල්හි **"සචෙ ආනන්ද මහාපජාපතීගොතමී අට්ඨගරු ධම්මෙ පටිග්ගණ්හාති සාවස්සා හොතු උපසම්පදා"** ආනන්දය! ඉදින් මහාප්‍රජාපතී ගෞතමිය අෂ්ට ගරු ධර්මය පිළිගන්නී නම්, ඕහට එය ම උපසම්පදාව වේවා! යි භාග්‍යවතුන් වහන්සේ දේශනා කළ සේක.

**අෂ්ටගරු ධර්මය**

**1. වස්සසතූපසම්පන්නාය භික්ඛුනියා තදහුපසම්පන්නස්ස භික්ඛුනො අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මං කාතබ්බං; අයම්පි ධම්මො සක්කත්වා ගරුකත්වා මානෙත්වා පූජෙත්වා යාවජීවං අනතික්කමනීයො"**

උපසම්පදා වී වස් සියයක් ගතවූ භික්ෂුණිය විසින් ද එදා ම උපසපන් වූ භික්ෂුව දැක වැඳීම, හුනස්නෙන් නැගිටීම, දොහොත් මුදුනේ තබා වැඳීම, සැප සරුප් වූ වතාවත් කිරීම යන මේවා කළ යුතු. මේ ධර්මය ද ගරු කොට සිතා ජීවිතාන්තය දක්වා නො ඉක්මැවිය යුතු.

**2. "න භික්ඛුනියා අභික්ඛුකෙ ආවාසෙ වස්සං වසිතබ්බං"**

භික්ෂූන් නැති ප්‍රදේශයක භික්ෂුණිය වස් නො විසිය යුතු යි. (අඩයොදුනක් අතරේවත් භික්ෂුවක් වාසය කරනවා නම්, ඒ පළාත යෝග්‍ය යි. භික්ෂුවක් අවශ්‍ය වනුයේ භික්ෂුණීන්ට අවවාද ලබා ගැනීමට යි.)

**3. අන්වද්ධමාසං භික්ඛුනියා භික්ඛුසඞ්ඝතො ද්වෙ ධම්මා පච්චාසිංසිතබ්බා; උපොසථපුච්ඡකඤ්ච ඔවාදූප-සඞ්කමනඤ්ච.**

අඩමසක් පාසා මෙහෙණිය විසින් භික්ෂු සංඝයාගෙන් කරුණු දෙකක් බලාපොරොත්තු විය යුතුයි. පොහොය අසා දැනගැනීම සහ අවවාද දීමට භික්ෂු කෙනකුන්ගේ පැමිණීම ද යන දෙකයි.

**4. "වස්සං වුට්ඨාය භික්ඛුනියා උභතො සඞ්ඝෙ තීහි ඨානෙහි පවාරෙතබ්බං, දිට්ඨෙන, සුතෙන, පරිසඞ්කාය."**

වස් විසූ භික්ෂුණිය භික්ෂු-භික්ෂුණී යන සභ පිරිස් දෙක්හි දැකීම් - ඇසීම් - සැකකිරීම් යන තුනෙන් පැවරිය යුතුයි.

**5. 'ගරුධම්මං අජ්ඣාපන්නාය භික්ඛුනියා උභතො සඞ්ඝෙ පක්ඛමානත්තං චරිතබ්බං"**

ගුරු (බර) ඇවැත් අවන් භික්ෂුණිය උභතෝ සංඝයා කෙරෙහි පක්ෂයක් මානත් පිරිය යුතුයි.

**6. "ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛාය සික්ඛමානාය උභතො සඞ්ඝෙ උපසම්පදා පරියෙසිතබ්බා"**

ප්‍රාණඝාතයෙන් වැළැකීම පටන් විකාල් භොජනෙන් දුරුවීම තෙක් ඇති ශික්ෂාපද සයෙහි දෙවර්ෂයක් හික්මුණු සාමණෙරියක විසින් ම භික්ෂු-භික්ෂුණී යන උභතො සංඝයා කෙරෙහි උපසම්පදාව සෙවිය යුතු යි. (ලැබිය යුතුයි.)

7. "න භික්ඛුනියා කෙනචි පරියායෙන භික්ඛු **අක්කොසිතබ්බො, පරිභාසිතබ්බො**"

මොනම කරුණකින් වත් භික්ෂුණියක විසින් භික්ෂුවකට ආක්‍රොශ පරිභව නො කළ යුතුයි.

8. "අජ්ජතග්ගෙ ඔවටො භික්ඛුනීනං භික්ඛූසු වචන පථො අනාවටො භික්ඛූනං භික්ඛුනීසු වචනපථො"

අද පටන් භික්ෂුණීන් විසින් භික්ෂූනට අවවාද නො කළ මනා ය. භික්ෂූන් විසින් භික්ෂුණීන් හට අවවාද කළ මනා ය.

බුදුරජාණන් වහන්සේ මේ ගරු ධර්ම අට ආනන්ද මාහිමියන් වහන්සේ හට දෙශනා කොට "**සචෙ ආනන්ද මහාපජාපතිගොතමී ඉමෙ අට්ඨ ගරු ධම්මෙ පටි-ගණ්හාති, සාවස්සහොතු උපසම්පදා**" ආනන්දය! ඉදින් මේ ධර්ම අට මහාප්‍රජාපතී ගෞතමිය පිළිගනී නම්, එය ම ඇයට උපසම්පදාව වේවා යි ආශිර්වාද මුඛයෙන් ප්‍රකාශ කළ සේක.

**අෂ්ට ගරු ධර්මය පිළිගැනීම**

ඉන්පසු ආනන්ද ස්ථවිරයන් වහන්සේ මහාප්‍රජාපතී ගෞතමිය වෙත පැමිණ "ගෞතමිය ඔබ මේ අෂ්ටගරු ධර්මය පිළිගන්නාහු නම්, ඔබට එය ම උපසම්පදාව වන්නීය" යි දෙශනා කළ සේක. එවිට මහාප්‍රජාපතී ගෞතමිය **"සෙය්‍යථාපි භන්තෙ ආනන්ද ඉත්ථී වා පුරිසො වා දහරො යුවා මණ්ඩනකජාතිකො සීසං නහාතො උප්පලමාලං වා වස්සිකමාලං වා අතිමුත්තකමාලං වා ලභිත්වා උභොහි හත්ථෙහි පටිග්ගහෙත්වා උත්තමඞ්ගෙ සිරස්මිං පතිට්ඨපෙය්‍ය, එවමෙව ඛො අහං භන්තෙ ආනන්ද ඉමෙ අට්ඨ ගරුධම්මෙ පටිගණ්හාමි යාවජීවං අනතික්කමනීයෙ"**

ස්වාමීනි, ආනන්ද ස්ථවිරයන් වහන්ස, සැරසීමට කැමැති වූ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ළදරුවෙක් හෝ තරුණයෙක් හෝ ස්නානය කොට, උපුල් මල් හෝ ඉද්දමල් හෝ යොහොඹු මල් හෝ ලැබ, දෙ අතින් පිළිගෙන උතුමඟ නම් වූ හිසෙහි තබාගන්නේ යම්සේ ද; එමෙන් ම ස්වාමීනි, මම මේ අෂ්ටගරු ධර්මය දිවි කෙළවර තෙක් නො ඉක්මවා ලියැ යුතු දහම් සේ ගෞරවයෙන් පිළිගනිමි'' යි පවසා ප්‍රජාපතී ගෞතමිය දෙහොත් මුදුන් දී ඒ අෂ්ට ගරු ධර්මය පිළිගත්තා ය. ඉන්පසු ආනන්ද ස්ථවිරයන් වහන්සේ බුදුරජාණන් වහන්සේ කරා එළඹ ''පටිග්ගහිතා භන්තෙ මහාපජාපතියා ගොතමියා අට්ඨගරුධම්මා, උපසම්පන්නා භගවතො මාතුච්ඡාති'' ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මහාප්‍රජාපතී ගෞතමිය විසින් අෂ්ටගරු ධර්මයෝ පිළිගන්නා ලදහ. භාග්‍යවතුන් වහන්සේගේ කුඩා මෑණියන්ද උපසපන් වූ දූය යි කීහ.

මහාප්‍රජාපතී ගෞතමිය බුදුසසුන්හි මෙසේ පැවිදි-උපසපන් වීමෙන් අනතුරු ව භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් වැඳ එකත්පස්හි සිට ''ස්වාමීනි බුදුරජාණන් වහන්ස, මේ ශාක්‍ය කුමාරිකාවන් ගැන කෙසේ ද''යි ප්‍රශ්න කළා ය. එවිට භාග්‍යවතුන් වහන්සේ ''ඒ ශාක්‍ය කුමාරිකාවරුන් විසින් භික්ෂු සංඝයා ගෙන් උපසම්පදාව ලබාගත යුතු බව'' නියම කොට වදාළ හෙයින් ඒ කුමරියෝ ද භික්ෂු සඞ්ඝයා ගෙන් උපසම්පදාව ලැබූහ. ඉන්පසු මහාප්‍රජාපතී භික්ෂුණිය පන්සියයක් භික්ෂුණීසඞ්ඝයා ත් සමග තථාගතයන් වහන්සේ සමීපයට ගොස් වැඳ එකත්පස්හි සිට ''යානි තානි භන්තෙ භික්ඛුණීනං සික්ඛාපදානි භික්ඛූහි සාධාරණානි, කථං මයං භන්තෙ තෙසු සික්ඛාපදෙසු පටිපජ්ජාම'' ස්වාමීනි බුදුරජාණන් වහන්ස, භික්ෂූන් හා සාධාරණ ව භික්ෂුණීන් හට යම් ඒ ශික්ෂාපද පණවන ලද නම්, ඒ ශික්ෂාපදයන්හි අපි කෙසේ පිළිපදිමු දැයි ප්‍රශ්න කළ කල්හි ''යානි තානි ගොතමි

භික්ඛුණීනං සික්ඛාපදානි භික්ඛූහි සාධාරණානි, යථා භික්ඛූ සික්ඛන්ති, තථා තෙසු සික්ඛාපදෙසු සික්ඛථ" ගෞතමිය භික්ෂූන් හා සාධාරණ ව භික්ෂුණීන් හට යම් ඒ ශික්ෂාපද කෙනෙක් පණවන ලද්දාහු නම්, ඒ ශික්ෂාවන්හි භික්ෂූන් හික්මෙන්නාක් මෙන් තෙපි ද හික්මෙවු යි තථාගතයන් වහන්සේ නියම කළසේක. නැවත ත් මහා ප්‍රජාපතිගෞතමී භික්ෂුණිය "යානි පන තානි භගෙන භික්ඛුණීනං සික්ඛාපදානි භික්ඛූහි අසාධාරණානි, කථං මයං භන්තෙ තෙසු සික්ඛාපදෙසු පටිපජ්ජාමාති" භික්ෂූන් හා අසාධාරණ වූ යම් ඒ ශික්ෂාපද කෙනෙක් භික්ෂුණීන් හට පණවන ලද්දාහු නම්, ඒ ශික්ෂාවන්හි අපි කෙසේ පිළිපදිමුදැ යි විචාළ කල්හි "යානි තානි ගොතමි භික්ඛුණීනං සික්ඛාපදානි භික්ඛූහි අසාධාරණානි, යථාපඤ්ඤත්තෙසු සික්ඛාපදෙසු සික්ඛථ" ගෞතමිය භික්ෂූන් හා අසාධාරණ වූ යම් ඒ ශික්ෂාපද කෙනෙක් භික්ෂුණීන් හට පණවන ලද්දාහු නම්, ඒ ශික්ෂාපද පැණ වූ ආකාරයෙන් ම හික්මෙවු" යි නියම කළ සේක.

ඉන්පසු තථාගතයන් වහන්සේ මහාප්‍රජාපතී ගෞතමිය ප්‍රධාන භික්ෂුණී සමූහයට චරිතානුකූල කම්සථාන දුන් සේක. ඒ බුද්ධාවවාදයෙහි පිළිපන්නා වූ භික්ෂුණී සමූහය ම සව් කෙලෙස් නසා රහත් වූහ. මහා ප්‍රජාපතිගෞතමිය අෂ්ට ගරු ධර්මය පිළිගෙනැ බුදු සසුන්හි පැවිදි උපසපන් බව් ලැබීමෙන් පසු මෙහෙණ සස්න ආරම්භ විය. මෙහෙණ සස්න ඇතිකිරීමටම පතා ගෙනැ ආ ගෞතමියට පවා මෙහෙණ සස්න ඇතිකිරීමට අනුදැනැ වදාරණ මෙන් නොයෙක් ලෙසින් බැගෑපත් වැ ඉල්ලන්නට සිදු වූයේ ස්ත්‍රීවර්ගයා කෙරෙහි විශ්වාසය තබා මෙබඳු වගකීය යුතු උතුම් තනතුරක් පිරිනමන්නට තථාගතයන් වහන්සේ එකැවරට ම නො කැමැති වූ හෙයිනි. ප්‍රකෘතියෙන් ම ත් ඉතා ම චපල වූ, කාම ක්‍රෝධාදිය ඉවැසීමට වුවත් දැඩි චිත්ත ශක්තියක් නොමැති, එහෙයින් ම සුළුසුළු වන, අනුවණ, ස්ත්‍රීනට එකැවරට මැ පැවිදි උපසපන් බව්

අනුදැනැ වදළ සේක් නම්, බොහෝ භික්ෂුණීහු සත්ත ලිහිල් කොට සිතන්නාහ. එහෙයින් ම තමන් විසින් රැකියැ යුතු සිකපද ඉක් මැ වන්නාහ. එවිට ගිහියෙකු වෙසෙසින් පින්දහම් කොට ලැබියැ හැකි සම්පත්, ඒ සුචරිතානුභාවයෙන් ම කාලාන්තරයකින් වත් ලබා ගත හැකි වන මොක්ෂය ත් යන දෙකින් ම පිරිහෙන්නට සිදු වනු නො අනුමානය. නොයෙක් ලෙසින් යැදැ අමාරැයෙන් ලබා ගත් කවර දෙයක් වුවත් හොඳින් රැකැ බලා ගැනීම සිරිත හෙයිනි, මුල් වතාවෙහි දී අනු දැනැ නො වදළේ.

## භික්ෂුණී විනය

භික්ෂුණීන්ගේ කය-වචන දෙක හික්මවා ගැනීම පිණිස පණවන ලද ශික්ෂා සමූහය භික්ෂුණී විනය නම්. ඔවුනතුරින් භික්ෂුණී ප්‍රාතිමොක්ෂයෙහි ලා ගැණෙන අෂ්ට පාරාජිකා-සප්තදශ සංඝාදිසෙස - තිස් නිස්සග්ගි පචිති-එක්සිය සැටක් ශුද්ධපචිති - අටවැදෑරුම් පාටිදෙසනීය - පන්සැත්තෑවක් සෙඛියා - සප්ත අධිකරණ සමථ යන සිකපද පිළිබඳ කෙටි හැඳින්වීමක් මෙහි දක්වනු ලැබේ.

**පාරාජිකාපත්තිහු**

උපසපත් බව සහමුලින් ම විනාශ කිරීමෙහි දොහො-සත් වන ආපත්තීහු පාරාජිකා නාමයෙන් අඳුන්වනු ලබති. භික්ෂුණී විනයෙහි පාරාජිකාපත්තීන් අටක් වුවත් භික්ෂු විනයෙහි සතරකි. යම් භික්ෂුණියක් මෙහි යටැ දක්වෙන පරාජිකා පත්තීන් අතුරෙන් යම් කවර ආපත්තියකට පැමිණියා නම්, ඕ පරිජි වූවා ය. කරටියෙන් කැඩී ගිය තල් ගසක් නැවැත පැළ නොවන්නා සේ ම පරිජි අවන් මෙහෙණ හට නැවැත එම දිවියෙහි දි උපසපත් බවක් නො ලැබෙන්නේ ය.

**1. පඨම පාරාජිකාපත්තිය**

**"යා පන භික්ඛුනී ඡන්දසො මෙථුනං ධම්මං පටි-සෙවෙය්‍ය අන්තමසො තිරච්ඡානගතෙන පි, පාරාජිකා හොති අසංවාසා"**

යම් මෙහෙණක් මෛථුන්දම් සෙවුනා කැමැත්තෙන් තිරිසන් ගිය පිරිමි සතකු සමග හෝ මෛථුන්දම් සෙවී නම්, පරිජි වූවා සෙසු භික්ෂුණීන් සමග කැරෙන විනය කර්මාදියට නුසුදුසු වූ හෙයින් සංවාස නැත්තී වෙයි.

කාමාසංවෙන් යුත් ස්ත්‍රී පුරුෂ දෙදෙනකු පිළිබඳ ලාමක ධර්මයට හෙවත් රහස් කර්මයට "මෛථුන ධර්මය" යි කියනු ලැබේ. යම් භික්ෂුණියක් තිරිසන් ගිය පිරිමි සතකු සමග හෝ මෛථුන් දම් සෙවුම් වශයෙන් අඞ්ගජාතයෙන් අඞ්ගජාතය තල ඇටයක් පමණ වත් ප්‍රවෙශ කිරීමය, ස්ථිතිය, උද්ධරණය යන ත්‍රිවිධ අවස්ථාවෙන් කවර අවස්ථා වෙක්හි හෝ එය ආස්වාද වශයෙන් ඉවසා නම්, ඕ පරිජි වන්නීය. හෙවත් කෙලෙස් සතුරන් විසින් පරදවනු ලබන්නී ය. එසේ පරිජි වූ කල්හි ප්‍රකෘති භික්ෂුණීන් හා එක් වැ කළ යුතු අපලොකනාදි විනය කර්මය, පාමොක් දෙසීම් ඈ එකුද්දෙසය, සියලු ලජ්ජීන් විසින් සම වැ හික්මියැ යුතු වූ හෙයින් සමසික්ඛතා ය, යන මෙකී කර්මයනට පරිජි අවත් භික්ෂුණිය නො පිළිගන්නා හෙයින් ඕ අසංවාසා නමි.

**"යා පන භික්ඛුනී ගාමා වා අරඤ්ඤා වා අදින්නං ථෙය්‍යසංඛාතං ආදියෙය්‍ය, යථාරූපෙ අදින්නාදානෙ රාජානො චොරං ගහෙත්වා හනෙය්‍යුං වා බන්ධෙය්‍යුං වා පබ්බාජෙය්‍යුං වා චොරාසි බාලාසි මූළ්හාසි ථෙනාසීති තථාරූපං භික්ඛුනී අදින්නං ආදියමානා අයම්පි පාරාජිකා හොති අසංවාසා"**

යම් මෙහෙණක් වස්තු හිමියන් නුදුන් වස්තුව ගමින් හෝ අරණ්‍යයෙන් හෝ සොරසිතින් ගනී ද, යම් බඳු වූ නුදුන් වස්තුව ගැනීමෙහි ලා රජදරුවෝ සෙරිය ගෙන

මරත් ද, බඳිත් ද, රවින් හෝ නෙරපා දමත් ද, සෙරෙනී අනුවණියක් මෙනි, මූඪනැනැත්තියක් මෙනි, දනා අයත් දූ සොරා ගත්තියක් මෙනි යන මේ වචනයෙන් නිය ගත්වා බෙණෙත් ද, එබඳු තුඳුන් වස්තුව සොරසිතින් ගත්තා වූ භික්ෂුණිය පරිජි වූවා අසංවාස වන්නී ය.

මෙහි අදත්තාදන පරාජිකාව පස් පිහි අගුරකින් වියැ හැකි ය. මේ පාරාජිකාපත්තිය සිදුවනුයේ පාදයක් (පුරාණ කහවණුවෙන් සතරෙන් කොටසක්) හෝ පාදයක් අගනා දෑයක් හෝ සොරසිතින් ගැනීමෙනි. වත්මන්හි ගනු දෙනු කරන කාසිවලින් රුපියල් දෙකකුත් ශත පනස්සැ යි බොහෝ දෙනකුන්ගේ මතය වන අතර ම සමහර කෙනෙක් ශත සැත්තෑපහක් යි කියත්. මෙබඳු තැන්හි දී අඩු ම ගණන ගැනීම සුදුසු යි. මේ ගැන විස්තර අප ලියූ කුදුසික විවරණයෙන් බලා දත්තේ ය.

3. "යා පන භික්ඛුනී සඤ්චිච්ච මනුස්සවිග්ගහං ජීවිතා වොරොපෙය්‍ය සත්ථහාරකං වාස්ස පරියෙසෙය්‍ය මරණවණ්ණං වා සංවණ්ණෙය්‍ය මරණාය වා සමාදපෙය්‍ය අම්භො පුරිස කිං තුය්හිමිනා පාපකෙන දුජ්ජීවිතෙන, මතන්තෙ ජීවිතා සෙය්‍යොති, ඉති චිත්තමනා චිත්තසඞ්කප්පා අනෙකපරියායෙන මරණවණ්ණං වා සංවණ්ණෙය්‍ය මරණාය වා සමාදපෙය්‍ය අයම්පි පාරාජිකා හොති අසංවාසා"

යම් මෙහෙණක් "මොහු මරම්" යි දැන මිනිස් සිරුරක් ජීවිතයෙන් තොර කරයි ද දිවි තොරකර ගැනීමට උපකාර වන්නා වූ ආයුධාදියක් හෝ ඔහුට එළවා දේද, මරණයෙහි ගුණ හෝ කියා ද, මරණය සඳහා උපාය හෝ කියා ද, "භවත් පුරුෂය, ඔබේ මේ ලාමක වූ දුක් ජීවිතයෙන් කවර ප්‍රයෝජන ද, තට ජීවත්වීමට වඩා මරණය ම යෙහෙකැ යි යන මෙබඳු මරණ සිත් මරණ මනස් ඇත්ති නොයෙක් ලෙසින් මරණයෙහි ගුණ කියා ද, මරණය පිණිස උපාය හෝ උගන්වා ද මෝ තොමෝ ද පරිජි වූවා අසංවාස වේ.

**4. යා පන භික්ඛුණී අනභිජානං උත්තරිමනුස්ස ධම්මං අත්තුපනායිකං අලමරියඤාණදස්සනං සමුදාචරෙය්‍ය ඉති ජානාමි ඉති පස්සාමීති; තතො අපරෙන සමයෙන සමනුග්ගාහියමානා වා අසමනුග්ගාහියමානා වා ආපන්නා විසුද්ධාපෙක්ඛා එවං වදෙය්‍ය "අජානමෙවං අය්‍යෙ අවචං ජානාමි, අපස්සං පස්සාමි, තුච්ඡං මුසා විලපින්ති" අඤ්ඤත්‍ර අධිමානා අයම්පි පාරාජිකා හොති අසංවාසා.**

යම් මෙහෙණක් තමා ලඟ නැති ධ්‍යානාදි උත්තරි මනුෂ්‍යධර්මයක් "මා ලබංතිබේ ය" යි හෝ, මේ මේ කරුණින් එය ප්‍රත්‍යක්ෂ ලෙස ම දකිමි'යි කියා හෝ, අධිමානයෙන් හෙවත් අධිගතධර්ම ඇත්තෙමැ යි ගත් මුලාවෙන් තොර වැ බහ තේරුම් ගත හැකි කෙනකුන් හට කියා ද, එයින් පසු අන් කාලයෙක්හි විචාරනු ලබන්නී හෝ නොවිචාරනු ලබන්නී හෝ ආරොපිතාවස්ථායෙහි ම පරිජි ඇවැත් අවත් ඕ තොමෝ ගෘහස්ථ භාවාදි විසුද්ධිය කැමැත්තී "ආය්‍යාවෙනි, උතුරු මිනිස් දම් මා කෙරෙහි නැති හෙයින් ඇතැයි නො දත්තෙම් දනිමියි ද, නො දක්නෙම් දක්නෙමි යි ද කීවෙමි. හිස් වූ බොරු කීවෙමි" යි මෙසේ කියා නම් මේ තොමෝ පරිජි වූවා අසංවාස වන්නීය.

**5 යා පන භික්ඛුණී අවස්සුතා අවස්සුතස්ස පුරිස පුග්ගලස්ස අධක්ඛකං උබ්භජාණුමණ්ඩලං ආමසනං වා පරාමසනං වා ගහණං වා ඡුපනං වා පතිපීළනං වා සාදියෙය්‍ය, අයම්පි පාරාජිකා හොති අසංවාසා - උබ්භජාණුමණ්ඩලිකා.**

යම් මෙහෙණක් කායසංසර්ගී රාගයෙන් යුතු වූවා තමාගේ අකු ඇටයෙන් යට දණ මඩලින් හා වැලමිටින් උඩ කාය සංසර්ගීරාගයෙන් යුක්ත වූ මිනිස් පුරුෂයකුගේ ශරීරාවයවයකින් තැනක් මිරිකීම හෝ පිරිමැදීම හෝ අතින් ගැන්ම හෝ, ස්පර්ශකිරීම හෝ ශරීරාංගයකින් ගෙන පෙළීම හෝ ඉවසා නම් මේ භික්ෂුණිය ද පරිජි අවන්නී අසංවාස වේ.

6. යා පන භික්ඛුණී ජානන්ති පාරාජිකං ධම්මං අජ්ඣාපන්නං භික්ඛුණිං නෙවත්තනා පටිචොදෙය්‍ය, න ගණස්ස ආරොචෙය්‍ය, යදා ච සා ඨිතා වා අස්ස චුතා වා නාසිතා වා අවස්සටා වා සා පච්ඡා එවං වදෙය්‍ය, පුබ්බෙවාහං අය්‍යෙ අඤ්ඤාසිං එතං භික්ඛුණිං එවරූපා ච එවරූපා ච සා භගිනීති නො ච ඛො අත්තනා පටිචොදෙස්සං, න ගණස්ස ආරොචෙස්සන්ති අයම්පි පාරාජිකා හොති අසංවාසා – වජ්ජපටිච්ඡාදිකා.

යම් මෙහෙණක් පරිජි අවන් බව දැන දැන (ඒ) පරිජි අවන් මෙහෙණ හට චෝදනා නො කෙරේ ද? සෙසු භික්ෂුණීන්ටත් නො කියා ද, යම් කලක ඒ පරිජි අවන් මෙහෙණ පැවිදි වෙසින් සිටියා හෝ වේද, මළ හෝ වේද, සිවුරු හැරවීම් සංඛ්‍යාත ලිඞ්ගනාශනාවෙන් නසන ලද්දී හෝ වේද, තීර්ථකායතනයකට සංක්‍රමණය හෝ වේද, ඊට පසු පරිජි අවන් බව දත් ඒ මෙහෙණ තොමෝ "ආර්‍යාවෙනි, ඒ නැගනිය මෙසේ මෙසේය යි මම කලින් ම දැන සිටියෙමි. එහෙත් මම චොදනා නො කෙළෙමි. සෙසු භික්ෂුණීන් හට ද නො කීවෙමි යයි පසුව කියා නම් මෝ තොමෝ ද පරිජි අවන්නී අසංවාසා වෙයි.

අන් භික්ෂුණියක පරිජි අවන් බව දැන දැනම එය එළිදරව් නො කරන භික්ෂුණිය ද පරිජි වන බව මෙයින් ප්‍රකාශිත යි.

7. යා පන භික්ඛුණී සමග්ගෙන සඞ්ඝෙන උක්ඛිත්තං භික්ඛුං ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන අනාදරං අප්පටිකාරං අකතසහායං තමනුවත්තෙය්‍ය, සා භික්ඛුණී භික්ඛුණීහි එවමස්ස වචනීයා එසො ඛො අය්‍යෙ භික්ඛු සමග්ගෙන සඞ්ඝෙන උක්ඛිත්තො ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන අනාදරො අප්පටිකාරො අකතසහායො මාය්‍යෙ, එතං භික්ඛුං අනුවත්තාහීති, එවං ච සා භික්ඛුණී භික්ඛුණීහි වුච්චමානා තථෙව පග්ගණ්හෙය්‍ය, සා

**භික්ඛුණී භික්ඛුණීහි යාවතතියං සමනුභාසිතබ්බා, තස්ස පටිනිස්සග්ගාය යාවතතියං චෙ සමනුභාසියමානා තං පටිනිස්සජ්ජෙය්‍ය ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය, අයම්පි පාරාජිකා හොති අසංවාසා-උක්ඛිත්තානුවත්තිකා.**

යම් මෙහෙණක් සමගි සඞ්ඝයා විසින් විද්‍යමාන වස්තුවකින් චෝදනා සාරණාදී විනය කර්මයකින් ශාස්තෘහුගේ අනුශාසනය කරණ කොට ගෙන උත්ක්ෂේපනීය කර්මයකින් බැහැර කරන ලද, ආයති සංවරය පිණිසවත් නො පිළිපද්නා වූ, නැවත පිරිසට ඇතුලත් කැර නො-ගත්තා වූ, භික්ෂූන් හා එක් වැ කැරෙන සංඝකර්ම තමන් සමග නොමැති හෙයින් අකෘත සහාය වූ, යම් ඒ භික්ෂුවක අනුව ඔහුගේ ලබ්ධිය ගැනීමෙන් පිළිපදින්නී වේද, ඒ භික්ෂුණී තොමෝ (ඒ භික්ෂුණියට) සෙසු භික්ෂුණීන් විසින් මෙසේ කියයුත්තීය. (කෙසේ දැ? යත්:) "ආර්ය්‍යාව මේ මහණ තෙම සමගි සංඝයා විසින් ධර්මයෙන් - විනයෙන් ශාස්තෘ ශාසනයෙන් සංඝයාගෙන් බැහැර කරන ලද්දේය. මොහු ආයති සංවරය පිණිසවත් නො පිළිපදී. නැවත සංඝ පිරිසට ඇතුලත් කර නොගන්නා ලදී. භික්ෂූන් හා එක් වැ කෙරෙන සංඝකර්මයෙහි ද සහායයකු වශයෙන් නො ගන්නා ලදී. ආර්ය්‍යාවෙනි, එ භික්ෂුව අනුව නො පිළි පදිනු. භික්ෂුණීන් විසින් මෙසේ ත් කියනු ලබන කල්හි ඒ මෙහෙණ සිය අදහස එසේ'ම තර වැ ගනී නම්; ඒ භික්ෂුණී තොමෝ භික්ෂුණීන් විසින් තුන්වන වර තෙක් ම ඒ දෘෂ්ටිය අත් හැර ගැනීම පිණිස කර්මවාක්‍යයෙන් කියයුත්තීය. තුන්වන වර තෙක් කියනු ලබද්දි ත් එය අත් හළේ නම්, යහපති. තුන්වන වර තෙක් කියද්දි ත් ඒ දෘෂ්ටිය අත් නො හළේ නම් පරිජි වූවා අසංවාස වෙයි.

**8. යා පන භික්ඛුණී අවස්සුතා අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස හත්ථගහණං වා සාදියෙය්‍ය, සඞ්ඝාටිකණ්ණගහණං වා සාදියෙය්‍ය, සන්තිට්ඨෙය්‍ය වා, සල්ලපෙය්‍ය වා**

**සඞ්ඝාතිං වා ගණ්හෙය්‍ය, පුරිසස්ස වා අබ්භාගමනං සාදියෙය්‍ය, ඡන්නං වා අනුපවිසෙය්‍ය, කායං වා තදත්ථාය උපසංහරෙය්‍ය, එතස්ස අසද්ධම්මස්ස පටිසෙවනත්ථාය අයම්පි පාරාජිකා හොති අසංවාසා – අට්ඨවත්ථුකා.**

යම් මෙහෙණක් කාය සංසර්ගී රාගයෙන් තෙත් වැ මේ කාය සංසර්ගී රාග සඞ්ඛ්‍යාත අසද්ධර්මය සෙවුනා පිණිස කාය සංසර්ගී රාගයෙන් තෙත් වූ මිනිස් පිරිමියකු තමාගේ අත ගැන්ම ඉවසා ද, සිවුරු කොණ ගැන්ම හෝ ඉවසා ද, පිරිමියා සමීපයේ හෝ සිට බෙණේ ද, පිරිමියා කී තැනකට හෝ (කාය සංසර්ගීරාගය) කැමැති වැ යා ද, පුරුෂයා තමා කරා එන ගමන හෝ ඉවසා ද, මුවා තැනකට හෝ වදී ද, ඒ කාය සංසර්ගීය සඳහා සිය කය හෝ ඉදිරිපත් කෙරේ ද, මෝ මෙහෙණ ද පරිජි ඇවැත් අවන්නී අසංවාස වෙයි.

පිරිමියකු හා කයින් කය ගැටීමෙන් අංස්වාදය ලබනා අදහස් ඇති ව මෙහි දක් වූ අටෙන් කවරක් හෝ ඉවැසීම මෙහෙණක පරිජි වීමට හේතුයි.

# සප්තරස සඞ්ඝාදිසෙසයෝ

භික්ෂු විනයෙහි සඞ්ඝාදිසෙසාපත්තීහු තෙළෙසකි. භික්ෂුණී විනයෙහි සතළොසකි. මේ ඇවැත් අවන් මෙහෙණ විසින් ස්වකීය ශීල පාරිශුද්ධිය ප්‍රාර්ථනය කිරිම පිණිස පිරිවෙස් සමාදන් වීම සඞ්ඛ්‍යාත ආදියෙහි දී ත් මානත් සමාදන්වීම් සඞ්ඛ්‍යාත මධ්‍යයෙහි දී ත් අබ්භාන සඞ්ඛ්‍යාත අන්තයෙහි දි ත් සඞ්ඝයා කැමැති විය යුතු හෙයින් - සඞ්ඝයාගෙන් ම මුල මැද අග යන තුන් තන්හි පිරිවෙස් - මානත් - අබ්භාන කර්මයන් සිද්ධ කැරැ ගත යුතු හෙයින් මොවුනට සඞ්ඝාදිසෙස යනු නමි.

**1. යා පන භික්ඛුනී උස්සයවාදිකා විහරෙය්‍ය ගහපතිනා වා ගහපතිපුත්තෙන වා දාසෙන වා කම්මකාරෙන වා අන්තමසො සමණපරිබ්බාජකෙනාපි අයම්පි භික්ඛුනී පඨමාපත්තිකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සඞ්ඝාදිසෙසං.**

යම් මෙහෙණක් ගැහැවියකු සමග හෝ ගැහැවි පුතකු සමග හෝ දසයකු සමග හෝ කම්කරුවකු සමග හෝ අඩු වශයෙන් මහණ ලිඟු දරූ පිරිවැජියකු සමග හෝ (උස්සයවාදිකා) විනිශ්චය මහාමාත්‍යයන් කෙරෙහි යුක්ති බණනු පිණිස ක්‍රොධ මානොත්සන්න වශයෙන් විවාද කරන්නියක් වැ වෙසේ නම්, මේ මෙහෙණ තොමෝ විකුම් කෙළෙහි ම ඇවැත් ඇවදුම් ඇති භික්ෂුණී සඞ්ඝයාගෙන් බැහැර කළ යුතු වූ සංඝාදිසෙසාපත්තියට පැමිණියා වේ.

**2. යා පන භික්ඛුනී ජානන්ති චොරිං වජ්ඣං විදිතං අනපලොකෙත්වා රාජානං වා සඞ්ඝං වා ගණං වා පූගං වා සෙණිං වා අඤ්ඤත්‍ර කප්පා උට්ඨාපෙය්‍ය අයම්පි භික්ඛුනී පඨමාපත්තිකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සඞ්ඝාදිසෙසං.**

යම් මෙහෙණක් වධයට නිසිය යි දන්නා ලද සොර තැනැත්තියකැ යි දැන දැන ම රජුන් හෝ භික්ෂුණී සඞ්ඝයා

හෝ මල්ලගණාදි ගණයක් හෝ ධර්ම ගණය යි කියන ලද සාංඝික යම් සමාගමක් හෝ සේනා සමූහයක් හෝ නො-විචාරා සෙසු යම් තැනක පැවිදි වූ සිටි තැනැත්තියක හැර (වධයට සුදුසු ස්ත්‍රියක) තොමෝ උපාධ්‍යාය වී උප-සපන් කෙරේ නම් මේ මෙහෙණ ද විකුම් කෙණෙහි ම ඇවැත් ඇවැදුම් ඇති භික්ෂුණී සඞ්ඝයාගෙන් බැහැර කළ යුතු සඞ්ඝාදිසෙසාපත්තියට පැමිණියා වෙයි.

3. යා පන භික්ඛුනී එකා වා ගාමන්තරං ගච්ඡෙය්‍ය එකා වා නදී පාරං ගච්ඡෙය්‍ය, එකා වා රත්තිං විප්පවසෙය්‍ය, එකා වා ගණම්හා ඔහීයෙය්‍ය, අයම්පි භික්ඛුනී පඨමාපත්තිකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සඞ්ඝාදි-සෙසං.

යම් මෙහෙණක් තනිය ම තමා හුන් ගමින් අන් ගමකට යේ නම් හෝ, තනිය ම ගඟින් එගොඩට යේ නම් හෝ, අන් මෙහෙණක නැති ව තනියම රෑ කාලය ගත කෙරේ නම් හෝ, ගමින් පිටත දී තනිය ම පිරිසෙන් වෙන් වූ යේ නම් හෝ, මේ මෙහෙණ ද විකුම් කෙණෙහි අවදින ඇවැත් ඇති භික්ෂුණී සඞ්ඝයාගෙන් බැහැර කළ යුතු සංඝාදිසෙසා-පත්තියට පැමිණියා වෙයි.

4. යා පන භික්ඛුනී සමග්ගෙන සඞ්ඝෙන උක්ඛිත්තං භික්ඛුනිං ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන අනපලො-කෙත්වා කාරකසඞ්ඝං අනඤ්ඤාය ගණස්ස ඡන්දං ඔසාරෙය්‍ය අයම්පි භික්ඛුනී පඨමාපත්තිකං ධම්මං ආපන්නා නිස්සාර-ණීයං සඞ්ඝාදිසෙසං.

යම් මෙහෙණක් සමගි සඞ්ඝයා විසින් ධර්මයෙන් විනය-යෙන් ශාස්තෘශාසනයෙන් (ධර්ම-විනය-ශාස්තෘශාසනයනට එකඟ ව) සංඝයාගෙන් බැහැර කළ මෙහෙණක ඒ බැහැර කළ සංඝයාගෙන් නො අසා, එම කාරක සංඝයාගේ අදහස් නො දැන සඞ්ඝයාට ඇතුළත් කර ගනී නම්, මේ මෙහෙණ ද

විකුම් කෙලෙණති ම ඇවැත් ඇවැදුම් ඇති, භික්ෂුණී සඞ්ඝයාගෙන් බැහැර කළ යුතු සඞ්ඝාදිසෙසාපත්තියට පැමිණියා වෙයි.

**5. යා පන භික්ඛුණී අවස්සුතා අවස්සුතස්ස පුරිස-පුග්ගලස්ස හත්ථතො ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා අයම්පි භික්ඛුණී පඨමාපත්තිකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සංඝාදි-සෙසං.**

යම් මෙහෙණක් මෛථුන්දම් රාගයෙන් තෙත් වැ, මෛථුන්දම් රාගයෙන් තෙත් වූ මිනිස් පිරිමියකුගේ අතින් කන දෙයක් හෝ (කැබලි වලට කඩමින් කෑ යුතු දෙයක් හෝ) වෙනසම් බොජුනක් - ආහාරයක් හෝ සියතින් පිළිගෙනා කා නම් හෝ, බුදී නම් හෝ, ඒ මෙහෙණ ද විකුම් කෙළෙණහි ඇවැත් අවදින හෙයින් පඨමාපත්තික වූ භික්ෂුණී සඞ්ඝයාගෙන් බැහැර කළ යුතු වූ, සඞ්ඝාදිසෙසාපත්තියට පැමිණියා වේ.

**6. යා පන භික්ඛුණී එවං වදෙය්‍ය කිං තෙ අය්‍යෙ එසො පුරිස පුග්ගලො කරිස්සති අවස්සුතො වා අනවස්සුතො වා යතො ත්වං අනවස්සුතා, ඉඞ්ඝ අය්‍යෙ යං තෙ එසො පුරිස පුග්ගලො දෙති ඛාදනීයං වා භොජනීයං වා, තං ත්වං සහත්ථා පටිග්ගහෙත්වා ඛාද වා භුඤ්ජ වා ති අයම්පි භික්ඛුණී පඨමාපත්තිකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සංඝාදිසෙසං.**

"ආර්යාවෙනි, මේ මිනිස් තෙම මෛථුන්දම් රාගයෙන් තෙත් වුයේ හෝ, මෛථුන්දම් රාගයෙන් තෙත් නොවුයේ හෝ තිට කුමක් කෙරේ ද, ඔබ මෛථුන්දම් රාගයෙන් යුක්ත නොවන්නී නම්, එය ම පමණි. එහෙයින් මේ මිනිස් තෙම යම් කන දෙයක් හෝ බුදින දෙයක් හෝ තිට දේ නම්, ඔබ එය සියතින් පිළිගෙන කව. අනුභව කරවයි යම් මෙහෙණක් කියා නම්, ඒ මෙහෙණ ද විකුම් කෙළෙණහි

ඇවැත් අවදින තියං පඨමාපත්තික වූ භික්ෂුණී සඞ්ඝයාගෙන් බැහැර කළ යුතු හෙයින් නිස්සාරණීය වූ සඟ වශේෂස් දහමට පැමිණියා වෙයි.

7. යා පන භික්ඛුනී සඤ්චරිත්තං සමාපජ්ජෙය්‍ය ඉත්ථියා වා පුරිසමතිං පුරිසස්ස වා ඉත්ථිමතිං ජායත්තනෙ වා ජාරත්තනෙ වා අන්තමසො තං ඛණිකායපි; අයම්පි භික්ඛුනී පඨමාපත්තිකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සඞ්ඝාදිසෙසං.

යම් මෙහෙණක් පුරුෂයාගේ අදහස ස්ත්‍රියට දන්වීමට හෝ ස්ත්‍රියගේ අදහස පුරුෂයාට දන්වීමට හෝ ගැහැණු පිරිමි දෙදෙනකුගේ සපිර අඹු සැමි බවෙහි හෝ, මිථ්‍යාචාර බැවීහි හෝ, යටත් පිරිසෙයින් එකෙණෙහි සංවාසය සඳහා හෝ පණිවිඩ ගෙන යෑමට යෙදුණී නම්, මේ මෙහෙණ ද පඨමාපත්තික වූ ද නිස්සාරණීය වූ ද සඞ්ඝාදිසේසාපත්තියකට පැමිණියා වෙයි.

8. යා පන භික්ඛුනී භික්ඛුනිං දුට්ඨා දොසා අප්පතීතා අමූලකෙන පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙය්‍ය "අප්පෙව නාම නං ඉමම්හා බ්‍රහ්මචරියා චාවෙය්‍යන්ති" තතො අපරෙන සමයෙන සමනුග්ගාහියමානා වා අසමනුග්ගාහියමානා වා අමූලකඤ්චෙව තං අධිකරණං හොති, භික්ඛුනී ච දොසං පතිට්ඨාති අයම්පි, භික්ඛුනී පඨමාපත්තිකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සඞ්ඝාදිසෙසං.

යම් මෙහෙණක් කිපියා, සෙස්සන් කුපිත කරන්නී ප්‍රීති සුඛාදියෙන් වෙන් වූවා, අන් මෙහෙණක මේ සසුන් බඹසරින් බැහැර කෙළෙම් නම් ඉතා යෙහෙකැයි සිතා දැකීම් - ඇසීම් - දැනීම් සඞ්ඛ්‍යාත මුල් රහිත හෙයින් අමූලක වූ පරිජී ඇවතකින් චෝදනා කරන්නී ද, ඒ චෝදනා කළ කාලයෙන් මෑත භාගයෙක්හි දී කිම? ඔබ දුටුවෙහි ද යනාදීන් කරුණු අසනු ලබන හෝ නො අසනු ලබන හෝ

මෙහෙණ ද මම තිස් දෙයක් කිමි. යනාදි විසින් සිය දොසය පිළිගනී ද, ඒ අධිකරණය ද දූකීම ඈ මුල් විරහිත ද, මේ මෙහෙණ ද පඨමාපත්තිකා වූ ද නිස්සාරණීය වූ ද සඞ්ඝාදිසෙසයට පැමිණියා වෙයි.

**9. යා පන භික්ඛුනී භික්ඛුනිං දුට්ඨා දොසා අප්පතීතා අඤ්ඤභාගියස්ස අධිකරණස්ස කිඤ්චිදෙසං ලෙසමත්තං උපාදාය පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙය්‍ය "අප්පෙව නාම නං ඉමම්හා බ්‍රහ්මචරියා චාවෙය්‍යන්ති" තතො අපරෙන සමයෙන සමනුග්ගාහියමානා වා අසමනුග්ගාහියමානා වා අඤ්ඤභාගියඤ්චෙව තං අධිකරණං හොති කොචිදෙසො ලෙසමත්තො උපාදින්නො, භික්ඛුනී ච දොසං පතිට්ඨාති, අයම්පි භික්ඛුනී පඨමාපත්තිකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සඞ්ඝාදිසෙසං.**

යම් මෙහෙණක් කිපියා සෙස්සන් කුපිත කරන්නී ප්‍රීති සුඛාදීන් වෙන් වූවා, "අන් මෙහෙණක මේ සසුන් බඹසරින් බැහැර කෙළෙම් නම් යෙහෙකැ යි සිතා භික්ෂුණී භාව මනුෂ්‍ය කොට්ඨාසාදියෙන් වෙන් වූ, තිරශ්චීන ජාති ජකාලක ආදි කොටස් ඇති යම් සතකුගේ මෙවුන්දම් සෙවුම් ආදි දෙයක් දූක, එය තමා අදහස් කරන අන් මෙහෙණකට චෝදනා පිණිස ආරෝපනය කිරීමට ගෙනැ පරිජි ඇවැතකින් චෝදනා කරන්නී ද, ඒ චොදනා කළ කාලයෙන් මෑත කාලයෙකැ "කිම ඔබ දූක්කෙහි ද?" ඈ විසින් සාරුණු අසනු ලබන හෝ නො අසනු ලබන හෝ ඒ මෙහෙණ ද මම අනෙකක් කිවෙමි යනාදි විසින් සිය දොස පිළිගනී ද, ඒ අධිකරණය ද වෙන යම් කෙනකුන් පිළිබඳ ලේශමාත්‍ර ඇත්තක් වේ ද, මේ මෙහෙණ ද පඨමාපත්තිකා වූ ද නිස්සාරණීය වූ ද සඞ්ඝාදිසෙසයට පැමිණියා වෙයි.

**10. යා පන භික්ඛුනී කුපිතා අනත්තමනා එවං වදෙය්‍ය "බුද්ධං පච්චක්ඛාමි ධම්මං පච්චක්ඛාමි සඞ්ඝං පච්චක්ඛාමි සික්ඛං පච්චක්ඛාමි කින්නුමාව සමණියො**

**සක්‍යධීතරො යා සමණියො සක්‍යධීතරා, සන්තඤ්ඤාපි සමණියො ලජ්ජිනියො කුක්කුච්චිකා සික්ඛාකාමා තාසාහං සන්තිකෙ බ්‍රහ්මචරියං චරිස්සාමීති" සා භික්ඛුනී භික්ඛුනීහි එවමස්ස වචනීයා "මාය්‍යෙ කුපිතා අනත්තමනා එවං අවච බුද්ධං පච්චක්ඛාමි ධම්මං පච්චක්ඛාමි සඞ්ඝං පච්චක්ඛාමි සික්ඛං පච්චක්ඛාමි කින්නුමාව සමණියො යා සමණියො සක්‍යධීතරො සන්තඤ්ඤාපි සමණියො ලජ්ජිනියො කුක්කුච්චිකා සික්ඛාකාමා; තාසාහං සන්තිකෙ බ්‍රහ්මචරියං චරිස්සාමීති අභිරමය්‍යෙ ස්වාක්ඛාතො ධම්මො චර බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියායාති එවඤ්ච සා භික්ඛුනී භික්ඛුනීහි වුච්චමානා තථෙව පග්ගණ්හෙය්‍ය සා භික්ඛුනී භික්ඛුනීහි යාවතතියං සමනුභාසිතබ්බා තස්ස පටිනිස්සග්ගාය, යාවතතියඤ්චෙ සමනුභාසියමානා තං පටිනිස්සජ්ජෙය්‍ය ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය අයම්පි භික්ඛුනී යාවතතියකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සංඝාදිසෙසං.**

යම් මෙහෙණක් කිපුණී නො සතුටු සිත් ඇත්තී "බුදුන් අත් හරිමි, දහම් අත් හරිමි, සඞ්ඝයා අත් හරිමි, ශික්‍ෂාව අත් හරිමි, ශාක්‍ය දූවරු වන යම් මෙහෙණ කෙනෙක් වෙත් ද, ඔවුහු මේ අය පමණක්ම ද? ලජ්ජී වූ, ශික්‍ෂාපදයන්හි කුකුස් ඇත්තා වූ, අධිශීල – අධිචිත්ත – අධිප්‍රඥා යන ත්‍රිවිධ ශික්‍ෂාව කැමැති වන්නා වූ සෙසු මෙහෙණහු ද ඇත්තාහ. මම ඒ මෙහෙණින් වහන්සේලා වෙත බඹසර හැසිරෙමි"යි මෙසේ කියා නම් ඒ භික්‍ෂුණී තොමෝ සෙසු භික්‍ෂුණීන් විසින් "ආර්‍ය්‍යාවෙනි, කිපියෙහි නොසතුටු සිත් ඇත්තෙහි බුදුන් අත් හරිමි, දහම් අත් හරිමි, සඞ්ඝයා අත් හරිමි, ශික්‍ෂාව අත හරිමි, ශාක්‍ය දූවරු වන යම් මෙහෙණ කෙනෙක් වෙත් ද, ඔවුහු මේ අය පමණක්ම ද? ලජ්ජී වූ කුකුස් ඇත්තා වූ ශික්‍ෂාකාමී වූ වෙනත් මෙහෙණහු ද ඇත්තාහ. ඔවුන් වෙත බඹසර හැසිරෙමි" යනු නො කියව, ආර්‍ය්‍යාවෙනි, සිත් අලවා වංසය කරව-

ධර්මය ස්වාඛ්‍යාත ය. හොඳින් දුක් කෙළවර කිරීම පිණිස බඹසර හැසිරෙව යි මෙසේ කිය යුත්තී ය. ඒ භික්ෂුණී තොමෝ සෙසු භික්ෂුණීන් විසින් මෙසේ ත් කියනු ලබන්නී එසේ ම සිය අදහස දැඩි වැ ගෙන සිටි නම් ඒ භික්ෂුණී තොමෝ ඒ අදහස අත්හැරීම සඳහා තුන්වන වර දක්වා (සමනුභාෂණයෙන්) කිය යුත්තී ය. තුන්වන වර දක්වා කියද්දී ත් ඒ අදහස අත්හරී නම් එය යහපති. ඉදින් නොහරී නම් ඒ මෙහෙණ ද යාවතතියක වූ නිස්සාරණීය වූ සඞ්ඝාදිසෙසාපත්තියට පැමිණියා වෙයි.

**11.** යා පන භික්ඛුනී කිස්මිඤ්චිදෙව අධිකරණෙ පච්චාකතා කුපිතා අනත්තමනා එවං වදෙය්‍ය ඡන්දගාමිනියො ච භික්ඛුනියො දොසගාමිනියො ච භික්ඛුනියො මොහගාමිනියො ච භික්ඛුනියො භයගාමිනියො ච භික්ඛුනියොති, සා භික්ඛුනී භික්ඛුනීහි එවමස්ස වචනීයා මාය්‍යෙ කිස්මිඤ්චිදෙව අධිකරණෙ පච්චාකතා කුපිතා අනත්තමනා එවං අවච ඡන්දගාමිනියො ච භික්ඛුනියො දොසගාමිනියො ච භික්ඛුනියො මොහගාමිනියො ච භික්ඛුනියො භයගාමිනියො ච භික්ඛුනියොති අය්‍යා ඛො ඡන්දාපි ගච්ඡෙය්‍ය දොසාපි ගච්ඡෙය්‍ය මොහාපි ගච්ඡෙය්‍ය භයාපි ගච්ඡෙය්‍යාති එවඤ්ච සා භික්ඛුනී භික්ඛුනීහි වුච්චමානා තථෙව පග්ගණ්හෙය්‍ය සා භික්ඛුනී භික්ඛුනීහි යාවතතියං සමනුභාසිතබ්බා තස්ස පටිනිස්සග්ගාය, යාවතතියඤ්චෙ සමනුභාසියමානා තං පටිනිස්සජ්ජෙය්‍ය ඉච්චෙතං කුසලං නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය අයම්පි භික්ඛුනී යාවතතියකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සඞ්ඝාදිසෙසං.

යම් මෙහෙණක් සතර අධිකරණයන් අතුරෙන් කිසි යම් අධිකරණයෙක්හි පරදවන ලද්දී, කිපුණී නො සතුටු සිත් ඇත්තී “භික්ෂුණීහු ඡන්දයෙන් අගතියට යන්නියෝ ය, භික්ෂුණීහු ද්වේෂයෙන් අගතියට යන්නියෝ ය, මෝහයෙන් අගතියට යන්නියෝ ය, බියෙන් අගතියට යන්නියෝ යැ යි

කියා ද, එවිට ඒ මෙහෙණ තොමෝ භික්ෂුණීන් විසින් "ආර්යාවෙනි, කිසියම් අධිකරණයෙක්හි පරදවන ලද්දී කිපුණී නොසතුටු සිත් ඇත්තී භික්ෂුණීහු ඡන්දයෙන් අගතියට යන්නියෝ ය, ද්වෙෂයෙන් අගතියට යන්නියෝ ය, මෝහයෙන් අගතියට යන්නියෝ ය, භයෙන් අගතියට යන්නියෝ ය කියා නො කියනු මැනැව, ආර්යා තොමෝ ම ඡන්දයෙන් ද අගතියට යන්නී ය, ද්වෙෂයෙන් ද අගතියට යන්නීය, මෝහයෙන් ද අගතියට යන්නීය, භයෙන් ද අගතියට යන්නීය' කියා මෙසේ කියයුතු වන්නී ය ඒ භික්ෂුණී තොමෝ භික්ෂුණීන් විසින් මෙසේ ත් කියනු ලබන්නී පෙර සේ ම දැඩි ව ගෙන සිටී නම්, ඒ භික්ෂුණී තොමෝ භික්ෂුණීන් විසින් තුන් යල දක්වා ඒ අදහස අත් හැරීම පිණිස කිය යුත්තීය. තුන් යල දක්වා කියනු ලබන්නී ඒ අදහස අත්හරින්නේ නම්; එය යහපත් ය. අත් නො හරින්නී නම්, මේ මෙහෙණ තොමෝ ද යාවතතියක වූ, නිස්සාරණීය වූ සඞ්ඝාදිසෙසාපත්තියට පැමිණියා වෙයි.

12. භික්ඛුනියො පනෙව සංසට්ඨා විහරන්ති පාපාචාරා පාපසද්දා පාපසිලොකා භික්ඛුනිසඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකා, තා භික්ඛුනියො භික්ඛුනීහි එවමස්සු වචනීයා "භගිනියො ඛො සංසට්ඨා විහරන්ති පාපාචාරා පාපසද්දා පාපසිලොකා භික්ඛුනිසඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකා විවිච්චථය්‍යො විවෙකඤ්ඤෙව භගිනීනං සඞ්ඝො වණ්ණෙතී'ති එවං ච තා භික්ඛුනියො භික්ඛුනීහි වුච්චමානා තථෙව පග්ගණ්හෙය්‍යුං, තා භික්ඛුනියො භික්ඛුනීහි යාවතතියං සමනුභාසිතබ්බා තස්ස පටිනිස්සග්ගාය, යාවතතියඤ්චෙ සමනුභාසියමානා තං පටිනිස්සජෙය්‍යුං ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජෙය්‍යුං ඉමාපි භික්ඛුනියො යාවතතියකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සඞ්ඝාදිසෙසං."

භික්ෂුණීහු ගිහියන්ගේ පණිවිඩ ගෙන යෑම් ආදි නුසුදුසු ක්‍රියා කරමින් ගිහියන් හා ගැටෙමින් වෙසෙත් ද, කාය වචන-දෙකින් පහත් හැසිරීම් ඇත්තාහු ද, ලාමක දේ නිසා-පැන නැඟි කීර්තිරාවයක් ඇත්තාහු ද, පහත් ආජීවය නිසා-හටගත් ලාභ ඇත්තාහු ද, භික්ෂුණී සඞ්ඝයාට වෙහෙස උපදවත් ද, ඔවුනොවුන්ගේ වැරදි වසත් ද, ඒ භික්ෂුණීහු භික්ෂුණී සඞ්ඝයා විසින් මෙසේ කිය යුත්තාහු කෙසේ ද? යත්: "නැගෙණිවරු සසුන් අනුලෝම නොවන ගිහි සසඟින් යුතු වැ, පහත් හැසිරීම් ඇති වැ, පහත් කීර්ති ඇති වැ, පහත් ලෙස ප්‍රත්‍යය ලාභී වැ, මෙහෙණ ගණයාට වෙහෙස කරන්නියෝ වැ, ඔවුනොවුන්ගේ වැරැදි වසාලන්නියෝ වැ වෙසෙත්. ආර්‍ය්‍යාවරුනි, පෙරකි නො සරුප් දූයින් වෙන්වවු. සඞ්ඝයා භික්ෂුණීන්ගේ විවේකය ගැන වර්ණනා කරයි" කියායි. ඒ භික්ෂුණීහු මෙසේ ත් කියනු ලබන්නී පෙරසේ ම දැඩි වැ ගෙනැ සිටිත් නම් ඒ භික්ෂුණීහු තුන්වන වර දක්වා එයින් වැළැකීම පිණිස කිය යුත්තාහු වෙති. තුන්-වන වර දක්වා කියනු ලබන්නාහු එය අත්හරිත් නම් එය යහපති. එසේ ත් නො හරණාහු නම් මේ භික්ෂුණීහු ද යාවත්තතියකා වූ නිස්සාරණීය වූ සංඝාදිසෙසාපත්තියට පැමිණියාහු වෙති.

**13.** යා පන භික්ඛුනී එවං වදෙය්‍ය: සංසට්ඨාව අය්‍යෙ තුම්හෙ විහරථ මා තුම්හෙ නානා විහරිත්ථ සන්ති සඞ්ඝෙ අඤ්ඤාපි භික්ඛුනියො එවාචාරා එවංසද්දා එවංසිලොකා භික්ඛුනිසඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජ-පටිච්ඡාදිකා, තා සඞ්ඝො න කිඤ්චි ආහ තුම්හඤ්ඤෙව සඞ්ඝො උඤ්ඤාය පරිභවෙන අක්ඛන්තියා වෙභස්සියා දුබ්බල්‍යා එවමාහ "භගිනියො ඛො සංසට්ඨා විහරන්ති පාපාචාරා පාපසද්දා පාපසිලොකා භික්ඛුනිසඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකා විවිච්චථ-ය්‍යො විවෙකඤ්ඤෙව භගිනීනං සඞ්ඝො වණ්ණෙතී" සා භික්ඛුනී භික්ඛුනීහි එවමස්ස වචනීයා "මාය්‍යෙ එවං අවච

සංසට්ඨාව අය්‍යෙ තුම්හෙ විහරථ, මා තුම්හෙ නානා විහරිත්ථ, සන්ති සඞ්ඝෙ අඤ්ඤාපි භික්ඛුණියො එවාචාරා එවං සද්දා එවං සිලොකා භික්ඛුණි සඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤ-මඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකා, තා සඞ්ඝො න කිඤ්චි ආහ තුම්හෙයෙව සඞ්ඝො උඤ්ඤාය පරිභවෙන අක්ඛන්තියා වෙභස්සියා දුබ්බල්‍යා එවමාහ "භගිනියො ඛො සංසට්ඨා විහරන්ති පාපාචාරා පාපසද්දා පාපසිලොකා භික්ඛුණි සඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකා විවිච්චථය්‍යෙ විවෙකඤ්ඤෙව භගිනීනං සඞ්ඝො වණ්ණෙතීති" එවඤ්ච සා භික්ඛුණී භික්ඛුණීහි යාවතතියං සමනුභාසිතබ්බා තස්ස පටිනිස්සග්ගාය, යාවතතියඤ්චෙ සමනුභාසියමානා තං පටිනිස්සජ්ජෙය්‍ය, ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය, අයම්පි භික්ඛුණී යාවතතියකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සඞ්ඝාදිසෙසං.

යම් මෙහෙණක් "ආර්‍ය්‍යාවරුනි, තෙපි ගිහි සසඟින් යුක්ත වැ වසවු. වෙන් වෙන් වැ නො වසවු. මෙබඳු හැසිරීම් ඇති මෙබඳු කීර්ති ඇති මෙබඳු ප්‍රත්‍යය සෙවීම් ඇති භික්ෂුණී සංඝයාට වෙහෙස ඇති කරන, ඔවුනොවුන්ගේ වරද වසන වෙනත් භික්ෂුණීහු භික්ෂුණී සංඝයා අතර ඇත්තාහ. භික්ෂුණී සඞ්ඝයා ඔවුනට කිසිවක් නො කියයි. භික්ෂුණී සඞ්ඝයා ඔබට ම අවඥ කිරීමෙන් ද, පරිභව කිරීමෙන් ද, නො ඉවසීමෙන් ද, බිය ගැන්වීමෙන් ද, දුබල බැවින් ද, නැගනිවරු ගිහි සසඟින් යුතු වැ පාපාචාර ඇති වැ පහත් කීර්ති ඝොෂායෙන් යුතු ව, පහත් ලෙස ලබන සිවුපස ඇති ව භික්ෂුණී සඞ්ඝයා වෙහෙසට පමුණුවමින් ඔවුනොවුන් ගේ වරද වසමින් වසන්නාහුය. ආර්‍ය්‍යාවරුනි, ගිහි සංසර්ගයෙන් වෙන්වවු. නැඟෙනිවරුන්ගේ විවෙකය ම යහපතැ යි සඞ්ඝයා වර්ණනා කරයි" යි මෙසේ කියා නම්; ඒ භික්ෂුණී තොමෝ භික්ෂුණීන් විසින් මෙසේ කිය යුත්තී වෙයි කෙසේ ද? යත්: "ආර්‍ය්‍යාවෙනි මෙසේ නො කියව, "තෙපි ගිහි සසඟින් යුතු වැ ම වසවු. තෙපි

වෙන් වෙන් වැ නො වසවු. භික්ෂුණී සඞ්ඝයා අතර මෙසේ හැසිරෙන, මෙසේ කීර්ති ඇති, මෙසේ ප්‍රත්‍යය ලබන භික්ෂුණී සඞ්ඝයාට වෙහෙස ඇති කරන ඔවුනොවුන්ගේ වරද වසන, මෙතාක් භික්ෂුණීහු ඇත්තාහ. ඔවුනට භික්ෂුණී සඞ්ඝයා කිසිවක් නො කියයි. භික්ෂුණී සඞ්ඝයා ඔබට ම අවඥා කිරීමෙන් ද, පරිභව කිරීමෙන් ද, නො ඉවසීමෙන් ද, බිය ගැන්වීමෙන් ද, දුබල බැවින් ද, නැගෙනිවරු ගිහි සසගින් යුතු වැ පහත් හැසිරීම් ඇති වැ, පහත් කීර්ති ඇති වැ, පහත් ලෙස ප්‍රත්‍යය ලැබී වැ භික්ෂුණී සංඝයාට වෙහෙස ඇති කරමින් ඔවුනොවුන්ගේ වරද වසමින් වෙසෙත්. ආර්‍ය්‍යාවරුනි, ගිහි සසගින් වෙන්වවු. සංඝයා නැගණිවරුන්ගේ විවේකය ම යහපත්බව වර්ණනා කරයි" යි මෙසේ නො කියව කියයි. භික්ෂුණීන් විසින් මෙසේ ත් කියනු ලබන ඒ භික්ෂුණිය එසේ ම දැඩි වැ ඒ කීමෙහි එල්බ සිටි නම්, ඒ භික්ෂුණිය(ට) භික්ෂුණීන් විසින් තුන් වන වර දක්වා එය අත් හැරීමට කිය යුත්තී ය. තුන් වන වර දක්වා ත් කියනු ලබන්නී එය අත්හළේ නම් මැනැවි. ඉදින් නොම අත් හළේ නම්, මේ මෙහෙණ ද යාවත්තියක වූ නිස්සාරණීය වූ සංඝාදිසේසයට පැමිණියා වෙයි.

14. "යා පන භික්ඛුණී සමග්ගස්ස සඞ්ඝස්ස භෙදාය පරක්කමෙය්‍ය භෙදනසංවත්තනිකං වා අධිකරණං සමාදාය පග්ගය්හ තිට්ඨෙය්‍ය, සා භික්ඛුණී භික්ඛුණීහි එවමස්ස වචනීයා, මාය්‍යා සමග්ගස්ස සඞ්ඝස්ස භෙදාය පරක්කමි, භෙදනසංවත්තනිකං වා අධිකරණං සමාදාය පග්ගය්හ අට්ඨාසි සමෙතාය්‍යා සංඝෙන සමග්ගො හි සඞ්ඝො සම්මොදමානො අවිවදමානො එකුද්දෙසො ඵාසු විහරතීති" එවඤ්ච සා භික්ඛුණී භික්ඛුණීහි වුච්චමානා තථෙව පග්ගණ්හෙය්‍ය, සා භික්ඛුණී භික්ඛුණීහි යාවතතියං සමනුභාසිතබ්බා තස්ස පටිනිස්සග්ගාය, යාවතතියඤ්චෙ

සමනුභාසියමානා තං පටිනිස්සජ්ජෙය්‍ය, ඉච්චෙතං කුසලං නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය අයම්පි භික්ඛුණී යාවතතියකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සංඝාදිසෙසං.

යම් මෙහෙණක් සමගි සඞ්ඝයාගේ භේදය පිණිස වෑයම් කෙරේ ද, භේදයට හේතු වන යම් කරුණක් ගෙන සිටී ද, ඒ භික්ෂුණිය භික්ෂුණීන් විසින් "ආර්‍ය්‍යාවෙනි, සමගි සංඝයාගේ භේදය පිණිස නහමක් උත්සාහ කරව, භේදයට හේතු වන කරුණක් ගෙන නොසිටුව. ආර්‍ය්‍යාව භික්ෂුණී සඞ්ඝයා සමග සමගිවනු මැනැවි. සමග සඞ්ඝයා සතුටු සිත් ඇත්තේ විරුඩවාද නොකරන්නේ එකට පාමොක් උදෙසීම් ආදිය ඇත්තේ සුවසේ වාසය කරයි" කියා මෙසේ කිය යුත්තීය. මෙසේ ත් කියනු ලබන ඒ භික්ෂුණිය එසේ ම ඒ අදහස ගෙන සිටී නම්, තුන් වන වර දක්වා ම ඒ අදහස අත් හැරිම සඳහා භික්ෂුණීන් විසින් කිය යුත්තීය. තුන් වන වර දක්වා කියනු ලබන්නී එය අත් හරී නම් යහපති. නොම අත් හළේ නම් මේ මෙහෙණ ද යාවතතියක වූ නිඃසාරණීය වූ සඞ්ඝාදිසේසාපත්තියට පැමිණියා වෙයි.

15. තස්සා යෙව ඛො පන භික්ඛුණියා භික්ඛුණියො හොන්ති අනුවත්තිකා වග්ගවාදිකා එකා වා ද්වෙ වා තිස්සො වා තා එවං වදෙය්‍යුං "මාය්‍යායො එතං භික්ඛුණිං කිඤ්චි අවචුත්ථ ධම්මවාදී එසා භික්ඛුණී විනයවාදී එසා භික්ඛුණී අම්හාකඤ්චෙසා භික්ඛුණී ඡන්දඤ්ච රුචිඤ්ච ආදාය වොහරති ජානාති නො භාසති අම්හාකම්පෙතං ඛමතීති. තා භික්ඛුණියො භික්ඛුණීහි එවමස්සු වචනියා "මාය්‍යායො එවං අවචුත්ථ න චෙසා භික්ඛුණී ධම්මවාදිනී න චෙසා භික්ඛුණී විනයවාදිනී මාය්‍යානම්පි සඞ්ඝභෙදො රුච්චිත්ථ සමෙතාය්‍යානං සංඝෙන සමග්ගො හි සංඝො සම්මොදමානො අවිවදමානො එකුද්දෙසො ඵාසු විහරතීති" එවඤ්ච තා භික්ඛුණියො භික්ඛුණීහි වුච්චමා

විසින් තුන් වල දක්වා එය අත හැරීම පිණිස කියැ යුත්තිය. තුන් වල දක්වා කියනු ලබන්නී ඒ අදහස අත්හලේ නම් එය මැනැවි. අත් නො හලේ නම් මේ භික්ෂුණිය ද යාවතතියක වූ නිස්සාරණීය වූ සංඝාදිසෙසාපත්තියට පැමිණියා වෙයි.

17. භික්ඛුණී පනෙව අඤ්ඤතරං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරති, කුලදූසිකා පාපසමාචාරා, තස්සා ඛො පාපකා සමාචාරා දිස්සන්ති චෙව, සුය්‍යන්ති ච, කුලානි ච තාය දුට්ඨානි දිස්සන්ති චෙව සුය්‍යන්ති ච සා භික්ඛුණී භික්ඛුණීහි එවමස්ස වචනීයා "අය්‍යා ඛො කුලදූසිකා පාපසමාචාරා. අය්‍යාය ඛො පාපකා සමාචාරා දිස්සන්ති චෙව සුය්‍යන්ති ච, කුලානි චය්‍යාය දුට්ඨානි දිස්සන්ති චෙව සුය්‍යන්ති ච පක්කමතය්‍යා ඉමම්හා ආවාසා, අලන්තෙ ඉධ වාසෙනාති" එවඤ්ච සා භික්ඛුණී භික්ඛුණීහි වුච්චමානා තා භික්ඛුණියො එවං වදෙය්‍ය "ඡන්දගාමිනියො ච භික්ඛුණියො දොසගාමිනියො ච භික්ඛුණියො මොහගාමිනියො ච භික්ඛුණියො භයගාමිණියො ච භික්ඛුණියො, තාදිසිකාය ආපත්තියා එකච්චං පබ්බාජෙන්ති එකච්චං න පබ්බාජෙන්ති"ති; සා භික්ඛුණී භික්ඛුණීහි එවමස්ස වචනීයා 'මාය්‍යෙ එවං අවච න ච භික්ඛුණියො ඡන්දගාමිනියො න ච භික්ඛුණියො දොසගාමිනියො න ච භික්ඛුණියො මොහගාමිනියො න ච භික්ඛුණියො භයගාමිනියො, අය්‍යා ඛො කුලදූසිකා පාපසමාචාරා අය්‍යාය ඛො පාපකා සමාචාරා දිස්සන්ති චෙව සුය්‍යන්ති ච කුලානි චය්‍යාය දුට්ඨානි දිස්සන්ති චෙව සුය්‍යන්ති ච පක්කමතය්‍යා ඉමම්හා ආවාසා අලන්තෙ ඉධ වාසෙනාති" එවඤ්ච සා භික්ඛුණී භික්ඛුණීහි වුච්චමානා තථෙව පග්ගණ්හෙය්‍ය සා භික්ඛුණී භික්ඛුණීහි යාවතතියං සමනුභාසිතබ්බා තස්ස පටිනිස්සග්ගාය, යාවතතියඤ්චෙ සමනුභාසියමානා තං පටිනිස්සජ්ජෙය්‍ය, ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය අයම්පි භික්ඛුණී යාවතතියකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සංඝාදිසෙසං"

භික්ෂුණිය වනාහි (ගිහියනට මල් ආදිය දීමෙන් හෝ වෙදකම් කිරීමාදියෙන්) කුලයන්ගේ ශ්‍රද්ධාව නසන්නී (කුල දූෂනය පිණිස මල් පැල රෝපනය කිරීමාදි) පහත් හැසිරීම් ඇත්තී එක්තරා ගමක් හෝ නියම් ගමක් හෝ ඇසුරු කොට වසා ද, ඒ කුල දූසක භික්ෂුණියගේ ලාමක හැසිරීම් දක්නා ලැබෙද් ද, අසනු ලැබෙද් ද, ඇය විසින් ශ්‍රද්ධානාසනය කරන ලද කුලයෝ දක්නා ලැබෙද්ද අසනු ලැබෙද් ද, ඒ භික්ෂුණී තොමෝ සෙසු ලජ්ජී භික්ෂුණින් විසින් ''ආර්යාව කුලයන්ගේ සැදැහැ නසන පහත් හැසිරීම් ඇත්තියකි; ආර්යාවගේ ලාමක හැසිරීම් දක්නා ලැබෙත්, අසන්නටත් ලැබෙත්, ආර්යාව විසින් දූෂිත කුල දක්නා ලැබෙත්, අසන්නට ත් ලැබෙත්. ආර්යාව මේ ආවාසයෙන් බැහැර යනු මැනැවි, ඔබගේ මෙහි විසීමෙන් කම් නැත'' කියා මෙසේ කිය යුත්ති ය. ඒ භික්ෂුණී තොමෝ සෙසු ලජ්ජී භික්ෂුණීන් විසින් මෙසේ කියනු ලබන්නී ඒ ලජ්ජී භික්ෂුණීන්ට ''භික්ෂුණීහු ඡන්දයෙන් අගතියට යන්නියෝ ය, ද්වේෂයෙන් අගතියට යන්නියෝ ය, මෝහයෙන් අගතියට යන්නියෝ ය, භයයෙන් අගතියට යන්නියෝ ය එබඳු ඇවතක දී ඇතැම් භික්ෂුණියක නෙරපා දමත්, ඇතැම් භික්ෂුණියක නෙරපා නො දමත් ය යි මෙසේ කියා නම්, ඒ භික්ෂුණී තොමෝ භික්ෂුණීන් විසින් ''ආර්යාව මෙසේ නො කියනු මැනැවි. භික්ෂුණීහු ඡන්දගාමිනීහු නො වෙති. ද්වේෂ ගාමිනීහු නො වෙති. මෝහ ගාමිනීහු නො වෙති. භය ගාමිනීහු නො වෙති. ආර්යාව කුල දූසිකාවකි. පාප සමාචාර ඇත්තියකි. ආර්යාවගේ පාපසමාචාර දක්නා ලැබෙත්, අසන්නට ලැබෙත්, ආර්යාව විසින් දූෂිත කුල ද දක්නා ලැබෙත්, අසන්නට ලැබෙත්, ආර්යාව මේ ආවාසයෙන් බැහැර යනු මැනැවි. ඔබගේ මෙහි විසීමෙන් කම් නැත කියා කිය යුත්ති ය. ඒ භික්ෂුණී තොමෝ මෙසේ කියනු ලබන්නී එසේ ම තර වැ ගෙන සිටී නම් ඒ භික්ෂුණී තොමෝ සෙසු භික්ෂුණීන් විසින් තුන් යළ දක්වා එය අත් හැරීම පිණිස කිය යුත්තී ය. තුන් යළක් කියනු ලබන්නී එය අත් හළේ නම් මැනැවි. අත් නො හළේ නම් මේ මෙහෙණ ද යාවත්තියකවූ නිස්සාරණීය වූ සංඝාදිසේසාපත්තියට පැමිණියා වෙයි.

# තිස් නිසගි පචිති

"නිසගි" යනු නිස්සජ්ජනය හෙවත් අන් කෙනකුන්ට පැවැරිය යුතු" යනුයි. යම්කිසි වස්තුවකින් මෙහි දක්වෙන තිස් නිසගි පචිතියෙන් කවර ඇවැතකට හෝ අසුවූ කල්හි ඇවැත් දෙසා ගැනුමෙන් පමණක් පිරිසුදු විය නො-හැකි ය. ඇවැත් දෙසීමට පළමු වැ තමන් නිසගි පචිති ඇවැදීමට හේතු වූ චීවරාදි යම්කිසි වස්තුවක් වේ නම්, එය සඞ්ඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයකුට හෝ නිස්සජ්ජනය (දීම) කළ යුතුයි. ඉන්පසු ඇවැත් දෙසා පිරිසුදු විය හැකි ය සෙසු පචිති වලට වඩා නිසගී පචිතියෙහි ඇති වෙනස මෙයයි.

**1 "යා පන භික්ඛුණී පත්තසන්නිචයං කරෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං"**

යම් මෙහෙණක් ඉටත් පොහොනා (අධිෂ්ඨානයට සුදුසු) පාත්‍රයක් නො ඉටා නො විකප්‍ය එක දවසකුදු තබා නම් ඇ නිසගි පචිති ඇවදී.

පාත්‍රයෝ නවයක් වෙත්. 1. උක්කට්ඨුක්කට්ඨ, 2. උක්කට්ඨමජ්ඣිම, 3. උක්කට්ඨඔමක, 4. මජ්ඣිමුක්කට්ඨ 5. මජ්ඣිමමජ්ඣිම, 6. මජ්ඣිමඔමක, 7. ඔමකුක්කට්ඨ, 8. ඔමකමජ්ඣිම, 9. ඔමකොමක කියා යි. මේ නවයෙන් 1-9 යන පාත්‍ර දෙක අධිට්ඨානයට සුදුසු නො වේ. ඉතා විශාල නිසා ත් ඉතා කුඩා නිසාත් ය. සෙසු පාත්‍ර සත අධිට්ඨානයට සුදුසු යි. යකඩින් හෝ මැටියෙන් කළ පාත්‍රයක් හැර වෙන වර්ගයකින් කළ පාත්‍ර නො වටී.

අධිට්ඨානය නම්: සිය පරිභොගයට වෙන් කැරැ ගැනීම යි.

විකප්පනය නම්: පරිභොග නො කරණ දෑ අන් කෙනකුන්ට පැවැරීම යි.

2. "යා පන භික්ඛුනී අකාල චීවරං කාලචීවරන්ති අධිට්ඨහිත්වා භාජාපෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං"

යම් මෙහෙණක් නො කල් සිවුරක් තමා කැළිග් අතුල බැවින් කාල චීවරයකැ යි සිතා ගෙන බෙදවා නම් නිසගි පචිති වේ.

3. "යා පන භික්ඛුනී භික්ඛුනියා සද්ධිං චීවරං පරිවත්තෙත්වා සා පච්ඡා එවං වදෙය්‍ය හන්දය්‍යෙ තුය්හං චීවරං, ආහරමෙතං චීවරං, යං තුය්හං තුය්හමෙවෙතං, යං මය්හං, මය්හමෙවෙතං, ආහරමෙතං චීවරං, සකං පච්චාහරාති අච්ඡින්දෙය්‍ය වා අච්ඡින්දාපෙය්‍ය වා නිස්සග්ගියං පාචිත්තියං"

යම් මෙහෙණක් මෙහෙණක සමඟ සිවුරක් මාරු කොට පසු වැ මෙසේ කියා ද, "අංයනීව නුඹගේ සිවුර ගනුව, මගේ ඒ සිවුර ගෙනෙව. යම් සිවුරක් නුබගේ ද එය නුඹට ම වේවා! යම් සිවුරක් මගේ ද ඒ මාගේ සිවුර මට වේවා! මගේ ඒ සිවුර ගෙනැත් දෙව, තමාගේ සිවුර පෙරළා ගනුව" යි මෙසේ කියා උදුරා ගන්නී නම් හෝ උදුරවා ගන්නී නම් හෝ නිසගි පචිති වේ.

4. "යා පන භික්ඛුනී අඤ්ඤං විඤ්ඤාපෙත්වා අඤ්ඤං විඤ්ඤාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං"

යම් මෙහෙණක් අනිකක් ඉල්වා ඒ හැර අනිකක් ඉල්ලා නම් නිසගි පචිති වේ.

5. යා පන භික්ඛුනී අඤ්ඤං චෙතාපෙත්වා අඤ්ඤං චෙතාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

යම් මෙහෙණක් සිය කැප බඩුවක් අන් බඩුවකට පෙරළි කරවා නැවෙකක් බලාපොරොත්තුවෙන් මෙයින් ප්‍රයෝජන නැතැ යි නැවත අනෙකක් පෙරළි කරවා නම් නිසගි පචිති වේ.

6. "යා පන භික්ඛුනී අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන සංඝිකෙන අඤ්ඤං චෙතාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං."

යම් මෙහෙණක් අතිකකට දුන් අතිකක් උදෙසා සඟ සතු කළ පිරිකරකින් දුන් දෙය තබා අනෙකක් පෙරළි කරවා නම් නිසගි පචිති වේ.

7. "යා පන භික්ඛුණී අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන සංඝිකෙන සඤ්ඤාචිකෙන අඤ්ඤං චෙතාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං"

යම් මෙහෙණක් අතිකකට දුන් අතිකක් උදෙසා සඟ සතු කළ පිරිකරකින හෝ තමා ඉල්ලා ගත් පිරිකරකින් හෝ දුන් දෙය තබා අනෙකක් පෙරළි කරවා නම් නිසගි පචිති වේ.

8. යා පන භික්ඛුණී අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන මහාජනිකෙන අඤ්ඤං චෙතාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

යම් මෙහෙණක් අතිකකට දුන් අතිකක් උදෙසා ගණයාට දුන් පිරිකරකින් දුන් දෙය තබා අනෙකක් පෙරළි කරවා නම් නිසගි පචිති වේ.

9. යා පන භික්ඛුණී අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන මහාජනිකෙන සඤ්ඤාචිකෙන අඤ්ඤං චෙතාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

යම් මෙහෙණක් අතිකකට දුන් අතිකක් උදෙසා ගණයාට දුන් තමා ඉල්ලා ගත් පිරිකරකින් දුන් දෙය තබා අනෙකක් පෙරළි කරවා නම් නිසගි පචිති වේ.

10. යා පන භික්ඛුණී අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන පුග්ගලිකෙන සඤ්ඤාචිකෙන අඤ්ඤං චෙතාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

යම් මෙහෙණක් අතිකකට දුන් අතිකක් උදෙසා පෞද්ගලිකව දුන් පිරිකරකින් තමා ඉල්ලා ගත් පිරිකරකින් දුන් දෙය තබා අනෙකක් පෙරළි කරවා නම් නිසගි පචිති වේ.

පළමු වන පාත්‍ර වර්ගය යි.

**1. ගරු පාපුරණං පන භික්ඛුණියා චෙතාපෙන්තියා චතුක්කංස පරමං චෙතාපෙතබ්බං තතො චෙ උත්තරිං චෙතාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.**

ශීත කාලයෙහි ප්‍රයෝජනයට ගන්නා ගරු (ඝන) පාපුරණයක් ඉල්ලන්නා වූ මෙහෙණ විසින් සොළොස් කහවණුවක් වටිනා පොරෝණයක් ඉල්ලිය යුතුයි. එයින් වැඩිය වටනා පොරෝණයක් ඉල්ලා නම් නිසගි පචිති වේ.

**2. ලහුපාපුරණං පන භික්ඛුණියා චේතාපෙන්තියා අඩ්ඪතෙය්‍යකංසපරමං චෙතාපෙතබ්බං තතො චෙ උත්තරිං චෙතාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.**

උෂ්ණ කාලයෙහි පෙරවියැ යුතු සැහැල්ලු පොරෝණයක් ඉල්ලන්නා වූ මෙහෙණ විසින් කහවණු දහයක් වටිනා පොරෝණයක් ඉල්ලිය යුතු යි. එයින් වැඩි පොරෝණයක් ඉල්ලා නම් නිසගි පචිති වේ.

**3. නිට්ඨිත චීවරස්මිං පන භික්ඛුණියා උබ්භතස්මිං කඨිනෙ දසාහපරමං අතිරෙක චීවරං ධාරෙතබ්බං තං අතික්කාමෙන්තියා නිස්සග්ගියං පාචිත්තියං.**

සිවුර මසා නිමි කල්හි කෙළින් උදුළ කල්හි (කඨිනා–නිසංස නැති කාලයෙහි) මෙහෙණ විසින් දස දිනක් පරම කොට අධිට්ඨාන – විකප්පන නො කළ සිවුරක් දැරිය යුතුයි. ඒ දස දින ඉක්මවන්තියට නිසගි පචිනි වේ.

**4. නිට්ඨිත චීවරස්මිං පන භික්ඛුණියා උබ්භතස්මිං කඨිනෙ එකරත්තම්පි චෙ භික්ඛුණී පඤ්චහි චීවරෙහි විප්පවසෙය්‍ය, අඤ්ඤත්‍ර භික්ඛුණී සම්මුතියා නිස්සග්ගියං පාචිත්තියං.**

සිවුරු කොට නිමි කල්හි කෙළින් උදුළ කල්හි මෙහෙණ එක් රැයක්වත් භික්ෂුණී සම්මුතියෙන් හැර පස් සිවුරින් වෙන් වැ වසා නම් නිසගි පචිති වේ.

**5. නිට්ඨිත චීවරස්මිං පන භික්ඛුණියා උබ්භතස්මිං කඨිනෙ භික්ඛුණියා පනෙව අකාලචීවරං උප්පජ්ජෙය්‍ය. ආකඞ්ඛමානාය භික්ඛුණියා තං පටිග්ගහෙතබ්බං, පටිග්ගහෙත්වා ඛිප්පමෙව කාරෙතබ්බං, නොචස්ස පාරිපූරි මාසපරමං තාය භික්ඛුණියා තං චීවරං නික්ඛිපිතබ්බං ඌනස්ස පාරිපූරියා සතියා පච්චාසාය; තතො චෙ උත්තරිං නික්ඛිපෙය්‍ය සතියාපි පච්චාසාය, නිස්සග්ගියං පාචිත්තියං.**

සිවුරු නිමි කල්හි කෙළින් උදුල කල්හි මෙහෙණ හට අකාල චීවරයක් උපන්නේ නම්, කැමැති මෙහෙණ විසින් එය පිළිගත යුතුයි. පිළිගෙන වහාම කරවිය යුත්තේ ය. ඉදින් සිවුරට නො සෑහේ නම් අඩුව සම්පූර්ණ කැර ගැනීම පිණිස ලැබේ යයි බලාපොරොත්තුවක් පිට ඇති මාස පරම කාලයක් තැබිය යුතු යි. ලැබේ ය යි බලාපොරොත්තුවක් ඇති කල්හි ද මාසයකට වඩා තබා නම් නිසගි පවිති වේ.

**6. යා පන භික්ඛුණී අඤ්ඤාතකං ගහපතිං වා ගහපතානිං වා චීවරං විඤ්ඤාපෙය්‍ය අඤ්ඤත්‍ර සමයා, නිස්සග්ගියං පාචිත්තියං, තත්ථායං සමයො අච්ඡින්නචීවරා වා හොති භික්ඛුණී නට්ඨචීවරා වා අයං තත්ථ සමයො.**

යම් මෙහෙණක් නො නෑ ගෘහපතියකු හෝ ගිහිණියකු හෝ නිසි කාලයෙහි හැර (අන් කලක) සිවුරක් ඉල්ලා නම් නිසගි පවිති වේ. එහි මේ සමය යි. මෙහෙණ සොරුන් ගත් සිවුරු ඇත්නි හෝ විනාශ වූ සිවුරු ඇත්තී හෝ වේ ද මේ එහි සමය යි.

**7. තඤ්චෙ අඤ්ඤාතකො ගහපති වා ගහපතානි වා බහූහි චීවරෙහි අභිහට්ඨුං පවාරෙය්‍ය සන්තරුත්තර පරමං තාය භික්ඛුණියා තතො චීවරං සාදිතබ්බං, තතො චෙ උත්තරිං සාදියෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං,**

නො නෑ ගැහැවියෙක් හෝ ගැහැවියක් ඒ සොරු ගත් සිවුරු ඇති හෝ නැසූ සිවුරු ඇති මෙහෙණ බොහෝ සිවුරින් පවරා නම් ඒ මෙහෙණ විසින් අඳනය සහ තනි පොරෝට සිවුර පමණ කොට එයින් ඉවැසිය යුතුයි. එයින් වැඩියක් ඉවසා නම් නිසගි පචිති වේ.

8. භික්ඛුනිං පනෙව උද්දිස්ස අඤ්ඤාතකස්ස ගහපතිස්ස වා ගහපතානියා වා චීවරචෙතාපනං උපක්ඛටං හොති ඉමිනා චීවරචෙතාපනෙන චීවරං චෙතාපෙත්වා ඉත්ථන්නාමං භික්ඛුනිං චීවරෙන අච්ඡාදෙස්සාමීති තත්‍ර චෙසා භික්ඛුනී පුබ්බෙ අප්පවාරිතා උපසංකමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍ය ' සාධු වත මං ආයස්මා ඉමිනා චීවර චෙතාපනෙන එවරූපං වා එවරූපං වා චීවරං චෙතාපෙත්වා අච්ඡාදෙහීති කල්‍යාණ කම්‍යතං උපාදාය නිස්සග්ගියං පාචිත්තියං.

මෙහෙණක උදෙසා නො නෑ ගැහැවියකු හෝ ගිහිණියක විසින් මේ සිවුරු මිලෙයෙන් සිවුරක් මිලදී ගෙන අසවල් මෙහෙණ සිවුරකින් පුදමි යි සිවුරු මිලක් තබන ලද්දේ වේ ද, එහි දී පෙර නො පවරණ ලද මේ මෙහෙණ තොමෝ එහි එළඹ "ඇවැත, මේ සිවුරු මිලෙයෙන් මෙබඳු වූ හෝ සිවුරක් මිල දී ගෙන මට දෙන්නෙහි නම් ඉතා යහපතැ" යි යහපතක් කැමැති බව සිතා ගෙන . සිවුරෙහි අධික විධානයට පැමිණේ නම් නිසගි පචිති වේ.

9. භික්ඛුනිං පනෙව උද්දිස්ස උභින්නං අඤ්ඤාතකානං ගහපතීනං වා ගහපතානීනං වා පච්චෙකචීවර චෙතාපනානි උපක්ඛටානි හොන්ති "ඉමෙහි මයං පච්චෙක චීවර චෙතාපනෙහි පච්චෙක චීවරානි චෙතාපෙත්වා ඉත්ථන්නාමං භික්ඛුනිං චීවරෙහි අච්ඡාදෙස්සාමාති තත්‍ර-චෙසා භික්ඛුනී පුබ්බෙ අප්පවාරිතා උපසංකමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍ය සාධු වත මං ආයස්මන්තො ඉමෙහි පච්චෙක චීවර චෙතාපනෙහි එවරූපං වා එවරූපං වා චීවරං චෙතාපෙත්වා අච්ඡාදෙථ උභොව සන්තා එකෙනාති කල්‍යාණකම්‍යතං උපාදාය නිස්සග්ගියං පාචිත්තියං"

මෙහෙණක උදෙසා නො නෑ ගෘහපතියන් දෙදෙනකු විසින් හෝ ගෘහපතිනියන් දෙදෙනකු විසින් හෝ "අපි මේ මෙවන් මෙවන් වූ සිවුරු මිල වලින් මෙවන් මෙවන් වූ සිවුරු මිලදී ගෙන අසුවල් මෙහෙණ සිවුරු වලින් පුදන්නෙමු" යි මෙවන් මෙවන් වූ සිවුරු මිල එලවන ලද්දේ වේ ද, එහිදී පෙර නො පවරණ ලද ඒ මෙහෙණ තොමෝ එහි එළඹ "ඇවැත, මේ මෙවන් මෙවන් වූ සිවුරු මිල වලින් තෙපි දෙදෙන ම එක් වැ මෙබඳු වූ හෝ මෙබඳු වූ හෝ සිවුරක් මිල දී ගෙන මට පුදව් නම් ඉතා යෙහෙකැ" යි යහපතක් කැමැති බව සිතාගෙන සිවුරෙහි අධික විධානයට පැමිණේ නම් නිසඟි පචිති වේ.

10. භික්ඛුණිං පනෙව උද්දිස්ස රාජා වා රාජ-භොග්ගො වා බ්‍රාහ්මණො වා ගහපතිකො වා දූතෙන චීවර චෙතාපන්නං පහිණෙය්‍ය "ඉමිනා චීවරචෙතාපන්නෙන චීවරං චෙතාපෙත්වා ඉත්ථන්නාමං භික්ඛුණිං චීවරෙන අච්ඡාදෙහීති සො චෙ දූතො තං භික්ඛුණිං උපසංකමිත්වා එවං වදෙය්‍ය "ඉදං ඛො අය්‍යෙ අය්‍යං උද්දිස්ස චීවර චෙතාපන්නං ආභතං පටිගණ්හාතු අය්‍යා චීවර චෙතා-පන්නන්ති" තාය භික්ඛුණියා සො දූතො එවමස්ස වච-නීයො" නඛො මයං ආවුසො චීවරචෙතාපන්නං පටි ගණ්හාම චීවරංච ඛො මයං පටිගණ්හාම කාලෙන කප්පියන්ති සො චෙ දූතො තං භික්ඛුණිං එවං වදෙය්‍ය අත්ථි පනාය්‍යාය කාචි වෙය්‍යාවච්චකරාති චීවරත්ථිකාය භික්ඛවෙ භික්ඛුණියා වෙය්‍යාවච්චකරා නිද්දිසිතබ්බා ආරාමිකා වා උපාසිකා වා "එසා ඛො අවුසො භික්ඛු-ණීනං වෙය්‍යාවච්චකරාති" සො චෙ දූතො තං වෙය්‍යා-වච්චකරං සඤ්ඤාපෙත්වා තං භික්ඛුණිං උපසංකමිත්වා එවං වදෙය්‍ය "යං ඛො අය්‍යෙ අය්‍යා වෙය්‍යාවච්චකරං නිද්දිසි, සඤ්ඤත්තා සා මයා උපසංකමතය්‍යා කාලෙන චීවරෙන තං අච්ඡාදෙස්සතීති චීවරත්ථිකාය භික්ඛවෙ භික්ඛුණියා වෙය්‍යාවච්චකරං උපසංකමිත්වා ද්වත්ති-ක්ඛත්තුං චොදෙතබ්බා සාරෙතබ්බා අත්ථො මෙ ආවුසො

චීවරෙනා ති'' ද්වත්තික්ඛත්තුං චොදියමානා සාරියමානා තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය ඉච්චෙතං කුසලං; නො චෙ අභිනිප්ඵාදෙය්‍ය, චතුක්ඛත්තුං පඤ්චක්ඛත්තුං ඡක්ඛත්තුං පරමං තුණ්හීභූතං උද්දිස්ස ඨාතබ්බං. චතුක්ඛත්තුං පඤ්චක්ඛත්තුං ඡක්ඛත්තුං පරමං උද්දිස්ස තිට්ඨමානා තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය ඉච්චෙතං කුසලං, නො චෙ අභිනිප්ඵාදෙය්‍ය තතො චෙ උත්තරිං වායමමානා තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං. නො චෙ අභිනිප්ඵාදෙය්‍ය යතස්සා චීවරචෙතාපන්නං ආභතං, තත්ථ සාමං වා ගන්තබ්බං දූතො වා පාහෙතබ්බො "යං ඛො තුම්හෙ ආයස්මන්තො භික්ඛුණිං උද්දිස්ස චීවරචෙතාපන්නං පහිණිත්ථ, න තං තස්සා භික්ඛුණියා කිඤ්චි අත්ථං අනුභොති යුඤ්ජන්තායස්මන්තො සකං මා වො සකං විනස්සා"ති'' අයං තත්ථ සාමීචි.

මෙහෙණක උදෙසා රජෙක් හෝ රජ ඇමැතියෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ ගැහැවියෙක් හෝ දූතයකු අත "මේ සිවුරු මිලයෙන් සිවුරක් මිලට ගෙන අසුවල් මෙහෙණ පුදව යි සිවුරු මිලක් එවා ද, ඒ දූත තෙමේ ඒ මෙහෙණ වෙත එළඹ "ආර්‍යාවෙනි ආර්‍යාව උදෙසා මේ සිවුරු මිලක් ගෙනෙන ලදී. ආර්‍යාව මේ සිවුරු මිල පිළිගනීවා යි මෙසේ කියා ද, ඒ මෙහෙණ විසින් ඒ දූත තෙමේ "ඇවැත අපි සිවුරු මිල නො පිළිගනිමු. අපි සුදුසු කල්හි කැප සරුප් සිවුරු නම් පිළිගනිමු යී කිය යුත්තේ ය. ඒ දූත තෙමේ ඒ භික්ෂුකියට "ආර්‍යාවගේ කිසියම් වතාවත් කරන්නියක් ඇත්ද යි මෙසේ අසා නම් මහණෙනි සිවුරින් ප්‍රයෝජන ඇති මෙහෙණ විසින් වතාවත් කරන ආරාමිකාවක් හෝ උපාසිකාවක් හෝ මේ තොමෝ භික්ෂුකීන්ගේ වතාවත් කරන්නියකැ යි පෙන්විය යුත්තී ය. ඒ දූත තෙමේ ඒ වතාවත් කරන්නියට සිවුරු ගෙනැත් දෙන පරිද්දෙන් දන්වා ඒ භික්ෂුකිය වෙත එළඹ "ආර්‍යාවෙනි ආර්‍යාව සම්බන්ධ වතාවත් කරන්නියක පෙන්වී ද, ඕ තොමෝ

(ඔබට) සිවුරු ගෙනැත් දෙන පරිදි මා විසින් දක්වන ලද්දිය. ආයුෂ්මත් ඈ වෙත සුදුසු කල්හි එළඹෙනු මැනැවි. සිවුරින් ඔබ පුදත්තේය යි මෙසේ කියා ද, සිවුරු කැමැති මෙහෙණ විසින් වනාවත් කරන්නීය වෙත එළඹ මට සිවුරෙන් ප්‍රයෝජනයයි දෙතුන් වරක් චෝදනා කට යුත්තීය, සිහි කැරවිය යුත්තීය, දෙතුන් වරක් චෝදනා කරනු ලබන්නී සිහිකරවනු ලබන්නී ඒ සිවුර ලැබේ නම් එය යහපති, නො ලැබේ නම් සිවුවරක් හෝ පස්වරක් හෝ සවරක් පරම කොට හෝ නිශ්ශබ්ද වැ ඒ උදෙසා සිටිය යුතු යි. සිවුවරක් හෝ පස්වරක් හෝ සවරක් පරම කොට හෝ උදෙසා සිටින්නී ඒ සිවුර ලැබේ නම් එය යහපති. ඉදින් නො ලැබේ නම් එයින් වැඩිය වෑයම් කරන්නී ඒ සිවුර ලබා නම් නිසගි පචිති වේ. ඉදින් නො-ලබා නම් රාජාදි යමක්හු කෙරෙන් ඈට සිවුරු මිල ගෙනෙන ලද ද, එහි ආයුෂ්මත් වරුනි, තෙපි යම් මෙහෙණක උදෙසා සිවුරු මිල යැවූහු ද, එය ඒ මෙහෙණට කිසි වැඩක් සිදු නො කරයි. ඒ නිසා ආයුෂ්මත්හු තමන් සතු ධනයට යෙදෙත්වා, තොපගේ වස්තුව නොනැසේවා යි කියා තොමෝ හෝ යා යුත්තීය. දූතයෙක් හෝ යැවිය යුත්තේ ය, එහි ලා මේ පිළිපැදිය යුතුවතයි. නොහොත් ලෝකෝත්තර ධර්මගත ප්‍රතිපත්තියයි.

දෙවැනි සිවුරු වග යි.

---

1. යො පන භික්ඛුණී ජාතරූප රජතං උග්ගණ්හෙය්‍ය වා උග්ගණ්හාපෙය්‍ය වා උපනික්ඛිත්තං වා සාදියෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

යම් මෙහෙණක් රන් රිදී මසු කහවණු තමා පිණිස තොමෝ ගනී නම් හෝ, තමා පිණිස අනුන් ලවා ගන්වා නම් හෝ තමා පිණිස තබන ලද්දක් ප්‍රතික්ෂෙප නොකොට ඉවසා නම් හෝ, නිසගි පචිති වේ.

2. යා පන භික්ඛුනී නානප්පකාරකං රූපියසංවොහාරං සමාපජ්ජෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

යම් මෙමෙහෙණක් නානා විධ රන් රිදී මසු කහවණු ගනු දෙනු කිරීමට පැමිණියා නම් නිසගි පචිති වේ.

3. යා පන භික්ඛුනී නානප්පකාරකං කයවික්කයං සමාපජ්ජෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

යම් මෙමෙහෙණක් (චීවර පාත්‍රාදි කැප බඩු පවිං භික්ෂු භික්ෂුණී – ශික්ඛමානා – සාමණේර – සාමණේරී යන පස් සහ දූමියන් අතර හැර) නානාවිධ ගනු දෙනු කිරීමට පැමිණියා නම් නිසගි පචිති වේ.

4. යා පන භික්ඛුනී ඌනපඤ්චබන්ධනෙන පත්තෙන අඤ්ඤං නවං පත්තං චෙතාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං, තාය භික්ඛුනියා සො පත්තො භික්ඛුනී පරිසාය නිස්සජ්ජිතබ්බො යො ච තස්සා භික්ඛුනී පරිසාය පත්තපරියන්තො; සො තස්සා භික්ඛුනියා පදාතබ්බො, අයං තෙ භික්ඛුනි පත්තො යාව භෙදනාය ධාරෙතබ්බො'ති අයං තත්ථ සාමිචි.

යම් මෙමෙහෙණක් බැමි පහකට වඩා අඩු වැ ඇති පාත්‍ර ඇතියා වැ අනෙක් අළුත් පාත්‍රයක් ඉල්ලා ගනී නම් නිසගි පචිති වේ. ඒ මෙමෙහෙණ විසින් ඒ පාත්‍රය භික්ෂුණී පිරිස්හි නිස්සජනය කටයුත්තේ ය. ඒ භික්ෂුණී පිරිස්හි අවසන් භික්ෂුණියගේ පාත්‍රය "භික්ෂුණිය ඔබ විසින් මේ පාත්‍රය බිඳීම තෙක් දැරිය යුතු යයි කියා දිය යුත්තේ ය. එහිලා මේ වතයි.

5. යානි ඛො පන තානි ගිලානානං භික්ඛුනීනං පටිසායනීයානි භෙසජ්ජානි සෙය්‍යථීදං? සප්පි-නවනීතං තෙලං-මධු-ඵාණිතං තානි පටිග්ගහෙත්වා සත්තාහපරමං සන්නිධිකාරකං පරිභුඤ්ජිතබ්බානි තං අතික්කාමෙන්තියා නිස්සග්ගියං පාචිත්තියං

ගිලන් මෙහෙණන් විසින් අනුභව කළ යුතු වූ යම් ඒ බෙහෙත් කෙනෙක් ඇද්ද, ඔවුහු කවරහු ද? ගිතෙල් ය, වෙඬරු ය, තලතෙල් ය, මීය, උක්සකුරු ය යන මොහුයි. ඒ බෙහෙත් පිළිගෙන සත්දිනකට වැඩි නොවන කාලයක් තැන්පත් කොට තබා පරිභෝග කටයුතු යි. ඒ සත්දින ඉක්මවන්නා වූ මෙහෙණ හට නිසගි පචිති වේ.

**6. යා පන භික්ඛුනී භික්ඛුනියා සාමං චීවරං දත්වා පච්ඡා කුපිතා අනත්තමනා අච්ඡින්දෙය්‍ය වා අච්ඡින්දාපෙය්‍ය වා නිස්සග්ගියං පාචිත්තියං.**

යම් මෙහෙණක් අන් මෙහෙණකට තොමෝ ම සිවුරක් දී පසු ව කිපුණී නොසතුටු සිත් ඇත්තී තමාගේය යන හැඟීමෙන් පැහැර ගනී නම් හෝ, අන් කෙනකුන් ලවා පැහැර ගන්වා නම් හෝ, නිසගි පචිති වේ.

**7. යා පන භික්ඛුනී සාමං සුත්තං විඤ්ඤාපෙත්වා තන්තවායෙහි චීවරං වායාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.**

යම් මෙහෙණක් තොමෝ ම සිවුරු පිණිස නූල් ඉල්ලා ගෙන නොනෑ නොපැවරූ රෙදි වියන්නන් ලවා සිවුරු පිණිස වස්තුයක් වියවා නම් නිසගි පචිති වේ.

**8. භික්ඛුනිං පනෙව උද්දිස්ස අඤ්ඤාතකො ගහපති වා ගහපතානී වා තන්තවායෙහි චීවරං වායාපෙය්‍ය තත්‍ර චෙ සා භික්ඛුනී පුබ්බෙ අප්පවාරිතා තන්තවායෙ උපසංකමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍ය, ඉදං ඛො ආවුසො චීවරං මං උද්දිස්ස වීයති ආයතඤ්ච කරොථ විත්ථතඤ්ච අප්පිතඤ්ච සුවීතඤ්ච සුප්පවායිතඤ්ච සුවිලෙඛිතඤ්ච සුවිතච්ඡිතඤ්ච කරොථ අප්පෙවනාම මයං පි ආයස්මන්තානං කිඤ්චිමත්තං අනුපදජ්ජෙය්‍යාමාති එවං ච සා භික්ඛුනී වත්වා කිඤ්චිමත්තං අනුපදජ්ජෙය්‍ය අන්තමසො පිණ්ඩපාතමත්තම්පි නිස්සග්ගියං පාචිත්තියං.**

මෙහෙණක උදෙසා නොනෑ ගෘහපතියෙක් හෝ ගෘහපතිනියක් හෝ රෙදි වියන්නන් ලවා සිවුරක් වියවා ද, පෙර නොපවරණ ලද ඒ මෙහෙණ ද රෙදි වියන්නන්

වෙත ගොස් "ඇමැත්නි. මේ සිවුර මා උදෙසා වියවනු ලබයි. දිගත් කරවු, පුළුලුත් කරවු, ඝනත් කරවු, හැම තැනම සමකොට වියවු, හැම තැනම සැල් සමකොට හැම තන්හි පහරණ ලදුවංද කරවු, මොනවට මැඩීම ද කරවු, කොස්සෙන් ගසා මොනවට බඳින ලද්දක් ද කරවු, මේ කිසේ කරවු නම් යෙහෙක; අපි ද ඇවතුන්ට කිසිවක් දෙන්නෙමු යි සිවුරෙහි අධික විධානයට පැමිණියේ වී නම් ඒ මෙහෙණ ද යටත් පිරිසෙන් පිණ්ඩපාත මාත්‍රයක්වත් දේ නම් ඕහට නිසඟි පචිති වේ.

**9. දසාහානාගතං කත්තිකතෙමාසිපුණ්ණමං භික්ඛු-ණියා පනෙව අච්චෙකචීවරං උප්පජ්ජෙය්‍ය, අච්චෙකං මඤ්ඤමානාය භික්ඛුණියා පටිග්ගහෙතබ්බං පටිග්ගහෙත්වා යාවචීවරකාලසමයං නික්ඛිපිතබ්බං, තතො චෙ උත්තරිං නික්ඛිපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.**

වප්මස මැදි පොහොයට (ප්‍රථම පවාරණයට) දස දිනකට කලින් මෙහෙණකට ඉක්මන් සිවුරක් ලැබේ නම් ගම්කාදීන් දෙන ඉක්මන් සිවුරකැ යි දන්නා වූ මෙහෙණ විසින් පිළිගත යුත්තේ ය. පිළිගෙන අධිෂ්ඨානාදිය නොකොට චීවරකාල සමය තෙක් තබා ගත යුතුයි. ඊට වඩා කල් තබන්නේ නම් නිසඟි පචිති වේ.

**10. යා පන භික්ඛුණී ජානං සඞ්ඝිකං ලාභං පරිණතං අත්තනො පරිණාමෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.**

යම් මෙහෙණක් දායකයා විසින් "සඞ්ඝයාට දෙම්හ"යි දුන් සාංඝික ලාභයක් දැන දැන තමාට හරවා ගනී නම් නිසඟි පචිති වේ.

**තුන්වන පාත්‍ර වර්ගයයි.**

**තිස් නිසඟි පචිති නිමි.**

---

**1. යා පන භික්ඛුණී ලසුනං ඛාදෙය්‍ය පාචිත්තියං**

යම් මෙහෙණක් සුදු ලූණු කා නම් පචිති වේ.

**2. යා පන භික්ඛුණී සම්බාධෙ ලොමං සංහරාපෙය්‍ය පාචිත්තියං.**

යම් මෙහෙණක් සැඟවුණු පියෙස්හි ලොම් ඉවත් කෙරේ නම් පචිති වේ.

**3. තලඝාතකෙ පාචිත්තියං**

යටත් පිරිසෙයින් මහනෙල් පෙත්තකිනුත් මූත්‍රාංගී තලය ගටං ස්පර්ශය විදීමෙහි පචිති වේ.

**4. ජතුමට්ටකෙ පාචිත්තියං**

මනාව සකස් කළ ලාකඩ කූරක් හෝ (ලී-පිටි-මැටි යනා යම්කිසිවකින් කරන ලද්දක්) හෝ මූත්‍රමාර්ගයෙහි ප්‍රවේශ කිරීමෙහි පචිති වේ.

**5. උදකසුද්ධිකං පන භික්ඛුණියා ආදියමානාය වංගුලපබ්බපරමං ආදාතබ්බං තං අතික්කාමෙන්තියා පාචිත්තියං.**

මූත්‍රමාර්ගය ජලයෙන් සෝදන්නා වූ මෙහෙණ විසින් දෑඟුල් පුරුකක් ප්‍රවේශ කොට සේදිය යුතුයි. එය ඉක්ම වන්නියට පචිති වේ.

**6. යා පන භික්ඛුණී භික්ඛුස්ස භුඤ්ජන්තස්ස පානීයෙන වා විධූපනෙන වා උපතිට්ඨෙය්‍ය පාචිත්තියං**

යම් මෙහෙණක් වළඳන්නා වූ භික්ෂුවක් හට පැනින් හෝ පවන් සැලීමෙන් හෝ යුක්තව සමීපයෙහි සිටී නම් පචිති වේ.

**7. යා පන භික්ඛුණී ආමකධඤ්ඤං විඤ්ඤිත්වා වා විඤ්ඤාපෙත්වා වා භජ්ජිත්වා වා භජ්ජාපෙත්වා වා කොට්ටෙත්වා වා කොට්ටාපෙත්වා වා පචිත්වා වා පචාපෙත්වා වා භුඤ්ජෙය්‍ය පාචිත්තියං.**

යම් මෙහෙණක් අමු ධාන්‍ය තොමෝ ම ඉල්ලා ගෙන හෝ අනිකකු ලවා ඉල්ලවා ගෙන හෝ තොමෝ බැද හෝ අනිකකු ලවා බද්දවා හෝ තොමෝ කොටා හෝ අනිකකු ලවා කොටවා හෝ, තොමෝ පිස හෝ අනිකකු ලවා පිසවා හෝ වළඳ නම් පචිති වේ.

8. **යා පන භික්ඛුනී උච්චාරං වා පස්සාවං වා සංකාරං වා විඝාසං වා තිරොකුඩ්ඩෙ වා තිරොපාකාරෙ වා ඡඩ්ඩෙය්‍ය වා ඡඩ්ඩාපෙය්‍ය වා පාචිත්තියං.**

යම් මෙහෙණක් මළ හෝ මුත්‍ර හෝ කසළ හෝ ඉඳුල් හෝ භිත්තියෙන් පිටත හෝ ප්‍රාකාරයෙන් පිටත හෝ දමයි හෝ දම්මවා නම් හෝ පචිති වේ.

9. **යා පන භික්ඛුනී උච්චාරං වා පස්සාවං වා සඞ්කාරං වා විඝාසං වා හරිතෙ ඡඩ්ඩෙය්‍ය වා ඡඩ්ඩාපෙය්‍ය වා පාචිත්තියං.**

යම් මෙහෙණක් මළ හෝ මූත්‍ර හෝ කසළ හෝ ඉඳුල් හෝ ගොයම් - මුං - තල - කලත් - ආදිය වැපුරූ කුඹුරු ආදියෙහි හෝ (යටත් පිරිසෙයින් නිල් තෘණයෙහි හෝ) දමා නම් හෝ දම්මවා නම් හෝ පචිති වේ.

10. **යා පන භික්ඛුනී නච්චං වා ගීතං වා වාදිතං වා දස්සනාය ගච්ඡෙය්‍ය පාචිත්තියං.**

යම් මෙහෙණක් නැටුම් හෝ ගැයුම් හෝ බෙර ඈ වැයුම් හෝ දක්නට යා නම් පචිති වේ.

**පළමුවන ලසුන වග යි.**

1. **යා පන භික්ඛුනී රත්තන්ධකාරෙ අප්පදීපෙ පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨෙය්‍ය වා සල්ලපෙය්‍ය වා පාචිත්තියං.**

යම් මෙහෙණක් අඳුරු රාත්‍රියෙහි පහන් ඈ එළියක් නැති තන්හි තනි පුරුෂයකු සමග හුදකලා වූවා සමීප වැ සිටි නම් හෝ එහි සිට කාම නිශ්‍රිත කථා බෙණේ නම් හෝ පචිති වේ.

2. යා පන භික්ඛුනී පටිච්ඡන්නෙ ඔකාසෙ පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨෙය්‍ය වා සල්ලපෙය්‍ය වා පාචිත්තියං.

යම් මෙහෙණක් ප්‍රාකාරාදියෙන් වැසුණු තැනක තනි පුරුෂයකු සමග හුදකලා වූවා සමීප වැ සිටි නම් හෝ බෙණේ නම් හෝ පචිති වේ.

3. යා පන භික්ඛුනී අජ්ඣොකාසෙ පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨෙය්‍ය වා සල්ලපෙය්‍ය වා පාචිත්තියං

යම් මෙහෙණක් එළිමහනෙහි තනි පුරුෂයකු සමග එකලා වූවා සමීප වැ සිටි නම් හෝ, බෙණේ නම් හෝ පචිති වේ.

4. යා පන භික්ඛුනී රථිකාය වා බ්‍යූහෙ වා සිඞ්ඝාටකෙ වා පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨෙය්‍ය වා සල්ලපෙය්‍ය වා නිකණ්ණිකං වා ජපෙය්‍ය වා දුතියිකං වා භික්ඛුනිං උය්‍යොජෙය්‍ය පාචිත්තියං.

යම් මෙහෙණක් මහ වීථියෙහි හෝ කුඩා වීථියෙහි හෝ සතරමං සන්ධියෙහි තනි පුරුෂයකු සමග එකලා වූවා සිටි නම් හෝ බෙණේ නම් හෝ කන්මුල්හි කොඳුරන්නී නම් හෝ තමනට දුශ්චරිතයෙහි හැසිරීම පිණිස අනි මෙහෙණක පිටත් කරන්නී හෝ වේද පචිති වේ.

5. යා පන භික්ඛුනී පුරෙභත්තං කුලානි උපසඞ්කමිත්වා ආසනෙ නිසීදිත්වා සාමිකෙ අනාපුච්ඡා පක්කමෙය්‍ය පාචිත්තියං.

යම් මෙහෙණක් පෙර බත් වේලෙහි කුලයන්ට (ගෙවල් වලට) එළඹ අසුනෙහි හිඳ ගෘහ ස්වාමීන් හට නොදන්වා යෑ නම් පචිති වේ.

6. යා පන භික්ඛුනී පච්ඡාභත්තං කුලානි උපසඞ්කමිත්වා සාමිකෙ අනාපුච්ඡා ආසනෙ අභිනිසීදෙය්‍ය වා අභිනිපජ්ජෙය්‍ය වා පාචිත්තියං.

යම් මෙහෙණක් පසු බත් වේලාවෙහි කුලයනට පැමිණ කුල හිමියන් නොවිචාරා අසුනෙහි හිඳ ගනී නම් හෝ සයනය කෙරේ නම් හෝ පචිති වේ.

**7. යා පන භික්ඛුණී විකාලෙ කුලානි උපසංකමිත්වා සාමිකෙ අනාපුච්ඡා සෙය්‍යං සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා අභිනිසීදෙය්‍ය වා අභිනිපජ්ජෙය්‍ය වා පාචිත්තියං.**

යම් මෙහෙණක් අවේලාවෙහි (හිරු බැස ගියවිට) කුලයන්ට පැමිණ කුල හිමියන් නොවිචාරා සයනයක් තොමෝ අතුට හෝ අනුන් ලවා අතුරුවා හෝ හිදි නම් හෝ හොවී නම් හෝ පචිති වේ.

**8. යා පන භික්ඛුණී දුග්ගහිතෙන දූපධාරිතෙන පරං උජ්ඣාපෙය්‍ය පාචිත්තියං.**

යම් මෙහෙණක් කී දූයෙන් අනෙකක් ගැනීමෙන් ද, කී දූයෙන් අනෙක් කරුණක් සිතා ගෙන ද, අන් උපසපන් මෙහෙණක ලවා ගරහවන්නී නම් පචිති වේ.

**9. යා පන භික්ඛුණී අත්තානං වා පරං වා නිරයෙන වා බ්‍රහ්මචරියෙන වා අභිසපෙය්‍ය පාචිත්තියං.**

යම් මෙහෙණක් තමා හෝ අන් කෙනකු හෝ (මගේ මේ වචනය අසත්‍ය නම් මම නිරයෙහි උපදිම්වා යි) නිරයෙන් හෝ (මගේ මේ වචනය අසත්‍ය නම් මගේ බ්‍රහ්මචර්‍ය්‍යයෙන් නැති වේවා යි) හෝ දිවුරා නම් පචිති වේ.

**10. යා පන භික්ඛුණී අත්තානං වධිත්වා වධිත්වා රොදෙය්‍ය පාචිත්තියං.**

යම් මෙහෙණක් තම සිරුරට පැහැර (ගසා ගසා) අඬා නම් පචිති වේ.

**දෙවැනි අන්ධකාර වර්ගයයි.**

---

**1. යා පන භික්ඛුනී නග්ගා නහායෙය්‍ය පාචිත්තියං**

යම් මෙහෙණක් නිර්වස්ත්‍ර වැ ස්නානය කෙරේ නම් පචිති වේ.

**2. උදකසාටිකං පන භික්ඛුනියා කාරයමානාය පමාණිකා කාරෙතබ්බා; තත්‍රිදං පමාණං දීඝසො චතස්සො විදත්ථියො සුගත විදත්ථියා, තිරියං ද්වෙ විදත්ථියො. තං අතික්කාමෙන්තියා ඡෙදනකං පාචිත්තියං.**

ජලසාටිකාවක් කරවන මෙහෙණ විසින් ප්‍රමාණයෙන් යුක්ත වූවක් ම කරවිය යුතු යි. එහි මේ ප්‍රමාණය යි. දිගින් සුගත් වියතින් සිවු වියතකි. සරස දෙවියතකි. ඒ ගණන ඉක්මවන්නා වූ මෙහෙණට ඡේදනක පාචිත්තියක් වේ.

"ඡේදනක පාචිත්ති" යනු යම් වස්තුවකින් තමාට ඇවැත් සිදු වී නම් ඒ වස්තුව සිඳ දමා සිදු වූ ආපත්තිය දෙසා ගත යුතු හෙයින් මේ නම යෙදුණි.

**3. යා පන භික්ඛුනී භික්ඛුනියා චීවරං විසිබ්බෙත්වා වා විසිබ්බාපෙත්වා වා සා පච්ඡා අනන්තරායිකානි නෙව සිබ්බෙය්‍ය න සිබ්බාපනාය උස්සුක්කං කරෙය්‍ය අඤ්ඤත්‍ර චතූහපඤ්චාහා පාචිත්තියං.**

යම් මෙහෙණක් අන් මෙහෙණකගේ සිවුරක් හොඳින් නොමසන ලද හෙයින් නැවත මැසීම පිණිස (ගෙත්තම්) මැහුම් මුදා (ලිහා) හෝ අනුන් ලවා මුදවා හෝ පසුව ඕ තොමෝ අනතුරක් නැත්නි සතර පස් දිනකින් වැඩිය නොමසන්නී හෝ අනුන් ලවා ගෙත්තම් කරවීමට උත්සාහ නොකරන්නී හෝ වේද පචිති වේ.

**4. යා පන භික්ඛුනී පඤ්චාහිකං සඞ්ඝාටිචාරං අතික්කාමෙය්‍ය පාචිත්තියං.**

යම් මෙහෙණක් (උත්තරාසඞ්ගය - අන්තරවාසකය - ජලසාටිකාවය - සංකච්චිකාවය යන) සිවුරු ඇඳීම් වශයෙන් හෝ අවුකැවීම් වශයෙන් හෝ නොපෙරළා පස් දිනක් ඉක්මවා නම් පචිති වේ.

**5. යා පන භික්ඛුණී චීවරං සංකමනීයං ධාරෙය්‍ය පාචිත්තියං.**

යම් මෙහෙණක් උපසපන් මෙහෙණක අයත් (ඇය විසින් නුදුන්) සිවුරක් නො විචාරා දරා නම් පචිති වේ.

**6. යා පන භික්ඛුණී ගණස්ස චීවරලාභං අන්තරායං කරෙය්‍ය පාචිත්තියං.**

යම් මෙහෙණක් භික්ෂුණී සඞ්ඝයාගේ චීවර ලාභයට අනතුරු කෙරේ නම් පචිති වේ.

**7. යා පන භික්ඛුණී ධම්මිකං චීවර විභඞ්ගං පටිබාහෙය්‍ය පාචිත්තියං.**

යම් මෙහෙණක් දැහැමි සිවුරු බෙදිමක් වළකා නම් පචිති වේ.

**8. යා පන භික්ඛුණී අගාරිකස්ස වා පරිබ්බාජකස්ස වා පරිබ්බාජිකාය වා සමණ චීවරං දදෙය්‍ය පාචිත්තියං.**

යම් මෙහෙණක් ගිහියකුට හෝ පිරිවැජියකුට හෝ පිරිවැජි ගැහැණියකට හෝ කප් බිඳු තැබූ හඳනා පොරෝනා යම් සිවුරක් දේ නම් පචිති වේ.

**9. යා පන භික්ඛුණී දුබ්බල චීවරපච්චාසාය චීවර කාල සමයං අතික්කාමෙය්‍ය පාචිත්තියං.**

යම් මෙහෙණක් සිවුරක් ලැබේය යන අංශාව හේතු කොට ගෙන සිවුරු බෙදන කාලය ඉක්මවා නම් පචිති වේ.

**10. යා පන භික්ඛුණී ධම්මිකං කඨිනුද්ධාරං පටිබාහෙය්‍ය පාචිත්තියං.**

යම් මෙහෙණක් භික්ෂුණී සඞ්ඝයා කරන ධාර්මික කඨිනුද්ධාරයක් වළකා නම් පචිති වේ.

**තුන්වන නග්න වගයි.**

1. යා පන භික්ඛුණියො ද්වෙ එකමඤ්චෙ තුවට්ටෙය්‍යුං පාචිත්තියං.

යම් මෙහෙණිහු දෙදෙනෙක් එක ඇඳක හොවිත් නම් පචිති වේ.

2 යා පන භික්ඛුණියො ද්වෙ එකත්ථරණ පාවුරණා තුවට්ටෙය්‍යුං පාචිත්තියං.

යම් මෙහෙණිහු දෙදෙනෙක් එක ඇතිරියක එහි ම ලෝතක් පොරවා ගත්තාහු සැතපෙත් නම් පචිති වේ.

3. යා පන භික්ඛුණී භික්ඛුණියා සංචිච්ච අඵාසුං කරෙය්‍ය පාචිත්තියං.

යම් මෙහෙණක් අන් උපසපන් මෙහෙණකට කරදර කිරීමට සිත සිතා ඉදිරියෙහි සක්මන් කිරීම් ආදී ඉරියව් පවත්වා නම් පචිති වේ.

4. යා පන භික්ඛුණී දුක්ඛිතං සහජීවිනිං නෙව උපට්ඨෙය්‍ය න උපට්ඨාපනාය උස්සුක්කං කරෙය්‍ය පාචිත්තියං.

යම් මෙහෙණක් ගිලන් වීමෙන් දුකට පත්වූ තමං සමග එකට ජීවත්වන ශිෂ්‍ය මෙහෙණට තමා හෝ උපස්ථාන නො කරයි ද අන්‍යයකු හෝ ඒ සඳහා මෙහෙය වීමෙහි උත්සුක නොවේ ද පචිති වේ.

5. යා පන භික්ඛුණී භික්ඛුණියා උපස්සයං දත්වා කුපිතා අනත්තමනා නික්කඩ්ඪෙය්‍ය වා නික්කඩ්ඪාපෙය්‍ය වා පාචිත්තියං.

යම් මෙහෙණක් මෙහෙණකට තමා සතු ගෙයක් දී පසුව කිපි නො සතුටු සිත් ඇත්තී එයින් බැහැර කෙරේ නම් හෝ අනුන් ලවා බැහැර කරවා නම් හෝ පචිති වේ.

6. යා පන භික්ඛුණී සංසට්ඨා විහරෙය්‍ය ගහපතිනා-වා ගහපති පුත්තෙන වා සා භික්ඛුණී භික්ඛුණීහි එව-මස්ස වචනීයා "මාය්‍යෙ සංසට්ඨා විහරි ගහපතිනාපි

ගහපති පුත්තෙනාපි විවිච්චෙය්‍ය විවෙකඤ්ඤෙව භගිනියා සඞ්ඝො වණ්ණෙතීති එවඤ්ච සා භික්ඛුනී භික්ඛුනීහි වුච්චමානා තථෙව පග්ගණ්හෙය්‍ය, සා භික්ඛුනී භික්ඛුනීහි යාවතතියං සමනුභාසිතබ්බා තස්ස පටිනිස්සග්ගාය, යාවතතියඤ්චෙ සමනුභාසියමානා තං පටිනිස්සජ්ජෙය්‍ය ඉච්චෙතං කුසලං නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය පාචිත්තියං.

යම් මෙහෙණක් ගැහැවියකු හෝ ගැහැවි පුතකු හෝ සමග ගිහි සංසර්ගයෙන් යුතුව වසා ද, ඒ මෙහෙණ(ට) සෙසු මෙහෙණන් විසින් "ආර්යාව ගැහැවියකු සමග හෝ ගැහැවි පුතකු සමග හෝ ගිහි සංසර්ගයෙන් යුතු ව නො වසනු මැනවි. ආර්යාව ගිහිසසගින් වෙන් වව. සඞ්ඝයා සහෝදරියගේ විවේකය ම වර්ණනා කරයි" යි කිය යුත්තිය. භික්ෂුණීන් විසින් මෙසේ ත් කියනු ලබන්නී එසේ ම දැඩි ව ගෙන සිටි ද, ඒ මෙහෙණ සෙසු මෙහෙණන් විසින් තුන්වර තෙක් එය අත්හැරීමට සමනුභාෂණය කටයුත්තී ය. තුන් වන වර තෙක් සමනුභාෂනය කරන්නී එය අත් හරී නම් යහපති. නොමඅත්හරී නම් පචිති වේ.

7. යා පන භික්ඛුනී අන්තො රට්ඨෙ සාසඞ්කසම්මතෙ සප්පටිභයෙ අසත්ථිකා චාරිකං චරෙය්‍ය පාචිත්තියං.

යම් මෙහෙණක් තමං කැටිව යන වෙළඳ සමූහයක් නැත්නි සැක සහිත පෙදෙස් වශයෙන් සම්මත වූ ප්‍රතිභය සහිත වූ තමං වසන රටෙහි තනියම චාරිකා කෙරේ නම් පචිති වේ.

8. යා පන භික්ඛුනී තිරොරට්ඨෙ සාසඞ්කසම්මතෙ සප්පටිභයෙ අසත්ථිකා චාරිකං චරෙය්‍ය පාචිත්තියං.

යම් මෙහෙණක් තමා කැටිව යන වෙළඳ මුලක් නැත්තී සැක සහිත පෙදෙස් වශයෙන් සම්මත වූ ප්‍රතිභය සහිත වූ තම වසන රටින් වෙන රටක තනියම චාරිකා කෙරේ නම් පචිති වේ.

**9.** යා පන භික්ඛුණී අන්තොවස්සං චාරිකං චරෙය්‍ය පාචිත්තියං.

යම් මෙහෙණක් වස් කාලයෙහි චාරිකා කෙරේ නම් පචිති වේ.

**10.** යා පන භික්ඛුණී වස්සං වුත්ථා චාරිකං න පක්කමෙය්‍ය අන්තමසො ඡප්පඤ්චයොජනානිපි පාචිත්තියං.

යම් මෙහෙණක් වස් වැස අවසන් වූවං යටත් පිරිසෙයින් යොදුන් පහක් හයක් වත් චාරිකා පිණිස නොයාය නම් පචිති වේ.

## සතර වන තුවට්ට වගයි.

---

**1.** යා පන භික්ඛුණී රාජාගාරං වා චිත්තාගාරං වා ආරාමං වා උය්‍යානං වා පොක්ඛරණිං වා දස්සනාය ගච්ඡෙය්‍ය පාචිත්තියං.

යම් මෙහෙණක් රජුගේ ක්‍රීඩා ගෘහයක් හෝ චිත්‍ර ශාලාවක් හෝ ක්‍රීඩා උපවනයක් හෝ ක්‍රීඩා උයනක් හෝ ක්‍රීඩා පොකුණක් හෝ දකිමට යා නම් පචිති වේ.

**2.** යා පන භික්ඛුණී ආසන්දිං වා පල්ලඞ්කං වා පරිභුඤ්ජෙය්‍ය පාචිත්තියං.

යම් මෙහෙණක් දික් කකුල් ඇති ඇඳ-පුටුවක් හෝ ඇත්, අස්, රූ බඳුරූ පාමුල ඇති පර්‍ය්‍යඞ්කයක් හෝ පරිභෝග කෙරේ නම් පචිති වේ.

**3.** යා පන භික්ඛුණී සුත්තං කන්තෙය්‍ය පාචිත්තියං.

යම් මෙහෙණක් නූල් කටි නම් පචිති වේ.

**4.** යා පන භික්ඛුණී ගිහිවෙය්‍යාවච්චං කරෙය්‍ය පාචිත්තියං.

යම් මෙහෙණක් ගිහියන්ගේ කුදු මහත් වතාවත් (වැඩ) කෙරේ නම් පචිති වේ.

5. යා පන භික්ඛුනී භික්ඛුනියා "එහය්යෙ ඉමං අධිකරණං වූපසමෙහී"ති වුච්චමානා සාධූති පටිස්සුණිත්වා සා පච්ඡා අනන්තරායිකිනී නෙව වූපසමෙය්‍ය න වූපසමාය උස්සුක්කං කරෙය්‍ය පාචිත්තියං.

මෙහෙණක විසින් "ආර්යාව එව මේ අධිකරණය සංසිඳුවා ලව"යි කියනු ලබන්නී වූ යම් මෙහෙණක් ඒ සිම මැනැවැයි පිළිගෙන පසුව අනතුරක් නැත්නී ඒ අධිකරණය නොම සංසිඳුවා ද සංසිඳුවාලීම පිණිස උත්සාහ හෝ නොකරයි ද පචිති වේ.

6. යා පන භික්ඛුනී අගාරිකස්ස වා පරිබ්බාජකස්ස වා පරිබ්බාජිකාය වා සහත්ථා ඛාදනීයං වා භොජනීයං වා දදෙය්‍ය පාචිත්තියං.

යම් මෙහෙණක් ගිහියකුට හෝ පිරිවැජියකුට හෝ පිරිවැජි ගැහැණියකට හෝ සියතින් ඛාද්‍යයක් හෝ භොජ්‍යයක් හෝ දේ නම් පචිති වේ.

7. යා පන භික්ඛුනී ආවසථචීවරං අනිස්සජ්ජිත්වා පරිභුඤ්ජෙය්‍ය පාචිත්තියං.

යම් මෙහෙණක් ඔසප් වූ කලැ පරිහරණය කරන සිවුර අත් නොහැර සෙසු දිනයන්හි ත් පරිභොග කෙරේ නම් පචිති වේ.

8. යා පන භික්ඛුනී ආවසථං අනිස්සජ්ජිත්වා චාරිකං පක්කමෙය්‍ය පාචිත්තියං.

යම් මෙහෙණක් දොර බංව ඇති සෙනස්න ආරක්ෂාවට කෙනෙකුට භාර නොදී චාරිකා කෙරේ නම් පචිති වේ.

9. යා පන භික්ඛුනී තිරච්ඡාන විජ්ජං පරියාපුණෙය්‍ය පාචිත්තියං.

යම් මෙහෙණක් හස්තිශිල්පාදි තිරශ්චීන විද්‍යාවක් පුහුණු කෙරේ නම් පචිති වේ.

**10. යා පන භික්ඛුණී තිරච්ඡානවිජ්ජං වාචෙය්‍ය පාචිත්තියං.**

යම් මෙහෙණක් තිරශ්චීන විද්‍යාවක් ඉගෙන ගනී නම් පචිති වේ.

**පඤ්චම චිත්තාගාර වග්ගයි.**

**1. යා පන භික්ඛුණී ජානං සභික්ඛුකං ආරාමං අනාපුච්ඡා පවිසෙය්‍ය පාචිත්තියං.**

යම් මෙහෙණක් භික්ෂූන් වාසය කරන බව දන දන භික්ෂූන් ඇති ආරාමයකට නො අසා ඇතුල් වේ නම් පචිති වේ.

**2. යා පන භික්ඛුණී භික්ඛුං අක්කොසෙය්‍ය වා පරිභාසෙය්‍ය වා පාචිත්තියං.**

යම් මෙහෙණක් භික්ෂුවකට ආක්‍රොශ කෙරේ නම් හෝ බිය උපදවා නම් හෝ පචිති වේ.

**3. යා පන භික්ඛුණී චණ්ඩිකතා ගණං පරිභාසෙය්‍ය පාචිත්තියං.**

යම් මෙහෙණක් කිපුණී භික්ෂුණී සඞ්ඝයාට බාලය අව්‍යක්තය යනාදී වශයෙන් පරිභව කෙරේ නම් පචිති වේ.

**4. යා පන භික්ඛුණී නිමන්තිතා වා පවාරිතා වා ඛාදනියං වා භොජනියං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පාචිත්තියං.**

යම් මෙහෙණක් අකැප වචනයෙන් ආරාධනා ලැබූ මෙහෙණක් වැ හෝ ආහාර පවාරණයෙන් පවාරිත වැ හෝ ඛාද්‍යයක් හෝ භොජ්‍යයක් හෝ කා නම් හෝ බුදී නම් හෝ පචිති වේ.

**5. යා පන භික්ඛුණී කුලමච්ඡරිණී අස්ස පාචිත්තියං**

යම් මෙහෙණක් "මේ මගේ දායක කුලයට අන් මෙහෙණක් නොයවා" යනාදී වශයෙන් කුලයෙහි මසුරු වේ නම් පචිති වේ.

**6. යා පන භික්ඛුනී අභික්ඛුකෙ ආවාසෙ වස්සං වසෙය්‍ය පාචිත්තියං.**

යම් මෙහෙණක් අවවාද ලබා ගැනීම සඳහා යටත් පිරිසෙයින් අඩයොදුන් ඇතුළත වත් භික්ෂූන් නැති ආවාසයෙක්හි වස් වසා නම් පචිති වේ.

**7. යා පන භික්ඛුනී වස්සං වුත්ථා උභතො සඞ්ඝෙ තීහි ඨානෙහි නප්පවාරෙය්‍ය, දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා පාචිත්තියං.**

යම් මෙහෙණක් වස් වසන ලද්දී භික්ෂු-භික්ෂුණී යන උභතො සඞ්ඝයා කෙරෙහි දැකීමෙන් හෝ ඇසීමෙන් හෝ සැකයෙන් හෝ යන තුනින් නො පවරා නම් පචිති වේ.

**8. යා පන භික්ඛුනී ඔවාදාය වා සංවාසාය වා න ගච්ඡෙය්‍ය පාචිත්තියං.**

යම් මෙහෙණක් අවවාද (ගරු ධම්) ඇසීමට හෝ පොහෝ පවුරුණු විචාරිමට හෝ නො යා නම් පචිති වේ.

**9. අන්වද්ධමාසං පන භික්ඛුනියා භික්ඛුසංඝතො ද්වෙ ධම්මා පච්චාසිංසිතබ්බා, උපොසථ පුච්ඡකඤ්ච ඔවාදූප-සංකමනඤ්ච; තං අතික්කාමෙන්තියා පාචිත්තියං.**

මෙහෙණ විසින් භික්ෂු සඞ්ඝයාගෙන් අඩමසක් පාසා පොහෝ විචාරිම සහ අවවාද ලබාගැනීමට එළඹීම ද යන මේ දෙක බලාපොරොත්තු විය යුතුයි. ඒ ඉක්මවන්නිට පචිති වේ.

**10. යා පන භික්ඛුනී පසාඛෙ ජාතං ගණ්ඩං වා රුධිතං වා අනපලොකෙත්වා සංඝං වා ගණං වා, පුරිසෙන සද්ධිං එකෙනෙකා භෙදාපෙය්‍ය වා ඵාලාපෙය්‍ය වා ධොවාපෙය්‍ය වා ආලිම්පාපෙය්‍ය වා බන්ධාපෙය්‍ය වා මොචාපෙය්‍ය වා පාචිත්තියං.**

යම් මෙහෙණක් නාභියෙන් යටත් දණ මඬලෙන් උඩත් ප්‍රදෙශයෙහි හටගත් ගඩක් හෝ වණයක් හෝ භික්ෂුණී සංඝයා හෝ භික්ෂුණී ගණයා හෝ නො අසා එක

පුරුෂයකු සමග හුදකලා වූවා බිඳුවා නම් හෝ පලවා නම් හෝ සෝදවා නම් හෝ බෙහෙත් ඇ අලේප කරවා නම් හෝ බෙහෙත් බඳවා නම් හෝ මුදවා නම් හෝ පචිති වේ.

## සවන ආරාම වගයි

---

1. යා පන භික්ඛුනී ගබ්භිනිං වුට්ඨාපෙය්‍ය පාචිත්තියං.

යම් මෙහෙණක් තොමෝ උපාධ්‍යාය ව ගැබ් ගත් ස්ත්‍රියක උපසම්පන්න කෙරේ නම් පචිති වේ.

2. යා පන භික්ඛුනී පායන්තිං වුට්ඨාපෙය්‍ය පාචිත්තියං.

යම් මෙහෙණක් තොමෝ උපාධ්‍යාය ව කිරි පොවන්නා වූ ස්ත්‍රියක උපසම්පදා කෙරේ නම් පචිති වේ.

3. යා පන භික්ඛුනී ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං සික්ඛමානං වුට්ඨාපෙය්‍ය පාචිත්තියං.

යම් මෙහෙණක් පුරා දෙවසක් පණිවාමයෙන් දුරුවීම් සිකපදයේ සිට විකල් බොජුනෙන් වැළැකීමේ සිකපදය තෙක් නො හික්මුණු සිකපද ඇති සික්ඛමානාවක තොමෝ උපාධ්‍යාය වැ උපසපන් කෙරේ නම් පචිති වේ.

4. යා පන භික්ඛුනී ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සික්ඛමානං සඞ්ඝෙන අසම්මතං වුට්ඨාපෙය්‍ය පාචිත්තියං.

යම් මෙහෙණක් පුරා දෙවසක් පාණාතිපාතාදි ශික්ෂා පද සයෙහි හික්මුණු ශික්ෂා ඇති සඞ්ඝයා විසින් සම්මත නො කරණ ලද සික්ඛමානාවක තොමෝ උපාධ්‍යාය ව උප-සම්පදා කෙරේ නම් පචිති වේ.

5. යා පන භික්ඛුනී ඌනද්වාදසවස්සං ගිහිගතං උට්ඨාපෙය්‍ය පාචිත්තියං.

යම් මෙහෙණක් දොළොස් වස් නොපිරුණු පුරුෂාන්-තරයට ගිය ශික්ෂමානාවක තොමෝ උපාධ්‍යාය ව උපසපන් කෙරේ නම් පචිති වේ.

**6. යා පන භික්ඛුනී පරිපුණ්ණද්වාදසවස්සං ගිහිගතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං වුට්ඨාපෙය්‍ය පාචිත්තියං.**

යම් මෙහෙණක් පිරුණු දොළොස් වස් ඇති, පුරුෂයකු අතරට ගිය පුරා දෙවසක් සටැකි සිකපද සලෙයහි නොහික්මුණ සික ඇති ශික්ෂමානාවක තොමෝ උපාධ්‍යාය ව උපසම්පද කෙරේ නම් පචිති වේ.

**7. යා පන භික්ඛුනී පරිපුණ්ණද්වාදසවස්සං ගිහිගතං ද්වෙවස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සඞ්ඝෙන අසම්මතං වුට්ඨාපෙය්‍ය පාචිත්තියං.**

යම් මෙහෙණක් පිරිපුන් දොළොස් විය ඇති පිරිමියකු අතරට ගිය පුරා දෙවසක් සවැදෑරුම් සිකපද දහමෙහි හික්මුණු සික ඇති, සංඝයා විසින් සම්මත නොකළ ශික්ෂමානාවක තොමෝ උපාධ්‍යාය ව උපසම්පද කෙරේ නම් පචිති වේ.

**8. යා පන භික්ඛුනී සහජීවිනිං වුට්ඨාපෙත්වා ද්වෙ වස්සානි නෙව අනුග්ගණ්හෙය්‍ය න අනුග්ගණ්හාපෙය්‍ය පාචිත්තියං.**

යම් මෙහෙණක් සද්ධිවිහාරිණිය උපසපන් කොට දෙවසක් උද්දෙසදානාදීයෙන් තොමෝ අනුග්‍රහ නො-කරන්නී නම් හෝ අනුන් ලවා අනුග්‍රහ නො කරවන්නී නම් හෝ පචිති වේ.

**9 යා පන භික්ඛුනී වුට්ඨාපිතං පවත්තිනිං ද්වෙ වස්සානි නානුබන්ධෙය්‍ය පාචිත්තියං.**

යම් මෙහෙණක් තමා උපසපන් කළ උපාධ්‍යාය භික්ෂුණී යට දෙවසක් උපස්ථාන නො කරන්නී නම් පචිති වේ.

10. යා පන භික්ඛුනී සහජීවිනිං වුට්ඨාපෙත්වා නෙව වූපකාසෙය්‍ය න වූපකාසාපෙය්‍ය අන්තමසො ඡප්පඤ්චයොජනානිපි පාචිත්තියං.

යම් මෙහෙණක් සද්ධිවිහාරිකාව උපසපත් කොට යටත් පිරිසෙයින් යොදුන් පහක් හයක් වත් තොමෝ කැඳවං ගෙන නොයයි නම් හෝ කැඳවං ගෙන යනු පිණිස අනිකකුට නියෝග නොකෙරේ නම් හෝ පචිති වේ.

## සත්වන ගබ්භිනී වගයි.

---

1. යා පන භික්ඛුනී ඌනවීසතිවස්සං කුමාරිභූතං වුට්ඨාපෙය්‍ය පාචිත්තියං.

යම් මෙහෙණක් විසිවයසින් අඩු කුමරියක වූ ශික්ෂමානාවක උපසම්පදා කෙරේ නම් පචිති වේ.

2. යා පන භික්ඛුනී පරිපුණ්ණවීසතිවස්සං කුමාරිභූතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං වුට්ඨාපෙය්‍ය පාචිත්තියං

යම් මෙහෙණක් පිරිපුන් විසිවයස් ඇති පුරා දෙවසක් සවැදෑරුම් සිකපද දහම්හි නොහික්මුණු ශික්ෂමානාවක උපසම්පද කෙරේ නම් පචිති වේ.

3. යා පන භික්ඛුනී පරිපුණ්ණවීසතිවස්සං කුමාරිභූතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සඞ්ඝෙන අසම්මතං වුට්ඨාපෙය්‍ය පාචිත්තියං

යම් මෙහෙණක් පිරිපුන් විසිවයස් ඇති පුරා දෙවසක් සවැදෑරුම් සිකපද දහම්හි හික්මුණු (එහෙත්) සඞ්ඝයා විසින් සම්මත නොකළ ශික්ෂමානාවක උපසම්පද කෙරේ නම් පචිති වේ.

4. යා පන භික්ඛුනී ඌනද්වාදසවස්සා වුට්ඨාපෙය්‍ය පාචිත්තියං.

යම් මෙහෙණක් තොමෝ දෙළොස් වසින් අඩු වූවා උපාධ්‍යායව ශික්ෂමානාවක උපසම්පද කෙරේ නම් පචිති වේ.

**5. යා පන භික්ඛුනී පරිපුණ්ණද්වාදසවස්සා සඞ්ඝෙන අසම්මතා වුට්ඨාපෙය්‍ය පාචිත්තියං.**

යම් මෙහෙණක් පිරිපුන් දෙළොස් වස් ඇත්තී (එහෙත්) සංඝයා විසින් උපසම්පද කරනු පිණිස සම්මත නොදෙන ලද්දී තොමෝ උපාධ්‍යායව උපසම්පද කෙරේ නම් පචිති වේ.

**6. යා පන භික්ඛුනී අලං තාව තෙ අය්‍යෙ වුට්ඨාපිතෙනාති වුච්චමානා සාධූති පටිස්සුණිත්වා පච්ඡා ඛීය්‍යනධම්මං ආපජ්ජෙය්‍ය පාචිත්තියං.**

යම් මෙහෙණක් "ආර්‍ය්‍යාවෙනි තිට උපාධ්‍යාය සථවිරාවක වීමෙන් කම් නැතැයි" කියනු ලබන්නී එය මැනැවැයි පිළිගෙන පසුව නුගුණ කියන ස්වභාවයට පැමිණේ නම් පචිති වේ.

**7. යා පන භික්ඛුනී සික්ඛමානං සචෙ මෙ ත්වං අය්‍යෙ චීවරං දස්සසි එවාහං තං වුට්ඨාපෙස්සාමීති වත්වා සා පච්ඡා අනන්තරායිකිනී නෙව වුට්ඨාපෙය්‍ය න වුට්ඨාපනාය උස්සුක්කං කරෙය්‍ය පාචිත්තියං.**

යම් මෙහෙණක් "ආර්‍ය්‍යාවෙනි, ඉදින් ඔබ මට සිවුරක් දෙන්නෙහි නම් එවිට මම ති උපසපන් කරමි" යි සික්ඛමානාවකට කියා ඕ පසුව සිවුරු ලද කල අනතුරක් නැත්තී ඈ උපසපන් නො කරා ද, උපසපන් කිරීමට උත්සාහ නැත්තී ද ඕ හට පචිති වේ.

**8. යා පන භික්ඛුනී සික්ඛමානං සචෙ මෙ ත්වං අය්‍යෙ ද්වෙ වස්සානි අනුබන්ධිස්සසි එවාහං තං වුට්ඨාපෙස්සාමීති වත්වා සා පච්ඡා අනන්තරායිකිනී නෙව වුට්ඨාපෙය්‍ය න වුට්ඨාපනාය උස්සුක්කං කරෙය්‍ය පාචිත්තියං**

යම් මෙහෙණක් ආර්‍ය්‍යාවෙනි, ඉදින් ති දෙවසක් මට උවටැන් කරහි නම්, එවිට මම ති උපසපන් කරන්නෙමි යි සික්ඛමානාවකට කියා ඕ සිවුරු ලැබීමෙන් පසුව අනතුරක් නැත්තී ඈ උපසපන් නො කරා ද උපසපන් කිරීමට උත්සාහ හෝ නැත්තී ද ඕහට පචිති වේ.

**9. යා පන භික්ඛුනී පුරිසසංසට්ඨං කුමාරකසංසට්ඨං චණ්ඩිං සොකාවස්සං සික්ඛමානං වුට්ඨාපෙය්‍ය පාචිත්තියං.**

යම් මෙහෙණක් පුරුෂයන් සමග හෝ කුමරුන් සමග හෝ නොමනා ලෙස ඇසුරු කරන පුරුෂයන් හට ශෝක දනය කරන සැඩ පරුෂ ගති ඇති සික්ඛමානාවක තොමෝ උපාධ්‍යායව උපසපන් කරන්නී නම් ඕහට පචිති වේ.

**10.** යා පන භික්ඛුණී මාතාපිතූහි වා සාමිකෙන වා අනනුඤ්ඤාතං සික්ඛමානං වුට්ඨාපෙය්‍ය, පාචිත්තියං

යම් මෙහෙණක් මවු පියන් විසින් හෝ සැමියන් විසින් හෝ අනු නොදුන් සික්ඛමානාවක උපසපන් කරයි නම් පචිති වේ.

**11.** යා පන භික්ඛුණී පාරිවාසිය ඡන්දදානෙන සික්ඛමානං වුට්ඨාපෙය්‍ය පාචිත්තියං

යම් මෙහෙණක් පාරිවාසික ඡන්දදානයෙන් (පළමු දිනැගත් ඡන්දයෙන්) සික්ඛමානාවක උපසපන් කරයි නම් පචිති වේ

**12** යා පන භික්ඛුණී අනුවස්සං වුට්ඨාපෙය්‍ය පාචිත්තියං

යම් මෙහෙණක් වසක් පාසා තොමෝ උපාධ්‍යාය ව උපසපන් කෙරේ නම් පචිති වේ.

**13.** යා පන භික්ඛුණී එකං වස්සං ද්වෙ වුට්ඨාපෙය්‍ය පාචිත්තියං

යම් මෙහෙණක් එක වර්ෂයක් තුළ දී සික්ඛමානාවන් දෙදෙනකු උපසපන් කරන්නී නම් පචිති වේ.

අටවන කුමාරිභූත වර්ගයයි.

---

**1.** යා පන භික්ඛුණී අගිලානා ඡත්තුපාහනං ධාරෙය්‍ය පාචිත්තියං

යම් මෙහෙණක් නොගිලන් වූවා කුඩ හා වහන් දරා නම් පචිති වේ.

2. යා පන භික්ඛුණී අගිලානා යානෙන යායෙය්‍ය පාචිත්තියං

යම් මෙහෙණක් නො ගිලන් වූවං යානයෙන් යා නම් පචිති වේ.

3. යා පන භික්ඛුණී සඞ්ඝාණිං ධාරෙය්‍ය පාචිත්තියං

යම් මෙහෙණක් ඉඟණෙහි බඳනා හවඩියකට බඳු ආකාර ඇති පළඳනා දරා නම් පචිති වේ.

4. යා පන භික්ඛුණී ඉත්ථාලඞ්කාරං ධාරෙය්‍ය පාචිත්තියං

යම් මෙහෙණක් ස්ත්‍රී ආභරණ දරා නම් පචිති වේ.

5. යා පන භික්ඛුණී ගන්ධවණ්ණකෙන නහායෙය්‍ය පාචිත්තියං

යම් මෙහෙණක් සුවඳින් සහ පැහැයෙන් යුතු කොට කළ සුණ්ණයෙන් (ඇඟ ගා) නා නම් පචිති වේ.

6. යා පන භික්ඛුණී වාසිතකෙන පිඤ්ඤාකෙන නහායෙය්‍ය පාචිත්තියං

යම් මෙහෙණක් සුවඳ කළ තල මුරුවට සුත්නෙන් (ඇඟ ගා) නා නම් පචිති වේ.

7. යා පන භික්ඛුණී භික්ඛුණියා උම්මද්දාපෙය්‍ය වා පරිමද්දාපෙය්‍ය වා පාචිත්තියං

යම් මෙහෙණක් භික්ෂුණියක ලවා ඇඟ උලවා නම් හෝ ඇඟ මිරිකා නම් හෝ පචිති වේ.

8. යා පන භික්ඛුණී සික්ඛමානාය උම්මද්දාපෙය්‍ය වා පරිමද්දාපෙය්‍ය වා පාචිත්තියං

යම් මෙහෙණක් සික්ඛමානාවක ලවා ඇඟ උලවා නම් හෝ ඇඟ මිරිකා නම් හෝ පචිති වේ.

9. යා පන භික්ඛුණී සාමණෙරියා උම්මද්දාපෙය්‍ය වා පරිමද්දාපෙය්‍ය වා පාචිත්තියං

යම් මෙහෙණක් සාමණෙරියක ලවා ඇඟ උලවා නම් හෝ මිරිකවා නම් හෝ පචිති වේ.

**10. යා පන භික්ඛුණී ගිහිනියා උම්මද්දාපෙය්‍ය වා පරිමද්දාපෙය්‍ය වා පාචිත්තියං**

යම් මෙහෙණක් ගැහැණියක ලවා ඇඟ උලවා නම් හෝ ඇඟ මිරිකා නම් හෝ පචිති වේ.

**11. යා පන භික්ඛුණී භික්ඛුස්ස පුරතො අනාපුච්ඡා ආසනෙ නිසීදෙය්‍ය පාචිත්තියං**

යම් මෙහෙණක් භික්ෂුවක් ඉදිරියෙහි නො විචාරා අසුනෙහි හිඳි නම් පචිති වේ.

**12. යා පන භික්ඛුණී අනොකාසකතං භික්ඛුං පඤ්හං පුච්ඡෙය්‍ය පාචිත්තියං**

යම් මෙහෙණක් අවකාශ නො කරන ලද්දා වූ (අවසර නොගත්) භික්ෂුවගෙන් ප්‍රශ්න අසා නම් පචිති වේ

**13. යා පන භික්ඛුණී අසංකච්චිකා ගාමං පවිසෙය්‍ය පාචිත්තියං**

යම් මෙහෙණක් සිරුරෙහි අකු ඇටයෙන් යට නාභියෙන් උඩ පෙදෙස වැසීමට නියම කරන ලද සඞ්කච්චි චීවරයෙන් (හැට්ටයෙන්) වෙන් ව ගම් වදි නම් පචිති වේ.

නව වන සත් වගයි.

---

**1. සම්පජානමුසාවාදෙ පාචිත්තියං**

දැන දැන බොරු කීමෙහි පචිති වේ.

**2. ඔමසවාදෙ පාචිත්තියං**

උපසපනක් හට ජාත්‍යාදියෙන් ගටා බිණුමෙහි පචිති වේ.

**3. භික්ඛුණී පෙසුඤ්ඤෙ පාචිත්තියං**

භික්ෂූන් ඔවුනොවුන් කෙරෙහි ප්‍රිය බව ශූන්‍ය කරන කේලාම් කීමෙහි පචිති වේ.

**4. යා පන භික්ඛුනී අනුපසම්පන්නං පදසො ධම්මං වාචෙය්‍ය පාචිත්තියං**

යම් මෙහෙණක් අනුපසපනකට පාලි ධර්මය පද වශයෙන් එකට උච්චාරණය කොට කියා නම් පචිති වේ.

**5. යා පන භික්ඛුනී අනුපසම්පන්නාය උත්තරිං දිරත්ත තිරත්තං සහසෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තියං**

යම් මෙහෙණක් අනුපසපනනා සමග දෙතුන් රැයකට වඩා එක සෙනස්නෙහි හොවී නම් පචිති වේ.

**6. යා පන භික්ඛුනී පුරිසෙන සහසෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තියං**

යම් මෙහෙණක පුරුෂයකු සමග එක සෙනස්නෙහි හොවී නම් පචිති වේ

**7. යා පන භික්ඛුනී පුරිසස්ස උත්තරිං ඡප්පඤ්චවාචාහි ධම්මං දෙසෙය්‍ය අඤ්ඤත්‍ර විඤ්ඤුනා ඉත්ථි විග්ගහෙන පාචිත්තියං**

යම් මෙහෙණක් තම ශබ්දය ඇසෙන දුරින් නුවණැති ස්ත්‍රියක නැති ව පිරිමියකුට වචන පහ හයකට වඩා දහම් දෙසා නම් පචිති වේ.

**8. යා පන භික්ඛුනී අනුපසම්පන්නාය උත්තරි මනුස්සධම්මං ආරොචෙය්‍ය භූතස්මිං පාචිත්තියං**

යම් මෙහෙණක් අනුපසපනකට උතුරු මිනිස් දම් ලැබූ බව් කියා නම් ඒ ධර්ම තමා කෙරෙහි ඇති කල්හි පචිති වේ.

**9. යා පන භික්ඛුනී භික්ඛුනියා දුට්ඨුල්ලං ආපත්තිං අනුපසම්පන්නාය ආරොචෙය්‍ය අඤ්ඤත්‍ර භික්ඛුනී සම්මුතියා පාචිත්තියං**

යම් මෙහෙණක් අන් මෙහෙණකගේ සඞ්ඝාදිසෙසාපත්තියක් භික්ෂුණී සම්මතයක් නැති ව අනුපසපන් නැනැත්තියකට කියා නම් පචිති වේ

10. යා පන භික්ඛුණී පඨවිං ඛණෙය්‍ය වා ඛණාපෙය්‍ය වා පාචිත්තියං.

යම් මෙහෙණක් පොළොව සාරා නම් හෝ අනිකකු ලවා සාරවා නම් හෝ පචිති වේ.

## දස වන මුසාවාද වගයි.

---

### 1. භූතගාමපාතව්‍යතාය පාචිත්තියං

වෘක්ෂලතාදි භූමියෙහි හටගත් භූත සමූහයාගේ විනාශ කිරීම නිමිති කොට පචිති වේ.

### 2. අඤ්ඤවාදකෙ විහෙසකෙ පාචිත්තියං

සඟමැද විචාළ දෙය හැර අනෙකක් කීමෙහි ද නිශ්ශබ්ද වැ සිට වෙහෙස කිරීමෙහි ද පචිති වේ.

### 3. උජ්ඣාපනකෙ ඛියනකෙ පාචිත්තියං

සම්මත කළ භික්ෂුකිය සෙසු භික්ෂුකින් විසින් ලාමක කොට සිතන පරිදි අගුණ පෙන්නා අගුණ කීමෙහි ද අගුණ පතළ කිරීමෙහි ද පචිති වේ.

**4. යා පන භික්ඛුණී සංඝිකං මඤ්චං වා පීඨං වා භිසිං වා බිම්බොහනං වා කොච්ඡං වා අජ්ඣොකාසෙ සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා තං පක්කමන්ති නෙව උද්ධරෙය්‍ය න උද්ධරාපෙය්‍ය අනාපුච්ඡා වා ගච්ඡෙය්‍ය පාචිත්තියං**

යම් මෙහෙණක් සඟ සතු ඇඳක් හෝ පුටුවක් හෝ බිස්සක් හෝ බිලම්බාහණයක් හෝ කොස්සක් හෝ අභ්‍යවකාශයෙහි තොමෝ අතුට හෝ අනුන් ලවා අතුරුවා හෝ බැහැර යන්නී තොමෝ හෝ නගා නො තබා නම් අනුන් ලවා හෝ නගා නො තබවා නම් කෙනකුට නො පවරා හෝ යා නම් පචිති වේ.

**5. යා පන භික්ඛුනී සංඝිකෙ විහාරෙ සෙය්‍යං සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා තං පක්කමන්තී නෙව උද්ධරෙය්‍ය න උද්ධරාපෙය්‍ය අනාපුච්ඡං වා ගච්ඡෙය්‍ය පාචිත්තියං**

යම් මෙමහෙණක් සංඝික විහාරයෙහි සයනයක් අතුරා හෝ අනුන් ලවා අතුරුවා හෝ බැහැර යන්නී එය නගා නොතබා ද අනුන් ලවා හෝ නගා නොතබ්බවා ද කෙනකුට නො පවරා හෝ යා ද? පචිති වේ.

**6. යා පන භික්ඛුනී සංඝිකෙ විහාරෙ ජානං පුබ්බූපගතං භික්ඛුනිං අනුපඛජ්ජ සෙය්‍යං කප්පෙය්‍ය යස්සා සම්බාධො භවිස්සති සා පක්කමිස්සතීති එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං පාචිත්තියං**

යම් මෙමහෙණක් සඟසතු විහාරයෙක්හි සඞ්ඝයා විසින් දෙන ලද බව දූන දූන මුලින් එළඹි මෙමහෙණ ගටා ගෙන (ඉවත් කොට) යම් තැනැත්තියකට ගැහැට වේ නම් ඕ යන්නී යයි එය ම කාරණ කොට ගිලන් බව ඈ අනෙකක් නො සිතා තොමෝ ශයනය කෙරේ නම් පචිති වේ.

**7 යා පන භික්ඛුනී භික්ඛුනිං කුපිතා අනත්තමනා සංඝිකා විහාරා නික්කඩ්ඪෙය්‍ය වා නික්කඩ්ඪාපෙය්‍ය වා පාචිත්තියං**

යම් මෙහෙණක් කුපිතව නො සතුටු වූවා අන් මෙහෙණක සඟසතු වෙහෙරින් එළවා නම් හෝ අනුන් ලවා එළවවා නම් හෝ පචිති වේ.

**8. යා පන භික්ඛුනී සංඝිකෙ විහාරෙ උපරි වෙහාසකුටියා ආහච්චපාදකං මඤ්චං වා පීඨං වා අභිනිසීදෙය්‍ය වා අභිනිපජ්ජෙය්‍ය වා පාචිත්තියං**

යම් මෙමහෙණක් සඟසතු විහාරයෙක්හි ලෑලි නො දමූ උස් යට මහල් ඇති ආකාශ කුටියෙක්හි තලාඳ මත්තෙහි තැබූ වීට්ටම විද සකුල් සවි කළ ඇඳක හෝ පුටුවක හෝ ඉදී නම් හෝ, හොවී නම්, හෝ පචිති වේ.

**9. මහල්ලකං පන භික්ඛුණියා විහාරං කාරයමානාය යාව ද්වාරකොසා අග්ගලට්ඨපනාය ආලොකසන්ධිපරිකම්මාය ද්වත්තිච්ඡදනස්ස පරියායං අප්පහරිතෙ ඨිතාය අධිට්ඨාතබ්බං, තතො චෙ උත්තරිං අප්පහරිතෙපි ඨිතා අධිට්ඨහෙය්‍ය පාචිත්තියං**

කරවා දෙන කෙනකුන් ඇති බැවින් මහල්ලක නම් වූ විහාරයක් කරවන මෙහෙණ විසින් උළුවස්සට හාත් පස දෙරියන් පියන් පමණ තැන් එය තද වීම පිණිස ත් දොර ගසානිමත් වීම පිණිසත් දෙතුන් වරක් මැටි ගැසිය යුතුයි. පියස්සෙහි තණ කැරලි එක පිට එක සිටින සේ සෙවිලි කළ යුතුයි. තණ නැති තැන සිට එය විධාන කටයුතුයි. ඊට වඩා මැටි ගැස්සුව හොත් පචිති වේ.

**10. යා පන භික්ඛුණී ජානං සප්පාණකං උදකං තිණං වා මත්තිකං වා සිඤ්චෙය්‍ය වා සිඤ්චාපෙය්‍ය වා පාචිත්තියං**

යම් මෙහෙණක් පණුවන් ඇති බව දන දනා පණුවන් සහිත දිය තණට හෝ මැටියට හෝ ඉසී නම් හෝ ඉසවා නම් හෝ පචිති වේ.

**එකොළොස්වන භූතගාම වගයි.**

---

**1. අගිලානාය භික්ඛුණියා එකො ආවසථපිණ්ඩො භුඤ්ජිතබ්බො තතො චෙ උත්තරිං භුඤ්ජෙය්‍ය පාචිත්තියං**

නොගිලන් මෙහෙණ විසින් එක ආවසථ පිණ්ඩයක් (පින් තකා දෙන ආහාරය - දොර දත්) අනුභව කටයුතුයි. ඉන් වැඩිය අනුභව කෙළේ නම් පචිති වේ.

**2 ගණ භොජනෙ අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං; තත්ථායං සමයො; ගිලාන සමයො චීවරදාන සමයො චීවර කාරසමයො අද්ධානගමනසමයො නාවාභිරූහන සමයො මහා සමයො සමණභත්තසමයො අයං තත්ථ සමයො**

ගණභොජනයෙහි සුදුසු කාලයෙහි හැර පචිති වේ. (ගණ භොජන නම් භික්ෂුණින් සිවුනමකට වඩා සිටින තැනකට ගොස් ඔදන-සත්තු - කුම්මාස - මච්ඡ - මංස යන භොජනයෙන් එකකින් හෝ වැඩි ගණනකින් ආරාධනා කිරීමෙන් පසු පිළිගත් භොජනය යි. භික්ෂුණීන් සතර නමක් උපාසකයකු වෙත ගොස් අප සතර නමට බත් දෙව යි විඥප්තියෙන් ලැබූ භොජනය ද ගණ භොජන නමි.) මේ ගණභොජනයෙහි ලං සුදුසු සමය යි. ගිලන් සමය - සිවුරු දෙන සමය - සිවුරු කරණ සමය - දික් ගමනකට පිළිපන් සමය - නැව් නගින සමය - බොහෝ භික්ෂුණින් රැස්වන සමය - භික්ෂුණින්ට දන් දෙන සමය යන මේ යි.

**3. භික්ඛුණිං පනෙව කුලං උපගතං පූවෙහි වා මන්ථෙහි වා අභිහට්ඨුං පවාරෙය්‍ය ආකංඛමානාය භික්ඛු-ණියා ද්වත්තිපත්තපූරා පටිග්ගහෙතබ්බා තතො චෙ උත්තරිං පටිග්ගණ්හෙය්‍ය පාචිත්තියං; ද්වත්තිපත්තපූරෙ පටිග්ගහෙත්වා තතො නීහරිත්වා භික්ඛුණීහි සද්ධිං සංවිභජිතබ්බං. අයං තත්ථ සාමීචි.**

කුලයට එළැඹි භික්ෂුණියට කැවුමෙන් හෝ අග්ගලායෙන් හෝ ගෙනැත් දුන්නේ නම් එය කැමැති භික්ෂුණිය විසින් පාත්‍ර දෙකක් තුනක් පමණ පිළිගත යුතුයි. ඊට වඩා වැඩිපුර පිළි ගනී නම් පචිති වේ. පාත්‍රා දෙකක් තුනක් පිළිගෙන එතැනින් ගෙන ගොස් සෙසු භික්ෂුණීන් සමග බෙදා ගත යුතුයි. එහි මේ වතයි.

**4. යා පන භික්ඛුණී විකාලෙ ඛාදනීයං වා භොජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පාචිත්තියං**

යම් මෙහෙණක් අවේලාවෙහි කඩා කන දෙයක් හෝ භොජනයක් හෝ කඩං කානම් හෝ වළඳ නම් හෝ පචිති වේ.

**5. යා පන භික්ඛුණී සන්නිධිකාරකං ඛාදනීයං වා භොජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පාචිත්තියං**

යම් මෙහෙණක් පිළිගත් එක රැයකුදු ඉකුත් වැ ගිය කෑ: කත දෙයක් හෝ භොජනයක් හෝ කඩා කෑ නම් හෝ වළඳා නම් හෝ පචිති වේ

**6. යා පන භික්ඛුණී අදින්නං මුඛද්වාරං ආහාරං ආහරෙය්‍ය අඤ්ඤත්‍ර උදකදන්තපොනා පාචිත්තියං**

යම් මෙහෙණක් දිය ත් දැහැටි ත් හැර තමහට නුදුන් ආහාරයක් උගුරෙන් පහතට එළවා නම් පචිති වේ.

**7. යා පන භික්ඛුණී භික්ඛුණිං එවං වදෙය්‍ය "එහය්‍යෙ ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසිස්සාමාති" තස්සා දාපෙත්වා වා අදාපෙත්වා වා උය්‍යොජෙය්‍ය "ගච්ඡය්‍යෙ න මෙ තයා සද්ධිං කථා වා නිසජ්ජා වා ඵාසු හොති එකිකාය මෙ කථා වා නිසජ්ජා වා ඵාසු හොතී"ති එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං පාචිත්තියං**

යම් මෙහෙණක් අන් මෙහෙණකට "ආර්‍ය්‍යාවෙනි, එව ගමට හෝ පිඬු පිණිස පිවිසෙන්නෙමුයි කියා ද, පසුව ඈට දෙවා හෝ නොදෙවා හෝ "ආර්‍ය්‍යාවෙනි යව මට තී සමග කතාවට ත් හිඳීමට ත් පහසු නො වෙයි. හුදෙකලා වූ මට කතාවට ත් හිඳීමත් පහසු වෙයි. මෙසේ අනෙකක් නො සලකා එයම කරුණු කොට ගෙන ඒ මෙහෙණ පිටත් කොට හරී නම් පචිති වේ.

**8. යා පන භික්ඛුණී සභොජනෙ කුලෙ අනුපඛජ්ජ නිසජ්ජං කප්පෙය්‍ය පාචිත්තියං**

යම් මෙහෙණක් මෛථුන රාගයෙන් යුත් ස්ත්‍රී පුරුෂයන් දෙදෙනකු ඇති ගෙහි ඇතුළට වැද හිඳී නම් පචිති වේ.

**9. යා පන භික්ඛුණී පුරිසෙන සද්ධිං රහො පටිච්ඡන්නෙ ආසනෙ නිසජ්ජං කප්පෙය්‍ය පාචිත්තියං**

යම් මෙහෙණක් පුරුෂයකු සමග රහසි ගත වැ අඳුනසා හිඳි නම් පචිති වේ.

**10 යා පන භික්ඛුනී පුරිසෙන සද්ධිං එකෙනෙකා රහො නිසජ්ජං කප්පෙය්‍ය පාචිත්තියං**

යම් මෙහෙණක් තනි පුරුෂයකු සමග හුදකලා ව රහසිගත වැ හිඳි නම් පචිති වේ.

## දෙලොස් වන බොජුන් වගයි.

---

**1. යා පන භික්ඛුනී නිමන්තිතා සභත්තා සමානා සන්තිං භික්ඛුනිං අනාපුච්ඡා පුරෙ භත්තං වා පච්ඡා භත්තං වා කුලෙසු චාරිත්තං ආපජ්ජෙය්‍ය අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං. තත්‍රායං සමයො චීවරදානසමයො චීවරකාරසමයො. අයං තත්ථ සමයො.**

යම් මෙහෙණක් භොජනයෙකින් ආරාධනා ලද්දී, ආරාධනා ලද හෙයින් සභත්ත වූවා, දෙලොස් රියන් ඇතුළත්හි සිටින මෙහෙණක නොවිචාරා වැළඳිමට පළමුව හෝ පසුව හෝ වෙන කුලයන්හි හැසිරෙන්නී නම් සමය තබා පචිති වේ. එහි මේ සමයයි. සිවුරු දෙන සමය ය සිවුරු කරන සමය ය යනු එහි සුදුසු සමය යි.

**2. අගිලානාය භික්ඛුනියා චාතුමාසප්පච්චය පවාරණා සාදිතබ්බා අඤ්ඤත්‍ර පුනපවාරණාය අඤ්ඤත්‍ර නිච්චපවාරණාය තතො චෙ උත්තරිං සාදියෙය්‍ය පාචිත්තියං.**

නොගිලන් මෙහෙණ විසින් සිවුමසකට කරන සිවුපස පවාරණය ඉවසිය යුත්තීය. නැවත පැවැරීමක් හෝ නිත්‍යයෙන් පැවැරීමක් හෝ නැතිව ඊට වඩා ඉවසා නම් පචිති වේ.

**3. යා පන භික්ඛුනී උය්‍යුත්තං සෙනං දස්සනාය ගච්ඡෙය්‍ය, අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා පාචිත්තියං.**

යම් මෙහෙණක් යුධය පිණිස නික්මුණු සිවුරඟ සෙනග දැකීමට සුදුසු කරුණක් නැතිව යා නම් පචිති වේ.

4. සියා ච තස්සා භික්ඛුණියා කොචිදෙව පච්චයො සෙනං ගමනාය; දිරත්තතිරත්තං තාය භික්ඛුණියා සෙනාය වසිතබ්බං තතො චෙ උත්තරිං වසෙය්‍ය පාචිත්තියං

ඒ භික්ෂුණියට සේනාවට යෑම පිණිස යම් කෙනකුන්ගේ ගිලන් බව ආදී කිසිවක් වන්නේ නම් ඒ භික්ෂුණිය විසින් දෙතුන් රැයක් සේනාවෙහි විසිය යුතුයි. ඊට වඩා වැඩිපුර විසා නම් පචිති වේ.

5. දිරත්තතිරත්තං චෙ භික්ඛුණී සෙනාය වසමානා උය්‍යොධිකං වා බලග්ගං වා සෙනාබ්‍යූහං වා අණීකදස්සනං වා ගච්ඡෙය්‍ය පාචිත්තියං

දෙතුන් රැයක් සේනාවෙහි වසන මෙහෙණ යුද පිටියට හෝ බල ගණනා තැනට හෝ සෙනග රැස්වෙන තැනට හෝ බල ඇණි දැකීමට හෝ යා නම් පචිති වේ.

6. සුරාමෙරයපානෙ පාචිත්තියං

රහමෙර බීමෙහි පචිති වේ.

7. අඞ්ගුලිපතොදකෙ පාචිත්තියං

ඇඟිල්ලෙන් කිති කැවීමෙහි පචිති වේ.

8. උදකෙ හස්සධම්මෙ පාචිත්තියං

දියෙහි ක්‍රීඩා කිරීමෙහි පචිති වේ.

9. අනාදරියෙ පාචිත්තියං

සිකපදයෙන් අවවාද කළහුට හෝ සිකපදයට හෝ අනදර කිරීමෙහි පචිති වේ.

10. යා පන භික්ඛුණී භික්ඛුණිං භිංසාපෙය්‍ය පාචිත්තියං

යම් මෙහෙණක් අන් මෙහෙණක බිය ගන්වා නම් පචිති වේ.

තෙළෙස් වන චාරිත්‍ර වගයි.

**1. යා පන භික්ඛුනී අගිලානා විසිබ්බනාපෙක්ඛා ජොතිං සමාදහෙය්‍ය වා සමාදහාපෙය්‍ය වා, අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා පාචිත්තියං.**

යම් මෙහෙණක් නො ගිලන් වුවං ගිනි තප්නා කැමැත්තී පහන් දැල්වීම් ඈ එබඳු කරුණක් නැති ව ගිනි දල්වා නම් පචිති වේ.

**2. යා පන භික්ඛුනී ඔරෙනද්ධමාසං නහායෙය්‍ය, අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං, තත්‍ථායං සමයො දියඩ්ඪො මාසො සෙසො ගිම්හානං වස්සානස්ස පඨමො මාසො ඉච්චෙතෙ අඩ්ඪතෙය්‍යමාසා උණ්හසමයො පරිළාහ සමයො ගිලාන සමයො කම්මසමයො අද්ධානගමනසමයො වාත-වුට්ඨි සමයො අයං තත්‍ථ සමයො**

යම් මෙහෙණක් අඩමසකින් මෙපිට නාන සමය තබා නා නම් පචිති වේ. එහි මේ සමය යි: ග්‍රීෂ්ම ඍතුවෙහි වූ අවසාන යෙළ මස (එනම් වෙසක් මස පසළොස්වක් දිය පෑළවිය පටන් ඇසළ මස මංසේ පෝය තෙක් මෙකී මාස එකහමාර) වශයෙන් ඇඳිත්වෙන උෂ්ණ සමය වස්සාන ඍතුයෙහි මුල්මාසය (ඇසළ මාසයේ මංසේ පෝය දිය පෑළවිය පටන් නිකිනි මස මංසේ පෝය තෙක් ගැනෙන) පරිළාහ සමය (ඇඟ දහය ඇති) සමය, ගිලන් සමය හැම දිමංදි කම්මාන්ත කරන සමය, අඩයොදුන් පමණ වූ හෝ දිග ගමනක් යා යුතු සමය, ධූලි සහිත වාතය නගින සමය යනු එහි සමය යි.

**3. නවං පන භික්ඛුනියා චීවර ලාභාය තිණ්ණං දුබ්බණ්ණකරණානං අඤ්ඤතරං දුබ්බණ්ණ කරණං ආදාතබ්බං නීලං වා කද්දමං වා කාළසාමං වා, අනාදා චෙ භික්ඛුනී තිණ්ණං දුබ්බණ්ණකරණානං අඤ්ඤතරං දුබ්බණ්ණ කරණං නවං චීවරං පරිභුඤ්ජෙය්‍ය පාචිත්තියං**

අළුත් සිවුරු ලැබූ මෙහෙණ විසින් නිල් හෝ මඩ හෝ අඟුරු දූලි ඈ කළුවක් හෝ යන තෙවැදෑරුම් දුර්වර්ණයන් අතුරින් එකකින් කප් බිඳු නො තබා අළුත් සිවුරක් පරි-භෝග කෙරේ නම් පචිති වේ.

**4 යා පන භික්ඛුනී භික්ඛුස්ස වා භික්ඛුනියා වා සික්ඛමානාය වා සාමණෙරස්ස වා සාමණෙරියා වා සාමං චීවරං වික්කප්පෙත්වා අපච්චුද්ධාරකං පරිභුඤ්ජෙය්‍ය පාචිත්තියං**

යම් මෙහෙණක් භික්ෂුවකට හෝ භික්ෂුණියකට හෝ සික්ඛමානාවකට හෝ සාමණේරයකුට හෝ සාමණේරියකට හෝ තොමෝම සිවුරක් විකප්පනය කොට ඔවුන් විසින් පච්චුද්ධරණය නො කොට පරිභෝග කෙරේ නම් පචිති වේ.

**5. යා පන භික්ඛුනී භික්ඛුනියා පත්තං වා චීවරං වා නිසීදනං වා සූචිඝරං වා කායබන්ධනං වා අපනිධෙය්‍ය වා අපනිධාපෙය්‍ය වා අන්තමසො හස්සාපෙක්ඛාපි පාචිත්තියං**

යම් මෙහෙණක් අන් මෙහෙණකගේ පාත්‍රය හෝ සිවුර හෝ නිසීදනය හෝ ඉදිකටු කුලාව හෝ පටිය හෝ යටත් පිරිසෙයින් කෙළි කැමැත්තෙන් හෝ සඟවා නම් හෝ අනුන් ලවා සඟවවා නම් හෝ පචිති වේ.

**6. යා පන භික්ඛුනී සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙය්‍ය පාචිත්තියං**

යම් මෙහෙණක් "මොහු මරමි"යි දැන දැන තිරිසන් සතකු ජීවිතයෙන් තොර කෙළේ නම් (මරා නම්) පචිති වේ.

**7. යා පන භික්ඛුනී ජානං සප්පාණකං උදකං පරිභුඤ්ජෙය්‍ය පාචිත්තියං**

යම් මෙහෙණක් පණුවන් සිටින බව දැනිමින් පණුවන් සහිත දිය පරිභෝග කෙරේ නම් පචිති වේ.

**8. යා පන භික්ඛුනී ජානං යථාධම්මං නිහතාධිකරණං පුනකම්මාය උක්කොටෙය්‍ය පාචිත්තියං**

යම් මෙහෙණක් දැන දැන ධර්මානුකූල වැ කෙළවර කරන ලද අධිකරණයක් නැවත විනිශ්චය පිණිස උගුළුවා නම් පචිති වේ.

9. යා පන භික්ඛුණී ජානං ථෙය්‍යසත්ථෙන සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය අන්තමසො ගාමන්තරම්පි පාචිත්තියං

යම් මෙහෙණක් දැන දැන හොර වෙළඳ මුලක් සමඟ බැණ ගෙන (කතාකර ගෙන) එක් දික් මඟකට යටත් පිරිසෙයින් ගමකින් ගමට හෝ යා නම් පචිති වේ.

10. යා පන භික්ඛුණී එවං වදෙය්‍ය තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා යෙ මෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා, තෙ පටිසෙවතො නාලං අන්තරායායාති, සා භික්ඛුණී භික්ඛුණීහි එවමස්ස වචනීයා "මායෙ එවං අවච, මා භගවන්තං අබ්භාචික්ඛි- න හි සාධු භගවතො අබ්භක්ඛානං, න හි භගවා එවං වදෙය්‍ය අනෙකපරියායෙන අය්‍යෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා, අලඤ්ච පන තෙ පටිසෙවතො අන්තරායායා" එවඤ්ච සා භික්ඛුණී භික්ඛුණීහි යාවතතියං සමනුභාසිතබ්බා තස්ස පටිනිස්සග්ගාය, යාවතතියඤ්චෙ සමනුභාසියමානා තං පටිනිස්සජ්ජෙය්‍ය, ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය පාචිත්තියං

යම් මෙහෙණක් "භාග්‍යවතුන් වහන්සේ විසින් ස්වර්ග මොක්‍ෂයනට අන්තරායකරය යි යම් ඒ ධර්ම කෙනෙනක් දෙශනා කරන ලදද, ඒ ධර්මයන් සෙවනය කිරීමෙන් ස්වර්ග මොක්‍ෂ බාධනයට නො සමත් බව මම දනිමි"යි කියා නම්, ඒ භික්‍ෂුණියට සෙසු භික්‍ෂුණීන් විසින් "ආර්යාවෙනි මෙසේ නො කියන්න. භාග්‍යවතුන් වහන්සේට අභිසවා නො- කියන්න. භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යානය නො මැනැවි භාග්‍යවතුන් වහන්සේ මෙසේ නො වදාරණ සේක. "ආර්යාවෙනි ස්වර්ග මෝක්‍ෂයනට අන්තරායකර ධර්මයෝ අන්තරායකරයහ" යි භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ලෙසින් දෙශනා කරන ලදහ"යි ඕහට කිය යුතුයි. සෙසු භික්‍ෂුණීන් විසින් මෙසේ කියද්දී ඒ මෙහෙණ උපර සේම දැඩි කොට ගෙන හිටි නම් භික්‍ෂුණීන් විසින්

තුන් වන වර දක්වා එය අත් හැරීම සඳහා සමනුභාෂනය කට යුත්තිය. තුන් වන වර දක්වා කියද්දී එය අත්හලේ නම් යෙහෙකි. නොම අත් හළේ නම් පචිති වේ.

තුදුස් වන ජොති වගයි.

---

1. යා පන භික්ඛුනී ජානං තථාවාදිනියා භික්ඛුනියා අකතානුධම්මාය තං දිට්ඨිං අප්පටිනිස්සට්ඨාය සද්ධිං සම්භුඤ්ජෙය්‍ය වා සංවසෙය්‍ය වා සහ වා සෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තියං

යම් මෙහෙණක් දැන දැන (යටැ සිකපදයෙහි කී පරිදි) වාද ඇති, භික්ෂුණී පිරිසට ඔසාරණ කර්මයෙන් ඇතුළත් කර නොගත්. ඒ දෘෂ්ටිය නොහළ මෙහෙණක සමග ආමිස සම්භොගයක් හෝ ධර්ම සම්භොගයක් හෝ කෙරේද විනය කර්මයක් හෝ කෙරේද එක ගෙයි සයනය හෝ කෙරේද පචිති වේ

2. සමණුද්දෙසාපි චෙ එවං වදෙය්‍ය තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි, යථා යෙ මෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා, තෙ පටිසෙවතො නාලං අන්තරායායාති'' සා සමණුද්දෙසා භික්ඛුනීහි එවමස්ස වචනීයා "මායය්‍ය සමණුද්දෙසෙ, එවං අවච මා භගවන්තං අබ්භාචික්ඛි, න හි සාධු භගවතො අබ්භක්ඛානං, න හි භගවා එවං වදෙය්‍ය අනෙකපරියායෙන අය්‍යෙ සමණුද්දෙසෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා, අලංච පන තෙ පටිසෙවතො අන්තරායායාති එවඤ්ච සා සමණුද්දෙසා භික්ඛුනීහි වුච්චමානා තථෙව පග්ගණ්හෙය්‍ය සා සමණුද්දෙසා භික්ඛුනීහි එවමස්ස වචනීයා "අජ්ජතග්ගෙ තෙ අය්‍යෙ සමණුද්දෙසෙ න චෙව සො භගවා සත්ථා අපදිසිතබ්බො, යම්පි චඤ්ඤා, සමණුද්දෙසා ලභන්ති භික්ඛුනීහි සද්ධිං දිරත්තතිරත්තං සහසෙය්‍යං, සාපි තෙ නත්ථි, චර පරෙ විනස්සාති'' යා පන භික්ඛුනී

ජානං තථා නාසිතං සමණුද්දෙසං උපලාපෙය්‍ය වා උපට්ඨාපෙය්‍ය වා සම්භුඤ්ජෙය්‍ය වා සහ වා සෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තියං

ඉදින් සාමණෙරියක් "භාග්‍යවතුන් වහන්සේ විසින් ස්වර්ග මොක්ෂයනට අන්තරායකරය යි යම් ඒ ධර්ම කෙනෙක් දෙශනා කරන ලද්ද, ඒ ධර්මයන් සෙවනය කිරීමෙන් ස්වර්ග මොක්ෂයන්ගේ අන්තරාය පිණිස නො සමත්ය යි මම දනිමි" යි කියා නම් ඒ සාමණෙරියට භික්ෂුණීන් විසින් "ආයුෂ්මතිනි, සාමණෙරිය, මෙසේ නො කියව භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යානය නොකරව භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යානය නො මැනවි. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නොවදාරණ සේක. "ආයුෂ්මතිනි, සාමණෙරිය, ස්වර්ග මොක්ෂයනට අන්තරායකර ධර්මයෝ අන්තරායකරයහ යි භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් අයුරින් දෙශනා කරන ලදහ" යි ඔහට කිය යුතුයි. භික්ෂුණීන් විසින් මෙසේ කියද්දිත් ඒ සාමණෙරිය එසේම දැඩිව ගෙන සිටී නම්, ඒ සාමණෙරියට භික්ෂුණීන් විසින් "ආයුෂ්මතිනි සාමණෙරිය, තී අද පටන් ඒ භාග්‍යවතුන් වහන්සේ ශාස්තෘ වශයෙන් නො ඇදහිය යුත්තාහ. සෙසු සාමණෙරියෝ භික්ෂුණීන් සමග එක සෙනස්නෙහි දෙතුන් රැයක් වසත්. තිට එය ද නැත. අපෙන් බැහැර වූ නැනැත්තිය, යව වැනසෙව යි කිය යුත්තිය. යම් මෙහෙණක් දැන දැන එසේ නාසිත සාමණෙරියක "පං සිවුරු දෙමි" යනාදි වශයෙන් සංග්‍රහ කෙරේ නම් හෝ, උවැටැන් කරවා ගනී නම් හෝ, එක ගෙයි සයනය කෙරේ නම් හෝ පචිති වේ.

3. යා පන භික්ඛුනී භික්ඛුනීහි සහධම්මිකං වුච්චමානා එවං වදෙය්‍ය "න තාවාහං අය්‍යෙ එතස්මිං සික්ඛාපදෙ සික්ඛිස්සාමි යාව න අඤ්ඤං භික්ඛුනිං ව්‍යත්තං විනයධරං පරිපුච්ඡාමී ති" පාචිත්තියං. සික්ඛමානාය භික්ඛවෙ භික්ඛුනියා අඤ්ඤාතබ්බං පරිපුච්ඡිතබ්බං පරිපඤ්හිතබ්බං අයං තත්ථ සාමීචි.

යම් මෙහෙණක් සෙසු භික්ෂුණීන් විසින් සිකපදය පෙන්වා අවවාද කරනු ලබන්නී ආයුෂ්මතියෙනි යම්තාක් ව්‍යක්ත විනයධර අන් භික්ෂුණියක ගෙන් අසන්නෙම් ද ඒ තාක් ඒ ශික්ෂාපදයෙහි නො හික්මෙන්නෙමැ යි කියා නම් පචිති වේ. මහණෙනි හික්මෙනු කැමැති භික්ෂුණිය විසින් වස්තු නිදනාදිය දත යුතුයි. නැවැත නැවැත පිළි විසිය යුතුයි. ප්‍රශ්න කට යුතුයි. මේ එහි වතයි.

4. යා පන භික්ඛුනී පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ එවං වදෙය්‍ය කිං පනිමෙහි ඛුද්දානුඛුද්දකෙහි සික්ඛාපදෙහි උද්දිට්ඨෙහි යාවදෙව කුක්කුච්චාය විහෙසාය විලෙඛාය සංවත්තන්තීති සික්ඛාපද විවණ්ණකෙ පාචිත්තියං

යම් මෙහෙණක් පාමොක් උදෙසන කල්හි "මේ කුදත් කුඩු සිකපද උදෙසීමෙන් කවර වැඩෙක් වේද? සැපදේ ඇසැපදේ යි උපදනා කුකුස පිණිස ත් විපිළිසරින් හට-ගන්නා පීඩාවට ත් විචිකිච්ඡා සංඛ්‍යාත මනොවිලෙඛයට ත් හේතු වෙයි කියා කියන්නී නම් සිකපදයට නින්දා කිරීමෙහි ලා පචිති වේ.

5. යා පන භික්ඛුනී අන්වද්ධමාසං පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ එවං වදෙය්‍ය "ඉදානෙව ඛො අහං අජානාමි අයම්පි කිර ධම්මො සුත්තාගතො සුත්තපරියාපන්නො අන්වද්ධමාසං උද්දෙසං ආගච්ඡතීති" තඤ්චෙ භික්ඛුනිං අඤ්ඤා භික්ඛුනියො ජානෙය්‍යුං නිසින්නපුබ්බං ඉමාය භික්ඛුනියා ද්වත්තික්ඛත්තුං පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ, කො පන වාදො භිය්‍යොති න ච තස්සා භික්ඛුනියා අඤ්ඤාණකෙන මුත්ති අත්ථි, යඤ්ච තත්ථ ආපත්තිං ආපන්නා තඤ්ච යථාධම්මො කාරෙතබ්බො; උත්තරිං චස්සා මොහො ආරොපෙතබ්බො තස්සා තෙ අය්‍යෙ අලාභා තස්සා තෙ දුල්ලද්ධං යං ත්වං පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ න සාධුකං අට්ඨිකත්වා මනසිකරොතීති ඉදං තස්මිං මොහනකෙ පාචිත්තියං

යම් මෙහෙණක් අඩමසක් පාසා පාමොක් උදෙසනු ලබන කල්හි "ආය්‍යාවෙනි, මේ ධර්මය සූත්‍රයෙහි ආයේල. සූත්‍රයට ඇතුළත් වූයේල, අඩමසක් පාසා උදෙසීමට ද එන්නේල, එහෙත් මා දන්නේ දැන් ය කියා කියා ද, (මෙසේ කී කල) ඒ භික්ෂුණිය පාමොක් දෙසද්දී දෙතුන් වරක් ම හුන් බව අනෙක් භික්ෂුණීහු දනිත් නම්, දෙතුන් දිනකට වඩා හුන්නාය යන මෙහි කියනුම කිම? ඒ මෙහෙණ හට නො දැනීම් හේතුවෙන් ඇවැතෙන් මිදීමක් නම් නැත. නොසම් කල ඒ අනාචාරයෙහි යම් ඇවතකට පැමිණියා ද, ඒ ඇවතට ද විනයානුකූල ව දඬුවම් කළ යුත්තේ ය.

නැවතත් ඒ මෙහෙණට මෙසේත් කියන්නට වරි.- "ආය්‍යාවනි පාමොක් දෙසන කල්හි ඔබ සිහි නුවණින් යුක්ත ව නො සිටියහ. එය ඔබට අලාභයෙකි. ඒ ඔබට මිනිස් කම ත් පැවිද්ද ත් දුලීහය. මෙසේ කියා මොහාරොපනය කළ යුතුයි. මොහාරොපනය කල කල්හි ත් මුළා බව පවසන ඒ භික්ෂුණිය කෙරෙහි මේ පචිතිය වේ.

6. යා පන භික්ඛුණී භික්ඛුණියා කුපිතා අනත්තමනා පහාරං දදෙය්‍ය පාචිත්තියං

යම් මෙහෙණක් කිපුණී නො සතුටු සිත් ඇත්නි අන් මෙහෙණකට ගසා නම් පචිති වේ.

7. යා පන භික්ඛුණී භික්ඛුණියා කුපිතා අනත්තමනා තලසත්තිකං උග්ගිරෙය්‍ය පාචිත්තියං

යම් මෙහෙණක් කිපුණී නො සතුටු සිත් ඇත්නි අන් මෙහෙණකට (ගැසීමට) අත උරුක්කරා නම් පචිති වේ.

8. යා පන භික්ඛුණී භික්ඛුණිං අමූලකෙන සඞ්ඝාදිසෙසෙන අනුද්ධංසෙය්‍ය පාචිත්තියං

යම් මෙහෙණක් අන් මෙහෙණකට අමූලක සඟ වෙසෙස් ඇවැතකින් චොදනා කෙරේ නම් පචිති වේ.

**9. යා පන භික්ඛුනී භික්ඛුනියා සඤ්චිච්ච කුක්කුච්චං උපදහෙය්‍ය ඉතිස්ස මුහුත්තම්පි අඵාසු භවිස්සතීති එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං පාචිත්තියං**

යම් මෙහෙණක් මෙසේ කල කල්හි මොහොට මොහොතක් හෝ අපහසු වන්නේය යි දැන දැන එයම සලකා අනෙකක් නොසලකා අන් මෙහෙණකට කුකුසක් ඇති කෙරේ නම් පචිති වේ.

**10. යා පන භික්ඛුනී භික්ඛුනීනං භණ්ඩනජාතානං කලහජාතානං විවාදාපන්නානං උපස්සුතිං තිට්ඨෙය්‍ය යං ඉමා භණිස්සන්ති තං සොස්සාමීති එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං පාචිත්තියං**

යම් මෙහෙණක් හටගත් භණ්ඩන ඇති, හටගත් කලහ ඇති, විරුඩ වාදයට පැමිණි භික්ෂුණීන්ගේ උපස්සුතියෙහි (තෙපුල් ඇසෙන මානෙහි) "මොවුහු යමක් කියත් නම් එය අසමු" යන එය ම තකා අනෙකක් නොසලකා සිටී නම් පචිති වේ,

පසළොස්වන දිටසි වර්ගය යි.

---

**1. යා පන භික්ඛුනී ධම්මිකානං කම්මානං ඡන්දං දත්වා පච්ඡා ඛීය්‍යනධම්මං ආපජ්ජෙය්‍ය පාචිත්තියං**

යම් මෙහෙණක් දැහැමි කමියනට ඡන්දය දී පසුව නුගුණ පහල කරයි නම් පචිති වේ.

**2. යා පන භික්ඛුනී සඞ්ඝෙ විනිච්ඡයකථාය වත්තමානාය ඡන්දං අදත්වා උට්ඨායාසනා පක්කමෙය්‍ය පාචිත්තියං**

යම් මෙහෙණක් සංඝයා අතර විනිශ්චය කථාවක් පවත්නා කල්හි ඡන්දය නොදී අසුනෙන් නැගිට යා නම් පචිති වේ.

3. යා පන භික්ඛුණී සමග්ගෙන සංඝෙන චීවරං දත්වා පච්ඡා ඛීය්‍යනධම්මං ආපජ්ජෙය්‍ය යථා සන්ථුතං භික්ඛුණී-යො සංඝිකං ලාභං පරිණාමෙන්තීති පාචිත්තියං

යම් මෙහෙණක් සංඝයා හා සමගි ව සිවුරක් දී පසුව "භික්ෂුණීහු සංඝික ලාභ තමන්ගේ විශ්වාසීන්ට දෙත්ය" යි නුගුණ පහළ කරා නම් පචිති වේ.

4. යා පන භික්ඛුණී ජානං සංඝිකං ලාභං පරිණතං පුග්ගලස්ස පරිණාමෙය්‍ය පාචිත්තියං

යම් මෙහෙණක් සංඝයාට පිරිණැමූ ලාභයක් ඒ බව දැනැ දැනැ පුද්ගලයකුට පිරිනමා නම් පචිති වේ.

5. යා පන භික්ඛුණී රතනං වා රතනසම්මතං වා අඤ්ඤත්‍ර අජ්ඣාරාමා වා අජ්ඣාවසථා වා උග්ගණ්හෙය්‍ය වා උග්ගණ්හාපෙය්‍ය වා පාචිත්තියං, රතනං වා පන භික්ඛුණියා රතන සම්මතං වා අජ්ඣාරාමෙ වා අජ්ඣාවසථෙ වා උග්ගහෙත්වා වා උග්ගණ්හාපෙත්වා වා නික්ඛිපි-තබ්බං, යස්ස භවිස්සති සො හරිස්සතීති අයං තත්ථ සාමීචි

යම් මෙහෙණක් මුතු මැණික් ඈ රත්නයක් හෝ රත්නය යි සම්මත වස්තුවක් හෝ ආරාමය ද වසන ගෙය ද හැර අන් තැනෙක්හි තිබී තොහොත් අවුලා ගති නම් හෝ අනුන් ලවා ගන්නවා නම් හෝ පචිති වේ. මෙහෙණ විසින් රත්නයක් හෝ රත්න සම්මතයක් හෝ ආරාමයෙහි හෝ වසන ගෙහි හෝ තිබී තොහොත් ගෙනැ හෝ අනුන් ලවා ගන්නවා හෝ යමකුගේ නම් හේ ගෙන යේවා යි සිතා තැන්පත් කොට තැබිය යුතු යි. මේ උහි වත යි.

6. යා පන භික්ඛුණී අට්ඨිමයං වා දන්තමයං වා විසාණමයං වා සූචිඝරං කාරාපෙය්‍ය භෙදනකං පාචිත්තියං

යම් මෙහෙණක් ඇටමුවා හෝ දළමුවා හෝ අංමුවා හෝ ඉඳිකුලාවක් කරවා නම් භෙදනක පාචිත්තියක් වේ. (එය බිඳ දමා පචිතිය දෙසා ගත යුතුයි.)

7. නවං පන භික්ඛුණියා මඤ්චං වා පීඨං වා කාරයමානාය අට්ඨඞ්ගුලපාදකං කාරෙතබ්බං සුගතඞ්ගුලෙන; අඤ්ඤත්‍ර හෙට්ඨිමාය අටනියා, තං අතික්කාමෙන්තියා ඡෙදනකං පාචිත්තියං

අළුත් ඇඳක් හෝ පුටුවක් කරවන මෙහෙණ විසින් සට විට්ටම හැර සුගත් අඟලෙන් අටඟුල් පා ඇත්තක් කර විය යුත්තේය. එය ඉක්මවන්නියට ඡේදනක පචිතියක් වේ.

8. යා පන භික්ඛුණී මඤ්චං වා පීඨං වා තූලොනද්ධං කාරාපෙය්‍ය උද්දාලනකං පාචිත්තියං

යම් මෙහෙණක් පුළුනින් පුරවං (කුමින්) කළ ඇඳක් හෝ පුටුවක් කරවං නම් උද්දාලනක පචිතියක් වේ. (ඒ පුළුන් උදුරා දමා පචිතිය දෙසා ගත යුතු හෙයින් මේ නම් වී)

9 කණ්ඩුපටිච්ඡාදිං පන භික්ඛුණියා කාරයමානාය පමාණිකා කාරෙතබ්බා, තත්‍රිදං පමාණං: දීඝසො චතස්සො විදත්ථියො සුගතවිදත්ථියා, තිරියං ද්වෙ විදත්ථියො තං අතික්කාමෙන්තියා ඡෙදනකං පාචිත්තියං

කණ්ඩු පටිච්ඡාදනයක් (වණ - පිළිකා ආදි තුවාළ වැසීමට රෙදි කඩක්) තනවන මෙහෙණ විසින් ප්‍රමාණ යුත්තක් කොට කරවිය යුතුයි. එහිලා මේ පමණි. දිගින් සුගත් වියතින් දෙවියතකි. සරස දෙවියතකි. ඒ ගණන ඉක්මවන මෙහෙණ හට පචිති වේ.

10. යා පන භික්ඛුණී සුගතචීවරප්පමාණං චීවරං කාරාපෙය්‍ය අතිරෙකං වා ඡෙදනකං පාචිත්තියං; තත්‍රිදං සුගතචීවරප්පමාණං: දීඝසො නව විදත්ථියො සුගතවිදත්ථියා, තිරියං ඡ විදත්ථියො ඉදං සුගතස්ස සුගතචීවරප්පමාණං

යම් මෙහෙණක් සුගත් සිවුර පමණ සිවුරක් කරවං නම් ඡේදනක පචිතියක් වේ. එහිලා මේ සුගත් සිවුරේ ප්‍රමාණය යි. සුගත් වියතින් දිගින් නව වියතෙකි. සරස ස වියතකි. මේ සුගතයන් වහන්සේගේ සුගත් සිවුරේ පමණ යි.

සොළොස් වන ධම්මික වග යි.

එක්සිය සැටක් පචිති ඇවැත්හු නිමියහ.

# අට්ඨ පාටිදෙසනීයාපත්තීහු

1. යා පන භික්ඛුණී අගිලානා සප්පිං විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය පටිදෙසෙතබ්බං තාය භික්ඛුණියා, ගාරය්හං අය්‍යෙ ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමීති

යම් මෙහෙණක් නොගිලන් වූවා ගිතෙල් ඉල්ලා වළඳා නම් ඒ මෙහෙණ විසින් "ආයසීංවෙනි, නිඤ කටයුතු වූ අසත්ප්‍රාය වූ පාටිදෙසනීයාපත්තියකට පැමිණියෙමි. එය දෙශනා කරමි" යි දෙසිය යුතු යි.

2 යා පන භික්ඛුණී අගිලානා දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය පටිදෙසෙතබ්බං තාය භික්ඛුණියා "ගාරය්හං අය්‍යෙ ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටි-දෙසෙමී"ති

යම් මෙහෙණක් නොගිලන් වූවා දී ඉල්ලා වළඳා නම් ඒ මෙහෙණ විසින් "ආයසීංවෙනි නිඤකට යුතු වූ අසත්ප්‍රාය වූ පාටිදෙසනීයාපත්තියකට පැමිණියෙමි. එය දෙසමි" යි දෙසිය යුතුයි.

3. යා පන භික්ඛුණී අගිලානා තෙලං විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය පටිදෙසෙතබ්බං තාය භික්ඛුණියා ගාරය්හං අය්‍යෙ ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමී"ති

යම් මෙහෙණක් නොගිලන් වූවා තල තෙල් ඈ තෙල් ඉල්ලා වළඳා නම් ඒ මෙහෙණ විසින් "ආයසීංවෙනි නිඤ කටයුතු වූ අසත්ප්‍රාය වූ පාටිදෙසනීයාපත්තියකට පැමිණියෙමි. එය දෙශනා කරමි"යි කියා දෙසිය යුතුයි

4. යා පන භික්ඛුණී අගිලානා මධුං විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය පටිදෙසෙතබ්බං තාය භික්ඛුණියා "ගාරය්හං අය්‍යෙ ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමී"ති.

යම් මෙහෙණක් නොගිලන් වූවා මී ඉල්ලා වළඳා නම් ඒ මෙහෙණ විසින් "ආර්යාවෙනි, නින්ද කටයුතු වූ අසත්-ප්‍රාය වූ පාටිදේසනීයාපත්තියකට පැමිණියෙමි එය දේශනා කරමි"යි කියා දෙසිය යුතු.

**5. යා පන භික්ඛුනී අගිලානා නවනීතං විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය පටිදෙසෙතබ්බං තාය භික්ඛුනියා "ගාරය්හං අය්‍යෙ ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමී"ති.**

යම් මෙහෙණක් නොගිලන් වූවා වෙඬරු ඉල්ලා වළඳා නම් ඒ මෙහෙණ විසින් "ආර්යාවෙනි නින්ද කටයුතු වූ අසත්ප්‍රාය වූ පාටිදේසනීයාපත්තියකට පැමිණියෙමි. එය දේශනා කරමි"යි කියා දෙසිය යුතු.

**6. යා පන භික්ඛුනී අගිලානා මච්ඡං විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය පටිදෙසෙතබ්බං තාය භික්ඛුනියා "ගාරය්හං අය්‍යෙ ධම්මං ආපජ්ජිං අසප්පායං තං පටිදෙසෙමී"ති.**

යම් මෙහෙණක් නොගිලන් වූවා මාළු ඉල්ලා වළඳා නම් ඒ මෙහෙණ විසින් "ආර්යාවෙනි නින්ද කටයුතු වූ අසත්ප්‍රාය වූ පාටිදේසනීයාපත්තියකට පැමිණියෙමි එය දේශනා කරමි"යි කියා දෙසිය යුතු යි.

**7. යා පන භික්ඛුනී අගිලානා මංසං විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය පටිදෙසෙතබ්බං තාය භික්ඛුනියා "ගාරය්හං අය්‍යෙ ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමී"ති.**

යම් මෙහෙණක් නොගිලන් වූවා මස් ඉල්ලා වළඳා නම් ඒ මෙහෙණ විසින් "ආර්යාවෙනි නින්ද කටයුතු වූ අසත්-ප්‍රාය වූ පාටිදේසනීයාපත්තියකට පැමිණියෙමි. එය දේශනා කරමි"යි කියා දෙසිය යුතුයි.

**8. යා පන භික්ඛුනී අගිලානා ඛීරං විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය පටිදෙසෙතබ්බං තාය භික්ඛුනියා "ගාරය්හං**

අගෙය්‍ය ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමි'' ති.

යම් මෙහෙණක් නොගිලන් වුවා කිරි ඉල්ලා වළඳ නම් ඒ මෙහෙණ විසින් "අංගනාවෙනි නිඤ කටයුතු වූ අසත්‍ර්‍යං වූ පාංටිදෙසනීයාපත්තියකට පැමිණියෙමි. එය දෙශනාං කරමි'' කියා දෙසිය යුතුයි.

පාටිදෙසනීයාපත්ති අට නිමියේ ය.

---

## සෙඛියා

භික්ෂුකි ප්‍රාතිමොක්ෂයෙහි සෙඛියාධම් පන්සැත්තෑවක් දක්වා තිබේ. එහෙත් සෙඛියාවෝ (හික්මිය යුතු ශික්ෂාවෝ) එපමණක් නොවෙති. මෙහි සඳහන් නොවන වත්තක්ඛන්ධක යෙහි ලා ගැනෙන ආගන්තුක වත් නේවාසික වත් ආදි සියලුම වත් හික්මිය යුතු හෙයින් සෙඛියා ගණයට ඇතුළත් වේ. සෙඛියා බිඳීම නිසා දුකුළා ඇවැත් අවදී.

1 "පරිමණ්ඩලං නිවාසෙස්සාමී'' ති සික්ඛා කරණීයා (1)

"හාත්පසින් වට කොට අඳනය අඳිමි"යි හික්මිය යුතුයි.

2. "පරිමණ්ඩලං පාරුපිස්සාමි'' ති සික්ඛා කරණීයා (2)

"හාත් පසින් වට කොට සිවුරු පොරවමි'' යි හික්මිය යුතු.

3. "සුපටිච්ඡන්නො අන්තරඝරෙ ගමිස්සාමි'' ති සික්ඛා කරණීයා (3)

"සුපිළිසත් ව කය වසා ඇතුළු ගම්හි යන්නෙමි'' යි හික්මිය යුතු.

4. "සුපටිච්ඡන්නො අන්තරඝරෙ නිසීදිස්සාමි'' ති සික්ඛා කරණීයා (4)

"සුපිළිසත් ව කය වසා ඇතුළු ගම්හි හිඳින්නෙමි'' යි හික්මිය යුතු.

5. "සුසංවුතො අන්තරඝරෙ ගමිස්සාමි" ති සික්ඛා කරණීයා (5)

"අත් පා නො නටවා සංවරණය කැර ගත් ඉන්ද්‍රිය ඇති ව ඇතුළු ගම්හි යන්නෙමි" යි හික්මිය යුතු.

6. "සුසංවුතො අන්තරඝරෙ නිසීදිස්සාමි" ති සික්ඛා කරණීයා (6)

"අත් පා නො නටවා දමනය කැරැ ගත් ඉඳුරන් ඇතිව ඇතුළු ගම්හි හිඳින්නෙමි"යි හික්මිය යුත්තිය.

7. "ඔක්ඛිත්තචක්ඛු අන්තරඝරෙ ගමිස්සාමි" ති සික්ඛා කරණීයා (7)

"යට හෙළූ ඇස් ඇති ව ඇතුළු ගම්හි යන්නෙමි" යි හික්මිය යුතුයි.

8. ඔක්ඛිත්තචක්ඛු අන්තරඝරෙ නිසීදිස්සාමි" ති සික්ඛාකරණීයා (8)

"යට හෙළූ ඇස් ඇති ව ඇතුළු ගම්හි හිඳිමි" යි හික්මිය යුත්තිය.

9. "න උක්ඛිත්තකාය අන්තරඝරෙ ගමිස්සාමි" ති සික්ඛාකරණීයා (9)

"සිවුර ඔසවා ගැනීමෙන් ඇතුළු ගම්හි නො යමි" යි හික්මිය යුතු.

10. "න උක්ඛිත්තකාය අන්තරඝරෙ නිසීදිස්සාමි" ති සික්ඛාකරණීයා (10)

"සිවුර ඔසවා ගැනීමෙන් ඇතුළු ගම්හි නො හිඳිමි" යි හික්මිය යුතුයි.

පළමුවන පරිමණ්ඩල වගයි.

---

1 "න උජ්ජග්ඝිකාය අන්තරඝරෙ ගමිස්සාමි" ති සික්ඛාකරණීයා (11)

"මහ සිනා ඇතිව ඇතුළු ගම්හි නොයමි" යි හික්මිය යුතුයි.

**2. "න උජ්ජග්ඝිකාය අන්තරඝරෙ නිසීදිස්සාමී" ති සික්ඛාකරණීයා** (12)

"මහ සිනා ඇතිව ඇතුළු ගම්හි නො හිඳිමි" යි හික්මිය යුතුයි.

**3. "අප්පසද්දො අන්තරඝරෙ ගමිස්සාමී" ති සික්ඛාකරණීයා** (13)

"දෙලොස් රියනකින් දුර ඇසෙන ශබ්ද කෙරෙමින් ඇතුළු ගම්හි නො යමි" යි හික්මිය යුතුයි.

**4. "අප්පසද්දො අන්තරඝරෙ නිසීදිස්සාමී" ති සික්ඛාකරණීයා** (14)

"දෙලොස් රියනකින් දුර ඇසෙන ශබ්ද කරමින් ඇතුළු ගම්හි හිඳිමි" යි හික්මිය යුතුයි.

**5. "න කායප්පචාලකං අන්තරඝරෙ ගමිස්සාමී" ති සික්ඛාකරණීයා** (15)

"කය සොලවමින් ඇතුළු ගම්හි නොයමි" යි හික්මිය යුතුයි.

**6. "න කායප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමී" ති සික්ඛාකරණීයා** (16)

"කය සොලවමින් ඇතුළු ගම්හි නො හිඳිමි" යි හික්මිය යුතුයි.

**7. "න බාහුප්පචාලකං අන්තරඝරෙ ගමිස්සාමී" ති සික්ඛාකරණීයා** (17)

"අත සොලවමින් ඇතුළු ගම්හි නො යමි" යි හික්මිය යුතුයි.

**8. "න බාහුප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමී" ති සික්ඛාකරණීයා** (18)

"අත සොලවමින් ඇතුළු ගම්හි නො හිඳිමි" යි හික්මිය යුතුයි.

**9. "න සීසප්පචාලකං අන්තරඝරෙ ගමිස්සාමි" ති සික්ඛාකරණීයා** (19)

"හිස සලමින් ඇතුළු ගම්හි නොයමි"යි හික්මිය යුතු යි.

**10. "න සීසප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමි" ති සික්ඛාකරණීයා** (20)

"හිස සලමින් ඇතුළු ගම්හි නොහිඳිමි" යි හික්මිය යුතුයි.

**දෙවන උජ්ජග්ඝික වගයි.**

---

**1. "න ඛම්භකතො අන්තරඝරෙ ගමිස්සාමි" ති සික්ඛාකරණීයා** (21)

"උකුලෙහි අත් තබා ඇතුළු ගම්හි නොයමි" යි හික්මිය යුතුයි.

**2. "න ඛම්භකතො අන්තරඝරෙ නිසීදිස්සාමි" ති සික්ඛාකරණීයා** (22)

"උකුලෙහි අත් තබා ඇතුළු ගම්හි නොහිඳිමි"යි හික්මිය යුතුයි.

**3. "න ඔගුණ්ඨිතො අන්තරඝරෙ ගමිස්සාමි" ති සික්ඛාකරණීයා** (23)

"හිස වසා පොරොවා ඇතුළු ගම්හි නොයමි" යි හික්මිය යුතුයි.

**4. "න ඔගුණ්ඨිතො අන්තරඝරෙ නිසීදිස්සාමි" ති සික්ඛාකරණීයා** (24)

"හිස වසා පොරොවා ඇතුළු ගම්හි නොහිඳිමි"යි හික්මිය යුතුයි.

**5. "න උක්කුටිකාය අන්තරඝරෙ ගමිස්සාමි" ති සික්ඛාකරණීයා** (25)

"විළුඹ හෝ අක් පතුල හෝ බිම අනිවින් ඇතුළු ගම්හි නොයමි" යි හික්මිය යුතුයි.

6. "න පල්ලත්ථිකාය අන්තරඝරෙ නිසීදිස්සාමී" ති සික්ඛාකරණීයා (26)

"අත් දෙකින් හෝ වස්ත්‍රයෙන් හෝ දෙදණ එල්ලා ගෙන ඇතුළු ගම්හි නො හිඳිමි" යි හික්මිය යුතු යි.

7. "සක්කච්චං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමී" ති සික්ඛාකරණීයා (27)

"සකස් (සිහි ඇතිව) පිණ්ඩපාතය පිළිගනිමි" යි හික්මිය යුතු.

8. "පත්තසඤ්ඤී පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමී" ති සික්ඛාකරණීයා (28)

"පාත්‍රයෙහි පිහිටුවා ගත් සිහි ඇතිව පිණ්ඩපාතය පිළිගනිමි" යි හික්මිය යුතු යි.

9. "සමසූපකං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමී" ති සික්ඛාකරණීයා (29)

"සම වූ (බතෙන් සතරෙන් කොටසක් ව්‍යඤ්ජනයෙන් යුක්තව) පිණ්ඩපාතය පිළිගනිමි" යි හික්මිය යුතු යි.

10 "සමතිත්තිකං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමී" ති සික්ඛාකරණීයා (30)

"අධිෂ්ඨිත පාත්‍රයෙහි ඇතුළු මුවවිට නො ඉක්මවා පිණ්ඩපාතය පිළිගනිමි" යි හික්මිය යුතු යි.

තුන්වන ඛම්භකත වග යි.

---

1. "සක්කච්චං පිණ්ඩපාතං භුඤ්ජිස්සාමී" ති සික්ඛාකරණීයා (31)

"සකස් (ප්‍රත්‍යවේක්ෂා කොට) පිණ්ඩපාතය වළඳමි" යි හික්මිය යුතු.

2. "පත්තසඤ්ඤී පිණ්ඩපාතං භුඤ්ජිස්සාමී" ති සික්ඛාකරණීයා (32)

"පාත්‍ර ගත සංඥා ඇතිව, පිණ්ඩපාතය වළඳමි" යි හික්මිය යුතු යි.

3. ‘‘සපදානං පිණ්ඩපාතං භුඤ්ජිස්සාමී’’ ති සික්ඛා කරණීයා (33)

‘‘ගෙපිළිවෙලින් පිඩු සිඟා වළඳමි’’ යි හික්මිය යුතුයි.

4 ‘‘සමසූපකං පිණ්ඩපාතං භුඤ්ජිස්සාමී’’ ති සික්ඛා කරණීයා (34)

‘‘බතට සුදුසු පමණ ව්‍යඤ්ජන සහිතව පිණ්ඩපාතය වළඳමි’’ යි හික්මිය යුතුයි.

5. ‘‘න ථූපකතො ඔමද්දිත්වා පිණ්ඩපාතං භුඤ්ජිස්සාමී’’ ති සික්ඛාකරණීයා (35)

‘‘බත් මුදුනෙන් ගනා පිණ්ඩපාතය නො වළඳමි’’ යි හික්මිය යුතුයි.

6. ‘‘න සූපං වා ව්‍යඤ්ජනං වා ඔදනෙන පටිච්ඡාදෙස්සාමී’’ ති භිය්‍යොකම්‍යතං උපාදායාති සික්ඛා කරණීයා (36)

‘‘වැඩියක් ලබා ගනු කැමැත්තෙන් මුද්ග සූපාදියක් හෝ සෙසු ව්‍යඤ්ජනයක් හෝ බතින් වසා නොගනිමි’’ යි හික්මිය යුතු.

7 ‘‘න සූපං වා ඔදනං වා අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සාමී’’ ති සික්ඛාකරණීයා (37)

‘‘නොගිලන්ව සූපයක් හෝ ඔදනයක් හෝ තමාගේ ප්‍රයෝජනයට ඉල්ලා ගෙන නො වළඳමි’’ යි හික්මිය යුතු.

8. ‘‘න උජ්ඣානසඤ්ඤී පරෙසං පත්තං ඔලොකෙස්සාමී’’ ති සික්ඛාකරණීයා (38)

‘‘නුගුණ කියනු රිසි ඇතිව අනුන්ගේ පාත්‍රය නොබලමි’’ යි හික්මිය යුතුයි.

9. ‘‘නාතිමහන්තං කබලං කරිස්සාමී’’ ති සික්ඛා කරණීයා (39)

‘‘ඉතා මහත් වූ බත් පිඩු නො කරමි’’ යි හික්මිය යුතුයි.

10. "පරිමණ්ඩලං ආලොපං කරිස්සාමී" ති සික්ඛා කරණීයා (40)

"හාත් පසින් වට කොට බත් පිඩු කරමි" යි හික්මිය යුතුයි.

සතර වැනි සක්කච්ච වගයි.

---

1. "න අනාහටෙ කබළෙ මුඛද්වාරං විවරිස්සාමී" ති සික්ඛා කරණීයා (41)

"බත්පිඩ කටට ගෙන ඒමට කලින් කට නො අරිමි" යි හික්මිය යුතුයි.

2. "න භුඤ්ජමානො සබ්බං හත්ථං මුඛෙ පක්ඛිපිස්සාමී" ති සික්ඛා කරණීයා (42)

"වළඳමින් මුළු අත කටේ නො දමමි" යි හික්මිය යුතු.

3. "න සකබළෙන මුඛෙන බ්‍යාහරිස්සාමී" ති සික්ඛා කරණීයා (43)

"කෑම කටේ තබා ගෙන කතා නො කරමි" යි හික්මිය යුතු

4. "න පිණ්ඩුක්ඛෙපකං භුඤ්ජිස්සාමී" ති සික්ඛා කරණීයා (44)

"බත් පිඩු කටට වීසි කරමින් නො බුදිමි" යි හික්මිය යුතු.

5. "න කබළාවච්ඡෙදකං භුඤ්ජිස්සාමී" ති සික්ඛා කරණීයා (45)

"බත් පිඩු කඩ කඩා නොබුදිමි" යි හික්මිය යුතු.

6. "න අවගණ්ඩකාරකං භුඤ්ජිස්සාමී" ති සික්ඛා කරණීයා (46)

"වඳුරන් මෙන් කටෙහි කෑම රැස්කර තබා ගෙන නො බුදිමි" යි හික්මිය යුතු.

7. "න හත්ථනිද්ධූනකං භුඤ්ජිස්සාමී" ති සික්ඛා කරණීයා (47)

"අත ගසා දමා දමා නො වළඳමි" යි හික්මිය යුතු.

8. "න සිත්ථාවකාරකං භුඤ්ජිස්සාමි" ති සික්ඛා-කරණීයා (48)

"බත් උළු ඉසිමින් නො වළඳමි"යි හික්මිය යුතු.

9. "න ජිව්හානිච්ඡාරකං භුඤ්ජිස්සාමි" ති සික්ඛා-කරණීයා (49)

"දිව එළියට අදිමින් නො වළඳමි"යි හික්මිය යුතුයි.

10. "න චපුචපුකාරකං භුඤ්ජිස්සාමි" ති සික්ඛා කරණීයා (50)

"චපු චපු යන හඬ ඇති කරමින් නො වළඳමි" යි හික්මිය යුතුයි.

පස්වන කබල වගයි.

---

1. "න සුරු සුරු කාරකං භුඤ්ජිස්සාමි" ති සික්ඛා-කරණීයා (51)

"සුරු සුරු යන හඬ ඇති කරමින් නො වළඳමි" යි හික්මිය යුතු.

2. "න හත්ථනිල්ලෙහකං භුඤ්ජිස්සාමි" ති සික්ඛා-කරණීයා (52)

"අත ලෙවමින් නො වළඳමි"යි හික්මිය යුතු.

3. "න පත්තනිල්ලෙහකං භුඤ්ජිස්සාමි" ති සික්ඛා-කරණීයා (53)

"පාත්‍රය ලෙවමින් නො වළඳමි"යි හික්මිය යුතු.

4. "න ඔට්ඨනිල්ලෙහකං භුඤ්ජිස්සාමි" ති සික්ඛා-කරණීයා (54)

"තොල් ලෙවමින් නො වළඳමි"යි හික්මිය යුතු.

5. "න සාමිසෙන හත්ථෙන පානීයථාලකං පටිග්ගහෙස්සාමි" ති සික්ඛාකරණීයා (55)

"ඉඳුල් සහිත අතින් පැන් භාජනය නො පිළිගනිමි"යි හික්මිය යුතු.

6. "න සසිත්ථකං පත්තධොවනං අන්තරඝරෙ ඡඩ්ඩෙස්සාමී" ති සික්ඛාකරණීයා (56)

"පාත්‍රය සෝදූ ඉඳුල් සහිත දිය ඇතුළු ගම්හි නො-දමමි" යි හික්මිය යුතු.

7. "න ඡත්තපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සා-මී" ති සික්ඛාකරණීයා (57)

"කුඩයක් අතේ ඇති නොගිලනාට බණ නො කියමි" යි හික්මිය යුතු.

8. "න දණ්ඩපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සා-මී" ති සික්ඛාකරණීයා (58)

"සැරයටියක් අතින් ගත් නොගිලනාට බණ නො-කියමි" යි හික්මිය යුතු.

9. "න සත්ථපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සා-මී" ති සික්ඛාකරණීයා (59)

"කඩු ආදී ආයුධ අතින් ගත් නො ගිලනාට බණ නො කියමි" යි හික්මිය යුතු.

10. "න ආවුධපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී" ති සික්ඛාකරණීයා (60)

"දුනු ආදි ආයුධ අතින් ගත් නො ගිලනාට බණ නො-කියමි" යි හික්මිය යුතුයි.

සවන සුරු සුරු වගයි.

---

1. "න පාදුකාරූළ්හස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සා-මී" ති සික්ඛාකරණීයා (61)

"කණ්ඩපාදුකාදි පාදුකාවයක්හි නැඟුණාවූ නො ගිලනා හට බණ නො දෙසමි" යි හික්මිය යුතුයි.

2. "න උපාහනාරූළ්හස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී" ති සික්ඛාකරණීයා (62)

"වහන් පයැ ලූ නොගිලනා හට බණ නො දෙසමි" යි හික්මිය යුතු.

3. "න යානගතස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී" ති සික්ඛාකරණීයා (63)

"රියට නැගී නොගිලනාට බණ නොදෙසමි"යි හික්මිය යුතු.

4. "න සයනගතස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සා-මී" ති සික්ඛාකරණීයා (64)

"නිදනා ඇඳට නැගී නොගිලනාට බණ නොකියමි"යි හික්මිය යුතුයි.

5. "න පල්ලත්ථිකාය නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී" ති සික්ඛාකරණීයා (65)

"අත් දෙකින් හෝ වස්ත්‍රයෙන් හෝ දෙදණ එල්ලා ගෙන සිටින නොගිලනාට බණ නොකියමි" යි හික්මිය යුතුයි.

6. "න වෙඨිතසීසස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සා-මී" ති සික්ඛාකරණීයා (66)

"හිස් වෙළුම් වෙළූ නොගිලනාට බණ නොකියමි"යි හික්මිය යුතුයි.

7. "න ඔගුණ්ඨිතසීසස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී" ති සික්ඛාකරණීයා (67)

"හිස වසා පොරවන ලද නොගිලනාට බණ නො-කියමි" යි හික්මිය යුතුයි.

8. "න ඡමාය නිසීදිත්වා ආසනෙ නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී" ති සික්ඛාකරණීයා (68)

"බිම හිඳ අසුන්හි හුන් නොගිලනාට බණ නොකියමි"යි හික්මිය යුතුයි.

9. "න නීචෙ ආසනෙ නිසීදිත්වා උච්චෙ ආසනෙ නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී" ති සික්ඛා-කරණීයා (69)

''මිටි අසුන්හි හිඳ උස් අසුන්හි හුන් නොගිලනාට බණ නොකියමි''යි හික්මිය යුතු.

10. ''න ඨිතො නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමි'' ති සික්ඛාකරණීයා (70)

''හිටුවනින් සිට අසුන්හි හුන් නොගිලනාට බණ නොකියමි''යි හික්මිය යුතුයි.

11. ''න පච්ඡතො ගච්ඡන්තො පුරතො ගච්ඡන්තස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමි'' ති සික්ඛාකරණීයා (71)

''පස්සෙන් යන්නී ඉදිරියෙන් යන නොගිලනාට බණ නොකියමි''යි හික්මිය යුතුයි.

12. ''න උප්පථෙන ගච්ඡන්තො පථෙන ගච්ඡන්තස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමි'' ති සික්ඛාකරණීයා (72)

''නොමගින් යන්නී මගින් යන නොගිලනාට බණ නොකියමි''යි හික්මිය යුතු.

13. ''න ඨිතො අගිලානො උච්චාරං වා පස්සාවං වා කරිස්සාමි'' ති සික්ඛාකරණීයා (73)

''නොගිලන්ව හිටුවනින් සිටගෙන මළ මූ කිස නො-කරමි''යි හික්මිය යුතුයි.

14. ''න හරිතෙ අගිලානො උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරිස්සාමි'' ති සික්ඛාකරණීයා (74)

''නොගිලන් වූවං නිල් තණ ඇති බිමෙහි මළ-මූ කිස හෝ කෙළ ගැසීම හෝ නොකරමි''යි හික්මිය යුතුයි.

15. ''න උදකෙ අගිලානො උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරිස්සාමි'' ති සික්ඛාකරණීයා (75)

''නොගිලන් වූවං දියෙහි මළ-මූ කිස හෝ කෙළ ගැසීම හෝ නොකරමි''යි හික්මිය යුතු

සත් වන පාදුකා වගයි.

---

# සප්ත අධිකරණ සමථයෝ

විවාදධිකරණ - අනුවාදධිකරණ - ආපත්තාධිකරණ - කිච්චාධිකරණ යි අධිකරණයෝ සතර දෙනෙකි. මේ සතර දෙනා අතුරෙන් විවාදධිකරණය නම්: මේ ධර්මය, මේ අධර්මය, යනාදි විශයෙන් අටළොස් භෙද කර වස්තූන් පිළිබඳ හටගත් විරුද්ධ වාදය යි.

ශිල - ආචාර - ආජීව විපත්ති නිසා පහළ වූ අනුවාද - උපවාද - චොදනා යන මොවුහු අනුවාදධිකරණ නමි.

සප්තාපත්ති ස්කන්ධයන් හේතුකොට ගෙන පවත්නා අධිකරණය ආපත්තාධිකරණ නමි.

අපලොකනාදි සිව්වැදෑරුම් කම් හේතුකොට පවත්නා අධිකරණය කිච්චාධිකරණ නමි.

මේ සතර අධිකරණයන් සමථයට අවශ්‍ය වන්නා වූ සම්මුඛාවිනයාදි සත අධිකරණ සමථ නමි. ඒ මෙසේ යි:

**උප්පන්නුප්පන්නානං අධිකරණානං සමථාය වූපසමාය සම්මුඛාවිනයො දාතබ්බො, සතිවිනයො දාතබ්බො, අමූළ්හවිනයො දාතබ්බො, පටිඤ්ඤාය කාරෙතබ්බො, යෙභුය්‍යසිකා තස්සපාපිය්‍යසිකා, තිණවත්ථාරකොති**

උපන් උපන් අධිකරණයන් ගේ සංසිඳවීම පිණිස ව්‍යපසමය පිණිස 1. සම්මුඛා විනයය දිය යුතුයි. 2. සති විනයය දිය යුතු. 3. අමූළ්හවිනයය දිය යුතු. 4. ප්‍රතිඥයෙන් (ඇවතින්) කට යුතුයි. 5. යෙභුය්‍යසිකායෙන් කට යුතුයි. 6. තස්ස පාපිය්‍යසිකා සමථය කට යුතුයි. 7. තිණවත්ථාරකය කට යුතුයි.

භික්ෂු ප්‍රාතිමොක්ෂය නිමියේ ය.

# බුද්ධාගමයෙන් ස්ත්‍රීනට සිදුවූ යහපත

බුදුරජාණන් වහන්සේ ලොවැ පහළ වන විට ස්ත්‍රී පක්ෂය පුරුෂ පක්ෂයට හාත්පසින් ම යටත් වූවකි. එහෙයින් ම ස්ත්‍රීය පුරුෂයාගේ භාණ්ඩයක් මෙන් පරිහරණය කළ බව පෙනේ. පුරුෂ පක්ෂය උසස්ය. ස්ත්‍රී පක්ෂය ඉතා ම පහත් ය, අවාසනාවන්තය යන හින්දූන්ගේ අකාරුණික ඉගැන්වීම මෙසේ වීමට ප්‍රධාන හේතුවකි. මේ නිසා ස්ත්‍රීනට එද සමාජයෙහි කිසි තනතුරක් හිමිවූයේ නැත. සාමාජික අයිතියෙන් ද ස්ත්‍රිය වෙන් කොට තබන ලදී. ගැහැණු ළමයකු ඉපදීම පවුලේ අභාග්‍යය උදාවීමකැයි කල්පනා කළහ. වෙසෙසින් ම "කුළුඳුල් ළමයා ගැණු ළමයකු වූ විට ඒ පවුල පිරිහීම කරා ගමන් කරන කාලකණ්ණි පවුලකැ"යි ගණන් ගත්හ. ඉන්දියාවේ සිරිත් ගුරු කොට සැලකූ පෙරදිග සෙසු රටවලැ ද මේ මත මෙසේම ය. කුළුඳුල් ළමයා ගැණු ළමයකු වූ විට ඒ ළමයා රහසිගත ව ගඟට වීසිකිරීම හෝ මරාදැමීම චීනාදි ඇතැම් රටවලා මෑතක් වන තුරු පැවැති සිරිතකි

තත්කාලීන බ්‍රාහ්මණයෝ ද ස්ත්‍රීන්ගේ නිදහසට බාධා වන පරිදි ක්‍රියා කළහ. ළදරු කල්හි තමා හා විවාහ වූ තැනැත්තා මළාසින් පසු දිවි නසා ගැනීමටත් හැම දම කණවැන්දුම්ව විසීමටත් වැඩි යමක් කිරීමට ස්ත්‍රියට බලයක් තිබුණේ නැත. එසේ සැමියා මළ ස්ත්‍රිය මඟුල ප්‍රස්තාවයකට වැද්ද නොගත්හ. බමුණන්ගේ මෙහෙ කිරීමට ම යොදවා ගත්හ. එය පාපප්‍රවාහයට (පව් වැනැසී යෑමට) හේතු වන බව කියා පෑහ. ස්ත්‍රීනට ශිල්ප ශාස්ත්‍රාදිය ඉගෙනීමට සම්පූර්ණයෙන් ම අවහිර කළහ. සිඩස්ථානයකට ඇතුල් වන්නට වත් ඉඩ නොදුන්හ.

බුදුරජාණන් වහන්සේ පහළ වූවායින් පසු ස්ත්‍රියට ද පුරුෂයාට හිමි වැ තුබුණු තැනට නොදෙවැනි තැනක් ලබා දුන් සේක. භාර්යාව විසින් ස්වාමිපුරුෂයා කෙරෙහි

යුතුකම් පසක් කළ යුත්තාක් මෙන් ම ස්වාමිපුරුෂයා විසින් ද භාය්‍යාව කෙරෙහි යුතුකම් පසක් කළ යුතු බවත් නියම කළ සේක. පියා මෙන් ම මෑණියන් ද දූ දරුවනට එක සමාන බව පහද දෙමින් බුදුන් - රහතුන් හා මවු - පිය දෙදෙනා ය යන මේ සිවු තැන පින්කුඹුරු බව පවසා ඉතා ඉහළ ම තත්වය මෑණියන් හට ද දුන් සේක.

අන් සමයයන්හි යම් තැනක ස්ත්‍රීන් ගැන සඳහන් වේ නම්, එසේ සඳහන් කොට ඇත්තේ ස්ත්‍රීන්ගේ අයහපතට හේතුවීම පිණිස වූවකි. ස්ත්‍රීන්ගේ යහපතට හේතු වන හැම අව පෙළඹුදු සොයා ගැනීම අතිශයින් උගහටය. එහෙත් බුදු සමයෙහි ස්ත්‍රීපක්ෂය උදෙසා සප්තභාර්‍යා සූත්‍ර - සුමනා සූත්‍ර - ථේරී අපදාන - භික්ෂුණී සංයුත්ත - භික්ෂුණී විභඞ්ග ආදි නොයෙක් තන්හි අපමණ කරුණු ප්‍රකාශ කළ සේක.

තථාගතයන් වහන්සේගේ ශාසනය ප්‍රාසාදයකට රූපනය කළොත් ඒ බුදුසසුන් පහය දරා සිටුනා මහණ - මෙහෙණ - උවසු උවැසි යන මහ කුළුණු සතරින් මෙහෙණ උවැසි යන දෙකුළුණු මැ ස්ත්‍රීන් පිළිබඳවය. පිරිමිනට මෙන් ම ශාසන දායාදය ත් ශාසනික ස්ථානාන්තර ත් සමවැ දී වදළ සේක. මෙසේ තථාගතයන් වහන්සේ එකලැ පැවැති ඒ දුෂ්ඨ සමාජ චාරිත්‍රයනට හාත්පසින් ම විරුඬ වැ ක්‍රියා කළහ. ශිඛස්ථානයකට ඇතුළු වන්නට පවා ඉඩයක් නොලබා හුන් ස්ත්‍රීපක්ෂයට පූජ්‍ය තන්හි ලා සලකවන්නට මහණ උපසපුව ද දුන් සේක. නිවන් මඟ ද පෙන්වූ සේක. උන්වහන්සේ පෙන් වූ නිවන් මඟැ ගමන් කොට නිවන් වන් මෙහෙණ සමූහයා මෙතෙකැ යි පිරිසිඳිය නොහැකිය. ඒ රහත් මෙහෙණින් වහන්සේ අතුරෙන් කිප දෙනෙකුන් වහන්සේගේ සංක්ෂිප්ත චරිත කථාවෝ මෙහිලා පැවැසෙත්. ඒවා ස්ත්‍රීවර්ගයාගේ පමණක් නොවැ මුළු ලෝවැස්සාගේ ම ආදර්ශය පිණිස වෙත්වා!

---

# මහාප්‍රජාපතී ගෞතමී සද්විරාවෝ

මෝ තොමෝ පියුමතුරා බුදුරජාණන් වහන්සේ දවස හංසවතී නුවර එක් කුලයෙකැ උපන්නාය. නුවණ මුහුකුරා ගිය බී දිනක් තථාගතයන් වහන්සේ වෙත බණ ඇසීමට ගොස් සැදෑහැයෙන් බණ අසමින් සිටියා එක් මෙහෙණක බොහෝ කල් දන්නා මෙහෙණන් ගෙන් අග තනතුරෙහි තබනු දැක “මම ද මතු බුදුසසුනෙහි මේ මෙහෙණ මෙන් ම බොහෝ කල් දන්නා භික්ෂුණින් අතුරෙන් අග්‍රවන්නෙමැ”යි පතා දිවි පමණින් දන් දී සිල් රැක සප්ලකක් ගිය තැනේ දී බරණැස පන්සියක් දාසියනට අග්‍ර වැ උපන්නා ය. එකල්හි පසේ බුදුවරයෝ පස්නමක් නන්ද මූලක පබ්භාරයෙන් (නන්ද මූලක නම් කඳු බෑවුම්හි වූ ගුහාවෙන්) නික්මැ අහසින් අවුත් ඉසිපතනෙහි බැසැ, නුවර පිඬු සිඟා නැවැත ඉසිපතන් වැඩ, දවස් යැවූහ. වස් වසන දින ලංවත් ම සවස් වරුවෙකැ සෙනසුන් පිණිස කුටියක් පිළියෙල කැරගැනීමට අත්කම් ඉල්ලම්හ”යි පසේබුදුවරයෝ නුවරට පිවිස, එය සාර්ථක නොවී ආපසු වැඩම කළහ. ආපසු වඩනා ඔවුන් වහන්සේ දුටු දෙටු දාසිය පිරිවර දැසින් හා කථාකොට ඔවුන්ගේ ත් තමාගේ ත් සැමියන් යොදවා සක්මන් මළු ආදියෙන් අනූන කොට කුටි පසක් කරවා, පසේ බුදුන් වහන්සේලා පස් නම වස් වසවා මුරදන් දෙමින් උවැටැන් කළහ. යම් දිනෙක දනක් වැරැදුණි නම් ඒ හැම දනක් ම තොමෝ දුන්නාය. මෙසේ තෙමසක් උවටැන් කොට දෙටු දස් තොමෝ එකෙකී දාසක ලවා එකෙකී සළුවක් පිළියෙළ කැරවූ ය. දළ සළු පන්සියයක් වූයෙන් ඒ සියල්ල පරිවර්තනය කරවා පසේ බුදුන් පස්දෙනා වහන්සේට තුන් සිවුරු කොට දුන්හ. පසේ බුදුන් වහන්සේ ඔවුනට අනුමෝදනාවකි බණ වදරා ඔවුන් බලාසිටිය දී ම අහසින් ගන්ධමාදනයට වැඩි සේක. ඒ සියලු ස්ත්‍රීහු ම ඒ අත් බැව්හි සෙසු ත් නොයෙක් පින්කම් කොට මැරී දෙව්ලොවැ උපන්හ. ඔවුනතුරෙන් ප්‍රධාන දැසිය එයින් සැව බරණැසට නුදුරු තන්හි පෙහෙර ගමක පෙහෙර දෙටුවාණන්ගේ ගෙහි උපන

ඉක්බිති ඕ එක් දවසක් පද්මාවතියගේ පුත් පන්සියක් පසේ බුදුවරයන් දැක ඉමහත් සොම්නසට පත් වැ වැඳැ දන් දුන්නාය. ඒ පසේ බුදුනු බන්ඩිත කොට ගන්ධමාදන-යටම වැඩියාහ. ඕ ද සෙසු ත් නොයෙක් පින් දහම් කොට ඉන් සැව දෙව් මිනිස් ලෙව්හි සැරැ අප බුදුරජාණන් වහන්සේ ඉපදීමට පෙරාතුවැ ම දෙව්දහ නුවර මහා සුප්‍රබුඩ රජුගේ ගෙහි උපන්නාහ. මහාමායා දෙවියගේ කනිටු සොහොයුරිවැ උපන් ඕ ගෞතමී නම් වූවාය. මන්ත්‍ර හදුරණ බ්‍රාහ්මණයෝ ලකුණු විමසන්නාහු "මොවුන් දෙදෙනාගේ ම කුසැ උපන් දරුවෝ සක්විති වන්නාහ" යි ප්‍රකාශ කළහ. සුදෙවුන් රජ ඔවුන් වැඩි විය පත් කල්හි දෙදෙනා ම සරණ පාවා ගති. මෑත භාගයෙහි අප මහ බෝසතාණන් වහන්සේ තුසි පුරෙන් සැවැ මහාමායා දේවියගේ කුසැ උපන්හ. බෝසතුන් ඉපිද සත්දිනකින් මායා දේවිය කළුරිය කොට තුසි පුරයෙහි මාතෘ දිව්‍යරාජ නමින් උපන්හ. ඉන්පසු ගෞතමිය සුදෙවුන් රජුගේ අග මෙහෙසි වූ. එවිට නන්ද කුමාරයෝ උපන්හ. ගෞතමිය නන්ද කුමරු කිරිමවුනට දී සිදුහත් කුමරු සියතින් හද වඩා පොෂ්‍ය කළහ. පසු කාලයෙහි බෝසත්නු මහබිනික්මන් කොට බුදු වැ දම්සක් පවත්වා විනෙය ජනයන් හික්මවමින් විසල් පුරට පිවිස කූටාගාර ශාලාවෙහි වැඩ වාසය කරන කාලයෙහි සුදෙවුන් රජ සේසත යටැ රහත් බවට පැමිණ පිරිනිවියේ ය. ඉන්පසු ප්‍රජාපති ගෞතමිය පැවිදි වනු කැමැත්ති එක් වරක් පැවිද්ද ඉල්ලා නො ලැබැ දෙවැනි වරැ කෙස් කප්පවා කසාවත හැඳ කලහ විවාද සූත්‍රාන්ත දෙශනාවසානයෙහි පැවිදි වූ සැහැකුමරුන් පන්සිය දෙනාගේ බිරියන් ද පැවිදි වෙසින් සරසා ගෙන විසල් පුරයට ගොස් ආනන්ද තෙරුන් ලවා තථාගතයන් වහන්සේ යැද අෂ්ටගරු ධම්යෙන් පැවිද්ද ත් උපසම්පදාවත් ලැබූහ. මෙසේ උපසපන් වූ මහාප්‍රජාපතී ගෞතමිය පසුව තථාගතයන් වහන්සේ ගෙන් කමටහන් ගෙන රහත් වූහ. සෙසු පන්සියයක් භික්ෂුණීහු නන්දකා තෙරුන්ගේ

අවවාද අවසන්හි රහත් බවට පැමිණියහ. මෑත කාලයෙහි තථාගතයන් වහන්සේ භික්ෂූන් සථානාන්තරයෙහි තබන්නාහු මහාපජාපතී ගෞතමිය විරරාත්‍රඥ භික්ෂූන් අතුරෙහි අග්‍රස්ථානයෙහි තබා වදාළ සේක.

ඕ තොමෝ පලසුවෙන් හා නිවන් සුවෙන් කල් යවන්නාහු දිනක් කෘතඥතායෙහි පිහිටා තථාගතයන් වහන්සේගේ ගුණ පවසා තුති කරමින් මෙසේ රහත් බව හෙළි කළහ

**බුද්ධවීර නමොත්‍ථු - සබ්බසත්තාන මුත්තම**
**යො මං දුක්ඛා පමොචෙසි - අඤ්ඤං ච බහුකං ජනං**

යම් බුදු කෙනෙක් මා සසර දුකින් මුදවා ලූවාහු ද, සෙසුත් බොහෝ දෙන සසර දුකින් මුදවා ලූවාහු ද, හැම සත්ත්වයන් අතුරෙන් ශීලාදි ගුණයෙන් උත්තරීතර වූ බුද්ධවීරයන් වහන්ස, ඒ ඔබ වහන්සේට නමස්කාර වේවා!

**සබ්බ දුක්ඛං පරිඤ්ඤාතං - හෙතු තණ්හා විසොසිතා**
**අරියට්ඨඞ්ගිකො මග්ගො - නිරොධො ඵුසිතො මයා**

මා සියලු දුක් පිරිසිඳ දන්නා ලදී. දුකට හේතු වූ තෘෂ්ණාව වියලන ලදී. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ග සම්ප්‍රයුක්ත නිවන මා විසින් ස්පර්ශ කරණ ලදී.

**මාතා පුත්තො පිතා භාතා - අය්‍යකා ච පුරෙ අහුං**
**යථාභුච්චං අජානන්ති - සංසරිං අනිබ්බිසං**

යම් ජාතියෙක්හි දී එක් සත්ත්වයකු ගේ මවු වීද, නැවත ජාතියෙක්හි ඔහුට පුත් විය. නැවත භවයෙකැ ඔහුට ම පියා විය. ඉන් අනෙක් භවයෙකැ ඔහුට සහෝදර විය. ඉන් අන් ජාතියෙකැ ඔහුට ම මිත්තණී වූය. (මෙසේ මම නොයෙක් ලෙස උපන්මි.) මේ ආකාරයෙන් කිසි පිහිටක් නැති ව "සංසාරයාගේ පැවැත්මෙහි මුල භව තෘෂ්ණාවය" යි නොදැන සැරි සැරීමි.

**දිට්ඨො හි සො මෙ භගවා - අන්තිමොයං සමුස්සයො**
**වික්ඛීණො ජාතිසංසාරො - නත්ථි දානි පුනබ්භවො**

මා විසින් ඒ භාග්‍යවතුන් වහන්සේ නැතහොත් ධර්මකාය සම්පත්තිය නුවණැසින් දක්නා ලදහ. මේ අන්තිම ශරීරය යි. උත්පත්ති වශයෙන් හැසිරීම ක්ෂය කරන ලදී. දැන් නැවත ඉපදීමකු ත් නැත.

**ආරද්ධ විරියෙ පහිතත්තෙ - නිච්චං දළ්හපරක්කමෙ**
**සමග්ගෙ සාවකෙ පස්ස - එසා බුද්ධානවන්දනා**

පටන් ගත් වීර්‍ය ඇති, නිවන් කරා යැවූ සිත් ඇති, නොලද ගුණ දහම් ස්ථිර වැ තබාගැනීමට ත් දැඩි මහන්සි ගන්නා වූ සමගි ශ්‍රාවක සංඝයා දකිද, ඒ බුදුවරුන්ට කරන වන්දනාව යි.

**බහූනං වත අත්ථාය - මායා ජනයි ගොතමං**
**ව්‍යාධිමරණතුන්නානං - දුක්ඛක්ඛන්ධං ව්‍යපානුදි**

මහාමායා දේවී තොමෝ බොහෝ දෙනාගේ ප්‍රයෝජනය සඳහා ගෞතම බෝසතාණන් වහන්සේ ඉපද වූය. උන්වහන්සේ ව්‍යාධි මරණාදීන්ගෙන් පීඩිත වූ සත්ත්වයන්ගේ දුක් රැස දුරු කළ සේක.

මහාප්‍රජාපතී ගෞතමිය මෙසේ උදන් අනා සිය රහත් බව ප්‍රකාශ කළහ. ඉන් මෑත දී තථාගතයන් වහන්සේ වෛශාලියේ කූටාගාර ශාලාවෙහි වැඩ වාසය කරද්දී තොමෝ වෛශාලියෙහි ම භික්ෂුණී ආශ්‍රමයෙහි විසූ ය. දිනක් පෙරවරුවෙහි පිඬු සිගා වළඳා පල සමවත් සම වැද එයින් නැගිට "සිය ප්‍රතිපත්තිය කෙබඳුදැ" යි විමසා බලා ඉමහත් සොම්නස් වූවා කොතෙක් කල් ජීවිතය පවත්නේ දැ යි බැලූය. ඉක්බිති ආයු ගෙවී ගිය බව දැන මම විහාරයට ගොස් තථාගතයන් වහන්සේ වැඳ සමුගෙනැ තමා ගරු කරන තෙරවරුනට ත්, සමග බඹසර හැසිරෙන සෙසු මෙහෙණ සමූහයාට ත් දන්වා මෙහි ම අවුත් පිරිනිවන්

පාන්නෙමි නම් යහපතැ"යි සිතූ ප්‍රජාපතී ගෞතමී සථිරා-වනට මෙන් ම ඇගේ පිරිවර පන්සිය දෙනා වහන්සේට ත් මෙසේ අදහස් පහළ විය. ඒ අදහස් කීපයක් අපදාන පාලියෙන් ගෙන මෙහි බහාලනු ලැබේ.

**බුද්ධස්ස පරිනිබ්බාණං – සාවකග්ග යුගස්ස වා**
**රාහුලානන්දනන්දානං – නාහං ලච්ඡාමි පස්සිතුං**

බුදුරජාණන් වහන්සේ ගේ ත් දගසවු දෙනමගේ ත්, රාහුල – ආනන්ද – නන්ද තෙරවරුන් ගේ ත් පිරිනිවන් පෑම මට දක්නට නො ලැබෙයි.

**පටිගච්චායු සංඛාරෙ – ඔස්සජ්ජිත්වාන නිබ්බුතිං**
**ගච්ඡෙය්‍යං ලොකනාථේන – අනුඤ්ඤාතා මහෙසිනා**

ආයු සංස්කාර අත්හැර ලෝකනාථ වූ තථාගතයන් වහන්සේ විසින් අනුදන්නා ලද්දෙම් (යටැ කී උත්තමයනට) පළමුව මැ නිවනට යන්නෙමි.

මෙසේ අදහස් වූ කල්හි පොළොව කම්පා විය. දෙව් බෙර වැයිණ. අසපුවෙහි අරක් ගත් දේවතාවෝ ශෝකා-තුර වූහ. මිතුරු මෙහෙණහු ඒ ගෞතමිය කරා අවුත් වැඳ මෙසේ කීහ.

**සාචලා චලිතා භූමි – නදිතා දෙවදුන්දුභි**
**පරිදෙවා ච සූයන්තෙ – කිමත්ථං නුන ගොතමි**

කම්පා නොවන සුළු වූ ඒ පොළොව කම්පා වූවාය. දෙව් බෙර වැයිණ. විලාප බස් ද ඇසෙත්. ගෞතමිය මෙය කුමක් නිසා ද?

එවිට ගෞතමිය සිතූ අදහස් සියල්ල ම පැවැසූවා. ඒ මෙහෙණහු ද තමන් සිතූ අදහස් පැවැසූහ. මෙසේත් දෙසූ හ.

**යදි තෙ රුච්චතං අය්‍යෙ – නිබ්බාණං පරමං සිවං**
**නිබ්බායිස්සාම සබ්බාපි – බුද්ධානුඤ්ඤාය සුබ්බතෙ**

මනා පැවැතුම් ඇති ආයසීමවති, පරම සුවය වූ නිවන් සුවය ඔබතුමියට අභිමත නම්, අපි හැමෝම ත් බුද්ධානුමත යෙන් පිරිනිවන් පාන්නෙමු.

**වයං සහාව ඤාතකා – සරාපි ච භවාපිච**
**සහයෙව ගමිස්සාම – නිබ්බාණ පුරමුත්තමං**

අපි එක්වැ ම ගිහිගෙයිනු ත් භවයෙනු ත් නික්මුණෙමු. උතුම් නිවන් පුරයට ත් එක්වැ ම යන්නෙමු.

**න ජරා මච්චු වා යත්ථ – අප්පියෙහි සමාගමො**
**පියෙහි න විප්පයොගොත්ථි – තං වජිස්සං අසඞ්ඛතං**

යම් නිවනෙක්හි ජරා මරණ හෝ අප්‍රිය සමාගමය හෝ ප්‍රිය විප්‍රයොගය හෝ නැද්ද, අසඞ්ඛත වූ ඒ නිවනට යමි.

**පරිඤ්ඤාතං මයා දුක්ඛං – දුක්ඛහෙතු විවජ්ජිතො**
**නිරොධො මෙ සච්ඡිකතො – මග්ගොචාපි සුභාවිතො**

මා විසින් දුක පිරිසිඳ දන්නා ලදී. දුක් හටගැනීමේ හේතුව වූ තෘෂ්ණාව දුරු කරන ලදී. නිවන ප්‍රත්‍යක්ෂ කරන ලදී. ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩන ලදී.

**පරිචිණ්ණො මයා සත්ථා – කතං බුද්ධස්ස සාසනං**
**ඔහිතො ගරුකො භාරො – භවනෙත්ති සමූහතා**

මා විසින් ශාස්තෘන් වහන්සේ ආශ්‍රිතයහ. බුදුරජාණන් වහන්සේගේ ධර්මය – අවවාදය අනුව හික්මී අවසන් කරන ලදී. මහත් සංසාර භාරය බහා තබන ලදී. සත්ත්වයා භවයෙන් භවයට ඇද ගෙන යන හෙයින් රැහැනක් බඳු වූ තෘෂ්ණාව සිඳින ලදී.

**යස්සත්ථාය පබ්බජිතා – අගාරස්මානගාරියං**
**සො මෙ අත්ථො අනුප්පත්තො – සබ්බසඤ්ඤො**
**ජනක්ඛයො**

ගිහිගෙයින් නික්ම යමක් බලාපොරොත්තුවෙන් පැවිදි වූයෙම් ද, මගේ ඒ බලාපොරොත්තුව මුදුන් පැමිණියේය. හැම සංයෝජනයෙක් ම ක්ෂය වූහ.

බුද්ධො තස්ස ච සද්ධම්මො - අනූනො යාව තිට්ඨති
නිබ්බාතුං තාව කාලො මෙ - මා මං සොචථ පුත්තිකා

බුද්ධරත්නයත් ධර්මරත්නයත් නිර්මල වැ පවතිද්දීම පිරිනිවන් පෑම පිණිස මට කාලය පැමිණියේය. දූවරුනි, මා ගැන ශෝක නොකරව්.

සචෙ මයි දයා අත්ථි - යදි චත්ථි කතඤ්ඤුතා
සද්ධම්මට්ඨිතියා සබ්බා - කරොථ විරියං දළ්හං

ඉදින් මා කෙරෙහි කරුණාවක් ඇත්නම්, කළ ගුණ දත්නා බවෙක් තිබේ නම්, සියල්ලෝම සද්ධර්මයාගේ චිර ස්ථිතිය පිණිස දැඩි වීර්යය කරවු.

ථීනං අදාසි පබ්බජ්ජං - සම්බුද්ධො යාචිතො මයා
තස්මා යථාහං නන්දිස්සං - තථා තමනුතිට්ඨථ

මා විසින් යදින ලද සර්වඥයන් වහන්සේ ස්ත්‍රීනට පැවිදි බව දී වදාළේ අමාරුවෙනි. ඒ නිසා මම යම් විදියකට සැමැති වෙම් නම්, එලෙස ඊට අනුව වසවු.

ඒ ප්‍රජාපතී ගෞතමී ස්ථවිරාවෝ මෙසේ අනුශාසන කොට භික්ෂුණීන් විසින් පිරිවරණ ලද්දී බුදුන් වෙත අවුත් වැඳ මෙසේ කීහ.

අහං සුගත තෙ මාතා - ත්වං ච වීර පිතා මම
සද්ධම්මසුඛදො නාථ - තයා ජාතම්හි ගොතම

සුගතයන් වහන්ස, මම ඔබ වහන්සේගේ මවු වෙමි, වීරයන් වහන්ස, ඔබ වහන්සේ මාගේ පියා වනසේක. සදහම් සුවය ගෙන දෙන ගෞතම නාථයන් වහන්ස, ඔබ වහන්සේ විසින් මග පල දහම්හි පිහිටුවීම් වශයෙන් මම උපදවන ලද්දී වෙමි.

සංවද්ධිතොයං සුගත - රූපකායො මයා තව
අනින්දියො ධම්මතනු - මම සංවද්ධිතො තයා

සුගතයන් වහන්ස, ඔබ වහන්සේගේ රූපකායය මා විසින් ඇති දැඩි කරන ලදී. මාගේ අති උතුම් ධර්ම ශරීරය ඔබ වහන්සේ විසින් ඇති දැඩි කරන ලදී.

වඩ්ඪිත රක්ඛිතො මය්හං - අනණො ත්වං මහාමුනි
පුත්තකාමා ථියො යා තා - ලභන්තු තාදිසං සුතං

මහා මුනි වූ සර්වඥයන් වහන්ස, ඔබ වහන්සේ වැඩීම රැකීම්හි ලා මට ණය නැති සේක. දරුවන් කැමැති වන ස්ත්‍රීහු ඔබ වහන්සේ වැනි දරුවන් ලබත්වා!

මන්ධාතාදි නරින්දානං - යා මාතා සා භවණ්ණවෙ
නිමුග්ගාහං තයා පුත්ත - තාරිතා භවසාගරා

යම් තැනැත්තියක් මන්ධාතාදි රජුන්ගේ මවු වීද, ඕ භව සාගරයෙහි ගිලුණාය. පුත්‍රයන් වහන්ස, මම ඔබ වහන්සේ විසින් භවසාගරයෙන් එතෙර කරන ලද්දී වෙමි.

රඤ්ඤො මාතා මහෙසීති - සුලභං නාම මිත්ථිනං
බුද්ධමාතාති යං නාමං - එතං පරම දුල්ලභං

රජුගේ මවය, මෙහෙසිය ය, යන නම් ස්ත්‍රීනට සුලභය. බුද්ධමාතාවය යන යම් බඳු නමක් ඇත් නම් එය පරම දුර්ලභය.

තං ච ලද්ධං මයා වීර - පණිධානං මමං තයි
අණුකං වා මහන්තං වා - තං සබ්බං පූරිතං මයා

වීරයන් වහන්ස, මා විසින් එය ද ලබන ලදී. තුඹ වහන්සේ කෙරෙහි මගේ කුඩා වූ හෝ මහත් වූ හෝ යම් ප්‍රාර්ථනාවක් බලාපොරොත්තුවක් වී නම් ඒ සියල්ල මා විසින් පුරවන ලදී.

පරිනිබ්බාතු මිච්ඡාමි - විහායෙමං කළෙබරං
අනුජානාහි මෙ වීර - දුක්ඛන්තකර නායක

වීරයන් වහන්ස, මම මේ සිරුර අත්හැර පිරිනිවන්නට කැමැත්තෙමි. දුක් කෙළවර කළ නායකයන් වහන්ස, මගේ පිරිනිවීම අනුදන්නා සේක්වා!

ඉත්ථියො නාම ලොකග්ග - සබ්බදොසාකරා මතා
යදි ඛො චත්ථි දොසො මෙ - ඛමස්සු කරුණාකර

ලෝකාග්‍ර වූ බුදුරජාණන් වහන්ස, ස්ත්‍රීහු නම් හැම වරදටම ආකරයහ යි දන්නා ලද්දහ. කරුණාවට ආකර වූ බුදුරජාණන් වහන්ස, ඉදින් මගේ යම් දෙසක් වේ නම් ඒට කමා කරන සේක්වා!

ඉත්ථිකානඤ්ච පබ්බජ්ජං – යමහං යාචිං පුනප්පුනං
තත්ථ චෙ අත්ථි දොසො මෙ – තං ඛමස්සු නරාසභ

නරෝත්තමයන් වහන්ස, ස්ත්‍රීනට පැවිද්ද දුන මැනවැ යි මම නැවත නැවතත් යාඥා කෙළෙමි. එහිලා මගේ යම් දෙසක් තිබේ නම් ඒට කමා කළ මැනවි.

මයා භික්ඛුණියො වීර – තවානුඤ්ඤාය සාසිතා
තත්‍ර චෙ අත්ථි දුන්නීතං – තං ඛමස්සු ඛමාධිතා

වීරයන් වහන්ස, ඔබ වහන්සේගේ අනුදැනුම ඇති ව මා විසින් භික්ෂුණීනට අනුශාසනා කරන ලදි. එහිලා යම් වරදක් තිබේ නම් ඒට කමා කළ මැනැවි.

මහා ප්‍රජාපතී ගෞතමිය මේ ආදි නොයෙක් ලෙසින් කරුණු පවසා තථාගතයන් වහන්සේගෙන් සමු ගෙන සෙසු භික්ෂූන් වහන්සේට ත් දන්වා රාහුල – ආනන්ද – නන්ද තෙරවරුන් ද වැඳ තමා පිරිනිවන් පානා බව කීහ. එවිට නන්ද – රාහුල තෙරවරු ධර්මස්වභාවය සිතූහ. අනඳ තෙරහු කණගාටු වූහ. එවිට ගෞතමී ස්ථවිරාවෝ අනඳ තෙරුනට කරුණු කියා සැනැසූහ. ඉන්පසු අසපුවට ගොස් එකාන්තයෙන් ම තමා පිරිනිවෙන් නෙමැ යි ඉටා නැවත තථාගතයන් වහන්සේ වෙත ගොස් පිරිනිවෙන කාලය සැලකළහ. තථාගතයන් වහන්සේ ගෞතමිය කල් දනුව යි අනු දත් සේක්; සෘද්ධි ප්‍රාතිහාර්‍ය්‍යය පානා ලෙස වදාළ සේක. ඉක්බිති ස්ථවිරාවෝ සර්වඥයන් වහන්සේ වැඳ අහසට නැඟ නානාවිධ සෘද්ධි ප්‍රාතිහාර්‍ය්‍යය දැක්වූහ. එකසිය විසි වයස් වූ ප්‍රජාපතී ගෞතමියගේ සෘද්ධි ප්‍රාතිහාර්‍ය්‍යයෙන් තුටු පහටු වූ මහජනයා කෙසේ මේ සෘද්ධි ලබාගත්තාහු දැ යි ඇසිය. එවිට පිළුමතුරා බුදුන් දවසේ සිට පිරිනිවීම තෙක් මුළු චරිතය පවසා සෘද්ධි ලැබූ සැටි පහදා දුන්හ.

ඉක්බිති පිරිවර රහත් මෙහෙණ පන්සිය ද ඍද්ධි ප්‍රාතිහාර්ය්‍ය කොට බුදුන් වැඳ එකත් පස්වැ හිඳ ගෞතමී ස්ථවිරාවන්ගේ ගුණ කියා "තාගේත් පිරිනිවීම අනුදත්නා සේක්වා" යි කීහ. තථාගතයන් වහන්සේ ඒ තාගේත් පිරිනිවීම අනුදත් සේක. ඉන්පසු ඒ හැමෝ ම අසුන් වලින් නැගිට ගියහ. තථාගතයන් වහන්සේ මහජනයා සමග විහාර සීමාව තෙක් පසු ගමන් කළ සේක. එහි දී ගෞතමී ප්‍රමුඛ මෙහෙණ සමූහයා අවසන් වරට බුදුරජාණන් වහන්සේගේ පා වැඳ අසපුවට ගියහ. ඔවුන් වහන්සේලා පිරිනිවීමට සමුගත් බව දත් සැදැහැත්තෝ එහි අවුත් නන් ලෙසින් හොඬාලාප පැවැසූහ. ඔවුනට ධර්මාවවාද කොට ඔවුන් පිටත් කැර. ප්‍රජාපතී ගෞතමී රහත් මෙහෙණින් වහන්සේ ප්‍රථම ධ්‍යානයේ සිට අනුලෝමින් නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය තෙක් සමවැද නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයේ සිට පිළිලෝමින් ප්‍රථම ධ්‍යානය තෙක් සමවැද නැවත ප්‍රථම ධ්‍යානයේ සිට චතුර්ථ ධ්‍යානය තෙක් සමවැද එයින් නැගිට පිරිනිවි සේක. ඉක්බිති පොළොව කම්පා විය. දෙව් මිනිසුන්ගේ මහත් පරිදේවය ඇතිවන්නට විය. තථාගතයන් වහන්සේ ද අනඳ තෙරුන් අමතා බුද්ධමාතාවගේ පරිනිර්වාණය භික්ෂූනට දන්වන්නට නියම කළ සේක. ඒ නිවේදනය ඇසූ භික්ෂූහු වහා එහි රැස් වූහ. පිරිනිවි මෙහෙණින් වහන්සේ පන්සිය දෙනාගේ මෘතශරීර සහිත කූටාගාර පන්සියය ඔසවා ගත් දෙවතාදීහු තොරණාදියෙන් අලඞ්කෘත මඟ ගමන් ගත්හ. පිරිනිවි සෙසු භික්ෂුණීන්ගේ සිවිගෙවල් ඉදිරියෙහි ගෙන ගියහ. සියල්ලට පසුව බුද්ධමාතාවගේ සිවි ගෙය විය. සුවඳ දරින් කළ සෑ මතැ තබා ආදාහන කළ පසු බුද්ධමාතාවගේ ශ්‍රී දේහයෙන් ඉතිරි වූ ධාතු අනඳ තෙරුන් විසින් එතුමියගේ පාත්‍රයෙහි බහා තථාගතයන් වහන්සේට එළවන ලදී. තථාගතයන් වහන්සේ ඒ ධාතු පාත්‍රය සියතින් පිළිගෙන එතුමියගේ ගුණ ප්‍රකාශ කළ සේක.

# ඛෙමා සථ්විරාවෝ

මේ තොමෝ පියුමතුරා බුදුන් දවස හංසවතී නුවර එක් දුසියක් වූවා ය. අනුනට බැල මෙහෙ කොට දුන් ලද දූලෙයකින් දිවි ගෙවූ ඈ දිනක් පියුමතුරා බුදුන් වහන්සේගේ අග සවු සුජාත තෙරුන් පිඩු පිණිස වඩිනු දැක, අගලා තුනක් පුද, එද ම සිය කෙස් කලඹ කපා විකොට තෙරුවනට දන් දී "අනාගතයෙහි මහනුවණැති බුද්ධ ශ්‍රාවිකාවක් වන්නෙමි" යි පතා ජීවිතාන්තය දක්වා හැකි පමණින් කුසල් කොට කළුරිය කළාය. එවක් පටන් දෙව් මිනිස් දෙක්හි සැරි සරන්නී චාතුර්මහාරාජිකය පටන් කොට ඇති සදෙව් ලෙව්හි මහෙශාක්‍ය දෙවිවරුන්ගේ මෙහෙසි බව් ලබමින් පිළිවෙළින් උපන්නා ය. මිනිස් ලෙව්හි උපන් කල්හි නොයෙක් ප්‍රදෙශ රජුන්ගේ සක්විත්තන්ගේ ත් අගමෙහෙසි වූවා ය.

විපස්සී භාග්‍යවතුන් වහන්සේ දවස මිනිස් ලොව ඉපිද බණ අසා පැහැදූ පැවිදි වැ හවුරුදු දස දහසක් බඹසර සැරැ බහුශ්‍රැත වූවා, ධර්මදෙශනා කිරීමාදි නුවණ වැඩීමට හේතු වන පින් දම් කොට සුගතින්හි ම හැසිරෙන්නී ඒ හැම අත් බැවක්හි දී ම මහාභොග ඇති ව, ධන ඇති ව, නුවණැති ව හැඩරුව ඇති ව, කීකරු පිරිවර ඇති ව උපන්නා ය. එය බඹසර විසීමෙන් ලත් අනුසසි. ඒ බව අපදානයෙහි-

"යසථ යඤ්ඤුපපන්නාහං - මහාභොගා මහධනා
මෙධාවිනී රූපවතී - විනීත පරිසාපිච" යි ප්‍රකාශ වේ.

මෙසේ සසර සැරි සරා කකුසඳ කොනාගමන යන දෙ බුදුවරුන්ගේ කාලයෙහි විශාල සංඝාරාම දෙකක් කරවා බුදු පාමොක් මහසඟනට පිදූවා ය.

කසුප් බුදුන් දවසැ කිකී නම් කසී රජුගේ දූන් සත් දෙනා අතුරෙන් වැඩිමහලු වූ සමණී නම් දුව වැ ඉපිද ගිහිගෙහි ම වෙසෙමින් හවුරුදු විසිදහසක් කුමරි බඹසර රකිමින් අනෙක් සොහොයුරියන් හා එක්ව සිත් කළ පිරි-

ලෙවනක් කරවා බුදු පාමොක් බික් සඟනට පිදූහ. මෙසේ පින්දහම්හි යෙදෙමින් සුගතිනිම හැසිරෙන්නී අප ගෞතම බුදුරජාණන් වහන්සේ දවස මගධ රටැ සාගල නුවර මද්දු රජ කුලයෙහි ඛෙමා නමින් උපන. ඕ රන්වන් ය. රන් සේ දිළියෙන සමින් යුක්ත ය. වැඩි විය පත් කල්හි රජගහ නුවර බිම්සර රජුගේ මෙහෙසි බවට පත් වූවා ය.

රූප මදයෙන් මත් වූ ඈ "රූපයෙහි දොස් දක්වතැ" යි බියෙන් නුදුරෙහි වැඩැහුන් තථාගතයන් වහන්සේ දක්නට නො ගියා ය. "කොයි ලෙසකින් හෝ දේවියට තථාගතයන් වහන්සේ සම්මුඛ වුවහොත් මැනැවැ" යි බිම්සර රජ සිතමින් සිටියේ ය. ඒ නිසා ම දිනක් බිම්සර රජ කිවිසුන් ලවා වෙළුවන උයන්හි ගුණවර්ණනා කරවා ඛෙමාවට එය දැකීමේ රුචි ඇති කරවිය. ඉන්පසු දේවිය විහාරය දක්නට යනු පිණිස රජුගෙන් අවසර ඉල්ලූහ. එවිට රජ ඉතා කැමැත්තෙන් අවසර දී "බලාත්කාරයෙන් වත් තථාගත-යන් වහන්සේ පෙන්වවු" යි රාජපුරුෂයනට නියම කෙළේ ය. මහත් පෙරහරින් වෙළුවන උයනට ගිය දේවිය වෙළුවන උයන්හි විසිතුරු බලා ආපසු එන්නට සූදානම් වූවා ය. එවිට රාජපුරුෂයෝ බලාත්කාරයෙන් ම ඈ බුදු-රජාණන් වහන්සේ වෙතට පැමිණැවූහ. රූප මදයෙන් මත් වැ හුන් ඈ එනු දුටු භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේට පවන් සලමින් සිටිනා දෙවඟනක බඳු ස්ත්‍රියක මැවූ සේක. ඛෙමා දේවිය තථාගතයන් වහන්සේට පවන් සලමින් සිටි ඒ ස්ත්‍රිය දැක එදෙස ම බලමින් හුන්හ. මෙසේ ද සිතූහ. දෙවඟනන් බඳු ස්ත්‍රීහු ද තථාගතයන් වහන් සේට නුදුරෙහි සිටිති. මම මේ ස්ත්‍රියගේ පරිචාරිකා (මෙහෙකාරියක) වීමට ද නො නිස්සෙමි" කියා යි. මෙසේ ඈ ඒ රුව දෙස බලා සිටිය දී ම, බුද්ධාධිෂ්ඨාන බලයෙන් ඒ රුව ක්‍රමයෙන් තරුණ - මධ්‍යම - මහලු යන තුන් වයසට පත් ව ඇඟ රැළි වැටි - දත් හැලී - කෙස් පැසී අබල දුබල වැ ජරපත් වැ තල්අත්ත ත් සමග බිමැ ගිණි ඒ දුටු

බෙමාව පෙර කළ පින් ඇති හෙයින් "අහෝ! මේ සා හැඩ රුවැති සිරුර පවා මෙතරම් විපතකට පත් වූණි නම්, මා වැන්නක ගේ සිරුරක් ගැන කිවමනා නැතැ' යි සිතූහ. ඒ මොහොතෙහි දී තථාගතයන් වහන්සේ බෙමාව අමතා-

ආතුරං අසුචිං පූතිං - පස්ස බෙමෙ සමුස්සයං
උග්ඝරන්තං පග්ඝරන්තං - බාලානං අභිනන්දිතං

බෙමාවති අනුවණයන් "යහපතැ" යි සලකන දුබලවූ ද, අපිරිසුදු වූද, කුණු වූද, සෙම් සොටු ආදිය වැගිරෙන්නා වූ ද මේ සිරුර දෙස බලව.

අසුභාය චිත්තං භාවෙහි - එකග්ගං සුසමාහිතං
සති කායගතාත්‍යත්ථු - නිබ්බිදා බහුලා භව

අසුභ භාවනාවෙහි ලා එකඟ කරගත් සිත වඩව. කාය ගතා සති ඇත්තියක් වව. සසර කළ කිරීම බහුල කොට ඇත්තියක් වව.

යථා ඉදං තථා එතං - යථා එතං තථා ඉදං
අජ්ඣත්තඤ්ච බහිද්ධා ච - කායෙ ඡන්දං විරාජය

මේ පඤ්චස්කන්ධය යම් සේ අනිත්‍ය ද, ඔය තිගේ පඤ්චස්කන්ධයත් එලෙසම අනිත්‍යය. ඔය පඤ්චස්කන්ධය යම්සේ අනිත්‍ය ද මේ පඤ්චස්කන්ධයත් එලෙසම අනිත්‍යය කයෙහි ආධ්‍යාත්මික වූද බාහ්‍ය වූද ඡන්දය අත්හරුව.

අනිමිත්තඤ්ච භාවෙහි - මානානුසයමුජ්ජහ
තතො මානාභිසමයා - උපසන්තා චරිස්සසි

විදර්ශනා වඩව, අනුසය සහිත මානය දුරු කරව, මාන නිරොධයෙන් පසු සුඤ්ඤත - අනිමිත්ත - අප්පණිහිත යන ත්‍රිවිධ විමොක්ෂයන් අතුරෙන් එක්තරා විමොක්ෂයකින් යුතු ව ශාන්ත වූවා ඵල සමවත් සුවෙන් කල් ගෙවව.

යෙ රාගරත්තානුපතන්ති සොතං
සයං කතං මක්කටකොව ජාලං
එතම්පි ඡෙත්වාන වජන්ති ධීරා
අනපෙක්ඛිනො සබ්බදුක්ඛං පහායාති

රාගයෙන් රත් වූ, ද්වේෂයෙන් දුෂ්ට වූ මෝහයෙන් මුළා වූ යම් කෙනෙක් වෙද්ද, ඔහු තමා විසින් සැරූ ගත් දැල මැදට වී සිටින මකුළුවකු මෙන් තමා ම උපදවා ගත් තෘෂ්ණා ස්‍රෝතස ඉක්මවන්නට නො හැකි වෙති. නුවණැත්තෝ ඒ තෘෂ්ණා ස්‍රෝතස (තෘෂ්ණා නමැති දිය පාර) පවා ඉක්මවා කාමයන් දුරු කොට සසර දුකින් මිදී නිවන් පුරට යෙත් යි වදාළ සේක.

මේ ගාථාවසානයෙහි දී ඛෙමාව සිවු පිළිසැඹියා පත් රහත් වූහ යි අර්ථකථාහි ඇත ද අපදානයෙහි දැක්වෙන්නේ මේ දෙසුම් කෙළවර දී සෝවාන් වැ පසුව රජුගෙන් අවසර ලබා ගෙන පැවිදි ව අඩමසකින් රහත් වූ බවයි.

පසු කාලයෙක්හි දී තථාගතයන් වහන්සේ ජේතවනයෙහි වැඩ වාසය කළසේක් ඛෙමාව මහා ප්‍රඥ ඇති මෙහෙණින් අතුරෙන් අගතන්හි තබා වදාළ සේක. මෙසේ රහත් වැ නිවන් සුව විඳි ඛෙමා ස්ථවිරාවන් වහන්සේ දිනක් එක් ගසක් මුලැ දිවා විහාරණය සඳහා වැඩැහුන් සේක. එවිට පාපී මාරතෙමේ තරුණ රූපයක් මවා ගත්තේ ඛෙමා ස්ථවිරාවන් වෙත එළඹ කාමයෙන් කුල්මත් කරනු කැමැති ව මෙසේ කීය.

දහරා ත්වං රූපවතී - අහම්පි දහරො යුවා
පඤ්චඞ්ගිකෙන තුරියෙන - එහි ඛෙමෙ රමාමසෙ

ඛෙමාවෙනි, නුඹ ත් හැඩ රුවැති තරුණියකි. මම ත් එසේ ම ලක්ෂණ තරුණයෙක්මි. එහෙයින් පසඟතුරු වැයුමෙන් යුතු ව කාමක්‍රීඩාවෙහි ඇලෙමු කීයා යි.

මාරයාගේ මේ කීමට ඛෙමා ස්ථවිරාව -

ඉමිනා පූතිකායෙන - ආතුරෙන පභඞ්ගුනා
අට්ටියාමි හරායාමි - කාමතණ්හා සමූහතා

දුබල වූ වහා බිඳෙන සුළු මේ කුණු කය කරණ කොට ගෙන පීඩා වෙමි. එසේම ලජ්ජා වෙමි. මා විසින් කාම තෘෂ්ණාව නසන ලදී.

**සත්තිසූලූපමා කාමා – ඛන්ධාසං අධිකුට්ටනා**
**යං ත්වං කාමරතිං බ්‍රෑසි – අරතී දානි සා මම**

කාමයෝ ඩූකලී අඬයටියට උපමාකොට ඇත්තෝ ය. හුල් වැනියහ. තෝ යම්බඳු කාම රතියක් ගැන කියහි නම් ඒ කාමරතිය මට නැත. එය මට අශුචියක් මෙන් පිළිකුල් ය.

**සබ්බත්ථ විහතා නන්දි – තමොක්ඛන්ධො පදාලිතො**
**එවං ජානාහි පාපිම – නිහතො ත්වමසි අන්තක**

මා විසින් හැම අරමුණු විෂයයෙහිම වූ තෘෂ්ණාව නසන ලදි. මෝහාන්ධකාර සමූහය පළන ලදි. එම්බා ලාමක මාරය! මා විසින් තෝ පෙළනු ලැබී ය. එසේ මම තොපෙළන ලදිමි. මෙසේ දැනගනුව.

**නක්ඛත්තානි නමස්සන්තා – අග්ගිං පරිචරං වනෙ**
**යථාභුච්චං අජානන්තා – බාලා සුද්ධිං අමඤ්ඤථ**

ඇතැම් අනුවණයෝ තාරකාවනට වඳිමින් වනයෙහි ගිනි දෙවියන් පුදමින් තත්වාකාරයෙන් නිර්වාණ ප්‍රවෘත්තිය නොදැන ශුද්ධිය සොයා වෙහෙසෙති.

**අහං ච ඛො නමස්සන්ති – සම්බුද්ධං පුරිසුත්තමං**
**පරිමුත්තා සබ්බදුක්ඛෙහි – සත්ථුසාසන කාරිකා**

මම වූ කලී එසේ නොව තතු දැන පුරුෂෝත්තම වූ සර්වඥයන් වහන්සේ වඳිමින් සියලු දුකින් මිදුනෙමි, ශාස්තෘ ශාසනය කරන්නියක් ද වෙමි.

මෙසේ පිළිතුරු ලද මාරයා ලජ්ජා වී ඉවත් වැ ගියේ ය.

# අම්බපාලි ස්ථවිරාවෝ

අම්බපාලිය ද පෙර බුදුවරුන් දවස පින් දහම් කොට රහත් බව පැතූහ. මෙසේ සිත් ම සිඛී බුදුන් වහන්සේගේ සස්නෙහි පැවිදි වැ සෙසු භික්ෂුණීන් සමග සෑයක් වඳනට ගියහ. ගොස් සෑය වැඳ පැදකුණු කරන විට පෙරටුව ගිය රහත් මෙහෙණක කිබිසීමෙන් නො දැනැ හුණු කෙළ පිඬක් දැක "මෙතැන කවර නම් ගණිකාවක විසින් කෙළ හැසිණිද" යි පරිභව කළහ. මෙසේ ආර්යෝපවාද කළ හෙයින් නිරයෙහි පැසී දස දහසක් ජාතීන්හි ගණිකා වූහ. මහණදම් පිරූ අවදියෙහි හොඳින් සිල් රකිමින් මව්කුස්හි ඉපැදීම පිළිකුල් කොට ඕපපාතික වැ ඉපැදීමට පැතූ හෙයින් අන්තිම ආත්ම භාවයෙහි ඕපපාතික වැ උපන. විසල් පුර අඹ ගසක් මුල උපන් හෙයින් අම්බපාලි නම් වූ. හොඳින් සිල් රැකි හෙයින් මනා රූ සපුයෙන් යුතු වූ ගස මුල හුන් ඇය දුටු උයන් පල්ලා නගරයට ගෙන ගියේය. ඇය ගැන නන් දෙස්හි පතළ වැ ගිය හෙයින් නොයෙක් රජකුමරුවෝ ඇය පතා හසුන් එවූහ ඔවුනොවුන් අතර කෝලාහල ද ඇති විය. ඔවුන්ගේ කෝලාහල සංසිඳුවීම පිණිස ඇගේ පෙර කර්මය විසින් මෙහෙයන ලද විනිශ්චය කාරයෝ ඇය ගණිකාවක කළහ වැඩි දෙනා කාමාවිෂ්ට හෙයින් එකලැ ගණිකාවනට නගරසෝභිණී - නුවර සොබවන්නිය යන නමක් ද සම්මත වැ තිබුණි.

රජගහනුවර සාලවතී ගණිකාව සහ ඇගේ දූ වූ සිරිමා ද, බරණැස් පුර සාමා හා සුලසා ද, උදේනී නුවර පදුමාවතී ද යන මේ සත්හු ඒ ඒ නගරයන්හි නගර සෝභිණීහු වූහ. අම්බපාලිය වෛශාලියෙහි නගරශෝභිණී වූහ. කල්ගතවත් ම අම්බපාලියගේ අදහස් වෙනස් විය. ශාස්තෲන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධා ප්‍රතිලාභය විය. ස්වකීය උයනෙහි වෙහෙරක් කරවා බුද්ධ ප්‍රමුඛ සංඝයාට පුදන ලදී. පසු වැ සිය පුත් විමල කොණ්ඩඤ්ඤ තෙරුන්ගෙන් බණ

අසා පැහැදැ පැවිදි වැ විදසුන් වඩන්නී ඕය සිරුරේ පෙර තතු ත් දැන් පත් වැ ඇති ජරා ස්වභාවයත් මෙනෙහි කොට සංවෙග උපදවා සංස්කාරයන් ගේ අනිත්‍ය ස්වභාවය පැවැසූහ.

කෙශකලාපයෙහි සැටි-

කාලකා හමරවණ්ණ සදිසා
වෙල්ලිතග්ගා මම මුද්ධජා අහු
තෙ ජරාය සාණවාක සදිසා
සච්චවාදි වචනං අනඤ්ඤථා

මගේ හිසෙහි සිනිඳු තිල් මී මැසි පැහැති අග්බමරු (අග සුරුණ්ඩු ගැසුණු) කේශයෝ වූහ. ඒ කෙස් දැන් ජරා ලත්තුයෙන් සුදු වූවාහු හන හූල් මෙන් වෙති. හැම රූපයම අනිත්‍යය. ජරාවෙන් මඩනා ලදය යි සත්‍යවාදී සම්බුදුන් වහන්සේ වදාළ වචනය එසේ මැ යි. නිත්‍යාදි අන් ස්වභාව-යකට නො පැමිණේ.

වාසිතො ව සුරභි කරණ්ඩකො
පුප්ඵපූර මම උත්තමඞ්ගජො
තං ජරාය සසලොම ගන්ධිකං
සච්චවාදී වචනං අනඤ්ඤථා

මල් සුවඳසුණු ආදියෙන් සුවඳ කවන ලද කරඬුවක් බඳු වූ සපු - දැසමන් ඉද්ද ආදි මලින් පුරවන ලද මාගේ කෙශයෝ පෙර ඉතා නිම්ල වූහ. දැන් ජරාවෙන් මඩනා ලදුව පැසී සුදු වී හාලොම් ගඳ හමති. සත්‍යවාදි බුදුන් වහන්සේගේ වචනය එසේමැ යි. නිත්‍යාදි අන් ලෙසකට නො පැමිණේ.

කානනං ව සහිතං සුරොපිතං
කොච්ඡසූචි විචිතග්ග සොභිතං
තං ජරාය විරලං තහිං තහිං
සච්චවාදි වචනං අනඤ්ඤථා

මනාව වැවූ ඝන සෘජු දික් අඳු ඇති උයනක් බදු වූ බුරුසුලෙවත් හා රන් පතාවෙන් පිරා අවුල් හළ කෙශයෝ දැන් ජරායෙන් මඩනා ලදුව තන්හි තන්හි හැළීමෙන් අතිශයින් තුනී වූහ. සත්‍යවාදි බුදුන්ගේ වචනය එසේම ය. අන් ලෙස නොවේ.

කණ්හ ඛන්ධක සුවණ්ණ මණ්ඩිතං
සොභතෙ තං සුවෙණිහි ලඞ්කතං
තං ජරාය ඛලිතං සිරං කතං
සච්චවාදි වචනං අනඤ්ඤථා

මනහර වූ ඇසල මල් දම් වැනි ගෙතු හිසකේ වැටි-යෙන් හා රං අබරණින් සරසන ලද මාගේ කෙශ කලාපය දැන් ජරාව හේතුකොට ගෙන කෙස් වැටි නට්ටය පෑදී ගිය හිසැත්තියක් වෙමි. සත්‍යවාදි බුදුන්ගේ වචනය සැබැම ය, අන් අයුරක් නොවේ.

බැම දෙකේ සැටි:

චිත්තකාර සුකතාව ලෙඛිකා
සොභතෙ සුභමුකා පුරෙ මම
තං ජරාය වලිහි පලම්බිතා
සච්චවාදි වචනං අනඤ්ඤථා

දක්ෂ චිත්‍ර ශිල්පියකු විසින් නිල් පැහැයෙන් මනා කොට තැනූ රේඛා දෙකක් මෙන් මගේ දෙ බැම බැබැළිණි. දැන් ජරාව හේතුකොට ගෙන නළලෙහි හටගත් රැලිවලින් එල්බ ගත්තාක් මෙන් පවති. සත්‍යවාදි බුදුන්ගේ වචනය එසේම ය. වෙනස් නොවේ.

නෙත් දෙකේ සැටි:

භස්සරා සුරුචිරා යථාමණි
නෙත්තා හෙසුං අභිනීල මායතා
තෙ ජරාය'භිහතා න සොභතෙ
සච්චවාදිවචනං අනඤ්ඤථා

දිලියෙන්නාං වූ ත් මනවඩන්නාං වූ ත් නිල්වන් දික් ඇස් දෙක පෙර මැණික් එබ්බූ පේරැස් මුද්දක් මෙන් බැබැළිණි. ඒ දෙ ඇස් දැන් ජරාංයෙන් මඩනා ලද වැ නොහොබී. සත්‍යවාංදී බුදුන්ගේ වචනය එසේමැ ය. වෙනස් නොංවේ.

**නාසයේ සැපි:**

සණ්හ තුඞ්ග සදිසී ච නාසිකා
සොභතෙසු අභිසොබ්බනං පති
සා ජරාය උපකූලිතා විය
සච්චවාදිවචනං අනඤ්ඤථා

මට සිළිටි වූ උස් වූ, සෙසු ශරීරාංවයවයනට ගැලැපෙන්නාං වූ තනාං තුබූ හිරියල් වැටියක් සේ තරුණ වියට සුදුසු පරිදි මගේ නාංසිකාව දැකුම් කළු වැ තිබුණි, ඒ නාංසිකාංව ජරාංයෙන් පීඩිත ව රැළි වැටි හැකිළී වරපටක් මෙන් පවතී. සත්‍යවාංදී බුදුන්ගේ වචනය එසේම ය. වෙනස් නොංවේ.

**කන් දෙකේ සැපි:**

කඩකණං ව සුකතං සුනිට්ඨිතං
සොභතෙසු මම කණ්ණපාලියො
තා ජරාය වලිභි පලම්බිතා
සච්චවාංදිවචනං අනඤ්ඤථා

දක්ෂ කම්කරුවකු හොංදින් පිරියම් කළ රන්වලලු දෙකක් මෙන් මාංගේ කන් පෙති බැබැළිණි. දැන් ඒ කන් පෙති ජරාංයෙන් පීඩිත වැ තන්හි තන්හි රැලි වැටි එල්ලෙන රෙදි කැබැලි දෙකක් මෙනි. සත්‍යවාංදී බුදුන්ගේ වචනය එසේමය. වෙනස් නොංවේ.

**දත් පෙළේ සැපි:**

පත්තලි මකුලවණ්ණ සදිසා
සොභතෙ සුදන්තා පුරෙ මම
තෙ ජරාය ඛණ්ඩිතා ච පීතකා
සච්චවාදිවචනං අනඤ්ඤථා

පෙර මගේ දත් කඳල මල් කැකුළු සමාන වර්ණ සණ්ඨානයෙන් බැබැළුණහ. දත් ජරා හේතුවෙන් සෙලැවී කසාවන්ය. සත්‍යවාදි බුදුන්ගේ වචනය එසේමය, වෙනස් නොවේ.

**කම්මුලේ සැටි:**

කානනම්හි වන සණ්ඩචාරිණී
කොකිලා ව මධුරං නිකූජපිහං
තං ජරාය ඛලිතං තහිං තහිං
සච්චවාදි වචනං අනඤ්ඤථා

මියුරු රස විඳිමින් වනයෙහි ගී ගයමින් හැසිරෙන කෙවිලියක මෙන් පෙර සවන් දුන්නවුන් පිනවන මිහිරි නාද කෙළෙමි. ඒ මගේ මිහිරි හඬ ජරාවෙන් අබලන්ව දත් වැටීමාදියෙන් ඒ ඒ තැන ගැටෙන බර්බර ස්වර ඇත්තියක්මි. සත්‍යවාදි බුදුන්ගේ වචනය සැබෑමය, වෙනස් නොවේ.

**බෙල්ලේ සැටි:**

සණ්හ කම්බුරිව සුප්පමජ්ජිතා
සොභතෙව සුගීවා පුරෙ මම
සා ජරාය භග්ගා විනාමිතා
සච්චවාදි වචනං අනඤ්ඤථා

පෙර මගේ බෙල්ල හොඳින් මැද ඔප දැමූ රන් සකක් මෙනි. දැන් ජරාභිභූත ව මස් වියැකී නහර ඉල්පී කැඩී බිඳී ගොස් නොහොබනේය. සත්‍යවාදි බුදුන්ගේ වචනය සැබෑමය, වෙනස් නොවේ.

**බාහු යුග්මයේ සැටි:**

වට්ට පලිඝ සදිසොපමා උභො
සුසොභතෙ සුබාහං පුරෙ මම
තා ජරා යථා පාටලිප්පලිතා
සච්චවාදිවචනං අනඤ්ඤථා

පෙර මගේ බාහු යුග වට වූ කණයම් දඬු මෙන් ශොභමානය. දැන් එය ජරායෙන් පීඩිතව හැම අතින්ම පැළුණු පලොල් අතු දෙකක් මෙන් දුදුරු වී අබල වීය. සත්‍යවාදි බුදුන්ගේ වචනය සැබෑමය.

**දෙ අත්හි සැටි:**

**සණ්හ මුද්දික සුවණ්ණ මණ්ඩිතා**
**සොභතෙ සුහත්ථා පුරෙ මම**
**තෙ ජරාය යථා මූල මූලිකා**
**සච්චවාදි වචනං අනඤ්ඤථා**

පෙර සිළුටු මුදු වළලු ආදි රන් අබරණින් සැරසූ මගේ අත් හොඳින් බැබැළිණි. දැන් ජරායෙන් මිරිකි රාබු අල මෙන් අවලක්ෂණය. සත්‍යවාදි බුදුන්ගේ වචනය සැබෑම ය.

**පයොධරයන්ගේ සැටි:**

**පීනවට්ට සහිතුග්ගතා උභො**
**සොභතෙ සුථනකා පුරෙ මම**
**ථෙවිකීව ලම්බන්තෙ නොදකා**
**සච්චවාදිවචනං අනඤ්ඤථා**

පිරී වට වැ එකට ගැටී මනාං වැ උස් වූ මගේ පියකරු පියයුරු දෙක පෙර රන් කුඹු මෙන් බැබැළිණ. දැන් ඒ පියයුරු වතුර නැති පෙරහන් කඩ මෙන් හැකිළී එල්බෙමින් තිබේ.

**ශරීරයේ සැටි:**

**කඤ්චනස්ස ඵලකංව සුමට්ඨං**
**සොභතෙ සුකායො පුරෙ මම**
**සො වලිහි සුඛුමාහි ඔතතො**
**සච්චවාදි වචනං අනඤ්ඤථා**

පෙර මගේ ශරීරය සාදිලිංගම් ගං පිරිමැදි රන්පුවරුවක් මෙන් හෙබී ය. දැන් ඒ සිරුර රැළියෙන් යුතුව නැමී අප්‍රිය වැ පවතී. සත්‍යවාදි බුදුන්ගේ වචනය සැබෑම ය.

**කලවා යුවලේ සැටි:** නාගභොග සදිසොපමා උභො
සොභතෙ සුඌරු පුරෙ මම
තෙ ජරාය යථා වෙළුනාලියො
සච්චවාදිවචනං අනඤ්ඤථා

පෙර මගේ කලවා දෙක ඇත් සොඬ මෙනි. දැන් එය ජරායෙන් මඩනා ලද්දහු උණ පුරුක් මෙනි. සත්‍යවාදි බුදුන්ගේ වචනය සැබෑම ය.

**කෙණ්ඩාවල සැටි:** සණ්හ නූපුර සුවණ්ණ මණ්ඩිතා
සොභතෙ සුජඞ්ඝා පරෙ මම
තා ජරාය තිල දණ්ඩකාරිව
සච්ච වාදි වචනං අනඤ්ඤථා

සිනිඳු මට්ටම් ඇති නූරුවලායෙන් හෙබි මගේ කෙණ්ඩා දෙක දැන් ජරායෙන් මඩනා ලදුව තල දඬු මෙනි. සත්‍යවාදී බුදුන්ගේ වචනය සැබෑමය.

**දෙපතුල්වල සැටි:** තූල පුණ්ණ සදිසොපමා උභො
සොභතෙ සුපාදා පුරෙ මම
තෙ ජරාය ඵුටිතා වලිමතා
සච්චවාදිවචනං අනඤ්ඤථා

පෙර මගේ පාදයෝ ඉඹුල් පුළුනින් වසන ලද වහන් මෙන් මෘදු වැ සිනිඳු ව මස් පිරී මනා ව බැබළුණහ. දැන් ජරායෙන් මඩනා ලදුව පැලී රැලි වැටී තිබෙත්. සත්‍යවාදී බුදුන්ගේ වචනය සැබෑම ය, වෙනස් නොවේ.

ඊදිසො අහු අයං සමුස්සයො
ජජ්ජරො බහු දුක්ඛානමාලයො
සො පලෙපපතිතො ජරාඝරො
සච්චවාදිවචනං අනඤ්ඤථා

පෙර මගේ ශරීරය මුලින් කී පරිදි හැම අඟපසඟක්ම දුටුවන් නෙත් සිත් පැහැර ගන්නා සුළුය. දැන් නා නා විධ ජරා රෝගාදි දුඃඛයනට වාසස්ථාන වී දුර්වල ය. ආලෙප කොට පසුව මැටි ගැලැවී වැටුණු ගෙයක් මෙන් විය. සත්‍යවාදි බුදුන්ගේ වචනය එසේම ය, වෙනස් නොවේ.

මෙසේ අම්බපාලි ස්ථවිරාවෝ සිය සිරුරු ම අරමුණු කොට අනිත්‍යතාවය වඩා ඒ අනුව ම දුඃඛ ලක්ෂණ ද අනාත්ම ලක්ෂණ ද වඩා රහත් වූහ.

# සුන්දරීනන්දා ස්ථවිරාවෝ

මේ තොමෝ පියුමතුරා බුදුන් දවස හංසවතී නුවර කුලගෙයක්හි ඉපිද, වැඩි විය පැමිණ බුදුන්වහන්සේගෙන් බණ අසමින් හුන් තැනැත්තී එක් මෙහෙණක ධ්‍යාන කරන මෙහෙණන් අතුරෙන් අග තනතුරෙහි තබනු දැක තොමෝ ද මතු බුදුකෙනකුන් ගේ ශාසනයෙහි "ධ්‍යායී මෙහෙණන් අතුරෙන් අග්‍රවන්නෙමි"යි පතා දෙව්මිනිස් දෙක්හි සැරිසරමින් අවුත්, අප බුදුන් දවස ශාක්‍යරජ කුල-යෙහි උපන්න. නන්දා නම් වූහ. මනා රූසපුවෙන් යුතුහෙයින් සුන්දරී නන්දා නම් වූ. පසුව ජනපදකල්‍යාණී (දනව්කලණ) යයි ද ප්‍රකට වූහ. භද්‍රාකාපිලානීන්ගේ මෙන් ම දෙළොස් රියන් විහිදෙන ශරීර කාන්තියෙන් හෙබි ඕ තොමෝ අප බුදුන්වහන්සේ කිඹුල්වත්පුරයට පිවිස තමන් බලා-පොරොත්තුව සිටි නන්ද කුමරු හා යශෝදරා දේවින් පුත් රහල් කුමරු ද පැවිදි කළ කල්හි, සුදොවුන් රජු පිරිනිවීමෙන් පසු වැ - මහා ප්‍රජාපතී ගෞතමිය සහ යශෝදරා දේවිය ද පැවිද්දට ගිය විට "මා හා සබඳ හැම දෙනම පැවිදි වූහ. මම තනියම ගිහි ගෙහි වැස කුම් කෙරෙම්ද? මම ද පැවිදි වන්නෙමැ"යි සිතා සැදැහැ නොමැති වැ නෑ සෙනෙහෙන් පැවිදි වැ රූපය නිසා හටගත් මත් ඇති වැ රූපයෙහි දොස් දක්වතැයි කියෙන් බුදුන් වහන්සේ වෙතට ද නොගොස් මෙහෙණ අසපුවෙහි ම වුසූහ.

බුදුරජාණන් වහන්සේ ඇගේ නුවණ මුහුකුරා ගිය බව දැන මහා ප්‍රජාපතී ගෞතමිය අමතා "හැම මෙහෙණන් විසින් ම අවවාද ලබා ගනු පිණිස පිළිවෙළින් පැමිණිය යුතුය"යි නියම කළ සේක. සුන්දරීනන්දාවෝ තමන් පත් වාරයෙහි අනිකක යැවූහ. එවිට සිය වාරයෙහි "අන් මෙහෙණක නොඑවා වරලද මෙහෙණ ම පැමිණිය යුතුය"යි භාග්‍යවතුන් වහන්සේ අණ කළ සේක. ඕ තොමෝ බුද්ධාඥාව

උල්ලඞ්ඝනය නො කට හැක්කි, අන් මෙහෙණන් හා බුද්ධෝ-පස්ථානය පිණිස එළඹුණාහ. එවිට ශාස්තෲන්වහන්සේ මනවඩන එක් ගැහැණු රුවක් ඍද්ධියෙන් මවා පෙන්නා එය ම ජරාවෙන් දිරා යන සැටි පෙන්වූසේක. සුන්දරි-නන්දාවෝ ඒ ජරාභිභූත රූපය දැක අනිච්ච දුක්ඛ වශයෙන් මෙනෙහි කළහ. එසේ කිරීමෙන් සිත කමටහනට අභි-මුඛ විය. එය දුටු බුදුරජාණන්වහන්සේ ඇට සුදුසු පරිදි දහම් දෙසන සේක්-

**ආතුරං අසුචිං පූතිං - පස්ස නන්දෙ සමුස්සයං**
**අසුභාය චිත්තං භාවෙහි - එකග්ගං සුසමාහිතං**

නන්දාවෙනි, හැමවිට ම ගිලන් වූ අපිරිසිදු වූ කුණු වූ මේ කය බලව. එකඟ වූ මනා වැ අරමුණෙහි පිහිටියා වූ සිත අශුභ භාවනාවට යොමු කොට වඩව.

**යථා ඉදං තථා එතං - යථා එතං තථා ඉදං**
**දුග්ගන්ධං පූතිකං වාති - බාලානං අභිනන්දිතං**

පංචස්කන්ධය දුගඳය, කුණු වැහෙන සුලු ය. අනු-වණයන් විසින් මැනැවැ යි තුටුවන ලද්දේය. මේ පෙනෙන නිර්මිත පංචස්කන්ධය ත් යම්සේ අනිත්‍ය නම්; ඔය තිගේ පංචස්කන්ධය ත් එලෙසම අනිත්‍ය ය. ඔය තිගේ පංච-ස්කන්ධය යම්සේ අනිත්‍ය නම්, මේ පෙනෙන නිර්මිත පංච-ස්කන්ධය ත් එලෙස ම අනිත්‍ය ය.

**එවමෙතං අවෙක්ඛන්තී - රත්තින්දිව මතන්දිතා**
**තතො සකාය පඤ්ඤාය - අභිනිබ්බිජ්ජ දක්ඛිසි**

දිවා රෑ දෙක්හි අනලස වූවා මෙසේ මේ සිරුර අශුභ වශයෙන් දකිමින් සිය විදසුන් නුවණින් සංස්කාර ධර්මයන්හි කලකිරී බලව.

මේ තුන් ගය දෙසූවිට සුන්දරීනන්දාවෝ සෝවාන් ඵලෙහි පිහිටියාහ. මතු මඟ ඵල පිණිස කමටහන් වදා-රණ සේක් "නන්දාවෙනි, මේ සිරුරෙහි මඳ වූ ද හරයක් නැත. මස් ලෙයින් පිරුණු ජරා - ව්‍යාධි - මරණයන් පදිංචිගත් ඇටසැකිලි මාත්‍රයකි යනු

**අට්ඨීනං නගරං කතං – මංසලොහිත ලෙපනං**
**යත්ථ ජරා ච මච්චු ච – මානො මක්ඛො ච ඔහිතො**

යම් තැනෙක ජරාව ද මරණය ද මානය ද මකු බව ද තැන්පත් වූයේ ද, මේ කය එසේ වූ මස් ලේ පිරුණු ඇටින් කැරුණු නුවරකි යි දෙසූ සේක. මේ දෙසුම් අවසන්හි සුන්දරීනන්දාවෝ රහත් වූහ. ඉන්පසු යම් යම් තැනක හුන්නීද, ඒ හැම විට ම ධ්‍යාන රත වැ මැ හුන් හෙයින් ඒ ගුණයෙහි ලා පහත් වූ බුදුරජාණන්වහන්සේ ධ්‍යාන කරනා ස්වභාවය ඇති මෙහෙණන් අතුරෙන් අග තනතුරෙහි තබා වදාළසේක.

# අනෝපමා ස්ථවිරාවෝ

මෝ තොමෝත් පෙර බුදුන් දවස කළ පින් ඇති වැ, අප බුදුන් දවස සාකේත නුවර මේඝ නම් සිටාණන්හට දූ වැ උපන්හ. එ රට අන් හැම ස්ත්‍රීන්ට වඩා රූප ශෝභායෙන් යුතු වූ හෙයින් අනෝපමා නම් වූහ. ඈය පතා නන් දෙසින් රජ - රජමහඇමතිආදීහු පියාණනට දූතයන් එවූහ. ඈ එපවත් අසා "ගිහිගෙහි විසීමෙන් මට පලක් නැත. නොපමා වැ ගොස් පැවිදි වන්නෙමි"යි සිතා ශාස්තෘන්වහන්සේ වෙත ගොස් බණ අසා විදසුන් වඩා අනැගැමි වැ පැවිදි බව පතා බුදුන් ඇයැද මහණ වැ සත්වැනි ද රහත් වැ උදන වශයෙන් මේ ගාථා කීහ.

උච්චෙ කුලෙ අහං ජාතා - බහුවිත්තෙ මහද්ධනෙ
වණ්ණරූපෙන සම්පන්නා - ධීතා මෙඝස්ස අත්‍රජා

ආභරණාදී බොහෝ විත්තූපකරණ ඇති නිදන් ගත සතළිස් කෙළක් ධනය ඇති, උසස් කුලයෙක්හි (පවුලෙක්හි) උපන්නෙමි. සිරුරු දැහැ සපුමෙවත් හා රූ සපුවෙත් ද යුතු වූ යෙමි මෙඝ සිටුහුගේ දුවක් වීමි.

පත්ථිතා රාජපුත්තෙහි - සෙට්ඨිපුත්තෙහි ගිජ්ඣිතා
පිතු මෙ පෙසසි දූතං - දෙථ මය්හං අනොපමං

යත්තකං තුලිතා එසා - තුය්හං ධීතා අනොපමා
තතො අට්ඨගුණං දස්සං - හිරඤ්ඤං රතනානි ච

රජපුතුයන් විසින් ද සිටුපුතුයන් විසින් ද ප්‍රාර්ථනා කරන ලදු වැ "නුඹගේ දූ වන අනෝපමාව යම් පමණ අගිය යි ලක්ෂණ පාඨකයන් විසින් ප්‍රමාණිත ද? ඉන් අට ගුණයක් අධික වැ රන් රුවන් දෙන්නෙමු. මට අනෝපමාව දෙව යි කියා මවුපියන් වෙත දූතයන් එවූහ.

සා'හං දිස්වාන සම්බුද්ධං - ලොකජෙට්ඨං අනුත්තරං
තස්ස පාදනි වන්දිත්වා - එකමන්තං උපාවිසිං

ඒ මම ලෝකජ්‍යෙෂ්ඨ නිරුත්තර වූ සම්බුදුන් දැක වැඳ එකත් පසෙක හුන්නෙමි.

සො මෙ ධම්මමදෙසෙසි - අනුකම්පාය ගොතමො
නිසින්නං ආසනෙ තස්මිං - ඵුස්සයිං තතියං ඵලං

ඒ ගෞතම සර්වඥයන් වහන්සේ අනුකම්පාවෙන් මට දහම් දෙසූ සේක. ඒ අසුන්හි හුන්නෙමි අනාගාමී වීමි.

තතො කෙසානි ඡෙත්වාන - පබ්බජිං අනගාරියං
අජ්ජ මෙ සත්තමී රත්ති - යතො තණ්හා විසොසිතා

ඉන්පසු කෙස්කපා සසුන්හි පැවිදි වීමි. යම් ඒ පැවිදි වීමෙකින් පසු රහත් වූයෙම් ද? රහත්වූ දිනය වන අද ඒ පැවිදි බවෙන් සත්වන රැය යි.

## ජීවකම්බවනික ශුභා ස්ථවිරාවෝ

මෝ තොමෝ පෙර බුදුන් දවස පින් කොට මේ බුද්ධෝත්පාද කාලයෙහි රජගහ නුවර බ්‍රාහ්මණ මහා සාල කුලයෙහි ඉපිද සුභා නම් ලද්දී. ඕ ශාස්තෘන් වහන්සේ රජගහ නුවරට පිවිසි දා සිට ම සැදැහැති උවැසියක් වැ සසර හතු වටහා ගෙන පසුව කාමයන් ගේ ආදීනව ත් නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස් ත් සලකා මහාප්‍රජාපතී ගෞතමී ස්ථවිරාවන් වෙත පැවිදි වී, විදසුන් වඩන්නී කීප දිනකින් ම අනාගාමී වූහ. ඉන්පසු දිනක් ජීවකම්බවනයට දිවාවිහරණය පිණිස යනු ඇය දුටු එක් සල්ලාලයෙක් මෙවුන් දම් කැමැති ව මග සරස සිටියේ කාමයෙන් ඇමතුවේය. ඕ තොමෝ ඔහුට නොයෙක් ලෙසින් කාමාදීනව ත් ස්වීය නෛෂ්ක්‍රම්‍ය චින්තා ත් ප්‍රකාශ කරමින් බණ කීහ. ඉන්පසු වැ ද හෙතෙමේ මගින් ඉවත් නොවූයේ ය. එවිට ස්ථවිරාවන් ගේ ඇස දෙස ම බලා සිටින ඔහුට ස්ථවිරාවෝ ඇසක් උපුටා දුන්හ. ඉක්බිති ඒ හේ බොහෝ තැති ගත්තේ හටගත් සංවේග ඇත්තේ පහවූ රාග ඇතිව ස්ථවිරාව සමා කරවා ගෙන මගින් ඉවත් විය. ස්ථවිරාවෝ ශාස්තෘන් වහන්සේ වෙත ගියහ. ශාස්තෘන් වහන්සේ දැකීම ත් සමගම ඇස නැවත ප්‍රකෘතිමත් විය. ඉක්බිති ඕ බුදුන් උදෙසා හටගත් ප්‍රීතියෙන් නිරතුරු වැ ම පිරී ගියහ. ඕ ප්‍රීතිය මැඩ පවත්වා එකෙණෙහි ම විදසුන් වඩා රහත් වූහ. රහත් වැ පල සුවෙන් හා නිවන් සුවෙන් වසන්නී සිය ප්‍රතිපත්තිය ප්‍රත්‍යවේක්ෂා කොට එද තමා විසින් හා ඒ සල්ලාලයා විසින් හා කී ගාථා උදාන වශයෙන් එක් කොට මෙසේ කීහ

ජීවකම්බවනං රම්මං - ගච්ඡන්තිං භික්ඛුණිං සුභං
ධුත්තකො සන්නිවාරෙසි - තමෙනං අබ්‍රවී සුභං

එක් ධූර්තයෙක් (සල්ලාලයෙක්) රමණීය වූ ජීවකම්බවනයට යන සුභා මෙහෙණ මග සරස සිට වැළැක්වීය. එවිට සුභා මෙහෙණ ඔහුට මෙසේ කීහ.

**කිං තෙ අපරාධිතං මයා – යං මං ඔවරියාන තිට්ඨසි**
**න හි පබ්බජිතාය ආවුසො – පුරිසො සම්ඵුසනාය**
**කප්පති**

යම් හෙයකින් නුඹ මං වළකා සිටින්නෙහිද, එබඳු දයක් කිරී ්ට මං ඔබට කවර අපරාධයක් කළාද, ඇවත මෙහෙණකට පුරුෂ ස්පර්ශය නුසුදුසු ය.

**ගරුකෙ මම සත්ථුසාසනෙ – යා සික්ඛා සුගතෙන**
**දෙසිතා**
**පරිසුද්ධපදං අනඞ්ගණං – කිං මං ඔවරියාන තිට්ඨසි**

ගරුකටයුතු ශාස්තෘශාසනයෙහි බුදුරජාණන් වහන්සේ විසින් යම් ශික්ෂාවක් පණවන ලදද, ඒ සිකපදයන් ගෙන් පිරිසිදු වූ කුසල් කොටස් ඇති රාගාදි කෙලෙස් රහිත වූ මං කුමකට අවුරා සිටින්නෙහි ද,

**ආවිලචිත්තො අනාවිලං – සරජො වීතරජං අනඞ්ගණං**
**සබ්බත්ථ විමුත්තමානසං – කිං මං ඔවරියාන තිට්ඨසි.**

කාමාදීයෙන් කැලැඹුණු සිත් ඇති කෙලෙස් සහිත වූ නුඹ කාමාදීයෙන් නොකැලැඹුණු, කෙලෙස් රහිත වූ මුළු ස්කන්ධ පඤ්චකයෙහි ම තෘෂ්ණාවයෙන් මිදුණාවූ මං කුමකට අවුරා සිටිහිද,

**ධූර්තයා**

**දහරා ච අපාපිකා චසි – කිං තෙ පබ්බජ්ජා කරිස්සති**
**නික්ඛිප කාසාය චීවරං – එහි රමාමසෙ පුප්ඵිතෙ වනෙ**

ඔබතුමී තුරුණු වියෙහි සිටියහුය, උත්තම රූපශෝභා ගෙන් යුතුය. එබඳු තට මොන පැවිද්දක්ද? එහෙයින් කසාවත් ඉවත දමව. එව අපි දෙදෙන මල්පිපි මේ වනයෙහි සිත් අලවං වසමු.

**මධුරඤ්ච පවන්ති සබ්බසො – කුසුමරජෙන**
**සමුට්ඨිතා දුමා**
**පඨමවසන්තො සුඛො උතු – එහි රමාමසෙ**
**පුප්ඵිතෙ වනෙ**

ගැම්පැත්තෙන් ම මිහිරි සුලං හමයි. වෘක්ෂයෝ වූකලී මද සුලඟින් ඔසවන මල් රොත් සමූහය කරණ කොට ලගත තුමූ මල් රොතින් ඔසවන ලද්දක් මෙන් වූවාහු, හාත්පස සුවඳ පතුරුවත්. මේ වසන්ත ඍතුව පිළිබඳ පළමුවන බක් මාසයයි. එහෙයින් එව අපි ඉඳගෙන මල් පිපි මේ වනයෙහි සිත් අලවා වසමු.

කුසුමිතසිඛරාව පාදපා – අභිගජ්ජන්ති ච මාළුතෙරිතා
කා නු යං රති භවිස්සති – යදි එකා වනමොත ; ස්සති

සුළඟින් කම්පා කරන ලද මුදුනෙහි පිපි මල් ඇති වෘක්ෂයෝ ද අපට පසසන්නාක් මෙන් වෙති. ඉදින් තනිය ම වනගත වන ඔබට කවර නම් ඇල්මක් ද?

වාළමිගසඞ්ඝසෙවිතං – කුඤ්ජරමත්තකරෙණු
ලොළිතං
අසහායිකා ගන්තුමිච්ඡසි-රහිතං භිංසනකං මහාවනං

සිංහ ව්‍යාඝ්‍රාදි රෞද්‍ර වන සතුන් වසන, මතැතුන් හා මත් ඇතින්නියන් විසින් ගස් අතු කැඩීමාදියෙන් කලඹන, බිය උපදවන සුලු, ජන ශූන්‍ය වූ මහවනයට තනියම යනු කැමැත්ති ද,

තපනියකතාව ධීතිකා – විචරසි චිත්තරථෙව අච්ඡරා
කාසික සුඛුමෙහි වග්ගුහි – සොභසි වසනෙහි නූපමෙ

උපමා රහිත තැනැත්තියෙනි. රනින් කළ බෝනික්කකු බඳු වූ ද, චිත්තරථ නම් දෙව් උයන්හි හැසිරෙන දෙව-ඟනක වැනි වූ ද, ඔබ (පැවිදි රුවින් තොරව) මනහර සියුම් සිනිඳු මට්ටම් කසිවත් හැඳ හොබනෙහි ය.

අහං තව වසානුගා සියං – ස ; විහරෙමසෙ
කානනන්තරෙ
න හි චත්ථි තයා පියතරො – පාණො කින්නරි
මන්දලොචනෙ

කිඳුරියකට බඳු ලද බෝලඳ ඇස් ඇත්තිය, ඉදින් මේ වනයෙහි අපි දෙදෙන එක්ව වෙළෙසමු නම්, මම තට වසඟ වන්නෙමි. තුඹට වඩා ප්‍රිය සත්වයෙක් මට වෙන නැත. නොහොත් මගේ පණට ත් වඩා මම තිට ප්‍රියකරමි.

යදි මෙ වචනං කරිස්සසි - සුඛිතා එහි අගාරමාවස
පාසාද නිවාන වාසිනී - පරිකම්මං තෙ කරොන්ති
නාරියො

ඉදින් මගේ වචනය පිළිගන්නෙහි නම් එකාන්තාදි බ්‍රහමචර්‍ය්‍යී දුක හැර දමා මං සමග එව. ගිහිගෙහි වසව. එවිට ප්‍රාසාදයන්හි වෙසෙන ස්ත්‍රීහු තිට වතාවත් කෙරෙති.

කාසික සුඛුමානි ධාරය - අභිරොහෙහි ච
මාලවණ්ණකං
කඤ්චනමණිමුත්තකං බහුං - විවිධං ආභරණං
කාරාමි තෙ

සියුම් කසී සළු දරව. සිරුර අලංකාරකරව. මල් ගඳ විලවුන් පරිභෝග කරව, තුඹට මහඟු මුතු මැණික් ඔබ්බවන ලද නොයෙක් රන් අබරණ කරදෙමි.

සුභොතරජපච්ඡදං සුභං - ගොනක තුලික
සන්ථතං නවං
අභිරූහ සයනං මහාරහං - චන්දන මණ්ඩිත
සාරගන්ධිකං

ගොඩින් සෝද හරණ ලද ධූලි ඇති තිරයෙන් යුත්, දික් එළු ලොමින් හා කළු කොඳු පලසින් අතුරා, හංස ලෝමාදිය ඇතුළෙහි බහා කළ කොට්ට ඇති, ගොශීර්ෂාදි සඳුන් ගරයෙන් සැරැසූ හෙයින් යහපත් සුවඳ ඇති මංහැණි යහනට නඟුව.

**උප්පලංව උදකාතො උග්ගතං - යථා තං අමනුස්ස සෙවිතං**

**එවං තුවං බ්‍රහ්මචාරිණී - සකෙසු අඞ්ගෙසු ජරං ගමිස්සති**

අමනුෂ්‍ය පරිගෘහීත විලක පිපි උපුල් මලක් (නිරඵක ව පරවී යන්නාක්) මෙන් බ්‍රහ්මචර්‍ය්‍යා ඇති නුඹ ද ස්වකීය ශරීරාවයවයන් කිසිවකු පරිභොග නොකළ කල්හි නිරඵකව ජරාවට යන්නෙහි ය. (පෙරළි කී පරිදි ධූර්තයා කී කල්හි ශුභාසුභවිරාගෙව් මෙ ළිමෙ ඇති.)

**කිං තෙ ඉධ සාරසම්මතං - කුණපපූරම්හි සුසානවඩ්ඪනෙ**

**භෙදනධම්මෙ කළෙවරෙ - යං දිස්වා විමනො උදික්ඛසි**

නුඹ යම් අරමුණක් දැක පෙරළුණු සිත් ඇත්තෙක් වැ බලන්නෙහිද, දෙතිස් කුණපයෙන් පිරුණු සොහොන් පුර- වන සුලු වූ බිඳෙන ස්වභාවය ඇති, මේ ශරීරයෙහි සාර වශයෙන් කවරක් දක්නා ලද්දෙහිද?

ධූර්තයා:-

**අක්ඛිනි ච තුරියාරිව - කින්නරියාරිව පබ්බතන්තරෙ**

**තවමෙ නයනානුදික්ඛිය - භිය්‍යො කාමරතී පවඩ්ඪති**

තිගේ ඇස් ලපටි මුවදෙනගේ මෙනි. නොහොත් ඇටිකිකිළියකගේ මෙනි. යළිදු පර්වත කුක්ෂියෙහි හැසි- රෙන කිඳුරියකගේ මෙනි. තිගේ මෙකී ගුණයෙන් යුත් ඇස් දැක මතු මත්තෙහි ත් මගේ කාමාශාව වැඩේ.

**උප්පලසිඛරොපමානි තෙ - විමලෙ හාටක සන්නිභෙ මුඛෙ**

**තව මෙ නයනානු දික්ඛිය - භිය්‍යො කාමගුණො පවඩ්ඪති**

ඉතා පිරිසිදු රන්රුවක මූව බඳු තිගේ මුහුණෙහි උපුල් පෙති අක්වන් ඇසිපිය ඇති තිගේ නෙත් බලතා මගේ කාමාශාව අතිශයින් ම වැඩේ.

**අපි දූරගතා සරම්භසෙ - ආයතපම්හෙ විසුද්ධනෙත්තෙ**
**න හි වජ්ජ තයා පියතරො - නයනා කින්නරි**
**මන්දලොචනෙ**

කිඳුරියකගේ මෙන් බොඳ නෙත් ඇත්තිය. දික් වූ පක්ෂම ඇත්තිය - පිරිසිදු නෙත් ඇත්තිය. නොපෙනෙන දුරකට ගියද මම තිගේ නෙත් සගල පිහිකරමි. තිගේ නෙත් සගලට වඩා ප්‍රියයෙක් මට නම් නැත.

ශුභා:-

**අපදේන පයාතු මිච්ඡසි - චන්දං කීළනකං ගවෙසසි**
**මෙරුං ලංඝෙතුමිච්ඡසි - යො ත්වං බුද්ධසුතං මග්ගයසි**

යම්බඳු වූ තෝ බුද්ධශ්‍රාවිකාවක වූ මා ප්‍රාර්ථනා කරන්නෙහිද? එය වූකලී සම මඟ තිබියදී ත් කටු සහිත බිය ජනක මඟකින් යන්නට සූදානම් වීම වැනිය. චන්ද්‍රයා ක්‍රීඩා කන්දුකයක් (පන්දක්) කරනු කැමැත්තාක් මෙනි. එය යොදුන් අසූ හාරදහසක් උස් මහමෙරට උඩින් පැනීමට තැත් කිරීමක් බඳුය

**නත්ථි හි ලොකෙ සදෙවකෙ - රාගො යත්ථ පි**
**දානි මෙ සියා**
**නපි නං ජානාමි කීරිසො - අථ මග්ගෙන හතො**
**සමූලකො**

යම් අරමුණක මං සිත ඇලේද, දෙවියන් සහිත ලෙව්හි එබඳු අරමුණක් නැත. සලිඳු කාම රාගය මුල් සහිත ව නසන ලදි. දැන් ඒ රාගය කෙබඳු දැයි කියාත් නොදනිමි.

**ඉඞ්ගාලකුයාව උජ්ඣිතො - විසපත්තොරිව**
**අග්ගිතො හතො**
**නපි නං පස්සාමි කීරිසො - අථ මග්ගෙන හතො**
**සමූලකො**

මහත් අඟුරු වලකට වංතමයෙන් ලූ දර කැල්ලක් මෙන්ද, බිඳලූ විස බඳුනක් මෙන්ද මං විසින් රාගය මංගීයෙන් නසන ලදී. ඒ රාගය කෙබඳුදැයි කියාත් නොදනිමි.

යස්සා සියා අපච්චවෙක්ඛිතං – සත්ථා වා
අනුපාසිතො සියා
ඛං තාදිසකං පලොභය – ජානන්තිං සො ඉමං
විහඤ්ඤසි

යම් ගැහැණියක විසින් මේ පඤ්චස්කන්ධය තතු වූ පරිදි පිරිසිඳ නොදන්නා ලදද, ධම් ශරීරය දැකීම් වශයෙන් ශාස්තෲන්වහන්සේගේ හෝ උපාසනය (වෙත එළැඹීම) නො කරන ලදද, තුඹ එබඳු ගැහැණියක පොළඹවා ගනුව. මේ ශරීරයෙහි තතු දත් මේ ශුභා මෙහෙණ වෙත එළඹ දෙලෙව්හි ම දුකට පැමිණෙන්නෙහිය.

මය්හං හි අක්කුට්ඨවන්දිතෙ – සුඛදුක්ඛෙ ච සතී
උපට්ඨිතා
සඞ්ඛතං අසුභන්ති ජානිය – සබ්බත්ථෙව
මනො න ලිප්පති

ආක්‍රොශ කිරීමෙහි ද වැඳීමෙහි ද සුවදුක් දෙකෙහි ද සිහිය එළඹ සිටියා ය. ත්‍රෛභූමික සංස්කාර අසුචි වශයෙන් දන සියලු භවයෙහි සිත නො ඇලෙයි.

සාහං සුගතස්ස සාවිකා – මග්ගට්ඨඞ්ගිකයාන යායිනී
උද්ධටසල්ලා අනාසවා – සුඤ්ඤාගාරගතා රමාමහං

බුද්ධ ශ්‍රාවිකාවක් වූ ඒ මම ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ග රථයෙන් නිවන් කරා යන්නියක් වෙමි. උදුරා දැමූ රාගාදි උල් ඇති ආශ්‍රව රහිත වූ මම ශූන්‍යාගාරයට ගියා සිත් අලවා වෙසෙමි.

දිට්ඨා හි මයා සුචිත්තිතා – සොම්භා
දාරුකපිල්ලකානි වා
තන්තීහි ච ඛීලකෙහි ච – විනිබද්ධා විවිධං පනච්චකා

අත් පා මුව ආදි වශයෙන් මනාව සිතියම් කරන ලද බෝනික්කෝ ද, ලීයෙන් කළ රූකඩ ද, නහරවැල් බඳු නූලින් අත් පා ආදිය සඳහා තබන ලද දඬුවල බඳනා ලද්දාහු නානා ලෙසින් නෘත්‍ය කරනවා මා විසින් දක්නා ලදහ.

**තමගුබමෙව තනජිබිලකෙ - විසාලෙ විසාලෙ**
**පරිපක්කඵලෙ**
**අවිජෙද ඛණ්ඩසො කතත - කිමහි තත්ථ මනං**
**නිවෙසයෙ**

එහි හුල් හං ලී කැබලි උදුරා වෙන් කොට තන්හි තන්හි විසුරුවා කඩ කඩ කොට පුණු විසුණු කළ කල්හි බෝනික්කෙක් හෝ රූකඩයක් එහි නො ලැබෙයි. එවිට බෝනික්කෙකැයි කුමක සිත යොදවාද?

**තථුපමා දෙහකානි මං - තෙහි ධම්මෙහි**
**විනා නවත්තන්ති**
**ධම්මෙ හි විනා නවත්තන්ති - කිංහි තත්ථ මනං නිවෙසයෙ**

මාගේ ශරීරාවයවයෝ ද පෙර කී රූකඩයකට බඳු උපමා ඇතියහ. ඒ පෘථිවි ආදි ධර්මයන්ගෙන් නැතහොත් චක්‍ෂු ආදි ධර්මයන්ගෙන් වෙන්ව ශරීරාවයව නො පවතියි. ඒ ශරීරාවයවයන්ගෙන් වෙන් ව දෙහය නො පවතියි. මෙයි කවරක් කෙරෙහි සත්ත්වසංඥාව වැටේද?

**යථාහරිතාලෙන මක්ඛිතං - අද්දස චිත්තිකං**
**භිත්තියා කතං**
**තම්හි තෙ විපරීතදස්සනං - සඤ්ඤා මානුසිකා**
**නිරත්ථිකා**

දක්‍ෂ කලාකාරයකු විසින් භිත්තියක සිරියලින් අඳින ලද චිත්‍රයක් දක්නේද, ඒ සිතියම් රූපය කෙරෙහි මිනිස් ස්ත්‍රියකැයි විපරීත දර්ශනයක් වේ නම්, එය නිරර්ථකය.

**මායං විය අග්ගතො කතං - සුජනෙනව**
**සුවණ්ණ පාදපං**
**උපගච්ඡසි අන්ධරිත්තකං - ජනමජ්ජෙරිව**
**රූපරූපකං**

මායා කාරයකු විසින් ඉදිරියෙහි කළ මායාවක් බඳු හීනෙන් දුටු රන් රුකක් වැනි වූ. පරමාර්ථයෙන් හිස් මේ ශරීරය හරය ඇත්තක් සේ දක්නෙහිද?

**වට්ටනිරිව කොටරොහිතා – මජ්ඣෙ**
**බුබ්බුළකා ස අස්සුකා**
**පීළකොළිකා චෙත්ථ ජායති – විවිධා චක්ඛුවිධා ච**
**පිණ්ඩිතා**

රුක් බෙනයක තුබූ ලාකඩ ගුලියක් වැනි ඇසි දල මධ්‍යයේ (ඇස් පිහාටු මැද) පිහිටි කඳුළු සහිත දිය බුබුලක් සේ දුගඳ හමන කබ නෙත්‍රයෙහි උපදී. නොහොත් ඇස්හි පොළ හටගත් ශ්වෙත නීලාදි චක්ෂුර් භාගයන්හි හා රක්ත පීතාදි සත් පටලයන් ගේ එක්වීම ඇස නමි. එහි සාර වස්තුයෙක් නැත.

**උප්පාටිය චාරුදස්සනා – න ච පජ්ජිත්ථ අසඞ්ගමානසා**
**හන්ද තෙ චක්ඛුං හරස්සු තං – තස්ස නරස්ස අදාසි තාවදෙ**

ඇසෙහි ම ඇලෙන ඔහුට ඇස්හි අනිත්‍යතාදිය පෙන්නා දුන් කල්හි ද ඒ ගැන ම ආශාවෙන් සිටි කල්හි සම් බඩු-වක් ගැන ආශාවෙන් සිටින සොරකු හට එය දී ගැලවී යන්නාක් මෙන් ඇස උපුටා දිනි. එහෙයින් කියන ලදී.

මනහර දැකුම් ඇති කිසි අරමුණක නො ඇළුණු ඒ භික්ෂුණී තොමෝ "එහෙනම් ඇස ගනුව"යි කියා ඒ මිනිසාට එකෙණෙහි ම ඇස ගලවා දුන්නීය.

**තස්ස ච විරමාසි තාවදෙ – රාගො තත්ථ ඛමාපයී ච නං**
**සොත්ථි සියා බ්‍රහ්මචාරිණී – න පුනො එදිසකං**
**භවිස්සති**

ඒ පුරුෂයා ගේ රාගය එකෙණෙහි ම සංසිඳුනි. එ තැන්හිදි ම ඒ මෙහෙණ (මං) කමා කරවා ගති. උතුම් හැසිරීම් ඇත්තිය තිට යහපතක් ම වේවා. මින් මතු මෙබඳු අනාචාරයක නො හැසිරෙන්නෙමි.

**ආසාදිය එදිසං ජනං – අග්ගිං පජ්ජලිතංව ලිඞ්ගිය**
**ගණ්හිස්සං ආසිවිසං විය – අපි නු සොත්ථිසියා**
**ඛමෙහි නො**

දිලිහෙන ගිනි කඳක් වැළඳ ගන්නාක් මෙන් විසකුරු සර්පයකු ගන්නාක් මෙන් මෙබඳු විතරාගී ජනයා ගවා ගහපතකුත් වේද, අපට කමාකළ මැනැවි යි ධූතීයා ප්‍රකාශ කෙළේය.

මුත්තා ච තතො සා භික්ඛුණී – අගමි බුද්ධවරස්ස
සන්තිකං
පස්සිය වර පුඤ්ඤලක්ඛණං – චක්ඛු ආසි යථා
පුරාණකං

ඒ ධූතියාගෙන් මිදුණු ඒ භික්ෂුණී තොමෝ බුදුරජාණන් වහන්සේ වෙත ගියාය. ශොභ පුණ්‍ය ලක්ෂණයෙන් හෙබි තථාගතයන් වහන්සේ දුටු කල්හි පෙර මෙන් ඇස ප්‍රකෘතිමත් විය.

# ශුභා (කම්මාරධීතා) ස්ථවිරාවෝ

මේ තොමෝ පෙර කළ පින් ඇත්තී අප බුදුරජාණන් වහන්සේ දවස රජගහ නුවර පොහොසත් රන්කරුවකු හට දූ වැ උපන්නා. මනාරූ සපුමෙන් යුත් හෙයින් 'සුභා' නම් වූ. නුවණ මුහුකුරා ගිය සුභාවෝ ශාස්තෘන්වහන්සේ කෙරෙහි අතිශයින් පහන් වූවාහු දිනක් තථාගතයන් වහන්සේ වෙත පැමිණ වැඳ එකත්පසෙක හුන්හ. බුදු-රජාණන් වහන්සේ ඉඳුරන් මුහුකුරා ගිය එතුමිය හට සිවුසස් ගැබ් කොටැ'ති දහමක් දෙසූසේක. ඒ සෝවාන් වූ මෑත කාලයේ දී ගිහි ගෙහි දොස් දැක මහා ප්‍රජාපතී ගෞතමිය වෙත පැවිදි වැ මතු තෙමග සඳහා බවුන් වැඩූහ. එවිට නෑ සමූහයා විටින් විට අවුත් කාමයන්හි රස පවසමින් වස්තුසම්භාරය ද පෙන්න පෙන්නා ගිහි වීමට ආරාධනා කළහ. දිනක් සුභාවෝ තමන් වෙත ආ නෑයනට කාමාදීනව ත්, ගිහි ගෙහි සම්බාධය ත් පවසමින් මෙසේ කීහ.

දහරා අහං සුද්ධ වසනා – යං පුරෙ ධම්ම මස්සුණිං
තස්සා මෙ අප්පමත්තාය – සච්චාභිසමයො අහු

පෙර පිරිසිදු වස්ත්‍රාභරණයෙන් සැරසුණු තරුණ වූ මම යම් ධර්මයක් ඇසූයෙම් ද, ඒ ධර්මයට අනුව අප්‍රමාද වැ සිල් ඉටා බවුන් වඩන මට චතුරාර්‍ය සත්‍යාවබෝධ විය. (සෝවාන්වීම්.)

තතො හං සබ්බකාමෙසු – භුසං අරති මජ්ඣගං
සක්කායස්මිං භයං දිස්වා – නෙක්ඛම්මමෙව පීහයෙ

ඒ බණ ඇසීමෙන් සියලු කාමයන්හි තදින් ම කල කිරුණෙමි. මේ පස්කඳ බිය විසින් දැක සසරින් නික්මීම මැ පතමි.

හිත්වාන'හං ඤාති ගණං – දාසකම්මකරානි ච
ගාමඛෙත්තානි ඵීතානි – රමණීයෙ පමොදිතෙ

මම වූ කලි නෑ සමූහයා ද, දැසි දස් කම්කරුවන් ද, සශ්‍රීක වැ වැඩුණු මනෝහර වූ ගම්-කුඹුරු-ඉඩකඩම් ආදිය ද ගණනට නොගෙන,

**පහායා'හං පබ්බජිතා - සාපතෙය්‍ය මනප්පකං**
**එවං සඞ්ඛාය නික්ඛම්ම - සඞ්ඛම්ම සුප්පවෙදිතෙ**

බොහෝ මුතු මැණික් රන් රිදී ආදි වස්තුව ද හැර දමා ගිහිගෙයින් නික්ම තථාගතයන් වහන්සේ විසින් මනා කොට ප්‍රකාශ කරන ලද ආර්‍ය්‍ය විනය සංඛ්‍යාත ශාසනයෙහි සැදැහැයෙන් පැවිදිවීමි.

**නාමෙතං අස්ස පතිරූපං - ආකිඤ්චඤ්ඤං හි පත්ථයෙ**
**යො ජාතරූපං රජතං - ඡඩ්ඩෙත්වා පුනරාගමෙ**

මට මේ සැපත නුසුදුසුයි. පළිබෝධ රහිත බව ම පතමි. යමෙක් රන් රිදී ආදි වස්තුව හැර එය නැවත පිළි-ගන්නේ නම්, හෙතෙමේ නුවණැත්තන් මැද කෙසේ නම් හිස ඔසවං සිටින්නට ද?

**රජතං ජාතරූපං වා - න බොධාය න සන්තියා**
**නෙතං සමණසාරුප්පං - න එතං අරියං ධනං.**

රන් රිදී ආදී වස්තුව මාර්ගාවබෝධයට හෝ නිර්වාණයට හේතු නොවෙයි. ඒ රන් රිදී ආදිය ශ්‍රමණයනට නො ගැළපේ. ඒවා ආර්‍ය්‍ය ධන ද නොවේ.

**ලොභනං මදනං චෙතං - මොහනං රජවඩ්ඪනං**
**සාසඞ්කං බහුආයාසං - නත්ථි චෙත්ථ ධුවං ඨිති**

ඒ රන් රිදී ආදී වස්තුව ලොභය උපදවයි. ධන මදය ඇති කරයි. මුළාව උපදවයි. රාගාදි රජස් දියුණු කරයි. සොර සතුරන් තමා මරාදේ යන බිය ද ඇති කරන හෙයින් සැකයට හේතුයි. බොහෝ වෙහෙස දරා ලබාගත යුතු යි. මේ ධනයෙහි ස්ථිර පැවැත්මෙක් නැත.

**එත්ථ රත්තා පමත්තා ච - සඞ්කිලිට්ඨමනා නරා**
**අඤ්ඤමඤ්ඤෙන ව්‍යාරුද්ධා - පුථු කුබ්බන්ති මෙධගං**

ඒ ධනයෙහි ඇලුන කුසල්දහම්හි පමා වූවෝ ලොභාදී කෙලෙසින් කිළුටු සිත් ඇත්තෝ නම් වෙති. ඔව්හු ඔවුනො-වුන් විරුද්ධ වූවාහු කලහ කරත්.

වධො, බන්ධො පරික්ලෙසො – ජානි සොකපරිද්දවො
කාමෙසු අධිපන්නානං – දිස්සතෙ ව්‍යසනං බහුං

කාමයන්හි ඇළුණවුන්හට මරණය ද, අනුබන්ධනාදී බැඳීම් ද, අත් පා සිඳීමාදි පීඩා ද, ධන හානිය ද, ශොකය හා විලාපය ද, යන නොයෙක් විපත්තීහු දක්නට ලැබෙත්.

තං මං ඤාතී අමිත්තාව – කිං වො කාමෙසු යුඤ්ජථ
ජානාථ මං පබ්බජිතං – කාමෙසු භයදස්සිනං

මාගේ ඤාතී වූ තෙපි කුමක් හෙයින් සතුරන් මෙන් මං කාමයන්හි යොදවුද? – මා කාමයන්හි බිය දක්නා සුලු පැවිදි මෙහෙණක බව දැන ගනිවු.

න හිරඤ්ඤසුවණ්ණෙන – පරික්ඛීයන්ති ආසවා
අමිත්තා වධකා කාමා – සපත්තා සල්ලබන්ධනා

කාමාසවාදීහු හිරණ්‍ය සුවර්ණයෙන් ක්ෂය නොවෙත්. කාමයෝ අහිත ගෙන දෙන හෙයින් මෛත්‍රී විරහිත වූවාහු අමිත්‍ර වෙති. මරණයට හේතු වන හෙයින් වධකයෝ නම් වෙත්. පසු පස්සෙන් එලවා ගොසින් විපත් සලසන හෙයින් සතුරු වෙති. රාගාදි උල් බඳනා හෙයින් සල්ල බන්ධනයහ.

තං මං ඤාති අමිත්තාව – කිං වො කාමෙසු යුඤ්ජථ
ජානාථ මං පබ්බජිතං – මුණ්ඩං සඞ්ඝාටිපාරුතං

නෑයෝ වූ තෙපි සතුරන් මෙන් එක්රැස් වැ කාමයන්හි නො ඇලුණු මං කුමක් හෙයින් කාමයන්හි යොදවු ද, හිස් මුඩු කළ සඟළ සිවුරක් දරූ මං පැවිදි මෙහෙණක බව දනිවු,

උත්තිට්ඨපිණ්ඩො උඤ්ඡා ච – පංසුකූලඤ්ච චීවරං
එතං ඛො මම සාරුප්පං – අනාගාරූපනිස්සයො

ගෙදෙරක් පාසා සිට ලබන පිණ්ඩාහාර ඇත්තී පිඩු සිඟීමෙහි හැසිරෙන්නී පංශුකූල වස්ත්‍ර දරමින් ප්‍රව්‍රජිතයන් විසින් සෙවියයුතු යම්බදු ජීවිත පරිෂ්කාරයක් වේ නම් එය පරිභොග කිරීම මට සුදුසුයි.

**චත්තා මහෙසීහි කාමා – යෙ දිබ්බා යෙ ච මානුසා**
**ඛෙමට්ඨානෙ විමුත්තා තෙ – පත්තා තෙ අචලං සුඛං**

බුද්ධාදි මහර්ෂීන් විසින් දිව්‍යමානුෂික කාමයෝ වර්ජණ ලදහ. කාම යෝගාදියෙන් උපද්‍රව විරහිත නිර්වාණය නිමිති කොට බුද්ධාදීහු කෙලෙසුන් ගෙන් මිදුණාහ. එසේ ම උන් වහන්සේලා අචල වූ නිවන් සුවයට පැමිණියාහුය.

**නා'හං කාමෙහි සංගච්ඡං – යෙසු තාණං න විජ්ජති**
**අමිත්තා වධකා කාමා – අග්ගික්ඛන්ධ සමා දුඛා**

යම් බඳු වූ කාමයන් පිරික්සන කල්හි එකකවත් පිහිටක් නැත්තේ ද, එබඳු කාමයන් හා මම එක් නොවෙමි. කාමයෝ වූ කලි සතුරෝ ය. වධ කරන්නෝය. ගිනි කඳු වැනියහ. දුක් එලවන්නාහ.

**පරිපන්ථො එසභයො – සවිඝාතො සකණ්ටකො**
**ගෙධො සුවිසමො ලෙපො – මහන්තො මොහනාමුඛො**

ඒ කාමයෝ වනාහි උවදුරු සහිත ය. බිය එළවන්නාහ. චිත්ත විඝාතකරයහ. කුසල් දහම් විනිවිදින හෙයින් කටු සහිතයහ. ගිජු බැව් පිණිස කාරණය. ඉතා ම විෂමය. සත්ත්වයන් අලවන ලාටුවක් බඳුය. ඉක්මවාලිය නොහැකි හෙයින් මහත්ය. මුළාවීමෙහි දොරටුවකි.

**උපසග්ගො භීමරූපො – කාමා සප්පසිරූපමා**
**යෙ බාලා අභිනන්දන්ති – අන්ධභූතා පුථුජ්ජනා**

අන්ධ පෘථග්ජනයෝ යමක් ගැන සතුටු වෙද්ද, ඒ කාමයෝ මහත් උවදුරු සහිතයහ. සර්පයකුගේ හිස මෙන් බිය සහිතයහ.

**කාම පඞ්කෙන සත්තා හි – බහු ලොකෙ අවිද්දසු**
**පරියන්තං නාභිජානන්ති – ජාතියා මරණස්ස ච**

කාම නමැති මඩෙහි ගිළුණු බොහෝ අඥනයෝ ජාති මරණ පිළිබඳ කෙළවර නොදනිත්.

**දුග්ගතිගමනං මග්ගං – මනුස්සා කාම හෙතුකං**
**බහුං වෙ පටිපජ්ජන්ති – අත්තනො රොගමාවහං**

මනුෂ්‍යයෝ වූකලී තමංට දෙලෝ දුක් ගෙන දෙන කාමය හේතු කොට ගෙන නිරංමඟට පිළිපදිත්.

**එවං අමිත්තජනනා – තාපනා සංකිලෙසිකා**
**ලොකාමිසා බන්ධනීයං – කාමා චරණ බන්ධනා**

සතුරන් ඇති කරන, තැවිම උපදවන සිත කෙලෙසන ලෝකයාගේ ඇම වූ, සංයෝජන ධර්මයන්ගෙන් බැඳියයුතු වූ කාමයෝ වනාහි සසර උත්පත්ති හේතු වශයෙන් පංබදිති.

**උම්මාදනා උල්ලපනා – කාමා චිත්ත පමාථිනො**
**සත්තානං සංකිලෙසාය – ඛිපං මාරෙන ඔඩ්ඩිතං**

කාමයෝ වනාහි ශෝකයෙන් උමතු කරවන්නාහ. අහෝ සැපය අහෝ! සැපය සී උඩුකුරු කැරගත් මුවින් කියන්නාහ. දැවිම ඉපදවීමාදියෙන් සිත පෙළන්නාහ. සත්වයන්හට අතරී ගෙන දෙන හෙයින් මරු විසින් අටවන ලද කෙමනක.

**අනන්තාදීනවා කාමා – බහු දුක්ඛා මහා විසා**
**අප්පස්සාද රණකරා – සුක්කපක්ඛ විසොසකා**

කාමයෝ වනාහි කෙළවරක් නැති දොස් ඇත්තාහ. අපායාදී නන් වැදෑරුම් දුක් අනු බඳනා සුළුයහ. කටුමැසි සයනාදියෙහි මෙන් මහා විෂ ඇත්තාහ. සැත් අග මීබිඳු මෙන් මඳ අස්වැසුම් ඇතියහ. රාගාදිය වඩන්නාහ. සත්වයන්ගේ යහපත් බව විනාස කරන්නාහ.

**සා'හං එතාදිසං කත්වා – ව්‍යසනං කාමහේතුකං**
**නතං පච්චාගමිස්සාමි – නිබ්බාණාභිරතා සදා**

නිවන්හි ඇළුණු සිත් ඇති ඒ මම මෙසේ දොස් සලකා ඒ වමාරං දමන ලද මෛථුන්දම් සෙවනය නැවත නොකරමි.

**රණං තරිත්වා කාමානං - සිති භාවාය කඩ්ඪති**
**අප්පමත්තා විහස්සාමි - තෙසං සංයොජනක්ඛයෙ**

සියලු කෙලෙස් දහ සංසිඳුණු රහත් බව කැමැත්තී ආර්ය මාර්ග පහර ගසා කාම යුද්ධයෙන් දිනා නිවනෙහි ඇලී අප්‍රමාදව වෙසෙමි.

**අසොකං විරජං ඛෙමං - අරියට්ඨඞ්ගිකං උජුං**
**තං මග්ගං අනුගච්ඡාමි - යෙන තිණ්ණා මහෙසිනො**

යම්බදු ආර්යමාර්ගයකින් බුද්ධාදී මහර්ෂිහු සංසාර මහෞඝයෙන් එතෙර වූවාහුද, ශොක රහිත වූ රාගාදී රජස් නැති නිර්භය වූ ඍජු වූ ඒ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය පිළිපදිමි,

**ඉමං පස්සථ ධම්මට්ඨං - සුභං කම්මාරධීතරං**
**අනෙජං උපසම්පජ්ජ - රුක්ඛමූලම්හි ඣායති**

තෘෂ්ණා විරහිත වූ අග්‍රමාර්ග ඵලයට පැමිණ රුකක් මුල ධ්‍යාන කරන කර්මාර ධීතෘ වූ, සුභා නම් මේ මෙහෙණ බලවු.

**අජ්ජට්ඨමී පබ්බජිතා -සද්ධා සද්ධම්ම සොභනා**
**විනීතුප්පලවණ්ණාය - තෙවිජ්ජා මච්චුහායිනී**

මාර්ගඵලාධිගමයෙන් සොබනාවූ ශ්‍රද්ධා ඇති, උත්පලවර්ණ ස්ථවිරාවන් විසින් හික්මවන ලද ත්‍රිවිද්‍යා ඇති, මරු පැරදූ මෑ තොමෝ පැවිදි වැ අදට දින අටක් ගෙවූය.

**සායං භුඤ්ජස්සා අන්නං - භික්ඛුණී භාවිතින්ද්‍රියා**
**සබ්බයොග විසංයුත්තා - කතකිච්චා අනාසවා**

කෙලෙස් පහ කිරීමෙන් නිදහස් වූ, කාමච්ඡන්දාදී ණය විරහිත, වඩන ලද ශ්‍රද්ධාදී ඉඳුරන් ඇති, හැම කාමාදී යොගයෙන් වෙන්වූ, සිවුමඟ කටයුතු අවසන් කළ, මේ භික්ෂුණී තොමෝ ආශ්‍රව රහිතය.

පෙරළ සඳහන් ගාථා තුන පැවිදිවූ අට වැනිද පලයම වත් සුමෙවත් ගසක්යට කල් යවන සුභා භික්ෂුණිය දුටු බුදුරජාණන්වහන්සේ භික්ෂූන් හට ඇය පෙන්වමින් ප්‍රශංසා මුඛයෙන් දෙශනා කරන ලදී.

තං සක්කා දෙව සඞ්ඝෙන - උපසංකම්ම ඉද්ධියා
නමස්සති භූතපති - සුභං කම්මාරධීතරං

කාමලෝකයෙහි සත්ත්වයනට අධිපති හෙයින් භූතපති නම් ලත් සක්‍රයා දෙවියන් සමග සෘද්ධියෙන් අවුත් කම්මාර ධීතෘවූ ශුභා භික්ෂුණිය වඳිති.

සර්වඥයන් වහන්සේ ශුභා ස්ථවිරාවන්ගේ ගුණ ප්‍රකාශ කරනු දිවැසින් දුටු ශක්‍රයා සහ පිරිවරින් අවුත් දෙහොත් මුදුනේ තබා වැන්දේය.

# පටාචාරා ස්ථවිරාවෝ

පියුමතුරා බුදුන් දවස හංසවතී නුවර කුලගෙයෙක්හි උපන් එක් කාන්තාවක් වූහ. බුදුරජාණන් වහන්සේ ගෙන් බණ අසමින් කල් ගෙවූ ඈ දිනක් තථාගතයන් වහන්සේ එක් මෙහෙණක විනයධර මෙහෙණන් අතුරෙන් අග තනතුරෙහි තබනු දුටු. එවිට ඈ ද මතු බුදු සසුනෙක්හිදී ඒ තනතුර ලැබීමට පැතුය. මෙසේ කොට දෙව් මිනිස් ලෙව්හි සැරිසරමින් අවුත් කසුප් බුදුන් දවස කිකී රජුන් ගෙහි සත් බුනුණනියන් ගෙන් එකියක් වැ ඉපදී විසිදහසක් හවුරුදු බඹසර රැකැ මහසඟනට පිරිවෙනක් කරවා පුද ඉන් සැවැ දෙව්ලෝ ගොස් ඉපිද මේ බුධෝත්පාද කාලයෙහි සැවැත්නුවර සිටු කුලයෙක්හි ඉපිද වැඩි විය පැමිණියහ. ඕ සිය ගෙහි එක් කම්කරුවකු හා කෙලෙස් සසගෙහි ගෙදී කුමරි බඹසර බිඳගත්හ. මවුපියෝ ඇය සම කුලික කුමරකු හට විවාහ කොටැ දෙන්නට දින නියම කළහ. එවිට ඈ අත්සර දන ගෙනැ පළමු සසගෙහි යෙදුණු කම් කරුවා හා පැනැ ගොස් පිටිසර ගමකට වත්හ. ටික කලක් ගෙවී ගිය පසු ඇයට දරුගැබ් හටගති. ගබ මේරා ගිය කලැ "සිය මාපියන් වෙත යමු"යී ඈ නොයෙක් විට කියද්දීත් "අදයමු හෙට යමු"යී කියමින් හේ පමා කෙළේය. දිනක් ඔහු ගෙයින් බැහැර ගිය විට ගෙහි හකුළා තැබූව මනා බඩු හකුළා තබා, යන්නට නික්මැ "මං මාපියන් වෙත ගිය බව සැමියාට කියවු"යි අසල් ගෙහි වැස්සනට පවසා පිටත් වැ ගියහ. සැමියා ගෙට අවුත් බැලූවිට සිය ඇඹේණිය නොදැක පිරික්සත්ම ගමට ගිය බැව් නුදුරු ගෙයින් දැනැ වහා පසු පස්සේ දුව ගොස් හමු වැ දෙදෙනා ම එක් වැ ගියහ. මෙසේ යන අතර මග දී ම දරුවාගේ බිහිවීම විය. එහෙයින් දෙදෙනා ම ආපසු හැරී ආහ. දෙවනවට ද දරුගබක් හටගත් කල්හි පෙර සේම කියා මවුපියන් බලා නික්මුණාහ. මුල් වතාවේ මෙන් ම සැමියා පස්සෙන් දිව පැමිණියේය. ඒ ලිය අතරමඟදී

දරුවකු වැදූ ය. ඒවේලෙහි මහා අකාලමේඝයක් ද ඇති විය. පුරුෂයා යම්තම්වත් නොතෙමෙන ලෙසක් කිරීමට සිතා කැලයට ගොස් කොළ - අතු ආදිය රැස්කිරීමෙහි යෙදුණේය. එවිට එක් විෂඝෝර නාගයකු විසින් දෂ්ට කරනු ලැබූ හේ එහි ම මළේය. සැමියා එනතුරු මග බලමින් සිටි ඒ ස්ත්‍රිය මහත් දුකින් රැය ගෙවා සැමියාගේ පමාව ගැන පිරික්සනුව දරු සිඟිත්තන් දෙදෙනාත් රැගෙන ඉතා අමාරුවෙන් ම ඔහුගේ අඩි සලකුණු ඔස්සේ ගියාහ. තුඹසක් මතු මැරී වැටී තුබුණු සැමියාගේ මළ සිරුර දුටු ඉමහත් සොවින් මා පියන්දෙසට ම පා නැඟුය. මුළු රැය වැසීවට හෙයින් තන පමණට ගලා තුබුණු අචිරවතී ගඟ දුටු "මම් මෙසේ මෙය තරණය කරමු"යි සිතූ 'පළමු වැ ළදරුවා පරතෙර තබා අවුත් පසු වැ දෙටුදරුවා ගෙනැයමි''යි අදිටන් කොට ළදරුවා ගෙනැ ගොස් ගෙරදි දරණුවෙක්හි තබා වසා ගඟට බැස ආහ. එය දුටු උකුස්සෙක් "මස් පිඩකැ'යි සිතා වේගයෙන් එතැනට. බට් උකුස්සා එළවාපීමට ගැහැණිය අත්පොළ සත් දී "සූ - සූ"යි ශබ්ද කළාහ. එහෙත් ඒ නිෂ්ඵල වී. මෙම්ගොඩ සිටි ළමයා "මගේ මෑණියන් මට හඬගසති"යි සිතා දිවැ අවුත් ගඟෙහි හිණි. හේ සැඩ පහරට අසුවිණ. මව දුව ගියද පුතු බේරා ගනුව අපොහොසත් වූ. මෙසේ දෙ දරු සිඟිත්තන් ද මරු වසඟ වූයෙන් හඬමින් වැළපෙමින් සැවැත්නුවර දෙසට යන ඇයට දක්නට ලැබුණේ සැවැත් නුවරින් නික්මැ එන මගියෙකි. ඔහු දුටු සිය මා පියන් තොරතුරු විමසනුව 'අසුවල් සිටුකුලයෙහි තොරතුරු කිමදැ'යි ඇසූ. එවිට ඒ පුරුෂයා'' යෙහෙළිය, ඒ සිටුකුලයේ තොරතුරු තබා අනෙකක් අසවු''යි කී. 'මට එය මුත් අනෙකක් ඇසීම ප්‍රයෝජන නැති'' යි ඕ කීය. එසේ නම් අසවු;- ඊයේ රෑ වට මහ වැස්සක් විය. එයින් තෙල සිටු මැදුර කඩා වැටී එහි හුන් මවුපියෝත් පුත් කුමරාත් යටවැ ගෙනැ මළෝය. දැන් තිදෙන ම එක සෑයෙක්හි දැවෙත්''යි කී. එය ඇසූ ගැහැණිය සොවින් උමතු වූ. හැදි වත ගිලිහී වැටෙනුදු නොමදතු. උපන්වනින්ම-

**"උභො පුත්තා කාලකතා – පන්ථෙ මය්හං පතී මතො
මාතා පිතා ච භාතා ච – එකචිතකම්හි ඩය්හරෙ.**

දෙපුත්තු මැ කළුරිය කළෝ. මා සැමියා මඟ මළේ. මව්ත් පියා ත් සහෝදරයා ත් එක් සෑයක්හි ම දැවෙත්. යි කෑ ගසමින් ඔබිනොබ දුව ගියාය. ඉන්පසු හැඳි වත පමණ වතකිනු දු වියුතු වූ හෙයින් ඕ පටාචාරා නම් වූ. උමතුවෙයෙන් විලාප දිදී යන ඇය දුටු දනෝ උසුළු විසුළු කිරීම් ගල් මුල් ගැසීමාදි හිරිහැර කළහ. එවේලෙහි ශාස්තෘනායකයන් වහන්සේ දෙව්රමෙහි මහ පිරිස් අමතා බණ දෙසමින් සිටිසේක්, ඇය ගේ එහි පැමිණීම අපෙක්ෂා කළ සේක. පටාචාරාවෝ විහාරයට වත්හ "සහෝදරිය, සිහි එළවා ගනුව"යි තථාගතයන් වහන්සේ දෙසූහ. ඕ එකෙණෙහි සිහි ලැබැ උළුලුයෙන් (උක්කුටිකයෙන්) හිඳගත්හ. මෙතැ සිටියෙක් උතුරුසළුවක් දුනි. එය හැඳ තථාගතයන් වහන්සේ පසඟ පිහිටුවා වැඳ තමාට සිදු වූ විපත් සියල්ල ම කියා සිටියහ. ශාස්තෘන්වහන්සේ "පටාචාරාවනි, ඒ ගැන නොසිතන්න. තිට උදව් වියැ හැක්කහු වෙත ම. ආවාහුය. තී දූත් පුත්‍රාදීන් ගේ මරණ හේතුයෙන් යම්සේ හඩහුද; එසේම අනවරාග්‍ර සංසාරයෙහි පුත්‍රාදීන්ගේ මරණ හේතුයෙන් වැගුරූ කඳුළු සිවු මහ මුහුදු දිය ද පසුබා සිටිය"යි යටැ දක්වෙන ගයින් දම් දෙසූහ.

**"චතුසු සමුද්දෙසු ජලං පරිත්තකං
තතො බහුං අස්සුජලං අනප්පකං
දුක්ඛෙන ඵුට්ඨස්ස නරස්ස සොචතො
කිං කාරණා සොකවසා පමජ්ජසි"යි**

බුදුහු මෙසේ සාංසාරික ස්වභාවය දෙසූහ. පටාචාරාවගේ ශොකය පියුම් පතැ දිය සේ ලිස්සා ගියේය. එසඳ බුදුහු "පටාචාරාවනි, පරලෝ යන්නහුට පිළිසරණ වීම්වස් පුත්‍රාදීහු අපොහොසත් වෙති. එහෙයින් නුවණැත්තහු විසින් නිවන් මඟ පිරිසුදු කටැයුත්තේය' යි මෙසේ පවසා වදාළහ. කෙසේදයත්:-

නසන්ති පුත්තා තාණාය - න පිතා නාපි බන්ධවා
අන්තකෙනාධිපන්නස්ස - නත්ථි ඤාතීසු තාණතා

එත මත්ථවසං ඤත්වා - පණ්ඩිතො සීලසංවුතො
නිබ්බාණ ගමනං මග්ගං - ඛිප්පමෙව විසොධයෙ''

කියා යි.

මේ දෙසුම් අවසන්හි ඕ සෝවාන් වැ පැවිද්ද ඉල්ලූහ. භාග්‍යවතුන් වහන්සේ ඇය භික්ෂුණීන් වෙතැ පමුණුවා පැවිදි උපසපත් කරවූසේක. ඒ පටාචාරාවෝ දිනක් කළයකට දිය ගෙනැ පා දොවමින් සිටියහ. පළමුවෙන් වගුරුවා ගත් දිය මඳ තැනක් ගොස් සිඳී ගියේ ය. දෙවනු වැ වගුරුවා ගත් දිය ඉන් මඳ තැනක් ගොස් සිඳී ගියේ ය. තෙවනු වැ වගුරුවා ගත් දිය ඉනුත් මඳ තැනක් ගොස් සිඳී ගියේ ය. එවිට ඕ තොමෝ තුන්වයස් සලකා මෙසේ සිතූහ. මං මුලින් දැමූ දිය මඳ තැනක් ගොස් පොළොවට සිඳී ගියාක් මෙන් සත්ත්වයෝ මුල් වියෙහි ද මැරෙත්. දෙවැනි වැ දැමූ දිය ඉන් මඳ තැනක් ගියා සේ සත්ත්වයෝ මැදුම් වියෙහි ද මැරෙත් ඉනිදු මඳ තැනක් ගොස් සිඳි දිය සේ සත්ත්වයෝ මහලු කල්හි මැරෙතැ''යි කියා යි. එය දුටු තථාගතයන් වහන්සේ ගඳකිළියෙහි හුන්සේක් මැ අවභාසයක් විහිදුවා ඇය හමුයෙහි දෙසන්නාක් මෙන් ''පටාචාරාවෙනි, ඒ කරුණ එසේම ය, ඒ කරුණ එසේ ම ය හැම සත්හු මැ මැරීම දහම් කොට ඇත්තාහ. ඒ උදය ව්‍යය දෙක නොසලකා හවුරුදු සියයක් ජීවත්වන්නහුගේ ජීවිතයට වඩා ඒ මැරීම්-ඉපදීම් සලකන්නහුගේ එක් දවසක් ජීවත්වීම මැ (යටත් පිරිසෙයින් මොහොතක් ජීවත්වීම වුවත්) වටින්නේය යි දක්වනසේක්.

''යො ච වස්සසතං ජීවෙ - අපස්සං උදයව්‍යයං
එකාහං ජීවිතං සෙය්‍යො - පස්සතො උදයව්‍යයං''

යන මේ ගාථාව දෙසූසේක. ගාථාවසානයෙහි පටාචාරාවෝ පිළිසිඹියා සමඟ රහත් වූහ. පසු වැ බුදු වචනය ඉගෙනැ ගත්තාහු වෙසෙසින් මැ විනය පිටකයෙහි චිණ්ණවසී වූහ. එහෙයින් මැ විනයධර භික්ෂුණීන් අතුරෙන් අග්‍රතනතුරු ලැබූහ. ඉන් මොබැ තමන් රහත් වූ සැටි පවසමින් මේ උදාන ගාථාවන් ප්‍රකාශ කළහ.

**නඞ්ගලෙහි කසං ඛෙත්තං - බීජානි පවපං ඡමා**
**පුත්තදාරානි පොසෙන්තා - ධනං වින්දන්ති මාණවා**

මෙ ලෝවැසි සත්ත්වයෝ නගුලින් කෙත සා, බිමැ බිජු වපුට, ඉන් අඹුදරුවන් පොෂ්‍යය කරත්. ධනය ද ලබත්. මෙලෙස ප්‍රඥප්ත්‍යාත වූ උත්සාහය සඵලවෙයි.

**කිමහං සීලසම්පන්නා - සත්ථු සාසනකාරිකා**
**නිබ්බාණං නාධිගච්ඡාමි - අකුසීතා අනුද්ධතා**

එමෙන් ම සිල්වත් වූ බුද්ධාවවාදය පිළිපදින්නාවූ, නොකම්මැලි වූ උඩගු නො වූ මම නිවන් ලබන්නට පොහොසත් වීම්.

**පාදෙ පක්ඛාලයිත්වාන - උදකෙසු කරොමහං**
**පාදොදකඤ්ච දිස්වාන - ථලතො නින්නමාගතං**

පා සෝදා උස් බිම සිට පහතට ගලා ආ ඒ පා දෙවී දිය දැක අනිත්‍ය දුඃඛ අනාත්ම වශයෙන් විදර්ශනා කෙළෙමි.

**තතො චිත්තං සමාධෙසිං - අස්සං භද්‍රං ව ජානියං**
**තතො දීපං ගහෙත්වාන - විහාරං පාවිසිං අහං**

දක්ෂ සාරථියෙක් ආජානීය අසකු සුවසේ මෙහෙයා ද එසේ ම මම මගේ සිත විදර්ශනා සමාධියෙන් සමාහිත කෙළෙමි. ඉක්බිති පහනක් ගෙන ලගිනා සෙනසුනට ගියෙමි,

**සෙය්‍යං ඔලොකයිත්වාන - මඤ්චකම්හි උපාවිසිං**
**තතො සූචිං ගහෙත්වාන - වට්ටිං ඔකස්සයාමහං**
**පදීපස්සෙව නිබ්බාණං - විමොක්ඛො අහු චෙතසො**

එසේ ගොස් පහන් එළියෙන් යහන බලා එහි හිඳ ගතිමි. එහි හිඳ ගෙන අඬුලු කූරෙන් පහන් තිරය තෙලට ලං කොට ඇද්දෙමි. එකෙණෙහි ම පහන නිවී ගියේය. එයම අරමුණු කොට සිත සමාහිත විය. විදර්ශනා විථියට වැටුණි. මාගේ සිත්හි කෙලෙස් නිවී ගියේය.

මෙසේ පටාචාරා ස්ථවිරාවෝ තමන් රහත් වූ බව ප්‍රකාශ කළහ.

# කිසාගෝතමී ස්ථවිරාවෝ

මේ තොමෝ පියුමතුරා බුදුන් දවස හංසවතී නුවර කුලගෙයක ඉපිද ශාස්තෲන් වහන්සේ ගෙන් බණ ඇසී මෙහි නිරත වැ සිටියාහ. දිනක් එක මෙහෙණක ත්‍රිවිධ රූක්‍ෂයෙන් සමන්විත පංශුකූල දරණ මෙහෙණන් අතුරෙන් අගතන්හි තබණු දුටු ඕ තොමෝ මතු බුදුසසුනක දී ඒ තනතුර ලබා නිවන් දක්නට පැතුවාය. මෙසේ පතා සසර සැරිසරමින් එන්නී මේ බුදුන් දවස සැවැත්නුවර දුගී කුලයෙකැ ඉපිද “ගෞතමී” නම් වූවා, කෘශ ශරීර වූ යෙන් පසු වැ කිසා ගෞතමී යයි ප්‍රකට වැ ගියාය. මවුපියෝ ඈය විවාහ කොට දුන්හ. දුගී කුලයෙකින් ආ බැවින් ඈයට නොයෙක් නින්‍දා බස් අසන්නට ලැබිණ. ඕ පසු වැ පුතකු වැදූයෙන් ඈවත් බොහෝ අය සැලකූහ. කුමරා ඔබිමොබ දුව - පනිමින් කෙළනා කල්හි මළේය. ඉන් ඕහට බලවත් ශෝක ඇති වී. උමතුවට ද පෙරළිණි. “ඕ තොමෝ” මම මේ ගෙහිදී ම පුතු ලැබෙන්නට පළමු වැ නොයෙක් නින්‍දා ලද්දෙමි; පුතු උපන් තැන් පටන් මට කවුරුත් සම්මාන කළහ. දැන් නැවතත් මපුතු ගෙයින් බැහැර දමන්නට සැරසෙතැ’යි උමතුයෙන් සිතා මළ පුතු ඇකයෙහි හොවා ගෙනැ “මගේ පුතුට බෙහෙතක් දුන මැනැවැ”යි ගෙ පිළිවෙළින් හැසිරුණහ. එබසට කන් දුන්නෝ පිරික්සා බලා “මේ මළකුණෙක. මළ කුණට බෙහෙත් දන්නෝ කවුරුදැ”යි නින්‍දා කොට එළවා ලූහ. මෙසේ යන් මැ එක් නුවණැත්තෙක් “මෙයට බෙහෙත් දන්නෝ නම් තිලෝගුරු බුදු රජාණන් වහන්සේ ම ය. එ බැවින් එහි යව”යි දෙව්රම් වෙහෙරට යොමුකොට යැවීය. එවේලෙහි භාග්‍යවතුන් වහන්සේ මහ පිරිස්හි බණ දෙසමින් සිටිසේක. ගෞතමිය මළ පුතු කරපින්නා ගෙනැ පිරිස් කෙළවර සිට “ස්වාමීනි මාගේ පුතුට බෙහෙතක් දුනමැනැවැ”යි කීහ. එසඳ බුදුහු “ගෞතමිය නී බෙහෙත් සොයා මෙහි ආවා යහපති. මම එයට සුදුසු

බෙහෙත දීමට සමත් වෙමි. ඔබ පළමු කොට මේ නුවර මුල පටන් අවසන තෙක් ඇවිද යම් ගෙයක මළ විරූ කිසිවෙක් නැත් නම්, ඒ ගෙයින් අබ ටිකක් ගෙනෙව"යි නියම කළහ. ඈ යහපතැ"යි පිළිවදන් දී නොපමාවැ නුවරට වැද පළමු ගෙයින්" මෙහි කිසිවෙක් නොමළේ නම් ම පුතුගේ රෝග සංසිඳුවා ලීමට අබටිකක් දුන මැනැව; නොමළ විරූ තැනකින් ම අබ ගෙනෙන්නට භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කළ සේකැ"යි කියා ඉල්ලූය. ගෙ වැස්සෝ "මෙහි මළවුන් ගණින්නට කවරෙක් සමත් වෙද්ද"යි කීහ. "එසේ නම් අබවලින් මට ප්‍රයෝජනයක් නැතැ"යි පවසා ගෞතමිය ඉක්බිති ගෙට ගියහ. ඔබින් ද ලදුයේ ඒ පිළිතුරය. මෙසේ දෙතුන් ගෙයකට ගොස් ඒ පිළිතුර ම ලැබ බුදු අනුහසින් උමතු බැව් පහ වැ ගොස් මෙසේ සිතූහ. මුළු නුවරට ම මේ කරුණ මෙසේ ම විය යුතුය. මහාකාරුණික බුදුරජාණන් වහන්සේ මා මේ ව්‍යාපාරයෙහි මෙහෙයවා ලූයේ මට මෙකරුණ අවබෝධ කරවීම පිණිස විය යුතුය" කියා යි. ඉන් පසු මළ පුතු අමු සොහොනෙහි දමා මේ ගය ගැයූ.

"න ගාමධම්මො නො නිගමස්ස ධම්මො
න චාපියං එකකුලස්ස ධම්මො
සබ්බස්ස ලොකස්ස සදෙවකස්ස
එසො ච ධම්මො යදිදං අනිච්චතා"

යම් මේ අනිත්‍යතාවයක් වේ නම්, එය ගමකට අයත් සවභාවයක් නොවේ. නියම් ගමකට අයත් සවභාවයකුත් නොවේ. එක කුලයකට (පවුලකට) අයත් සවභාවයක්ද නොවේ. දෙවියන් සහිත වූ මුළු ලොවට ම අයත් සවභා-වයකි කියායි. මෙසේ කියා ශාස්තෘන් වහන්සේ සමීපයට ගියහ. 'ගෞතමිය, නොමළ විරූ තැනෙකින් අබ ලදද"යි බුදුන් වහන්සේ ඇසූ සේක. සවාමීනි අබවලින් කම් නැත. මට පිහිට වුව මැනැවි"යි ඕ කීහ.

''තං පුත්ත පසු සම්මත්තං - ව්‍යාසත්තමනසං නරං
සුත්තං ගාමං මහොඝො ව - මච්චු ආදාය ගච්ඡති''

දරුවන් හා ගව මහිෂාදීන් නිසා මත් වූ, කාම වස්තූන් කෙරෙහි වෙසෙසින් ම ඇළුණු සිත් ඇති ඒ මිනිසා නිදිගත් මිනිස් සමූහයා ඇදගෙන මුහුදට ගලා යන මහ ගංවතුරක් සෙයින් මරණය තෙම ඇදගෙන යන්නේය''යි තථාගතයන් වහන්සේ දෙශනාකළසේක. දෙසුම් කෙළවර ගෞතමිය සෝවාන් වැ පැවිදි බව ඉල්වූය. බුදුහු පැවිදි බව අනුදත්හ. ඇය තෙ සලක් බුදුන් පැදකුණු කොට වැඳ මෙහෙණවරට ගොස් පැවිදි උපසපන් වැ විදසුන් වඩන්නට පටන් ගත් සඳ බුදුහු

''යො ච වස්සසතං ජීවෙ - අපස්සං අමතං පදං
එකාහං ජීවිතං සෙය්‍යො - පස්සතො අමතං පදං''

යන මේ ඔභාස ගාථාව වදාළහ ''නිවන නොදකි-මින් සියවසරක් ජීවත් වුව ද ඔහුගේ ජීවත්වීමට වඩා නිවන දකිමින් දවසක් ජීවත් වීම ම උතුම්ය'' යනු ඒ ගාථායෙහි අදහස යි. මේ ගාථාවගේ අවසානැ රහත් වැ පිරිකර පරිහරණයෙහි පරමොත්කෘෂ්ට වූවා ත්‍රිවිධ රූක්ෂ-තාවයෙන් සමන්විත පංශුකූල චීවරයක් පොරොවා හැසුරු-ණාහ. පසු වැ තථාගතයන් වහන්සේ කිසාගෞතමී ස්ථවිරාවන් රූක්ෂ චීවර ධාරී මෙහෙණන් අතුරෙන් අග තන්හි තබා වදාළ සේක. පසුව තථාගතයන් වහන්සේ නිසා මේ උතුම් සැනසුම ලදිමි''යි සැලැකූ කිසාගෞතමී ස්ථවිරාවෝ කළණ මිතුරු බැව්හි ලා පැසැසීම් වශයෙන් මෙසේ කීහ.

කල්‍යාණ මිත්තතා මුනිනා - ලොකං ආදිස්ස වණ්ණිතා
කල්‍යාණමිත්තෙ භජමානො - අපි බාලො පණ්ඩිතො අස්ස

මුනිඳුයන් වහන්සේ විසින් කල්‍යාණ මිත්‍රයන් ඇති බව ලෝ වැස්සා උදෙසා වර්ණනා කරන ලදී. කල්‍යාණ මිත්‍රයන් සේවනය කරන නුවණ මද තැනැත්තේ ද නුවණැත්තෙක් වන්නේය.

**භජිතබ්බා සප්පුරිසා - පඤ්ඤා තථා වඩ්ඪති භජන්තානං**
**භජමානො සප්පුරිසෙ - සබ්බෙහිපි දුක්ඛෙහි පමුච්චෙය්‍ය**

බුද්ධාදි සත්පුරුෂයෝ ඇසුරු කට යුත්තාහ. එසේ ඇසුරු කරන්නවුන්ගේ ප්‍රඥාව වැඩෙයි. බුද්ධාදි සත්පුරුෂයන් ඇසුරු කරන්නා හැම සසර දුකින් ම මිදෙයි.

**දුක්ඛඤ්ච විජානෙය්‍ය - දුක්ඛස්ස ච සමුදයං නිරොධං**
**අට්ඨඞ්ගිකඤ්ච මග්ගං - චත්තාරිපි අරියසච්චානි**

සත්පුරුෂයන් ඇසුරු කරන්නා දුඃඛ - සමුදය නිරෝධ - මාර්ග යන චතුරාර්‍ය්‍ය සත්‍යය අවබෝධ කරයි. (මෙය අසංහුත් යක්ෂණියක් පෙර තමා විඳි දුක සිහි කොට මතු ගාථා දෙක කීහ.)

**දුක්ඛො ඉත්ථිභාවො - අක්ඛාතො පුරිසදම්ම සාරථිනා**
**සපත්තිකම්පි දුක්ඛං - අප්පෙකච්ච සකිං විජාතායො**

“පුරිසදම්මසාරථි වූ බුදුරජාණන් වහන්සේ විසින් ස්ත්‍රීභාවය දුකැ”යි ප්‍රකාශ කරන ලදී. අඹුවන් කීප දෙනකු සිටින පිරිමියකුට අඹුවක වීම ද දුකකි. එක්වරක් මද නැවත ඒ දුක විඳිනු නො කැමැති ස්ත්‍රීහු-

**ගලකෙ අපි කන්තන්ති - සුඛුමාලිනියො විසානි ඛාදන්ති**
**ජනමාරක මජ්ඣගතා - උභො'පි ව්‍යසනානි අනුභොන්ති**

තමන් ගේ ගෙල සිඳගනිත්. සියුමැලි සිරුරු ඇති නිසා දුක නො ඉවසා මැරෙන්නට වස කති. මූඪගබ් වූ කලැ දරුවා ත් මව ත් යන දෙදෙනම මහත් පීඩාවට පත් වෙති.

කිසාගොතමිය පටාචාරාව අරමුණු කොට මෙසේ කියති.

**උපවිජඤ්ඤා ගච්ඡන්ති - අද්දසාහං පතිං මතං**
**පන්ථම්හි විජායිත්වාන - අප්පත්තාව සකං ඝරං**

වැදීමට කල් පැමිණි කල්හි සිය ගෙදරට නො පැමිණ ම මග දී වදා, තමනට පිහිට වශයෙන් සිටි සැමියා ද මළ සතින් දුටිමි.

**දෙව පුත්තා කාලකතා - පතීච පන්ථෙ මතො**
**කපණිකාය**
**මාතා පිතා ච භාතා - ඩය්හන්ති ච එකචිතකායං**

ඒ අවාසනාවන්තියගේ දරු දෙදෙන ද මළහ. සැමියා ද මඟ මළේය මවු ද පියා ද සහෝදරියද, යන තිදෙන එක් සෑයෙකැ දැවෙත්. එබඳු දුක් උසුලන ස්ත්‍රීන් දැක්කෙමි.

තමා විදි දුක ද මෙසේ පවසති.

**ඛීණා කුලීනෙ කපණෙ - අනුභූතං තෙ දුක්ඛං**
**අපරිමාණං**
**අස්සු ච තෙ පවත්තං - බහූනි ජාති සහස්සානි**

දුගී කුලයන්හි ඉපිද තී විඳි දුක් අපමණය. නොයෙක් ජාතීන්හි තීගේ ඇසින් ගැලූ කඳුළු සයුරු දිය පරදවයි.

**වසිතා සුසානමජ්ඣෙ - අථොපි ඛාදිතානි පුත්තමංසානි**
**හත කුලිකා සබ්බ ගරහිතා - මතා පතිකා අමතං අධිගච්ඡිං**

බලු සිවල් වැ සොහොනෙහි විසිමි. ව්‍යාඝ්‍රාදීන් වී පුත්‍ර මාංශය ද කන ලදී. කා විසිනුත් නිඳා කල, නැසීගිය කුල පරපුර ඇති වැන්දඹු ස්ත්‍රිය කල්‍යාණ මිත්‍රයන් නිසා නිවනට පැමිණියහ.

**භාවිතො මෙ මග්ගො - අරියො අට්ඨඞ්ගිකො අමතගාමි**
**නිබ්බාණං සච්ඡිකතං - ධම්මාදාසං අවෙක්ඛිහං**

මා විසින් නිවන් යන අරී අටඟි මඟ වඩන ලදී. නිවන ප්‍රත්‍යක්ෂ කරන ලදී. මම දහම් කැඩපත දැක්කෙමි.

**අහං හි කන්තසල්ලා - ඔහිත භාරා කතං හි කරණීයං**
**කිසාගොතමී ථෙරී - විමුත්තචිත්තා ඉමං අභණි**

මම වනාහි ආර්‍යමාර්ගයෙන් උගුළං දමූ රාගාදි හුල් ඇත්තියක්මු. බහා තැබූ ස්කන්ධාදි බර ඇත්තියක්මු. සිවුමඟ කට යුතු කරන ලද තැනැත්තියක්මු. (රහත් වූ කිසාගෝතමිය මෙසේ කීහ.)

——

# භද්‍රාකුණ්ඩලකේසා ස්ථවිරාවෝ

මෝ තොමෝ ත් පියුමතුරා බුදුන් දවස හංසවතී නුවර කුලගෙයක ඉපිද, බුදුන්වහන්සේගෙන් බණ අසමින් හුන් තැනැත්තී එක් භික්ෂුණියක ක්ෂිප්‍රාභිඥ ලාභීන් අතුරෙන් අගතන්හි තබනු දැක තොමෝ ද ඒ තනතුර පතා පින් දහම් කොට කසුප් බුදුන් දවස කිකී නම් කසී රජුට දූ වැ හවුරුදු විසිදහසක් බඹසර සැරූ බික්සඟනට පිරිවෙනක් කරවා පුදා අප බුදුන් දවස රජගහ නුවර එක් සිටු කුලයෙක උපන්හ නමින් භද්‍රා නම් වූ ය.

වැඩි විය පැමිණි භද්‍රාවෝ දිනක් මහජන හඬක් අසා "මේ කිමෙක්දැ"යි සීමැදුරැ කවුළුව විවර කොට බලත් ම එනුවර පුරෝහිතයා පිත් "සත්තුක" නම් සොරැ පැහැර ගත් බඩු සහිත ව මරනු සඳහා ගෙන යනු දැක ඔහු පිළිබඳ සිතැති වැ "ඔහු නො ලද මැරෙමැ"යි ඉටා යහනැ වැතිරැ ගත්හ. යහන මතැ වැතිරැ හොත් භද්‍රාවන් දුටු පියාණෝ දුව වෙතඅවුත් විමසා දැන, රාජ පුරුෂයනට දහසක් දී කිසියම් උපායකින් දඟගෙහි හුන් මිනිසකු මරණයට යොදවා සත්තුකයා මුදවා සුවඳ පැනින් නහවා අබරණින් සරසවා ප්‍රාසාදයට යැවූහ. ඉක්බිති මනදොළ පිරුණු භද්‍රාවෝ ඉමහත් සොම්නසින් සත්තුකයා සමග වුසූහ. කිපදිනක් ගත වැ ගිය පසු ඇගේ අබරණෙහි ලොල් වූ සත්තුකයා ඇය මරා අබරණ ගනු කැමැති වැ "සොඳුර, නගරගුත්තිකයා මා අල්ලාගත් කෙණෙහි ම මා දිවි ලදහොත් ඔබට බිලියමක් කරමි,'යි චෞරප්‍රපාත පර්වතයෙහි දෙවතාවාහට ඇප වීමි. එම බිලියමට උවාරණ සපයව"යි කීහ. ඔහු බස් "සැබැවැ"යි පිළිගත් භද්‍රාවෝ බලිකර්මෝපකරණ සපයා ගත්හ. මහ පිරිවරින් පව් පාමුලට ගොස් සෙසු පිරිස පව් පාමුල්හි හිඳුවා මේ අඹු සැමියෝ පමණක් ම පව්වට නගින්නට වන්හ. පව් මතැ නැග අවසන් වූ විට සත්තුකයා බිරිඳ අමතා "සොඳුර, තිගේ සළුව මුදා පැලැඳි අබරණ

පොදියක් කොට බඳුව''යි කීය. එවිට ''මෙසේ කියනුයේ මගේ කිනම් අපරාධයක් නිසාදැ''යි භද්‍රාවෝ අසූහ. ''කිම? මඹ කිලිටියම් සඳහා මෙහි අංගයකිම්දැ''යි නී සිතහුදැ? මම ලමිනි කිලිටියම් සඳහා නො ද අංගි. නිගේ අබරණ ලොබින් අංගෙයම්''යි යොරා කීය. එබසට භද්‍රාවෝ ''හිමියනි, පලදනා කාගේද? මා කාගේද? හැම ම ඔබ සතුය යි කීහ ''එබසින් කම් නැත. සියල්ල බැඳ පොදියක් කරව''යි නැවතත් සොරා කීය. ''මැනැව ස්වාමීනි, එලෙසත් මගේ එක් අදහසක් පුරාලනු මැනැව, සැරසී සිටි වනිත් ම මට ඔබ ඉදිරි පසින් ද පිටිපසින් ද වැළැඳ ගෙන පෙම් කරන්නට දුනමැනවැයි භද්‍රාවෝ කීහ. සෝ 'යහපතැ''යි පිළිගති. ඉන්පසු භද්‍රාවෝ ඔහු වැළැඳ ගැන්මට ඉඩ දුන් බව දැන ඉදිරියෙහි වැළැඳ ගෙන පිටිපස්හිදු වැළැඳ ගන්නට තැත්කරන්නියක මෙන් සැරසී දෙ අත් දිගු කොට පර්වතයෙන් තල්ලු කැර ලූහ. සෝ වැටෙන්නේ බිමැ හෙන්නට පෙරාතු වැ මැ ගල්හි වැදී සුණු විසුණු විය. එ සඳ ඇගේ සථානොචිත ප්‍රඥාව දැන පසන්නා වූ පර්වතාධිගෘහිත දෙවිතෙමේ–

''න සො සබ්බසු ඨානෙසු – පුරිසො හොති පණ්ඩිතො
ඉත්ථී පි පණ්ඩිතා හොති – තත්ථ තත්ථ විචක්ඛණා''

හැමවිට ම පුරුෂයා නුවණැත්තේ නො වෙයි. ඒ ඒ කට යුත්තෙහි විචක්ෂණ වූ ස්ත්‍රිය ද නුවණැති වන්නීය.

''න සො සබ්බසු ඨානෙසු – පුරිසො හොති පණ්ඩිතො
ඉත්ථී පි පණ්ඩිතා හොති – මුහුත්තම්පි චින්තයෙ''

හැමවිට ම පුරුෂයා නුවණැත්තේ නොවෙයි. ඇසිල්ලක් පමණ කල් අවස්ථානුරූප අර්ථය සිතන්නට හැකි වේ නම් ඒ ස්ත්‍රිය ද පණ්ඩිත වන්නීයයි කීය.

ඉන්පසු භද්‍රාව මෙසේ සිතූ. මම ගෙදර ගොස් ගිහි ගෙහි වසනුව අපොහොසත් වෙමි. ''මෙතැනින් ම ගොස් යම්කිසි තැනෙක පැවිදි වෙමැ''යි සිතා නික්මැ නිර්ග්‍රන්ථාශ්‍රමයකට පිවිස පැවිදි බැව් ඉල්ලූහ. එහි ලදුවු නිවටං නී

කවරාකාර පැවිදි බවක් පතහිදැ"යි ඇසූහෙයින් "ඔබ සසුන්හි
උතුම පැවිද්ද ම පතමි"යි කී විට තල් ඇටයෙන්
කෙස් උපුටා ඇය පැවිදි කරවූහ. නැවැත කෙස්
වැඩෙනවිට රාශි රාශි වැ කුණ්ඩලාවර්ත වැ වැඩුණු
හෙයින් "කුණ්ඩලකෙශී" නම් ද වූ. නොබෝ කලකින්
නිගණ්ඨයන් ගේ හැම සමය ම ඉගෙනැ විශෙෂාධි
ගමයක් නො දැක ඉන් නික්මැ ගම් නියම් ගම්හි පණ්ඩිත
කෙනෙක් වුහු නම්, ඔවුන් ඇසුරැ කරමින් ඉගෙන වාද-
යෙහි දක්ෂ වැ තමන් හා විරුද්ධ වැ වාද කිරීමෙහි සමතකු
නො දැක තුමූ වදනා හැම ගම්හි මැ දොරටුයෙහි වැලි
රැසක් කොට දඹ අත්තක් එහි සිටුවා "මා හා වාද
කටැකියෝ මේ අත්ත මඩිත්වා"යි ප්‍රකට කළහ. සතියක්
ගතවැ ගිය ද එය මඩිනා කෙනෙක් කොතනකවත්
නොවූහ. කල්ගතවත් ම සැවැත් නුවරට වදනා කුණ්ඩල-
කෙසාවෝ වැලි රැසක් මතැ දඹ අත්තක් සිටුවා "වාද
කට හැක්කෙක් වේ නම්, මෙය මඩිත්වා"යි කියා වන්හ.
එවිට මහණ ගණා පිරිවරා පිඬු සිඟා වඩනා සැරියුත්
මාහිමිපාණන් වහන්සේ එය දැක කරුණු අසා දැනැ
ගම් දරුවන් ලවා එය මඩවාපූහ. ඩිත් කිස කොට පෙරළා
එන කුණ්ඩලකෙශාවෝ සුණු විසුණු වැ ගිය දඹ අත්ත
දැක විමසා කරුණු දැන සැරියුත් මාහිමියන් සොයා
ගියහ. ගසක් මුලැ හුන් සැරියුත් මාහිමියන් දුටු ඕ වෙත
එළඹ දන්නා තාක් ප්‍රශ්න විචාළහ. ඒ හිමියෝ තියුණු
සැතින් සිඳ ලන කෙසෙල් ගොබයක් සේ සියල්ල විසඳ
වදාළහ. පසු වැ සැරියුත් මාහිමියෝ ද 'එක් ප්‍රශ්නයක් ම
ඇසීමට තමනට ද ඉඩ දුනමැනැවැ"යි කියා අවසර ලබා
ගෙන "එක නම්" කිමදැ"යි ඇසූහ. කුණ්ඩලකෙශාවෝ
නො දත්මී "සවාමීනි" කියා එකෙණෙහි ම පෙරැන්
පාමුලැ හෙවැ "සවාමීනි තුඹ වහන්සේ සරණ යෙමි"යි
කීහු. "මා සරණ යෑමෙන් කම් නැති. තිලොවග බුදු
රදුන් වහන්සේ නුදුරැ වෙහෙරෙහි වෙසෙති. ඔවුන්
වහන්සේ සරණ යව"යි දම්සෙනෙවි මාහිමියෝ කීහ.

මැනැවැ''යි පිළිගත් කුණ්ඩල කෙසාවෝ ශාස්තෲන් වහන්සේ දම් දෙසද්දී එහි ගොස් වැද එකත් පසෙක සිටියහ. එවිට තථාගතයන් වහන්සේ—

**සහස්සමපි චෙ ගාථා – අනත්ථ පද සංහිතා**
**ඒකං ගාථාපදං සෙය්‍යො – යං සුත්වා උපසම්මති**

උසස් දියුණුවක් සිදු කැර ගැනීමට ඉවහල් නොවන ගාථා දහසකට වඩා අසන්නහුගේ සිත නිවා ගන්නට ඉවහල් වන එක ම ගාථා පදය උතුම් යී දෙසූ සේක. ගාථාවසානයෙහි කුණ්ඩලකෙසාවෝ සිවුපිළිසැඹියා සමග රහත් වූ හ. රහත් වැ පැවිදි වැ වහා ලත් අභිඥ ඇති මෙහෙණන් ගෙන් අග්‍ර වූහ.

# සෝමා සථ්විරාවෝ

මෝ තොමෝ ද පෙර බුදුවරුන් දවස තිවන් පතා පින් දහම් කරමින් සැරිසරන්නී සිඛී බුදුන් දවස ක්‍ෂත්‍රිය මහාසාලකුලයෙහි ඉපිද නුවණැති ව අරුණවත රජුට අගමෙහෙසි වූ ය. දිනක් රජතෙමේ ඇයට සුවඳැති උපුල් මල් සතක් දුන්නේය. එවිට "මේ සුවඳැති මල් පැළඳීමෙන් කවර ප්‍රයෝජනද? මේ සත ම තථාගතයන් වහන්සේට පුදන්නෙමි" නම් යෙහෙකැයි සිතූ ය. තථාගතයන් වහන්සේ ද පිඬු පිණිස හැසිරෙන සේක්, රජ ගෙදරට වැඩමකළසේක. ඕ වඩනා බුදුන් දැක පහන් සිතින් පෙර ගමන් කොට මල් පුද පසග පිහිටුවා වැන්ද ය. පසු වැ ඒ අත්බැවින් සැවැ දෙව්මිනිස් දෙක්හි සැරිසරන්නී අප බුදුන් දවසැ බිම්සර රජුගේ පෙරෙවි බමුණාහට දූ වැ උපන්හ. සෝමා නම් වූ ඇ බුදුරජාණන් වහන්සේ රජගහ නුවරට පිවිසි කල්හි ම තෙරුවන් කෙරෙහි අතිශයින් පහන් වැ කාමාදීනව සලකා පැවිදි ව නොබෝ කලකින් ම රහත් වූ හ.

රහත් වැ සැවැත්නුවර වෙසෙමින් විමුක්ති සැපෙන් කල් යවන්නී දිනක් දිවා විහරණය සඳහා අන්ධවනයට වැද ගසක් මුල හුන්හ. එවිට මාරයා සෝම භික්ෂුණිය ගේ විවේකයට බාධා කරනු කැමැත්තේ එහි අවුත්

"යං තං ඉසීහි පත්තබ්බං – ඨානං දුරභිසම්භවං
න තං ද්වඞ්ගුලි පඤ්ඤාය – සක්කා පප්පොතුමිත්ථියා"

බුද්ධාදි මහර්ෂින් විසින් දුකසේ ලබා ගත යුතු යම් ඒ රහත් බවක් වේ නම් එය ද්වාංගුලිප්‍රඥා සංඛ්‍යාත (කුඩා කලැ සිට ම බත් උයතුදු සැමදම බත ඉදී තිබේදැයි දැන ගැනීමට බත් උලක් ගෙන දැගිල්ලෙන් පොඩි කොට බත ඉදී තිබෙන බව දැනැ ගැනීමට පමණක් නුවණ ඇති නැතහොත් දැඟිල්ලෙන් කරන කපු කැටීම වැනි සුළු කිසකට පමණක් නුවණ ඇති) ගැහැණියක විසින් ලැබීමට නො හැකිය යි කිය. මාරයා කී ඒ වචනයට නිඳුකරමින් සෝමා සථවිරාවෝ යටැ දැක්වෙන ගාථා දෙක කීහ.

ඉජ්ජි භාවො නො, කිං කයිරා – චිත්තම්හි සුසමාහිතෙ
ඤාණම්හි වත්තමානම්හි – සම්මා ධම්මං විපස්සතො

සිත අභීත් මාර්ගී සමාධියෙන් සමාහිත කල්හි රහත් මග නුවණ ද නිබෙන විට හොඳින් චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්‍මයන් දන්නා වූ අපට සන්ත්‍රාසයක් කුමක් කෙරේද? රහත් බවට කිසි දු බාධාවක් නොකෙරේ.

සබ්බසු විහතා නන්දි – තමොක්ඛන්ධො පදාලිතො
එවං ජානාහි පාපිම – නිහතො ත්වමසි අන්තකාති

මා විසින් හැම අරමුණු විෂයයෙහි ම තෘෂ්ණාව නසන ලදී. මෝහ රාශිය පළා දමන ලදී. එම්බා ලාමක මාරය, මා විසින් තෝ පෙලනු ලැබිය එසේ තා විසින් මම නොපෙලන ලදිමි. මෙසේ දනුව.

---

# ධම්මදින්නා ස්ථවිරාවෝ

ඕ තොමෝ පියුමතුරා බුදුන් දවසැ හංසවතී නුවර මෙහෙකාරියක් වැ උපන්නී නිරෝධ සමාපත්තියෙන් නැගී අග්‍රශ්‍රාවකයන් වහන්සේට සත්කාර පූජිකා වැ මහ දන් දී දෙව්ලොව උපන්නාය. ඉන් සැවැ දෙව් මිනිස් දෙක්හි හැසිරෙන්නී කසුප් බුදුන් දවසැ කිකී නම් කාසී රජුගේ දූ වැ ඉපිද විසිදහසක් හවුරුදු බඹසර සැරැ දෙව්ලෝ වැසැ අප බුදුන් කල්හි රජගහ නුවර කුලගෙයෙක්හි උපන. ධම්මදින්නාය යි මවුපියෝ නම් කළහ. වැඩි විය පත් ධම්මදින්නාවෝ විසාඛ නම් සිටුහුගේ භාර්‍යා වූහ. දිනක් විසාඛ සිටුහු බුදුන්ගෙන් බණ අසා අනාගාමි වැ ගෙට අවුත් ප්‍රාසාදයට නඟින්නාහු, හිණ මතැ (තරප්පියෙහි) හුන් ධම්මදින්නාවගේ අත්හි එල්බැ ගෙන නො නැංගේය. කෑම කමින් ද වෙතද මෙන් නො වැ නිහඬ වැ ම කෑහ. එවිට ධම්මදින්නාවෝ ‘‘මා අතැ යම් දොසක් හෝ ඇද්ද’’යි සැමියාගෙන් ඇසූහ. ‘‘ඔබ ගේ කිසි දොසෙක් නැත. මම උතුම් ධර්මයක් අවබොධ කෙළෙමි. ඉන්පසු පස්කම් සැප විඳීමට නුසුදුස්සෙමි. ඔබ මෙහි වසනු රිසියහු නම්, මෙහි ම වසව, නො එසේ නම් කැමැති තාක් වස්තුව ගෙන සිය ගෙට යව’’යි සිටාණෝ කීහ. එබසට ධම්මදින්නාවෝ ‘‘ආර්‍යපුත්‍රය ඔබ ලූ වමනය මම නො ගනිමි. මට පැවිදි වීමට ඉඩ දෙනු මැනැවැයි කීහ. විසාඛ සිටුහු ඇය රන් දෝලාවකින් මෙහෙණ අසපුවට යැවූහ. එහි දී පැවිදි වැ කමටහන් ගෙන විවෙක සෙනසුනක් සොයා ගොස් කීප දිනකින් ම රහත් වූහ. ඉන්පසු තමා කැටි වැ ගිය මෙහෙණන් සමග ආපසු රජගහනුවරට ම ගොස් විසූහ. විසාඛ තෙමේ ධම්මදින්නාවන් ආ බව අසා ‘‘ඇගේ අධිගමය කෙබඳුදැ’’යි දැනගනුව ප්‍රශ්න ඇසීය. ධම්මදින්නාවෝ ඒ සියල්ල පහසුවෙන් විසඳූහ. විසාඛයෝ විසඳූ සැටි තථාගතයන් වහන්සේට සැලකළහ. තථාගතයන් වහන්සේ ‘‘පණ්ඩිතා විසාඛ ධම්මදින්නා භික්ෂුණී’’ ඈ විසින් පසසා ධම්මදින්නාවන් ධර්ම කථික භික්ෂුණීන් අතුරෙන් අගතනතුරෙහි තබා වදාළ සේක.

# දන්තිකා ස්ථවිරාවෝ

මෝ තොමෝ පෙර බුදුවරුන් දවසැ නොයෙක් පින්කම් කරමින් දෙව් මිනිස් දෙක්හි හැසිරෙන්නී බුඬ ශූන්‍ය කාලයෙක්හි දී චන්ද්‍රභාගා ගං ඉවුරෙහි එක් කිඳුරු යෝනියෙක්හි උපන. ඕ දිනක් ගසක් මුලැ හුන් පසේ බුදු කෙනකුන් දැක පහන් වැ සල් මලින් පුද ගියාය. ඒ පිනින් අප බුදුන් දවස කොසොල් රජුගේ පෙරෙවි බමුණානන් ගෙහි ඉපිද දෙව්රම් පූජායෙහි දී සැදහැ ලැබැ පසු වැ මහා ප්‍රජාපතී ගෞතමිය වෙත පැවිදි වැ රජගහනුවර වසන්නී, දිනක් දහවල් විවේකය පිණිස ගිජුකුළු පව්වට නැග හුන්කල්හි එක් ඇතකු ඇත්ගොව්වාට පිටැ නැගීමට පය එළවනු දැක, එය ම අරමුණු කොට විදසුන් වඩා පිළිසිඹියා සමග රහත් වූවාය. ඉන්පසු දන්තිකා ස්ථවිරාවෝ

**දිවා විහාරා නික්ඛම්ම – ගිජ්ඣකූටම්හි පබ්බතෙ**
**නාගමොගාහ මුත්තිණ්ණං – නදිතීරම්හි අද්දසං**

ගිජුකුළු පව්වෙහි දිවා විහරණය කොට එයින් නික්මුණු මම සපිතිකා ගංගාවෙහි ගැලී සොඬ නැගුණු ඇතකු ගං ඉවුරෙහි දී දිටිමි.

**පුරිසො අඞ්කු සමාදාය – දෙහි පාදන්ති යාචති**
**නාගො පසාරයී පාදං – පුරිසො නාගමාරුහි**

ඇතරුවෙක් අකුස්සක් ගෙන ඇතු පිට නැගීමට පය දෙව යි කීයයි. ඇත්තෙමේ පය දිගු කෙළේ ය. ඇතරුවා ඇතු පිට නැංගේය.

**දිස්වා අදන්තං දමිතං – මනුස්සානං වසං ගතං**
**තතො චිත්තං සමාධෙසිං – ඛලු තාය වනං ගතා**

පෙර නො දැමුණු, පසු වැ මිනිසුන් වසහයට ගොස් දැමුණු ඇතා දැක වනයට ගියෙමි, ඒ ඇතාගේ ක්‍රියාව හේතු කොට ගෙන තිරිසනුන් පවා මෙසේ හික්මී සිටින විට කවර හෙයින් මනුෂ්‍යයනට තම සිත දමනය නො කට හැකිදැයි නුවණින් සලකා විදසුන් වඩා රහත් වීමි.

# උබ්බරී ස්ථවිරාවෝ

මේ තොමෝ ද පෙර බුදුන් දවස නිවන් පිණිස හේතු වන පින් දහම් කොට පියුමුතුරා බුදුන් දවස හංසවතී නුවර කුලගෙයෙක්හි ඉපිද නුවණැති ව මහ රහතන් වහන්සේ කෙනෙකුන්හට දන් පාත්‍රයක් පුදා ඒ පිනින් තව්තිසා දෙව්ලොව ඉපිද, එහි මහත් දෙව් සැප විඳ ඉන් සැව සුගතීන්හි ම සැරිසරමින් අවුත් අප බුදුන් දවස සැවැත් නුවර ගැහැවි මහසල් කුලයෙහි "උබ්බරී" නමින් උපන්හ. ඕ තොමෝ කොසොල් රජුගේ ගෙට කැඳවන ලද්දී පිරිවර සත්‍රියක් වූවා, ටික කලකින් "ජීවා" නම් දුවක් ලදූ. රජතෙමේ ඇගේ දුව දැක තුටුපහටු ව අභිෂේක කෙළේය. ඒ ජීවා නම් දුව දිවැ ඇවිදිනා කල්හි මළහ. සෝවින් පෙළුණ මව දුව ආදාහන කළ තැනට ගොස් දිනපතා හැඬුහ. දිනක් ඈ බුදුන් වැඩ වසා අචිරවතී ගං ඉවුරට ගොස් දුව සිහිකොට හැඬුහ. තථාගතයන් වහන්සේ ආලෝකයක් විහිදුවා තමන්වහන්සේ දක්නට සලසා කා සිහිකොට හඬහිදැයි ඇසූවිට දුව සිහි කොටය යි කී කල්හි මේ සොහොන්හිම තිගේ දූවරුන් අසූහාර දහසක් පමණ ආදහන කොට තිබේ. ඔවුනතුරෙන් කා සිහිකොට අඬහි දැයි නැවත ඇසූ ඒ දූවරුන් ආදහන කළ තැන් පෙන්වා

**අම්ම ජීවාති වනමහි කන්දසි – අත්තානං අධිගච්ඡ උබ්බරි**
**චුල්ලාසීති සහස්සානි – සබ්බා ජීවසනාමිකා**
**එතම්හාලාහනෙ දඩ්ඪා – තාසං කමනුසොචසි**

උබ්බරිය, නුඹ අම්ම ජීවා – දුව ජීවය යනාදින් කියමින් වන මැද හඬන්නෙහිය. අනුන් උදෙසා හැඬීමට පළමුව තමන් ගැන හොඳින් සලකා බලව, මීට පෙර භවයන්හි දී ජීවා නම් ලත් තිගේ දූවරු සුවාසූ දහසක් මේ සොහොනෙහි ම දවන ලදහ. ඔවුනතුරෙන් කවර දුවක නිසා හඬහිද" යි ඇසූ සේක. ඉක්බිති මීට කන් දුන් උබ්බරිය විදසුන් වඩා රහත් වූහ.

රහත් වැ අධිගමය හෙළි කරමින්

අබ්බහී වත මෙ සල්ලං – දුද්දසං හදය නිස්සිතං
යං මෙ සොකපරෙතාය – ධිතු සොකං ව්‍යපානුදි

සාජ්ජ අබ්බුළ්හ සල්ලාහං – නිච්ඡාතා පරිනිබ්බුතා
බුද්ධං ධම්මං ච සංඝං ච – උපෙමි සරණං මුනිං

හෘදයා ශ්‍රිත වැ පැවැති පීඩා කරන හෙයින් ද, දුකසේ ඉවත් කටයුතු හෙයින් ද, ඇතුළත රිදවීම් වශයෙන් විනිවිද යන හෙයින් ද සල්ල නම් ලද ශෝකය සහ තෘෂ්ණාව එකැතින් ම බැහැර කෙළේ ය. ශෝකයෙන් පීඩිත වූ මාගේ ධීතෘශෝකය යම් හෙයකින් පහවැ ගියේද, එහෙයින් ඕ මම බැහැරකළ (උදුරාදැමූ) ශෝක සල්ල හා තෘෂ්ණා සල්ල ඇත්තෙමි, තෘප්තියට පැමිණියෙමි. කෙලෙස් නසා පීමෙන් නිවුනෙම්ද, බුදුන් දහම් සඟ යන තෙරුවන ලොවුතුරා සරණ යැම් විසින් සරණ කොටයෙමි යි ප්‍රකාශ කළහ.

## මිත්තාකාලි ස්ථවිරාවෝ

මේ තොමෝ ත් පෙර බුදුවරුන් දවස කෘතාධි-කාරී ව උපනුපන් ජාතීන්හි නිවන් පතා පින් කොට අප බුදුන් දවස කුරුරට කම්මාසදම්ම නම් නියම් ගම්හි බමුණු කුලයෙක්හි ඉපිද මහා සතිපට්ඨාන දේශනාව අසා පැහැද පැවිදි වැ සත්වසක් ලාභ සත්කාර ගේධ වැ නොයෙක් තන්හි හැසිරෙමින් කල් ගත කළාය. ඉන් මොබැ මිත්තාකාලිය මේ මම මහණ දම් පුරම්ද? නැතහොත් ලාභ උපදවන්නෙම් දැ"යි නුවණින් සලකා, ගත වැ ගිය කාලය ගැන ලජ්ජාවට පත් වැ හටගත් සංවේග ඇත්තී විදසුන් වඩා නොබෝ දිනකින් ම රහත් වැ මෙසේ උදන් ඇනූහ.

**සද්ධාය පබ්බජිත්වාන – අගාරස්මානගාරියං**
**විචරිහං තේන තේන – ලාභ සක්කාර උස්සුකා**

ගිහි ගෙයින් නික්ම අනගාරිය සංඛ්‍යාත සාසනයෙහි සැදැහැයෙන් පැවිදි වැ ලාභ සත්කාර ලබා ගැනීමෙහි උත්සුක වුවා ලාභ සත්කාර ලැබීමට හේතුවන ඒ ඒ දෙයෙහි යෙදෙමින් හැසුරුණෙමි.

**රිඤ්චිත්වා පරමං අත්ථං – හීනං අත්ථමසෙවිහං**
**කිලෙසානං වසං ගන්ත්වා – සාමඤ්ඤත්ථං න බුජ්ඣිහං**

මම පරමාර්ථය වූ ධ්‍යාන විදර්ශනා මාර්ගඵලාදිය අත් හැර දමා ආමිස සෙවීම නම් වූ හීනාර්ථය සෙවීමි. කෙලෙස් වසඟයට පැමිණ මහණකම ගැන නොදත්තෙමි.

**තස්සා මෙ අහු සංවෙගො – නිසින්නාය විහාරකෙ**
**උම්මග්ග පටිපන්නම්හි – තණ්හාය වසමාගතා**

වෙහෙරෙහි හුන් ඒ මට "මම තෘෂ්ණා වසඟ වූයෙමි නොමඟැ පිළිපන්නෙමැ"යි සංවේගය හට ගති.

**අප්පකං ජීවිතං මය්හං - ජරා ව්‍යාධි ච මද්දති**
**ජරාය භිජ්ජතෙ කායො - න මෙ කාලො පමජ්ජිතුං**

මගේ ජීවිත කාලය ස්වල්ප යි. එද ජරා ව්‍යාධීන් ගෙන් යටපත් වේ. කය ජරාවෙන් බිඳේ. එහෙයින් ම පමාවීමට කාලය නොවේ.

**යථා භූතං අවෙක්ඛන්තී - ඛන්ධානං උදයබ්බයං**
**විමුත්තචිත්තා උට්ඨාසිං - කතං බුද්ධස්ස සාසනං**

ස්කන්ධයන් ගේ උදය ව්‍යය තතු සේ සලකන්නී කෙලෙසුන්ගෙන් මිදුණු සිත් ඇති ව, නැගී සිටියෙමි. බුද්ධාවවාදයට අනුව ක්‍රියා කෙළෙමි.

# රෝහිණී ස්ථවිරාවෝ

මේ තොමෝ පෙර බුදුවරුන් දවසැ පින් දහම් කොට රහත් බව පතමින් එත්නී විපස්සී බුදුරජාණන් වහන්සේ පිඬු සිඟා වඩිනු දැක *කැවුම් පාත්‍රයක් පුද පසඟ පිහිටුවා වැඳ ඉමහත් සොම්නසින් වැස පරලොව ගියා ය. මෙසේ නොයෙක් විට තිවන් පිණිස රැස්කැරගත් පින් දහම් ඇත්තී මේ බුද්ධෝත්පාද කාලයෙහි විසල්පුර මහත් ධන සම්පත් ඇති බ්‍රාහ්මණ කුලයෙක්හි ඉපිද රෝහිණී නමින්පළ වූවා ය. නුවණ මුහුකුරා ගිය රෝහිණීය තථාගතයන් වහන්සේ විසල්පුර වැඩැ වෙසෙන සමයෙහි වෙහෙරට ගොස් බණ'සා සෝවාන් වැ මවුපියනට ත් බණ කියා බුදු සසුන් විෂයෙහි පහදවා ඔවුන්ගේ කැමැත්ත ලබා ගෙන පැවිදි වැ විදසුන් වඩා නොබෝ කලෙකින් ම රහත් වූවා ය.

රහත් වීමෙන් පසු පෙර සෝවාන් වැ වුසු කාලයෙහි සිය පියා ත් තමනු ත් අතර ඇති වූ දෙබසක් උදන වශයෙන් මෙසේ ප්‍රකාශ කරන ලදි.

**පියා:**

**සමණාති හොති ත්වං සයසි – සමණාති පටිබුජ්ඣසි**
**සමණානමෙව කිත්තෙසි – සමණී නූන භවිස්ස සි**

පින්වතිය, ඔබ "ශ්‍රමණයෝය" යි කියා නිද ගන්නෙහිය "ශ්‍රමණයෝ ය" යි කියමින් ම අවදිවන්නෙහිය. මෙසේ හැම විට ම ශ්‍රමණයන් ගැන ම කියන්නෙහි ඔබ ද වැඩිකල් නොගොසින් මෙහෙණක් වන්නෙහිය. නොහොත් ගිහි රූපයෙන් සිටිය ද මෙහෙණකගේ ඉරියවු ඇත්තියක.

**විපුලං අන්නං ච පානං ච – සමණානං පයච්ඡසි**
**රෝහිණී දානි පුච්ඡාමි – කෙන තෙ සමණා පියා**

---

* ථෙරීගාථාට්ඨකථාවේ පාත්‍රයක් පිදූ බව ද, අපදානයේ කැවුම් පිදූ බවද එයි.

නුඹ ශ්‍රමණයනට ආහාර පානාදිය බොහෝ කොට දෙන්නෙහිය. රොහිණිය, දූ නුඹ විචාරමි. කවර හෙයින් නුඹට ශ්‍රමණයෝ ප්‍රිය වෙත්ද!

**අකම්මකාමා අලසා - පරදත්තුපජීවිනො**
**ආසංසුකා සාදුකාමා - කෙන තෙ සමණා පියා**

තමනට හෝ අනුනට හෝ යහපත පිණිස පවතින කිසි වැඩක් නො කරන්නා වූ කුසීත වූ, අනුන් දුන් දෑයෙකින් ජීවත්වන, අනුන්ගෙන් ම සිවුපසය බලාපොරොත්තු වන මිහිරි ආහාර ම කැමැති වන, ශ්‍රමණයෝ තිට කවර හෙයින් ප්‍රිය වෙත්ද!

රොහිණිය ගේ පියා විසින් රොහිණිය අතින් සංකයා ගැන මෙසේ ඇසූ කලැ "මගේ ආයසීයන් වහන්සේලා ගේ ගුණ ප්‍රකාශ කිරීමට මට ඉඩ ලැබිණැ'යි ඉමහත් සොම්නසින් මෙසේ කියන්නට පටන් ගත්හ.

**චිරස්සං වත මං තාත - සමණානං පරිපුච්ඡසි**
**තෙසං තෙ කිත්තයිස්සාමි - පඤ්ඤා සීල පරක්කමං**

පියාණන් වහන්ස, ඔබ බොහෝ කාලයකින් ශ්‍රමණයන් ගැන මාගෙන් අසන්නාහුය. එහෙනම් ඒ ශ්‍රමණයන් ගේ නුවණ ත් සීලය ත් උත්සාහයත් ඔබට කියන්නෙමි.

**කම්මකාමා අනලසා - කම්මසෙට්ඨස්ස කාරකා**
**රාගං දොසං පජහන්ති - තෙන මෙ සමණා පියා**

සිල් පිරිවීම් වශයෙන් වත්පිළිවෙත් කරනු කැමැති, මහණ දම්හි ම ඇලී මහත්සිලයන් සිල් පුරන හෙයින් අලස නො වූ, ශ්‍රේෂ්ඨ නිර්වාණය ගෙන දෙන ක්‍රියා කරන්නා වූ ඒ ශ්‍රමණයෝ රාග ද්වේෂයෝ යම්සේ ප්‍රහීණ වෙත් නම්, එලෙස ක්‍රියා කරත්, ඒ නිසා මට ශ්‍රමණයෝ ප්‍රියයෝ වෙති.

**තීනි පාපස්ස මූලානි - ධුනන්ති සුචි කාරිනො**
**සබ්බං පාපං පහීනෙසං - තෙන මෙ සමණා පියා**

පිරිසිදු ක්‍රියා ඇති ඒ ශ්‍රමණයෝ ලෝභ දෝස මෝහ යන අකුශල මුල් දුරුකරත්. උත්වහන්සේලාගේ හැම පව් ම රහත් මඟින් ප්‍රහීණය. ඒ නිසා මට ශ්‍රමණයෝ ප්‍රියයෝ වෙත්.

කායකම්මං සුචි නෙසං - වචී කම්මං ච තාදිසං
මනොකම්මං සුචි නෙසං - තෙන මෙ සමණා පියා

ඒ ශ්‍රමණයන්ගේ කාය - වාක් - මනඃ කර්ම පිරිසිදුය. එහෙයින් මට ශ්‍රමණයෝ ප්‍රිය වෙති.

විමලා සඞ්ඛමුත්තා ව - සුද්ධා අන්තරබාහිරා
පුණ්ණා සුභෙහි ධම්මෙහි - තෙන මෙ සමණා පියා

මනාව දෙවි හකක් හෝ මුතු හෝ යම්සේ පිරිසුදුද? එසේ ම ශ්‍රමණයන්ගේ ඇතුළත සහ පිටත පිරිසුදුය. කුශල ධර්මයන්ගෙන් සම්පූර්ණ ය. ඒ නිසා ශ්‍රමණයෝ ප්‍රියයෝ වෙති.

බහුස්සුතා ධම්මධරා - අරියා ධම්මජීවිනො
අත්ථංධම්මං ච දෙසෙන්ති - තෙන මෙ සමණා පියා

පර්යාප්ති සංඛ්‍යාත බුද්ධ වචන විෂයයෙහි ඉගෙනීම දැරීම් විසින් හා ප්‍රතිවේධ සංඛ්‍යාත සිව්මඟ පල නිවන් දහම් අවබෝධ කිරීම් විසින් ද ලැබගත් බහුශ්‍රුත බැව් ඇති, ඒ දෙවැදෑරුම් ධර්මය ම දරන හෙයින් ධර්මධර වූ ආර්ය වූ දැහැමි දිවිපෙවෙත් ඇති ශ්‍රමණයෝ අර්ථ ධර්ම දෙක ප්‍රකාශ කෙරෙත්. එහෙයින් ශ්‍රමණයෝ මට ප්‍රියයෝ ය.

බහුස්සුතා ධම්මධරා - අරියා ධම්ම ජීවිනො
එකග්ගචිත්තා සතිමන්තො - තෙන මෙ සමණා පියා

බහුශ්‍රුත වූ ධර්මධර වූ ආර්යයෝ දැහැමි දිවිපෙවෙත් ඇත්තෝය. එකඟ කැරගත් සිත් සතන් ඇත්තෝය. එළඹී සිටි සිහි ඇත්තෝය. ඒ නිසා මට ශ්‍රමණයෝ ප්‍රියයෝ ය.

දූරඞ්ගමා සතිමන්තා - මන්තභාණී අනුද්ධතා
දුක්ඛස්සන්තං පජානන්ති - තෙන මෙ සමණා පියා

මිනිස් පියෙස ඉක්මවා වනයෙහි දුර සෙනසුන් සොයා යන්නා වූ, එළඹැ සිටි සිහි ඇත්තා වූ, නුවණින් විමසා කතා කරන්නා වූ, උඩඟු නැති, ඒ ශ්‍රමණයෝ සසර දුකෙහි කෙළවර දනිත්. එහෙයින් මට ශ්‍රමණයෝ ප්‍රිය වෙත්.

**යස්මා ගාමා පක්කමන්ති – නාවලොකෙන්ති කිඤ්චනං**
**අනපෙක්ඛා ව ගච්ඡන්ති – තෙන මෙ සමණා පියා**

ඒ ශ්‍රමණයෝ යම් ගමකින් නික්මැ යෙත් නම්, එහි සත්ව සංස්කාරාදි කිසිවක් ගැන බලාපොරොත්තු රහිත වැ ම යෙත්. හැම දේ කෙරෙහි ම බලාපොරොත්තු විරහිත වැ යෙත්. එහෙයින් මට ශ්‍රමණයෝ ප්‍රියහ.

**න තෙසං කොට්ඨෙ ඔපෙන්ති – න කුම්භිං න ඛළොපියං**
**පරිනිට්ඨිත මෙසානා – තෙන මෙ සමණා පියා**

ඒ ශ්‍රමණයෝ සිය වස්තුව කොටු ගුල්වලැ ලා නො රකිත්. නිදන් ගත කිරීමක් ද නො කරත්. පැසෙහි ලා නො තබත්. අනුන්ගේ ගෙවලැ අනුන් උදෙසා පිළියෙළ කළ ආහාර සොයන්නෝ ය. එහෙයින් මට ශ්‍රමණයෝ ප්‍රිය වෙති.

**න තෙ හිරඤ්ඤං ගණ්හන්ති – න සුවණ්ණං න රූපියං**
**පච්චුප්පන්නෙන යාපෙන්ති – තෙන මෙ සමණා පියා**

ඒ ශ්‍රමණයෝ අමුරන් නො පිළිගනිත්. රන් රිදී නො පිළිගනිත්. පසුගිය දේ ගැන ශෝක නො කරමින් අනාගතය ගැන අමුතුවෙන් නො පතමින් ඒ වේලාවෙහි ලද යම් කිසි දෑයකින් යැපෙත්. ඒ නිසා මට ශ්‍රමණයෝ ප්‍රිය වෙත්.

**නානා කුලා පබ්බජිතා – නානා ජනපදෙහි ච**
**අඤ්ඤමඤ්ඤං පියායන්ති – තෙන මෙ සමණා පියා**

නොයෙක් ජනපද (පළාත්) වලින් ද ක්ෂත්‍රිය බ්‍රාහ්මණ චණ්ඩාලාදි නොයෙක් කුලවලින් ද අවුත් පැවිදි වූවෝ නමුත් ඔවුනොවුන් ප්‍රිය මනාප වැ – නො වෙනස් වැ වෙසෙත්. ඒ නිසා මට ශ්‍රමණයෝ ප්‍රියයෝ වෙත්.

මෙසේ ඒ බ්‍රාහමණයා දුව විසින් ප්‍රකාශිත භික්ෂූන්ගේ ගුණ අසා පැහැදුණු සිත් සතන් ඇත්තේ දුවට ප්‍රශංසා මුඛයෙන් මෙසේ කීය.

**අත්ථාය වත නො භොති - කුලෙ ජාතාසි රොහිණී**
**සද්ධා බුද්ධෙ ච ධම්මෙ ච - සඞ්ඝෙ ච තිබ්බගාරවා**

බුදුන් - දහම් සහ සඟ යන තෙරුවන් විෂයයෙහි ශ්‍රද්ධාව ඇති, ඒ තෙරුවන් කෙරෙහි මහත් ගෞරව ඇති රොහිණිය, අපට යහපත පිණිස නුඹ අපගේ පවුලෙහි උපන්නෙහිය.

**තුවං හෙතං පජානාසි - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං**
**අම්හම්පි ච තෙ සමණා - පටිග්ගණ්හන්ති දක්ඛිණං**

තී නිරුත්තර පින් කෙත දන්නෙහිය. කිම! අපගේ දක්ෂිණාව ත් ඒ ශ්‍රමණයන් වහන්සේලා පිළිගනිද්ද?

**රොහිණී:**

**පතිට්ඨිතො හෙත්ථ යඤ්ඤො - විපුලො නො භවිස්සති**
**සචෙ භායසි දුක්ඛස්ස - සචෙ තෙ දුක්ඛමප්පියං**

මේ සංඝයා කෙරෙහි පිහිටුවන ලද දක්ෂිණාව අපට මහත් ඵල වන්නේය. ඉදින් දුකට බිය වෙහි නම්, දුක අප්‍රිය නම්:

**උපෙහි සරණං බුද්ධං - ධම්මං සංඝංච තාදිනං**
**සමාදියාහි සීලානි - තං තෙ අත්ථාය හෙහිති**

නුඹ මා කී ලෙස බුදුන්-දහම්-සඟ යන තෙරුවන් සරණ යව. සිල් සමාදන්වව. එය ඔබට වැඩ පිණිස වන්නේය. (මෙයැසූ බ්‍රාහමණ තෙමේ තෙරුවන් සරණ යන බවට මෙසේ ප්‍රතිඥ දුන්නේය.)

**උපෙමි සරණං බුද්ධං - ධම්මං සංඝංච තාදිනං**
**සමාදියාමි සීලානි - තං මෙ අත්ථාය හෙහිති**

නුඹ කී ලෙස මම බුදුන් දහම් සඟ යන තෙරුවන් සරණ කොට යෙමි. සිල් ද සමාදන් වෙමි. එය මට වැඩ පිණිස වෙයි.

මෙසේ ඒ බ්‍රාහ්මණ තෙමේ දුවගෙන් සහ ගුණ අසා පැහැද තෙරුවන් සරණ කොට යැම පිණිස අවවාදත් ලබා තෙරුවන් සරණ ගොස්, පසුවැ පැවිදිවැ, රහත්වැ සිය ප්‍රතිපත්තිය ප්‍රත්‍යවේක්‍ෂා කොට පසුව උදන වශයෙන් මේ ගවැ දක්වෙන ගය කිය.

බ්‍රහ්මබන්ධු පුරෙ ආසිං–සො ඉදානිම්හි බ්‍රාහ්මණො
තෙ විජ්ජා සොත්ථියො චම්හි–වෙදගු චම්හි නහාතකො

පූර්වයෙහි මම බ්‍රාහ්මණ ජාතියෙහි උපන් හෙයින් උත්පත්තියෙන් බ්‍රාහ්මණ වීමි. දැන් සියලු පව් දුරුකළ හෙයින් බ්‍රාහ්මණ වෙමි. ත්‍රිවිද්‍යා ලාභියෙක් ද වෙමි. කෙලෙස් රෝග නැත්තෙක් ද වෙමි. සිවු මඟැ කෙළ පැමිණියෙක් ද වෙමි. පව් සොධා හැරියෙක් ද වෙමි.

---

## මෙහෙණ සස්න ව්‍යාප්තවීම

බුද්ධකාලයේ දී භික්ෂුශාසනය මෙන් ම භික්ෂුණී ශාසනය ද දඹදිවැ මධ්‍යමණ්ඩලයට අයත් අංග – මගධ– කාශි – කෝසල – වජ්ජි – මල්ල – චේති – වච්ඡ – කුරු – පංචාල මච්ඡ – සූරසේන – අස්සක – අවන්ති – ගන්ධාර – කාම්බෝජ යන සොළොස් මහා ජනපදයෙහි ත් ඒ අවට තරමක් දුරට ත් පැතිර ගිය බව පෙනේ. ලක්දිව ආදි බැහැර රට වල භික්ෂුශාසනය මෙන් ම භික්ෂුණී ශාසනය ද පිහිටියේ ධර්මාශෝක රජුගෙන් පසු ව බව ප්‍රසිද්ධ කරුණකි.

---

## අශෝක කාලය

අශෝක රජ ද පිය බින්දුසාර රජු මෙන් ම බමුණු බැති වැ විසීය. බමුණන්ගේ අසංවර ගති පැවතුම් නිසා ඔවුන් කෙරෙහි කලකිරි හුන් අශෝකයනට නිග්‍රෝධ සාමණේරයන්වහන්සේ හමුවීම අශෝකයනට පමණ නො ව මුළු ලොවට ම මහත් වැඩදායක විය. නිග්‍රෝධ සාමණේරයන් වහන්සේ ගේ සංසුන් ඉරියව්වෙහි පහන් වූ අශෝකයෝ උන්වහන්සේගෙන් බණ පදයක් ඇසීම නිසා මුළු බුදු සසුන් විසාහි මැ නොවක් බැතිමත් කෙනෙක් වූහ. අශෝකයෝ අශෝකාරාම නම් මහ වෙහෙර ත්, සුවාසූ දහසක් ධර්මස්කන්ධය පුදනු පිණිස සුවාසූ දහසක් විහාරත් කරවා බුදුසසුනට පිදූහ. ඒ විහාර පූජා දිනයෙහි රජුගේ සොම්නස අපමණ විය. එහෙයින් "මෙවැනි සොම්නසක් ලද අන් කෙනෙක් ඇද්ද"යි මොග්ගලීපුත්තතිස්ස මාහිමියන් වහන්සේ අභින් විචාළෙන් "මහරජ බුද්ධ කාලයෙහි ද ඔබ තරම් ප්‍රත්‍යය පිදූ කෙනෙක් නොවූහ"යි ඒ මහරහතන් වහන්සේ ගේ පිළිතුර විය. එසේ නම් මම් බුදුසසුන්හි අයිතිය ලබන්නෙක් නොවෙම්දැ"යි රජතෙමේ නැවැත විචාළේය. "නැත මහරජ, කොතරම් ප්‍රත්‍යය පිදුව ත් එපමණකින් බුදුසසුන්හි අයිතියක් කාට වත් නොලැබේ. යමෙක් සිය දරුවකු බුදුසසුන්හි පැවිදි කෙරේ නම්, හේ බුදු සසුන්හි අයිතිකාරයෙක් වේ ය"යි මහරහතන් වහන්සේ පහද දුන්සේක.

### මහින්ද සංඝමිත්තා දෙදෙන පැවිදිවීම

මහරහත් මොග්ගලිපුත්තතිස්ස මාහිමියන් ගේ ප්‍රකාශය තදින් සිත්හි කා වැදී ගිය අශෝක රජ ඒ මොහොතෙහි තමන් ළඟ සිටි මහින්ද – සංඝමිත්තා දෙදෙනාගෙන් "පැවිදි වීමට කැමැත්තහු දැ"යි ඇසීය. මහ පිනැති ඒ කුමර කුමරියෝ පිය රජුගේ ප්‍රශ්නයෙන් ඉමහත් සොම්නස් වැ සිය පැවිදි බවෙන් තමනට මෙන් ම ලොවට ත් මහත්

ආශිර්වාදයක් වන බව සිතා එකවිට ම ඊට කැමතිවූහ. අශෝක රජුගේ සොහොවුරු තිස්ස කුමාරයා පැවිදි වූ දා සිට ම පැවිදිවීමට පුල පුලා සිටි මිහිඳුකුමරුට පිය රජුගේ ප්‍රශ්නය කනට මිහිරක් විය. සංඝමිත්තා කුමරිය ද සිය සැමි අග්ගිබ්‍රහ්ම කුමරු තිස්ස කුමරු සමග පැවිදි වීමෙන් පසු තොමෝ ද පැවිදි වීමට ආසා උපදවා විසූවා ය. ඉන් පසු අශෝක රජ "මේ දරුවන් දෙදෙන පැවිදි කොට මට ශාසන උරුමය ලබා දුන මැනැවැ' යි මහා සංඝයා වහන්සේගෙන් ඇයැද සිටියේ ය. මහරජුගේ වචනය පිළිගත් මහාසංඝයාවහන්සේ මිහිඳු කුමරා මහණ උපසම්පදා කළසේක. බුදු සසුන්හි මහණ උපසම්පදා ලත් මිහිඳුයෝ එදා ම රහත්වූහ. පැවිදිවනවිට අටළොස් වියෙහි සිටි සංඝමිත්‍රා කුමරිය ද පැවිදි වැ විසිවයස් පිරුණුකල්හි ධම්මපාලි ස්ථවිරාවන් උපාධ්‍යාය කොට ආයුපාලි ස්ථවිරාවන් ආචාර්ය කොට උභතෝසංඝයාගෙන් උපසම්පදාව ලැබ රහත්වූහ.

## අශෝක රජ ධර්ම දූතයන් යැවීම

අශෝක රජු බුදු සසුන් විෂයයෙහි පහන් වැ සිවුපසින් කිසිදු අඩුවක් නොදැනෙන පරිදි සංඝයාට උවැටැන් කළ හෙයින් ලාභ සත්කාරයෙහි ගිජු වූ තීර්ථකයෝ ද සසුන් ගත ව දුෂ්ප්‍රතිපත්තිහි යෙදෙමින් පිරිසිදු බුදුදහම මිථ්‍යාමත බහා දූෂණය කිරීමට පටන්ගත්හ. එහෙයින් මොග්ගලිපුත්තතිස්ස මහරහතන් වහන්සේ ප්‍රධාන දහසක් මහරහතන් වහන්සේ විසින් තෙවැනි සංගායනාව කොට නිමිකල්හි දූරදර්ශී වූ මොග්ගලිපුත්තතිස්ස මහ රහතන් වහන්සේ ප්‍රත්‍යන්තයන්හි මතු ශාසනය හොඳින් පිහිටන බැව් දැන, ඒ ඒ ප්‍රදේශයන් කරා ධර්මදූතයන් වහන්සේලා පස්නම බැගින් පිටත් කර යැවූහ. මේ දූතකණ්ඩායමක් පස් නමකින් පරිමිත වූයේ ප්‍රත්‍යන්තයන්හි උපසම්පදා කර්මයට පස් නමක් ප්‍රමාණ වන හෙයිනි. මොග්ගලිපුත්ත තිස්ස මාහිමියන් වහන්සේ විසින් ධර්මදූතයන් යැවූ

ප්‍රත්‍යන්ත නාවයෙන් ලංකාව ද එකකි. ලංකාව වූ කලි ශාසන බීජරෝපණය පිණිස හැම අයුරින් ම සුදුසු බිමක් වූයෙන් අශෝක පුත්‍ර මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රධාන දූත පිරිස ලක්දිව ධර්ම ප්‍රචාරය සඳහා මෙහෙයවනු ලැබූහ.

එකලැ ලක් රජය කළ මුටසීව රජු මහලු වියෙහි සිටි හෙයින් ලක්දිව් ගමනට තව ම කල් නො වන බව සලකා මිහිඳු මාහිමියෝ සුදුසු කාලය පැමිණෙන තුරු ඉට්ඨිය - උත්තිය - සම්බල - භද්දසාල යන රහතන් වහන් සේලා සහ සංඝමිත්තාවන් පුත් අභිඥ ලාභී සෘද්ධිමත් සුමන සාමණේරයන් වහන්සේ ද භණ්ඩුක නම් අනැගැමි උපාසකයා ද සමග දක්ඛිණගිරිද නුවරට පැමිණි සේක. ඉන් සමසකට පසු මවු බිසවුන් දැක්ම පිණිස වෙදිසගිරි නගරයට වැඩම කොට මෑණි-යන්ද ඇතුළු නෑ සමූහයාට ත් සෙසු මහ ජනයාට ත් සගපත සලසමින් විසූ සේක. මිහිඳු මහරහතන් වහන්සේ ගෙන් බණ ඇසූ ඒ මවු බිසෝව අනාගාමී වූහ.

මුටසීව රජු ඇවෑමෙන් තිස්ස කුමරා ලක් රජයට පැමිණ තම අභිෂේකයේ දී තමනට ලැබුණු දක්ෂිණා වන සංඛ්‍ය ගජමුතු - හයමුතු ආදි මුතුවර්ග අටක්ද, ඉන්ද්‍රනීල ලෝහිතාඞ්ක - වෛඩූර්ය යන ත්‍රිවිධ මාණික්‍යද - ලතා යෂ්ටි - කුසුමයෂ්ටි - සකුණයෂ්ටි යන සැරයටි තුනක් ද දී- මහාරිෂ්ට නම් අමාත්‍යයා ඇතුළු පිරිසක් ධර්මාශෝක රජු වෙත යවන ලදි. එයින් තුටු පහටු වූ අශෝක රජ තෙමේ තමන් තෙරුවන් සරණ ගිය බව ත් තිස්සරජුට ද තෙරු-වන් සරණ කොට යන්නට ත් දන්වා තිස්ස රජුට "දේවා-නම්පිය" යන උපපද නාමය ද අභිෂේකෝපකරණ ද දී ඒ පිරිස ආපසු එවීය. ඒ පිරිස පැමිණීමෙන් පසු අශෝක රජුගේ නියමයෙන් තිස්ස රජුගේ දෙවන අභිෂේකය බු: ව: 237 වෙසක් පොහෝද සිදු කරන ලදි. එයින් මසකට පසු පැමිණි පොසොන් පොහෝද පෙරළ කී පිරිස් සහිත මිහිඳු මාහිමියන් වහන්සේ ලක්දිව මිස්සක පර්වතයට වැඩම කොට එහිදී ලක් රජු හමු වැ දහම් දෙසූහ. ලක් රජ ද එදින ම බුදු දහම වැළඳ ගත්තේය.

දෙවන පෑතිස් රජ මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රධාන භික්ෂූන් අන්තඃ පුරයට වැඩම කරවා ගෙන ගොස් කැඳ අවුළුයන් හා බොජුන්හෙන් සතප්පවා ලූයේය. දන් වළඳා නිමි කල්හි මහානාග නම් සිය සොහොයුරු යුව රජුගේ බිරින්ද වූ රජගෙහි ම වසන අනුලා දේවිය පිරිවර ස්ත්‍රී පන්සියයක් සමග අවුත් තෙරුන් වැඳ එකත්පසෙක හිඳ ගත්හ. තෙරුන් වහන්සේ ප්‍රේත වස්තු, විමාන වස්තු සත්‍ය සංයුක්ත යන දහම් දෙසූසේක. එයැසූ ඒ ස්ත්‍රීහු සද්දිරූ ත් සෝවාන් වූහ.

රජතෙමේ පසු ද යුව රජු සමග මහාමෙවුනා උයනට ගොස් තෙරුන් වැඳ පුද පිළිසඳර කොට "ස්වාමීනි භික්ෂූන් හට ආරාමය කැපදැයි" ඇසීය. එවිට මාහිමියෝ ආරාමය කැප බව ප්‍රකාශ කරමින් වේළුවනාරාමපූජාකථාව දේශනා කළසේක. ඒ අසා සපිරිවර මහරජාණෝ ඉමහත් සොම්නසට පත්වූහ. අනුලා දේවිය ඇතුළු පිරිස සකෘදාගාමී වූහ. රජ තෙමේ මහාමෙවුනා උයන ද භික්ෂූන්හට පිදීය.

සකෘදාගාමී වූ සිය පිරිස් සහිත අනුලා දේවිය මහණ වීමට කැමැත්ත කියා සිටියහ. රජතෙමේ අනුලා ඇතුළු පිරිස මහණ කරන ලෙස මිහිඳුමාහිමියනට සැලකෙළේය. එවිට මිහිඳුමාහිමියෝ "මහරජ, ස්ත්‍රීන් මහණ කිරීම අපට අකැපය. මාගේ නැඟණී වූ සංඝමිත්‍රා නම් බහුශ්‍රැත ස්ථවිරාවක් පැළලුප් නුවර වෙසෙති. භික්ෂුණීන් සමග එතුමිය ත් ශ්‍රී මහාබෝධින් වහන්සේ ගේ දක්ෂිණ ශාඛාව ත් මෙහි එවන ලෙස අප පිය මහරජුට දන්වා යැව්ව මැනැවැ"යි කීහ.

රජතෙමේ පිරිවර තිදෙනකු සමග සිය බෑනා වූ අරිට්ඨ නම් ඇමතියා අශෝක රජු වෙත හසුන් පත් දී පිටත්කර යැවීය. අරිට්ඨ ඇමැති තෙමේද පැළලුප් නුවරට ගොස් ධර්මාශෝක රජු බැහැදැක දෙවන පෑතිස් රජුගේ හසුන් පත් දී මිහිඳු මාහිමියන් වහන්සේ ගේ සන්දේශය ත් මෙසේ සැලකෙළේය. "උතුම් රජතුමනි, ලක්දිවැ රජයනඹ යහළු

රජුගේ සොහොයුරු මහානාග යුවරජුගේ බිසෝ තොමෝ ප්‍රව්‍රජ්‍යාව අපේක්ෂාවෙන් සංඝතා වැ වසන්නීය. ඒ දේවිය පැවිදි කරනු පිණිස සංඝමිත්‍රා ස්ථවිරාව ද ඇය සමග ශ්‍රී මහාබෝධියේ දක්ෂිණ ශාඛාව ද මෙහි එවනු මැනැවැ කියායි. මෙතෙම සංඝමිත්‍රාවන් හට ද තෙරුන් කී කරුණු කීවේය. ඒ කාලය වන විට සංඝමිත්‍රා තොමෝ තෙවළා දහම් හොඳින් පුහුණු කැරගෙනැ විසුවාය.

සොහොයුරාණන්වහන්සේගේ පණිවුඩය ලැබූ සංඝමිත්‍රාස්ථවිරාවෝ පිය රජුවෙත ගොස් තොරතුරු කියා සිටියාය. මහරජතෙමේ සංඝමිත්‍රා ස්ථවිරාවන්ගේ ලංකා ගමන ගැන අකැමැත්ත දක්වීය. එහෙත් මිහිඳු මහරහතන් වහන්සේගේ පණිවුඩය නිසා ත් සංඝමිත්‍රා ස්ථවිරාවන් ලංකා ගමන ගැන දක් වූ බලවත් කැමැත්ත නිසා ත් මහරජ ද පසුව කැමැති වී "ආර්යාවෙනි, එසේ නම් තව ත් භික්ෂුණීන් එකොළොස් නමකු ත් ශ්‍රීමහා බෝධි දක්ෂිණශාඛාව ත් රැගෙන යනු මැනැවැ යි කීය.

## බෝධි ශාඛාව සූදානම් කිරීම

ධර්මාශෝක මහරජතෙමේ සංඝමිත්‍රාව ත් ශ්‍රී මහාබෝධි දක්ෂිණ ශාඛාව ත් ලක්දිව් එවීමට තීරණය කොට ඒ බව මොග්ගලිපුත්තතිස්ස මහරහතන් වහන්සේට ද දන්වා සිටියේය. එසඳ මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ "මහරජ පිරිනිවන් ඇඳෙහි හොත් තථාගතයන් වහන්සේගේ අධිෂ්ඨාන පසක් විය" යි කීසේක. ඒ පස දනු කැමැති රජහට මෙසේ වදාළහ.

1 ධර්මාශෝක රජ ලංකාද්වීපයෙහි රෝපණය කිරීම පිණිස ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාව සිදින්නට වන් කල්හි තොමෝ මැ වෙන් වී ස්වර්ණ කටාහයෙහි පිහිටාවා!

2 ඒ බෝධියේ පත්‍රවලින් සවණක් රැස් විහිදේවා!

3 මහාබෝධිය වළාගැබට වැද සතියක් මුළුල්ලෙහි තිබේවා!

4 හෙළදිව ථූපාරාම චෛත්‍යයෙහි මාගේ දකුණු අකුදව පිහිටුවන දවස්හි යමාමහ පෙළහර කෙරේවා

5 හෙළදිව රුවන්මැලි මහා සෑයෙහි මාගේ ධාතූන් පිහිටුවන දවස්හි ඒ ධාතු බුද්ධවේශය මවාගෙන අහසට නැගී යමාමහ පෙළහර කෙරේවා!

මහරහතන් වහන්සේ විසින් අනාවරණය කළ මේ අධිෂ්ඨාන පස නොදින් දැනගත් මහ රජාණෝ ඉමහත් ප්‍රීතියට පත්වූහ. පැළලුප් නුවර සිට මහබෝමැඩ තෙක් ඇති සත් යොදුන් මහමඟ නන් විසිතුරු ලෙසින් සරසන්නට ත් රන් කටාරයක් සූදානම් කිරීමට ත් යනාදි අවශ්‍ය හැමෙකක් ම පිළියෙළ කිරීමට නියෝග කළහ. ඒ නියෝගය පිළිගත් මහජනයා එදවස වන විට ධජපතාකාදියෙන් මහමඟ අහස ත් සුදු වැලියෙන් සහ ලද පස්මලින් පොළව ත් විසිතුරු කොට සදන ලදී. දෙපස කෙසෙල් ගසින් සහ පුන්කලසින් අලංකාර කරන ලදී. සැදැහැති උවසු උවැසියෝ මඟ දෙපස කුහුලින් බලා හුන්හ. මහරජාණෝ සුවිසි බරණින් සැරසි ඇමැති ගණයාගෙන් හා දහසක් රජදරුවන් ගෙනුදු සිව්රඟ සෙනඟ නුදු පිරිවරණ ලදුව මහා සංඝයාවහන්සේ පෙරට කොටැ පසහතුරු රැසින් දසදෙස පුරවමින් බෝමැඩ සැපත්වූහ. ඉක්බිති සිව්රඟ සෙනඟ වටේට සිටුවා වට තිරයක් ඇද මහා සංඝයා වහන්සේ දහසක්දෙනා වහන්සේ ත් දහසක් රජුනු ත් වටේට සිටුවා මහරජාණෝ බෝමුල්හි දෙහොත් මුදුනෙන් තබා, හුන්හ. එවිට බෝරුක්හි කඳ හා දක්ෂිණ ශාඛායෙහි සිවුරියන් සා තැන් හැර සෙසුතැන් නොපෙනී ගියේය. ඒ පෙළහර දුටු රජතෙමේ නොහිම් සොම්නස් පත් වැ මුළු දඹදිව් රජයෙන් පුදා තුන්යළක් පැදකුණු කොට අට තැනෙක බැසැ හෙවැ වැඳ නැඟී, රන්කටාහය ආසනයක තබා දෙහොත් මුදුන්හි තබා කැර "ඉදින් මහා බෝධි ශාඛාව ලක්දිවට යා යුතු වේ නම් මම් බුදු සසුන්හි විමති රහිත වෙම් නම්, දක්ෂිණ බෝධි ශාඛාව ඉබේ ම සිඳී රන් බඳුනෙහි පිහිටාවා' යි සත්‍යක්‍රියා කරමින් හුන්නේය.

රජුගේ ශ්‍රද්ධාබලයෙන් හා සත්‍යක්‍රියාබලයෙන්ද, සර්වඥයන් වහන්සේගේ අධිෂ්ඨාන බලයෙන් ද මහා සංඝයා වහන්සේගේ සෘද්ධි බලයෙන් ද මහා බෝධි ශාඛාව රන් සිරියලින් ලකුණුකල තැනින් ඉබේ මැ වෙන් වැ සුවඳ මඩ පිරි රන් බඳුනෙහි පිහිටියා ය. එවිට පොළෝ කම්පා විය. රජු ඇතුළු ලක්ෂ සංඛ්‍යාත මහ සෙනඟ සාධු නාද පැවැත්වූහ. ඒක්ෂණෙහි මහා බෝධි ශාඛාව අහසට නැඟ වලාගැබ් වැදී නොපෙනී ගොස් නොයෙක් පෙළහර පා මහජනයා ප්‍රීති සාගරයේ ගිල්වමින් බිමට බැස්සාය. ඉන්පසු බෝධි ශාඛාව වැඩම කරගත් මහ පෙරහර වජ්මස අව පසළොස්වක ද පිටත් වැ දවසකින්ම පැළලූප් නුවරට වති.

ශ්‍රී මහා බෝධි ශාඛාව නොයෙක් පුද පෙරහරින් වැඩම කරවා ගෙනවුත් ගඞ්ගා නම් නදියෙහි නන් විසිතුරු ලෙසින් සැරසූ නැව්හි තැන්පත් කරවා භික්ෂුණීන් එකොළොසක් හා සමග සංඝමිත්‍රා ස්ථවිරාවන් ද අරිට්ඨ අමාත්‍යයා ප්‍රධාන ලාංඡකය පිරිස ද බෝධිගුප්ත කුමාරයා ප්‍රධාන කොට ඇති පිරිස ද දඹදිව් වැස්සන් ද නැවට නංවා, අවශේෂ කුලවැස්සන් සෙසු නැව් වලට නංවා තුමූ ත්, ඒ සමග තාමලිත්ති නම් තොටට (දැන් තාමලුක්) පැමිණියෝය. එහිදී ද අනේකත් දහතලාදිය පිරූ මඟුල් සක් තුනෙනත් බෝධි ශාඛාව අභිෂේක කොට සිරි බුදු වසින් දෙසිය[1] සත්තිස් වැන්නෙහි උඳුවප් මස පුර පැළවිය ද පිරිවර භික්ෂුණීන් එකොළොස් නම සහිත සංඝමිත්‍රා තෙරණිය ත් බෝධීන් වහන්සේ ත් එක නැවකට වැඩමකරවා සෙස්සන් ඉතිරි නැව් වලට නංවා අරිට්ඨ අමාත්‍යයා කැඳවා "දරුව මම මහාබෝධීන් වහන්සේට තෙවරක්ම දඹදිව රජය පුද කරවටික් දියට බැස මා යහළු දෙවන පෑතිස් රජුට යවමි. ඒ රජතුමෝද මා සේ ම බෝධි-පූජා කෙරෙත්වා! යි හසුන්පත් දිනි. ශ්‍රී මහා බෝධීන් වහන්සේ ත් රහත් මෙහෙණීන් වහන්සේ ත් රැගත් නැව දියත් වත්ම නොයෙක් ප්‍රාතිහාර්යයෝ වූහ. රජුගේ

1. සතිස් ඇතැම්

දෙඇසින් කඳුළු ධාරාවෝ ද වැගිරෙන්නට වන්හ. සාධු නාදයෙන් තාම්‍රලිප්ති තොටුපල ම රැව් පිළිරැව් දුනි. උඳුවප් මස පුර තුදුස්වක් ද ශ්‍රී මහා බෝධි ශාඛාව සහ රහත් මෙහෙණින් වහන්සේලා ත් රැගත් නැව ලංකා වෙරළට පැමිණියාය. රජු ඇතුළු මහ ජනයා අපමණ හරසරින් ශ්‍රී මහා බෝධිය ත් ඒ පිරිස ත් පිළිගති. දඹකොළපටුනෙන් සිට අනුරාධපුරය තෙක් මහ පෙරහරින් ශ්‍රී මහා බෝධි ශාඛාව වැඩම කරවාගෙන ගොස් බුද්ධාධිෂ්ඨානය පරිදි මහමෙව්නා උයන්හි රෝපණය කරන ලද්දිය. එය අද ත් නිර්මල බුද්ධ ධර්මය මෙන් ම පුනර්ජීවය ලබමින් විරාජමානවනු දැක්ම බෞද්ධයනට අපමණ ප්‍රීතියකි. මේ බෝධින් වහන්සේ ත් සංඝමිත්‍රා රහත්මෙහෙණින් වහන්සේ විසින් පිහිටුවන ලද ලක්දිව මෙහෙණ සස්න ත් සංඝමිත්‍රාවන්ගේ නම සමග ම අන්වැල් බැදගෙන සිටී.

# අනුලා ඇතුළු පිරිස පැවිදිවීම

සංඝමිත්‍රා මෙහෙණින් වහන්සේ මෙහි වැඩම කරන තෙක් අනුලා දේවිය සිය පිරිවර පන්සිය සමග දසසිල් සමාදන් වැ කහවත් හැඳ පැවිදි බව පතමින් "උපාසිකා විහාර" නම් තැන විසූහ. ඉන්පසු සංඝමිත්‍රා ස්ථවිරාවන් විසින් ඒ සියල්ලෝම පැවිදි කරනු ලැබ රහත්වූහ. සංඝමිත්‍රා ස්ථවිරාවෝ ද සිය පිරිස සමග එහි ම නතරවූහ. එහි චූලඞ්ගන - මහඞ්ගන - සිරිවඩ්ඪ යන මන්දිර තුනක් ප්‍රධාන කොටැති මන්දිර දොළසක් රජු විසින් කරවන ලදි. එක එක මැදුරක බෝධිය ගෙනා නැවේ රිට ත් එකක හබල ත් එකක කුඹ ගස ත් තැබ්බවී. පසුවැ මහරජු විසින් හත්ථාළ්හක නම් මෙහෙණවරක් කරවා සංඝමිත්‍රා ස්ථවිරාවන් ප්‍රමුඛ භික්ෂුණීන් හට පූජා කරන ලදි. එහි වැඩ වෙසෙමින් ලක්දිව අපමණ ස්ත්‍රී වර්ගයා පැවිදි උපසපත් කිරීමාදියෙන් ඔවුනට නිවන් මඟ පාදා දුන්හ. මෙකී හත්ථාළ්හක මෙමෙහෙණවර පසුකාලයෙහි ධම්රුචිකාදි නිකායාන්තර ඇතිවීමෙන් පසුද සංඝමිත්‍රා පරම්පරානුගත මෙහෙණින් වහන්සේගෙන් ම පාලනය විය.

සඞ්ඝමිත්‍රා රහත් මෙහෙණින් වහන්සේ සාමාන්‍යයෙන් ලක්දිවැ කාහට ත් විශේෂයෙන් ලාංකික ස්ත්‍රී වර්ගයාට ත් සිදුකළ යහපත අනන්තය. ඒ උත්තමාවෝ උසස් පහත් භේදයක් නොතැකූහ. හුදු කුළුණු මෙත් සිත් පෙරට කොටැ ගත්හ. සිය රට ත් නෑදෑයනු ත් සුවපහසු ත් සදහටම අත් හළහ. මේ ආදි නොයෙක් කරුණු නිසා ලක්වැසියාට සංමිත් තෙරණින් කවදාවත් අමතක කළ නොහැකිය.

## උත්තිය සමය (බු: ව: 277-287)

ලක්දිවැ මෙහෙණ සස්න පිහිටුවා වදාළ සංමිත් රහත් මෙහෙණින් වහන්සේ උපසම්පදාවෙන් නව පණස් වස් ඇති සේක්[1] බුද්ධ වර්ෂ 277 වැන්නෙහි රජ පැමිණි උත්තිය රජුගේ නවවැනි හවුරුද්දෙහි පිරිනිවිසේක. ඉන්පසු

1. මහාවංශ 20 50

උත්තිය රජ මුළු ලක්දිව්හි ම සතියක් පුද උළෙල පවත්වන්නට විධාන කොට සත්වැනි ද නුවරින් බැහැර ථූපාරාම දාගැබට පෙරදිගින් පිහිටියා වූ ද ඉන්මොබ වූ "චිත්තසාලා" නම් ගොඩනැගිල්ලට නුදුරෙන් පිහිටි බිම් පෙදෙසෙහි මහත් පුද පෙරහරින් එතුමියගේ ශ්‍රී දේහය ආදාහන කරවී. ඒ ආදාහන භූමිය වනාහි සංඝමිත් තෙරණිය විසින් ම සියදේහය ආදාහන කළයුතුය යි පෙන්නූ තැනයි. එතැන සිට බලන්නාහුට ශ්‍රී මහාබෝධීන් වහන්සේ ද පහසුවෙන් දැකිය හැකිය. උත්තිය රජතුමාණෝ ඒ බිමෙහි ම සංඝමිත් තෙරණියගේ ධාතු නිදන්කොට සෑයක් බැඳවූහ. (දීපවංසයේ 18 වන පරිච්ඡේදයෙහි එදවසැ භික්ෂුණීන් ගෙන් සිදු වූ නොහිමි මෙහෙය විස්තරකොට තිබේ.)

**ගැමුණු කාලය** (බු: ව 382-406)

මෙහෙණ සස්න පිහිටුවා සියවස් එකහමාරක් පමණ ගතවත් ම ලංකාවේ භික්ෂුණීහු ලක්‍ෂ ගණන් වුසූ බවට කරුණු තිබේ. දුටුගැමුණු රජුගේ මිරිසවැටි පූජෝත්සවයෙහි දී භික්ෂුණීන් අනූ දහසක් සිටි බවත්, රත්නමාලි චෛත්‍යයේ මංගලශිලාප්‍රතිෂ්ඨාපනයට දඹදිවැ දෙව්රම් වෙහෙරින් වැඩම කළ පියදස්සි මහරහතන් වහන්සේගේ ධර්මදෙශනාවට සවන් දුන් මෙහෙණින් වහන්සේලා[1] දහහතර දහසක් රහත්වූ බවත් වංශකථාගත ප්‍රවෘත්තීන්ගෙන් පෙනේ.

**ලජ්ජිතිස්ස කාලය** (බු: ව: 425-34)

සද්ධාතිස්ස රජුගේ වැඩිමහලු පුත් ලජ්ජිතිස්ස රජතෙමේ කුමක් කැමැති දැයි විචාරා කැමැති දූත් සහල් ආදී උපකරණත්[2] භික්ෂුණීන් හට පූජා කෙළේය.

**වළගම්බා කාලය** (බු: ව: 440-457)

දීපවංශයෙහි 18 වන පරිච්ඡේදයෙහි දක්වෙන පරිදි මෙහෙණ සස්න පිහිටුවනු ලැබූ කාලයෙහි සිට ම භික්ෂුණීහු ද භික්ෂූන් මෙන්ම පැවිද්දෙහි පරමාර්ථය (රහත් බව) ලබාගත්හ.

---

1. මහාවංස 26-69. 2. මහාවංස 33-28

එසේම සෙසු මෙහෙණ ගණයාට විනය පිටකය සහ පස්මහ සඟියද අභිධර්ම සප්තප්‍රකරණය ද ඉගැන්වූ බව එහි සඳහන් කොට ඇත්තේය. ඒ හැම කාලයෙහිම රජු ඇතුළු පිරිසට ත් බණ දෙසුවාට සැකයක් නැත. වෙසෙසින්ම [1]වලගම්බා රජ තෙමේ භික්ෂුණීන්ගේ සුභාෂිත වචන අසා සුදුසු කාල-යෙහි භික්ෂුණීන් හටද කැමැති පරිදි බෙහෙත් ආදී ද්‍රව්‍ය පිදුවේය.

**මහසිළුමහතිස් කාලය** (බු: ව: 467-82)

මේ රජු විසින් [2]දෙළොස් දහසක් භික්ෂුණීන්හට වස්ත්‍ර ත් තිස් දහසකට තුන් සිවුරු ත් පූජා කරනලදී.

**මකලන්තිස් සමය** (බු: ව: 502-528)

මෙරජුගේ මවු බිසොව දත් සෝද බුදු සසුන්හි පැවිදි වූහ. රජ තෙමේ රජ මාලිගාවට නුදුරෙන් මවු මෙහෙණියට [3]මෙහෙණවරක් කරවා පිදුවේය. එය දනාගෙහ නම්. පසුව දනාවොවන නමින් හැඳින්වූයේත් මෙය ම යි. ඒ රජ භික්ෂුණීන් උදෙසා ගිනිහල් ගෙයක් ද කරවිය.

**මහදාළියමානා සමය** (බු: ව: 552-564)

[4]මේ රජ තෙමේ කහවණු ලක්ෂයක් අගනා සිවුරු භික්ෂුණීන් වහන්සේට පිදීය.

**භාතියතිස්ස කාලය** (බු: ව: 684-698)

''සතුන් කෙරෙහි මොලොක් සිත් ඇති සඞ්ඝයා කෙරෙහි දැඩි ගෞරව ඇති ඒ මිහිපල් භික්ෂු[5] භික්ෂුණී සඞ්ඝයා විෂය යෙහි මහදන් පැවැත්වී.

**මහසෙන් සමය** (බු: ව: 819-845)

භාතියතිස්ස රජුගේ කාලයෙන් පසු මෙහෙණ සස්න ගැන සඳහන් වනුයේ මහසෙන් කාලයේය. මහසෙන් රජ තෙමේ උතුරු අබාහෙබෑ [6]මෙහෙණවර දෙකක් කරවී.

---

1. දීපවංස 19-13. 2. මහාවංස 34-7-8. 3. මහාවංස 35-36
4. මහාවංස 34-87 5. මහාවංස 36-5 6. මහාවංස 37-43

## මහානාම සමය (බු: 953-975

අපේ වංශ කථාවලෑ නම් මේ රජුගේ කාලයෙහි මෙහෙණ සස්න පිළිබඳ කිසි ම සටහනක් නැත. එහෙත් ලක්දිවෑ මෙහෙණ සස්නේ වැදගත් අවස්ථාවක් මේ රජුගේ කාලයට අයත් ය.

## ලක්දිව භික්ෂුණීන් චීනයට යෑම

ලක්දිව රජය කළ මහානාම රජුගේ කාලය වනවිට ලක්දිව මෙහෙණ සස්න දියුණුවෑ පැවැත්තේ ය. ක්‍රිස්තු වර්ෂ 413 දී කාශ්මීර ජාතික කුමාරයෙක් රජකම ගැන කලකිරී පැවිදි වූයේ ය. 'ගුණවර්මන්'' නම් ඒ භික්ෂුව චීනයට යන්නේ ජාවාරට වාසීනට ද දම් දෙසා ගියේ ය. චීනයට ගිය ගුණවර්මන් භික්ෂුව විසින් චීන ස්ත්‍රීහු පැවිදි කරන ලදහයි සමහර කෙනෙක් විශ්වාස කරති.

ගුණවර්මන් චීනයෙහි වාසය කළ කාලයෙහි ම පිටරටවියෙක් වූ ''නන්දි'' නම් සෙන්පතියෙක් ලක්දිව භික්ෂුණීන් තිදෙනෙකු ත් සමග ''සුවාන්චියා'' නම් චීන රජුගේ රාජ්‍යාදයෙන් සවන වර්ෂය වූ ක්‍රිස්තු වර්ෂයෙන් 429 දී චීනයට යාත්‍රා කෙළේ ය. ''සුං'' රාජධානියේ අගනුවර වූ ''චියෙන්කං'' නුවර (මෙකලෑ නැන්කිනයේ) ''විපු'' නම් පන්සලෙහි පෙරැඩි පිරිස නැවතුණහ. ටික කලක් ගතවෑ ගියාට පසු චීනයෙහිත භික්ෂුණීන් සිටිනු දැක මෙරටට පිටරටකින් භික්ෂුණීහු ආවාහුදැයි සිංහල භික්ෂුණීහු චීන මෙහෙණකගෙන් ප්‍රශ්න කළහ. ''නැත'' යනු චීන මෙහෙණගේ පිළිතුර විය. ''මෙහි භික්ෂුණීන් නො ආවේ නම් චීන ස්ත්‍රීනට මහණ කම ලැබුණේ කෙසේ ද''යි නැවත ඇසූහ. අපි භික්ෂූන් වහන්සේ ගෙන් ම පැවිද්ද ලැබුවෙමු යි චීන මෙහෙණිය පිළිතුරෑ දින. එවිට ලාංකේය භික්ෂුණීහු ''භික්ෂූන් වහන්සේලාට ස්ත්‍රීන් මහණ කොට හැකි බවත්, එසේ කිරීම දුකුලං ඇවැදීමට හේතුවන බවත්, භික්ෂූන් ගෙන් පැවිද්ද ලැබූ ස්ත්‍රීනට සම්බුදුන් වහන්සේ අනුදත් භික්ෂුණී ප්‍රව්‍රජ්‍යාව නොලැබෙන බවත්'' ප්‍රකාශ කොට ඔවුනට නැවතත් පැවිදි වීමට නියම කළහ. සැදැහැති ඒ චීන මෙහෙණින් වහන්සේලා නිවැරැදි භික්ෂුණී ප්‍රව්‍රජ්‍යාව ලබනු කැමති වූවාහු ඊට එකඟ වූහ.

ඉන්පසු ඒ ලාංකික භික්ෂුණීහු මේ කරුණ සැලකොට ගණපූරණයට සෑහෙන තරම් භික්ෂුණී පිරිසක් චීනයට එවන මෙන් දන්වා එකල්හි ලක්දිව රජය කළ මහානාම රජුට දන්වා එවූහ. එඇසූ රජ තෙමේ "ටිෂාලා" නමැති භික්ෂුණිය ප්‍රධාන භික්ෂුණීන් වහන්සේලා අට නමක් "නන්දි" සමග ම නැවැතක් පිටත්කර හැරියේය. මේ පිරිස චීනයට ශොංඩබවුගේ "යුවාන්චියා" රජුගේ රාජ්‍යෝදයෙන් දශවැනි වර්ෂයේය. මේ පිරිස යනවිට මුලින් ගිය පිරිස චීන භාෂාව හොඳින් දැන සිටියහ. ඉන්පසු දෙපිරිස එක්වැ එරටැ [1]භික්ෂුණී ශාසනය පිහිටුවා ලූහ. ශ්‍රේෂ්ඨ භික්ෂුණී අපදාන නම් චීන පොතෙහි දක්වෙන මේ ප්‍රවෘත්තිය ලාංකාවාසීන්ගේ ඉමහත් සන්තෝෂයට හේතු වන්නකි. එදා අද මෙන් ගමන් පහසුවක් නොවීය. එදා තිබුණේ රුවල් නැව පමණි. එද ඉතා අවදානම් සහිතය. සැඩ කුණාටුවලට මූන දෙමින් ජීවිතාශාව ත් අත්හැර මාස ගණන් ගෙවමින් මුහුදේ සැතපුම් දහස් ගණන් යාත්‍රා කොට චීනයට පැමිණ භික්ෂුණී ශාසනය එරටැ පිහිටුවීමට වෑයම කළ ඒ භික්ෂුණීන් වහන්සේලාගේ නම ලංකා ඉතිහාසයෙහි රන් අකුරින් ලියා තැබිය යුතුව තිබුණද ලංකාවේ වංශ කථාවල එය සටහන් නොවීම ලොකු පාඩුවකි. මේ භික්ෂුණීහු මහා විහාර පාක්ෂික නොවූවාහුදැයි මෙහිලා ඇතමුන් නගන ප්‍රශ්නයකි.

මේ මහානාම රජු කාලයෙහිම මෙරටට සැපත් ප්‍රසිද්ධ දේශ සංචාරකයකු වන (ෆාහියන් නම් ඒ චීන භික්ෂුවගේ පැමිණීම ද මෙරටැ පොත්හි සඳහන්වී නැත. මෙරටත් චීනයත් අතර පැවැති වෙළඳ සම්බන්ධය නිසා වැඩිපුරත් දෙරට අතර ගමනාගමනය තිබෙන්නට ඇත. සඳමුහුණු රජුගේ කාලයේ දී ආරම්භ වූ වෙළඳ සම්බන්ධය මහානාම කාලය වන විට තිබුණාට සැකයක් නැත. ලක්දිව මෙහෙණින් වහන්සේ ගොස් චීනයෙහි පිහිටුවා ලූ මෙහෙණ සස්න දැනට එහි නැත. දැනට එහි තිබෙන්නේ පසු වැ ඇති කැර ගත් මහායාන මෙහෙණි සස්නයි.

---

1, Biographies of Famous Buddhist Nuns.

### මුගලන් සමය (බු: ව: 1040-1058)

මුගලන් රජ තෙමේ [1]රාජන නම් මෙහෙණවරක් කොට ජේතවන නිකායික මෙහෙණීන් වහන්සේට පූජා කෙළේය.

### සුළු අග්බෝ කාලය (බු: ව: 1141-1151)

මේ කාලයෙහි ලක්දිවැ මහණ මෙහෙණ දෙසසුනම දියුණුව පැවතුනාව සැකයක් නැත. මෙකලැ කාලිඟු රට රජ තෙමේ යුද්ධයෙන් මැරෙන සත්ත්වයන් දැක අතිශයින්ම කලකිරී ලංකාවට අවුත් ජෝතිපාල නම් මහ තෙරුන් වහන්සේ වෙත පැවිදි විය. ලක් රජ තෙමේ මතාපමිත විහාරය කරවා එහි නවත්වාගෙන රාජකීය භික්ෂුවට උපස්ථාන කෙළේය. කාළිඟු රජුගේ[2] ඇමැතියා සහ දේවියද රජු මහණ වූ බව දැන මෙහි විත් පැවිදි වූහ. සුළු මුගලන් රජුගේ බිසොව කාලිඟු රජ බිසෝ මෙහෙණ හට සකසා උවැටැන් කළාය. අග්බෝ මෙහෙසිය හැම [3]භික්ෂුණීන්-ගේම දත්වැට නියම කළහ.

### 3 දෙටුතිස් සමය (බු: ව: 1167-1172)

මේ කාලයෙහි විසූ මෙහෙණින් වහන්සේ පවා පරම ගම්භීර වූ අභිධර්මයත් උගත්හ. දෙටුතිස් රජ යුද්ධයෙන් පරදින්නට වන් කල්හි සිය දේවිය ගැන මතක්වී දේවියට පණිවිඩයක් යවනු රජ තෙමේ මෙසේ කියා යැවීය. "මං දේවිනී, පැවිදි වැ ආගම හදුරා අබිදම් කියා රජහට පින් දෙව" කියාසි. රජ තෙමේ මේ හස්න ඇමැතියකු අත එවා සිය අත්හි තුබුණු සිරියෙන් ගෙල කපාගෙන මළේය. රජුගේ හස්න ගත් ඇමැති තෙමේ බිසොව වෙත අවුත් හස්නත් රජු මළ බවත් කිය. ඒ බිසොව රජු මළ පුවතින් සෝපත්වැ මෙහෙණ අසපුවට ගොස් පැවිදිවැ අටුවා සහිත අභිධර්ම පිටකය ඉගෙනැ ඒ ඇමැතියා ලවා රජු මළ තැපි පෙන්වාගෙන තොමෝද මළාය.[4] ඒ කාලය වනතුරුත් රජ බිසොවට පවා පැවිදි වීමට සුදුසු තත්ත්වයෙන් ලක්දිව මෙහෙණ සස්න පැවැති බවද මේ පුවතින් අනාවරණය වේ.

---

1. මහාවංශ 40-33, 2. මහාවංශ 41-47. 3. මහාවංශ 41-6°.
4. මහාවංශ 46-37

4 අග්‍රබෝධි සමය (බු: ව: 1270-1276)

මේ රජුගේ ජෙට්ඨා නම් මෙහෙසිකා තොමෝ [1]ජේතවනාරාම නම් මෙහෙණවරක් කරවා ඒ ආරාමයට පතනපාසාණ ප්‍රදේශයෙහි වූ ගම් දෙකක් හා ඒ බද බුද්ධගල නම් ගමක්ද ආරාමිකයන් සියයක්ද දුන්හ. මේ ආරාමයට ආරාමිකයන් වැඩපල කරන්නන්) සියයක් දීමෙන් ම විශාල ආරාමයක් බව පෙනේ.

මිහිඳු කාලය (බු: ව: 1282-1285)

මේ රජ තෙමේ[2] භික්ෂුණීන් හට පිය නමින් අසපුවක් කරවා පිදී. මොහු ඔටුනු නොපැළඳ රජය විචාළේය.

අග්බෝ සලමෙවන් (බු ව: 1285-1288)

මේ රජ තෙමේ[3] සංඝා නම් සිය දුව උප රජහට විවාහ කර දුන්නේය. එක් දවසක් කිසියම් කරුණක් නිසා උපරජ සංඝා කුමරියට තැළූ හෙයින් කුමරිය පිය රජු වෙත අවුත් තුඹවහන්සේ විසින් මා විවාහ කොට දුන් පුරුෂයා මා නිකරුණේ මරන්නේය"යි කී කල්හි දුකට පත් රජ තෙමේ වහා ම ඇය මෙහෙණවරට කැඳවාගෙන ගොස් පැවිදි කරවීය

1 මිහිඳු කාලය (බු: ව: 1331-1351)

මේ රජ තෙමේ රිදීයෙන් බෝසත් රුවක් කරවා [4]සිලාමේඝ නම් මෙහෙණවරෙහි තැබ්බවී.

දෙවැනි දප්පුල සමය (බු: ව: 1351-1356)

මේ රජුට "සේනා" නම් නැණවත් මෙහෙසියක් වූවාය. ඕ තොමෝ [5]සිලාමේඝ නම් මෙහෙණවරක් කරවා එහි විසූ භික්ෂුණීන්හට සිවුපසය දුන්නාය.

---

1. මහාවංස 46-57. 2. මහාවංස 46-57. 3 මහාවංස 46-138
4. මහාවංස 49-26 5 මහාවංස 50-3

**ජේන කාලය** (බු ව: 1411-1431)

ඉතා දැහැමි වූ මේ රජතෙමේ භික්ෂූන්ට ද [1]භික්ෂුණීන්ට ද නෑසන්ට ද ලක්දිව් වැස්සන්ට ද මිසුන්ට ද මාග පසිඳුන්ට ද කටයුතු සියල්ල පැවැත්වී.

**4 කසුප් කාලය** (බු: ව: 1457-1474)

මේ රජුගේ සෙනෙවි තෙමේ[2] තිස්සාරාම නම් මෙහෙණවර කරවා මිරිසවැටි විහාරයෙහි මහාබෝධිය භාර කෙළේය. මහිනුරාව නම් මෙහෙණවරක් ගැන කුකුරුමහන්දමන සෙල් ලිපියේ සඳහන් වන්නේය. ඒ සෙල්ලිපිය මේ රජුගේ කාලයට අයත් යයි බොහෝ දෙනකුන්ගේ හැඟීමය.

**5 කසුප් කාලය** (බු: ව: 1474-1484)

මේ රජුගේ පුත් සක්සෙනෙවියන්ගේ වජිරං නම් භාර්යාව [3] ශ්‍රීපාදසංඝාතයෙහි මෙහෙණවරක් කරවා සියලු තන්හි පූදනු ලබන සථවීර වංශික භික්ෂුණීන්ගට දුන්නාය.

**4 මිහිඳු කාලය** (බු: ව: 1545-1560)

මේ රජතෙමේ සොළින් විසින් වනසනලද විහාරාරාම-යන් ප්‍රතිසංස්කරණය කිරීමාදි වශයෙන් බොහෝ පින්කම් කෙළේය. එසේම [4] මහාමල්ලක නම් මෙහෙණවරක් කොට සථවිර වංශයෙහි භික්ෂුණීන්නට දුනි.

---

1. මහාවංශ 52 24 සහ අභිනවෙගවැව ටැම්ලිපිය E Z 2 3.
2. මහ වංස 52-62, 3. මහ වංස 54-47, E Z 219 4. මහාවංස 50 4

# මෙහෙණ සස්නේ අවසානය

සිවුවන මිහිඳු රජුට ත් මහා විජයබාහු රජුට ත් අතර කාලය තුළ දී ලක්දිව මෙහෙණසස්න අභාවයට ගිය බව ඉතිහාසඥයන්ගේ නිගමනය වී තිබේ. එයට සාධක වශයෙන් ඉදිරිපත් කරනු ලබන ප්‍රධාන කාරණය නම්: සිවුවන මිහිඳු රජුට ත් මහා විජයබාහු රජුට ත් අතර කාලය තුළ මෙහෙණ සස්න ගැන වංශ කථාවන්හි කිසිත් සඳහන් නොවීම යයි කියති. මහා විජයබාහු කාලය වන විට මෙහෙණ සස්න පමණක් නොව මහණ සස්න ද බොහෝ දුරට පිරිහී තිබුණු බව පෙනෙන්නේ උපසම්පදා කර්මය සඳහා ගණපූරක භික්ෂූන් පස්නමක් පවා සොයා ගන්නාට නොලැබුණෙන් ඒ රජුට රාමඤ්ඤ දේශයෙන් ත්‍රිපිටකධර භික්ෂූන් ගෙන්වා ලක්වැස්සන් පැවිදි උපසපන් කරවා ත්‍රිපිටකය පුහුණු කරවන්නට ත් සිදුවූ හෙයිනි.

මහා විජයබාහු කාලය වන විට දුබල වෙමින් ආ මෙහෙණසස්න රැක ගැනීමට හෝ නගාසිටුවීමට එකල රජයනුදු වහලක් ලැබෙන්නට නැතැයි සිතිය හැකිය. එකොළොස්වන සියවසේ මුල් භාගයේ දී ඇති වූ නොයෙක් දේශපාලන විප්ලවයන් නිසා හටගත් දුෂ්කරතාවයෝ මෙහෙණසස්න පිරිහීමට ත් හේතුවූහයි සිතන්නට ඉඩ තිබේ. එකොළොස්වන සියවසේ මැද භාගයේදී රජ වූ මහා විජයබාහු නරපතියා විසින් ගැම උවදුරක් ම ඉවත් කොට රටේ ත් ශාසනයේ ත් දියුණුව සලසාලූවත් මෙහෙණ සස්න දියුණු කිරීම සඳහා එතුමා විසිනුදු කිසිවක් කළ බවක් ඉතිහාසයෙහි දක්නට නොලැබෙන හෙයින් ඒ කාලය වන විටත් මෙහෙණ සස්න අභාවයට ගොස් තිබුණු නිසා විය යුතුයයි මෙකලැ නිගමනයට බැසගත් මනායයි. එය එසේ වුවත් මහාවංශයෙහි අසූවන පරිච්ඡේදයෙහි සැටවන ගාථාව විචාරකයන් විසින් මදක් විමසා බැලිය යුතුය.

තාලයුං දූරතො පංච- පීලයුං සඝධම්මිනො
භාරසිංසු ජනෙ භාරං- කාරයුං බහුකාරියං

(මහාවංශය 80- 66)

මාඝ රජුගේ බලමුළුව දරුවනට කසයෙන් තැළූහ. පස්සන්දම්සත් පෙළූහ ජනයා ලවා බර ඇද්දවූහ බොළඳෝ මූ සවිසුරු කරවූහ. යනු ඒ ගාථායෙහි අදහසයි. එහි පංච සහ ධම්මික යන්නෙන් සඳහන් වන පස්සහදම්මියෝ නම් 1, භික්ෂු, 2. භික්ෂුණී,) 3 ශික්ෂමානා (උපසපත් බව සඳහා හික්මෙන සාමණේරිය.) 4. සාමණේර, 5. සාමණේරී යන පස්දෙනායි මාඝ රජුගේ කාලය වන විට භික්ෂුණීන් සහ ශික්ෂමානාවන් සිටීමෙන් පෙනියනුයේ භික්ෂුණී ශාසනය පැවැති බවයි මාඝයන්ගේ කාලයෙහි රට ත ශාසනය ත් පෙළා ලූ හෙයින් භික්ෂුණී ශාසනය ඒ කාලයේදී අභාවයට ගිය බව සිතිය හැකිය. ඉන් මෙපිට මෙහෙණ සස්න ගැන වංශකථාදියෙහි කිසි සටහනක් නැත මේකල ලක්දිව පමණක් නොව ලෝකයේ කිසි ම රටක භික්ෂුණීහු නැත්තාහ. එබැවින් මෙහෙණ සස්න ද අභාවයට ගොස් අවසානය. චීන ටිබැට්-ජපන්-කොරියා-වියට්නාම් යනාදි රටවලැ මහායාන භික්ෂුණීන් නමවත් සිටින බව අසන්නට ලැබෙනත් ඒ ථෙරවාද භික්ෂුණීහු නොවෙති. ඔවුන්ගේ "ශීලය කවරක්-දැ"යි ප්‍රශ්න කළොත් ඔවුන් ඊට පිළිතුරු සපයන්නේ මස් මාංස නොකෑම ම ඔවුන්ගේ ශීලය බවයි. මේ අනුව සලකත් ම චීනාදි රටවල වත්මන්හි වෙසෙන භික්ෂුණීන් අප රට දසසිල් උවැසියක තරම් වත් ගුණ දහම් නොපුරණ බව කාට වුවත් පහසුවෙන් තේරුම් යන කරුණකි. ලෝකයෙහි නැවත මෙහෙණ සස්නක් පිහිටුවා ලිය හැක්කේ සවදහරි බුදු කෙනකුන් වහන්සේ නමක් පහළ වීමෙනි.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු